ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද බන්ධනාගාර පිළිබඳ ජාතික අධ්‍යයනයේ වාර්තාවේ විධායක සාරාංශය සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සිරකරුවන් පිළිබඳ පරිච්ඡේදයේ නිල නොවන පරිවර්තනයකි

- වධහිංසාවට එරෙහි ශ්‍රී ලාංකීය එකමුතුව -

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவினால் வெளியிடப்பட்ட சிறைச்சாலைகள் தொடர்பான தேசிய ஆய்வறிக்கையில் இருந்து நிறைவேற்றுச் சுருக்கம் மற்றும் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின் கீழ் தடுத்து வைக்கப்பட்டுள்ள கைதிகள் பற்றிய அத்தியாயத்தின் உத்தியோகபூர்வமற்ற மொழிபெயர்ப்பு

- சித்திரவதைக்கு எதிரான இலங்கை ஒன்றியம் -

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද බන්ධනාගාර පිළිබඳ ජාතික අධ්‍යයනයේ වාර්තාවේ විධායක සාරාංශය සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සිරකරුවන් පිළිබඳ පරිච්ඡේදයේ නිල නොවන පරිවර්තනයකි.

වධහිංසාවට එරෙහි ශ්‍රී ලාංකීය එකමුතුව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් බන්ධනාගාර පිළිබඳ සිදු කළ අධ්‍යයනයක්

බන්ධනාගාර පිළිබඳ ව 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සිදු කළ අධ්‍යයනය ඇසුරෙන් සම්පාදනය කරන ලද විධායක සාරාංශය හා නිර්දේශ ප්‍රකාශනය

අප වර්තමාන බන්ධනාගාර ක්‍රමවේදය හා ශ්‍රී ලාංකේය මානව හිමිකම් බැඳීම් අතර අනුකූලතාව අවබෝධ කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය පිළිබඳ ව 2018 දී අධ්‍යයනයක් සිදු කරන ලදී. ඒ හරහා ශ්‍රී ලංකාවේ බන්ධනාගාරගත වූවන්ගේ මානව හිමිකම් කෙරෙහි බලපෑම් සිදු කෙරෙන අදෘශ්‍යමාන ගැටලු පිළිබඳ ව විමර්ශනය කරන ලදී. මෙම විමර්ශනයේ මිනුම් දර්ශකය වූයේ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් සම්පාදනය කරන ලද නෙල්සන් මැන්ඩෙලා කොන්දේසීන් ය.

මෙම අධ්‍යයනය 2018 අප්‍රේල් හා සැප්තැම්බර් අතර කාලය තුළ සිදු කෙරිණ. එය බන්ධනාගාර, රිමාන්ඩ් බන්ධනාගාර හා වැඩ කඳවුරු ඇතුළු ප්‍රතිශෝධන ආයතන 20ක සිදු කළ අධීක්ෂණයන් මෙන් ම බන්ධනාග ාරගත වූවන්, බන්ධනාගාර නිලධාරීන් හා රාජ්‍ය ආයතන, ස්වාධීන ආයතන හා රාජ්‍ය නොවන කණ්ඩායම් වැනි පාර්ශ්වකරුවන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවන්ගෙන් ද සමන්විත විය.

මෙම අධ්‍යයනයේ නිගමනයන් හා නිර්දේශයන් හරහා ඒ පිළිබඳ ව ඇති දැනුම් පරතරය අවම කරමින් බන්ධනාගාර පද්ධතිය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ඇති කරයි. එමෙන් ම මෙතුළින් ආකෘතිකමය වශයෙන් පවතින අඩුලුහුඩුතා ද මතු කර පෙන්වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. මේ නිගමන හරහා බන්ධනාගාරගත වූවන්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම, බන්ධනාගාර පද්ධතිය ශක්තිමත් කිරීම මෙන් ම නිලධාරීන් මුහුණ දෙන ගැටලු කෙරෙහි අවධානය යොමු වීමට අදාළ වඩාත් සංවර්ධිත ක්‍රමවේදයන් හා ප්‍රතිපත්තීන් සම්පාදනය වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී බන්ධනාගාර දෙපාර්තමේන්තු නිලධාරීන් ලබා දුන් සහයෝගය කොමිසමේ ඇගයීමට බඳුන් වේ. ඔවුන්ගේ ඉල්ලීම මත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් බන්ධනාගාර නිලධාරීන් වෙනුවෙන් මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ද පවත්වන ලදී.

අධ්‍යයනයෙන් සිදු කළ ප්‍රධාන අනාවරණයන් ත්‍රිත්වය වන්නේ ඃ

- පද්ධතිය දරාගත නොහැකි තරම් තදබද සහිත බව හා සම්පත්වල ඌනතාවය
- බන්ධනාගාර පද්ධතියේ කේන්ද්‍රීය අවධානය යොමු ව ඇත්තේ වඩාත් සුදුසු පුනරුත්ථාපන ආකෘතිය කෙරෙහි නොව දණ්ඩනීය අංශය කෙරෙහි බව
- බන්ධනාගාර නිලධාරීන් තුළ මෙහි පවතින අඩුලුහුඩුතා පිළිබඳ හොඳ අවබෝධයක් ඇති බව හා ඔවුන් වෙනසකට සූදානම් බව

මින් අවසන් අනාවරණය නිසා සිරකරු සංඛ්‍යාවන් අඩු කොට පුනරුත්ථාපන ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා යම් පියවර ගතහොත්, ප්‍රමාණවත් සම්පත් සහිත ව අපගේ පද්ධතියට අපේක්ෂිත ප්‍රතිමානයන් කරා ළඟා විය හැකි බවට කොමිසම තුළ විශ්වාසයක් පවතී.

මේ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 20212025 උපක්‍රමික සැලසුම වන ''සුරක්ෂිත සමාජයක් උදෙසා හිමිකම් මත පදනම් වූ ප්‍රතිශෝධන ක්‍රමවේදයක්'' යනු නිවැරදි මාර්ගය කරා තැබූ එක පියවරක් ලෙස සැලකිය හැකි ය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම අද දින මෙම අධ්‍යයනයෙහි විධායක සාරාංශය හා නිර්දේශ පරිතුලනය ප්‍රකාශයට පත් කරන්නේ ඉමහත් සතුටිනි.

2020 නොවැම්බර් 25

කොළඹ

බන්ධනාගාර වාර්තාව : අන්තර්ගතය

විධායක සාරාංශය 7

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින සිරකරුවන් 38

නිර්දේශ වගුව 72

විධායක සාරාංශය

දළ විශ්ලේෂණය

බන්ධනාගාර පද්ධතිය පිළිබඳ මහජන සාකච්ඡාවක් මෙන් ම මහජන දැනුවත්භාවයක් නොමැති වීම හා සිරකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ ව තොරතුරු නොමැති වීම හේතුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ප්‍රථම වරට බන්ධනාගාර සම්බන්ධයෙන් දීප ව්‍යාප්ත අධ්‍යයනයක් දියත් කළේ ය.

මෙම අධ්‍යයනයට දිවයින පුරා පිහිටි බන්ධනාගාර 20ක් පාදක විය. මෙහි අධ්‍යයන ක්‍රමවේදයට බන්ධනාගාර සුපරීක්ෂණය කිරීම, බන්ධනාගාරගත වූවන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා ප්‍රශ්නාවලි බෙදා හැරීම, සෑම බන්ධනාගාරයකම නිලධාරීන් සම්මුඛ සාකච්ඡාවට බඳුන් කිරීම මෙන් ම අපරාධ යුක්තිය හා පරිශෝධන ක්‍රියාවලියට අදාළ රාජ්‍ය අමාත්‍යාංශවල පාර්ශ්වකරුවන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ද ඇතුළත් විය. රැස් කළ තොරතුරු මත පදනම් ව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, බන්ධනාගාර පරිපාලනය සම්බන්ධ දේශීය නෛතික ආකෘතීන් හා රජය අන්තර්ජාතික මානව හිමිකම් රෙගුලාසි කෙරෙහි ඇති බැඳීම්වලට අදාළ ව බන්ධාගාරවල පවතින තත්ත්වය හා සිරකරුවන් කෙරෙහි පවතින සැලකීම ඇගයීමට ලක් කරනු ලැබිණ.

සිරකරුවන්ට සැලකීම හා රඳවා තබා ගැනීම පිළිබඳ තත්ත්වය මූලික ජීවන ප්‍රමිතීන්ගෙන් ද බොහෝ පහළ තත්ත්වයක පවතින බව මෙම අධ්‍යයනයෙන් හෙළිදරව් වූයේ ය. සෞඛ්‍ය පහසුකම් හා පුනරුත්ථාපන අවස්ථා ද ඇතුළු ව බන්ධනාගාරගත වූවෙකුට අනිවාර්යයෙන් හිමි විය යුතු සේවාවන් ද ඉතා දුර්වල තත්ත්වයක පැවතීමට ප්‍රධාන හේතුව බන්ධනාගාරවල රඳවා ගත හැකි ධාරිතාවය බොහෝ සේ ඉක්මවා ගොස් තිබීම යි. බරපතල සේවක ඌනතාවය හේතුවෙන් බන්ධනාගාර නිලධාරීහු දැඩි වෙහෙසට පත් ව වෘත්තීමය අසංතෘප්තතාවයෙන් හා මානසික පීඩාවන්ගෙන් යුතු ව කටයුතු කරති. ඔවුන්ගේ රාජකාරියෙහි ඇති අසීරු බව හා අවදානම් සහිත බවට සරිලන වැටුපක් නොලැබීම නිසා දෛනික ව ඔවුන් මුහුණ දෙන අභියෝගවලට ඵලදායි ලෙස මුහුණ දීමේ හැකියාව අවම තත්ත්වයක පවතී. මේ හේතුවෙන් බන්ධනාගාර තුළ දැඩි තදබදයක් පවතින අතර කාර්යක්ෂමතාව ද දුර්වල තත්ත්වයක පවතී. මෙය අපරාධ, දූෂණය හා නැවත වරදට පෙළඹීමේ ත්ත්වයන් ඉහළ නැංවීමටත් පුනරුත්ථාපන අවස්ථා අවම කිරීමටත් හේතු සාධක වේ. එහි ප්‍රතිඵලයක් ලෙස පුනරුත්ථාපිත බන්ධනාගාරගත වූවන් ඵලදායී ව නැවත සමාජගත කිරීමේ අවස්ථාව අහිමි වී තිබේ.

මෙවන් සන්දර්භයක් තුළ මරණ දඬුවමට ලක් වූවන්, කාන්තාවන්, තරුණ වරදකරුවන්, විදේශිකයන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින්නවුන් හා ආබාධ සහිත සිරකරුවන් වැනි විශේෂ ගණයේ බන්ධනාගාරගත වූවන් අනෙක් පිරිස්වලට සාපේක්ෂ ව අවදානම් සහගත තත්ත්වයක සිටින බව කොමිසමට අධ්‍යයනය කළ හැකි විය. ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඔවුන් මුහුණ දෙන සුවිශේෂී අභියෝග පිළිබඳ සැලකීම තුළින් ඔවුනට ද පුනරුත්ථාපනය සඳහා සමාන අවස්ථාවක් සැලසීම අනිවාර්යයෙන් සිදු විය යුතු ය.

බන්ධනාගාරගත වූවන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවල දී රැස් කළ ගුණාත්මක දත්ත ඇසුරෙන් පෙන්වා දෙන්නේ ඔවුන්ගෙන් බහුතරයක් පහළ සමාජ ආර්ථික පසුබිමකින් පැවත එන බව යි. ඔවුන් විස්තරාත්මක ව සිය පෞද්ගලික තොරතුරුවලින් දක්වන පරිදි මුදල් නොමැති වීම හේතුවෙන් නීතිඥ සහාය ලබා ගැනීමට අපොහොසත් වීම ද එයට අයත් වේ. සිරකරුවෝ බොහෝ විට තමන් අපරාධ ක්‍රියාවලට යොමු වීමට දරිද්‍රතාවය හා ආර්ථික අස්ථායීතාවය ප්‍රධාන හේතු වශයෙන් දක්වති. දරිද්‍රතාවය යනු සියලු ම ආකාරයේ වයස් මට්ටම්, ජාතීන් හා ආගමික පසුබිම් සහිත සිරකරුවන් අතර දක්නට ලැබෙන පොදු සාධකයකි. විශේෂයෙන් පිරිමි සිරකරුවන් දක්වා සිටියේ තමන් සිය පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා වූ බැවින් සිරගත වන කාල සීමාව තුළ පවුලේ ආදායම අහිමි වීම හේතුවෙන් එම පවුල් තව තවත් දුෂ්කරතාවලට මුහුණ දෙන බව යි. ඒ පිළිබඳ ව ඔවුන් තුළ පැවතියේ දැඩි සංවේගයකි. තමන්ට දිනකට වේල් තුනක්

ආහාර ලැබෙද්දී ඔහුගේ හෝ ඇයගේ පවුලේ සාමාජිකයන්ට එකදු ආහාර වේලක්වත් නොලැබී යන බව පවසමින් ඔවුහු බොහෝ අවස්ථාවල දී වැළපුණහ.

කොමිසම විසින් විශේෂයෙන් නඩු විභාගයට පෙර කාලය තුළ දීර්ඝ කාලීන ව රඳවා තබා ගැනීම්වලට තුඩු දෙන ආකාරයෙන් අපරාධ අධිකරණමය ක්‍රියාවලියේ පවතින විවිධ දුර්වලතාවන් පිළිබඳ ව ද අනාවරණය කරනු ලැබිණ. මේ හරහා පෙරළා බන්ධනාගාර තුළ පවතින පීඩාකාරී ජීවන තත්ත්වයන් හා සැලකීම්වලට ද මාර්ගය සැලසේ. ඇප නියම කරන ක්‍රමය නීතිපති දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතනවල පරිපාලනමය අකාර්යක්ෂමතා, නීති සහාය ලබා දීමේ දුර්වලතා මෙන් ම සිරගත කිරීමට විකල්ප වශයෙන් භාවිත කළ හැකි වෙනත් ක්‍රම භාවිතයේ දුර්වලතා ආදී සියල්ල විශාල සිරකරුවන් පිරිසක් දීර්ඝ කාලීන ව බන්ධනාගාර තුළ රැඳී සිටීමට හේතු සපයයි. මෙය බදු ගෙවන්නන් හට දැවැන්ත බරක් වනු පමණක් නොව අපේක්ෂිත ප්‍රතිඵලවල ද පසුබෑමට හේතුවක් වන්නේ ඵලදායි පුරවැසියන් ලෙස නැවත සමාජගත වීමේ සූදානමකින් සිරකරුවන් බන්ධනාගාරයෙන් පිට නොවන බැවිනි. ඒ වෙනුවට පවතින ක්‍රමවේදය අනුව බොහෝ විට සිදු වන්නේ සමාජය තුළ නොනැසී පැවතීම සඳහා ඒ පුද්ගලයන් තවදුරටත් අපරාධ කරා යොමුවීම යි.

මේ හේතුවෙන් සිරකරුවන් පුනරුත්ථාපනය කිරීම හා අවසන් වශයෙන් අපරාධ වැළැක්වීම සම්බන්ධ අරමුණු සපුරා ගැනීම සඳහා විශෝධන ක්‍රමවේදය තුළ පුළුල් ප්‍රතිසංවිධානයක් සිදු කිරීම අත්‍යවශ්‍ය ය. මෙම අධ්‍යයනය, බන්ධනාගාරගත ව සිටින කාල සීමාව තුළ මෙන් ම ඉන් පසු ව ද ඔවුන් මූලික ව අපරාධ කරා යොමු කළ සමාජආර්ථික හා මානසික තත්ත්වයන් කුප්පනු වෙනුවට ඵලදායී පුනරුත්ථාපන වැඩසටහන් හරහා ගෞරවාන්විත දිවියක් වෙත සිරකරුවන් යොමු කළ හැකි විශෝධන ප්‍රතිපත්තීන් සම්පාදනයට පදනම් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම අධ්‍යයනය පුරාවට සිරකරුවන් බන්ධනාගාර තුළ දී මෙන් ම ඔවුනගේ පෞද්ගලික ජීවිතවල දී මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳ බන්ධනාගාර නිලධාරීන් හට විශාල අවබෝධයක් හා සහකම්පනයක් ද පවතින ආකාරය කොමිසමේ නිරීක්ෂණය බව ද විශේෂයෙන් පෙන්වා දිය යුතු ය. බන්ධනාගාර සේවකයෝ බන්ධනාගාර තුළ පවතින අඩු ලුහුඬුතා හා දුර්වලතා පිළිබඳ ව ස්වේච්ඡාවෙන් ම කතා කිරීමට ඉදිරිපත් වූ අතර නිලධාරීහු පවතින දණ්ඩන ක්‍රමවේදය විශෝධන ක්‍රමවේදයක් කරා පරිවර්තනය කිරීමට ගත යුතු සංවර්ධනීය පියවර යෝජනා කළහ. ඔවුන් ඉදිරිපත් කළ යෝජනා සිරකරුවන්ගේ ජීවන තත්ත්වය හා නැවත වරදට පෙළඹීමේ නැඹුරුව අවම කළ හැකි පුනරුත්ථාපන වැඩසටහන් හා අපරාධ යුක්ති ක්‍රියාදාමය තව දුරටත් ශක්තිමත් කිරීමට පවා අදාළ වන සේ ඉතා පුළුල් පරාසයක පැතිර ගොස් තිබුණි. මේ හේතුවෙන් රජය මඟින් ගනු ලබන සෑම බන්ධනාගාර ප්‍රතිසංවිධාන පියවරක දී ම සියලු තරාතිරමවල බන්ධනාගාර නිලධාරීන්ගෙන් උපදෙස් ලබා ගත යුතු බව කොමිසම විශ්වාස කරයි.

I කොටස : සිරකරුවන්ට සැලකීම හා පවතින තත්ත්වය

01. ඇතුළුවීම හා පිටවීම පිළිබඳ ක්‍රියාවලිය

නව සිරකරුවෙකු බන්ධනාගාරයට ඇතුළු කිරීම හා ලියාපදිංචි කිරීම පිළිබඳ ක්‍රමවේදය දිවයින පුරා සියලු බන්ධනාගාරවල සමාන වුව ද එහි දුර්වලතා ගණනාවක් දක්නට ලැබේ. උදාහරණයක් ලෙස කේන්ද්‍රීය විද්‍යුත් තොරතුරු පද්ධතියක් වෙනුවට ලිපිගොනු භාවිත කරන බැවින් බන්ධනාගාරවල තොරතුරු කළමනාකරණ පද්ධතිය ඉතා අකාර්යක්ෂම වන අතර සිරකරු ලිපිගොනු සෙවීම හා ලබා ගැනීමෙහි විශාල ප්‍රමාදයක් දක්නට ලැබේ. බන්ධනාගාර කිහිපයක විද්‍යුත් තොරතුරු කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වනු දක්නට ලැබුණ ද, කාර්ය මණ්ඩලය තුළ තොරතුරු තාක්ෂණ දැනුම සහිත නිලධාරීන් හිඟ වීම හේතුවෙන් එම ක්‍රියාවලින්හි දීර්ඝ කාලින සාර්ථකත්වයක් අපේක්ෂා කළ නොහැකි ය.

ඇතුළත් කිරීමේ ක්‍රමවේදයෙහි කොටසක් ලෙස සිරකරුවන්ගෙන් ඔවුන් අත්අඩංගුවට ගැනීමේ දී පොලිසියේ පහරදීමකට ලක්වූයේ ද හා ඒ පිළිබඳ නීතිමය පියවර ගැනීමට අපේක්ෂා කරන්නේ ද යන්න විමසනු ලැබේ.

සිරකරු එසේ අපේක්ෂා කරයි නම්, ප්‍රහාරයේ ස්වභාවය හා චෝදනාවට ලක්වන්නන් පිළිබඳ ව තොරතුරු ලබා ගෙන අදාළ පොලිස් ස්ථානයේ පොලිස් අධිකාරීවරයා වෙත එම තොරතුරු යොමු කෙරේ. කෙසේ වෙතත්, එවැනි ක්‍රියාවලියක් හරහා අදාළ වරදකරුවන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනුණි ද යන්න පිළිබඳ තහවුරු වීමක් සිදු නොවේ. එයට හේතුව ඒ සම්බන්ධ යම් පියවරක් ගැනුණේ ද යන්න තහවුරු කිරීමේ ක්‍රමවේදයක් හෝ සිරකරුවාට සිය පැමිණිල්ල පිළිබඳ පසු විපරම් කිරීමේ හැකියාවක් නොපවතින බැවිනි.

ලියාපදිංචි කිරීමේ දී සිරකරුවන් ඡායාරූපගත කිරීම අනිවාර්යයෙන් සිදු කෙරෙයි. බොහෝ විට උඩුකය කමිසය ඉවත් කර සිදු කෙරෙන මෙම ඡායාරූපගත කිරීමේ දී දැකිය හැකි තුවාල කැළැල් ආදිය සටහන් කෙරේ. මෙය එම තුවාල සිදු වූ කාල සීමාව පිළිබඳ කාල නිර්ණයට උපයෝගී වේ. කෙසේ වෙතත්, බොහෝ බන්ධනාගාරවල ලියාපදිංචිය සිදු කෙරෙනුයේ බන්ධනාගාරයට ඇතුළත් කර දෙවැනි දිනයේ දී ය. විශේෂයෙන් සන්ධ්‍යා කාලයේ දී රැගෙන එන සිරකරුවන් පිළිබඳ ව ක්‍රියා කෙරෙනුයේ ඒ ආකාරයෙනි. එබැවින් බන්ධනාගාරගත වීමට පෙර සිරකරුට සිදු වූ තුවාල පිළිබඳ ව සටහනක් තබා ගැනීම සිදු නොවේ. ඒ අනුව බන්ධනාගාරගත වීමෙන් පසු සිරකරුට කෙබඳු තුවාල ඇති වූයේ ද යන්න තීරණය කිරීම අපහසු වේ.

සිරකරුවන්ගේ රෝගාබාධ නිශ්චය සඳහා ඔවුන් විස්තරාත්මක සෞඛ්‍ය පරීක්ෂණයකට බඳුන් කිරීම අත්‍යවශ්‍ය වුව ද ඊට අවශ්‍ය තාක්ෂණික සම්පත් හා උපකරණවල ඌනතාවය හේතුවෙන් මෙය බොහෝ විට මගහැරී යයි. බොහෝ විට සිදු වන්නේ බන්ධනාගාරගත වීමෙන් පසු සිරකරු වෛද්‍යවරයෙකු විසින් මූලික වෛද්‍ය පරීක්ෂණයකට ලක්කිරීම පමණි. එහෙත් යම් කිසි බරපතල රෝගයක් හෝ විශේෂයෙන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමක්, ඉන් මිදීමේ දී දක්නට ලැබෙන රෝග ලක්ෂණ හෝ සියදිවි නසාගැනීමේ ප්‍රවණතාවක් නව සිරකරු තුළ තිබේ ද යන්න හඳුනා ගැනීමට විස්තරාත්මක වෛද්‍ය පරීක්ෂණයක් සිදු කිරීම අත්‍යවශ්‍ය ය.

තහනම් භාණ්ඩ රහසේ බන්ධනාගාරයට රැගෙන යාම වැළැක්වීම සඳහා සෑම සිරකරුවෙකු ම බන්ධනාගාරයට ඇතුළු වීමේ දී ශරීර පරීක්ෂාවකට ලක්කිරීම අනිවාර්ය බව කොමිසම වෙත දැනුම් දෙන ලදී. කෙසේ වෙතත්, මෙම පරීක්ෂාවන් පුද්ගල අභිමානය හෝ පෞද්ගලිකත්වය පිළිබඳ කිසිදු සැලකීමකින් තොර ව නින්දා පරවශ ආකාරයෙන් සිදු කෙරෙන බවට කොමිසම වෙත පැමිණිලි ගණනාවක් ලැබී ඇත. මින් පෙනී යන්නේ සිරකරුවන්ට අපහසුතාවයක් හෝ අවමානයක් සිදු නොවන අයුරින් ඵලදායී ලෙස ශරීර පරීක්ෂාවන් සිදු කළ හැකි නව තාක්ෂණික උපකරණවල කඩිනම් අවශ්‍යතාවය යි. මේ සම්බන්ධයෙන් ඇතැම් බන්ධනාගාරවල ශරීර ස්කෑන් කිරීමේ යන්ත්‍ර කොමිසමට දක්නට ලැබුණ ද ඒවා බොහොමයක් පිළිසකර කළ යුතු තත්ත්වයක පවතින බව හා විවිධ තහනම් ද්‍රව්‍ය අනාවරණය කිරීමට තරම් තාක්ෂණයෙන් දියුණු ඒවා නොවන බව ද නිරීක්ෂණය විය. එපමණක් නොව, ඇතැම් බන්ධනාගාරවල ස්ථාපනය කර ඇති විද්‍යුත් පද්ධති ඒවා මෙහෙයවීමට පුහුණු සේවකයන් නොමැතිකමින් හෝ නිසි නඩත්තුවක් සිදු නොවීම නිසා හෝ අකර්මණ්‍ය තත්වයේ පවතී.

නව බන්ධනාගාරගත වීමක දී බන්ධනාගාරයේ දින චර්යාව, නීති හා රෙගුලාසි, බන්ධනාගාරය තුළ වැරදි ලෙස සැලකෙන දේ හා ඒ පිළිබඳ සම්බාධක, අන්තර් දුක්ගැනවිලි යාන්ත්‍රණය ආදිය පිළිබඳ සම්මත හඳුන්වාදීමේ වැඩසටහනක් සිදු කළ යුතු වුව ද සෑම බන්ධනාගාරයකම එය සිදු නොවන බව කොමිසමට අනාවරණය විය. ඇතැම් බන්ධනාගාරවල වාචික ව යම් යම් තොරතුරු සිරකරුවන්ට ලබා දුන්න ද එය සිදු වන්නේ ද සිංහල භාෂාවෙන් පමණි.

බන්ධනාගාර ගණනාවක බන්ධනාගාරගත වූවන්ගෙන් කොමිසම ලද තොරතුරු අනුව ඔවුන් සිදු කළ වරදට සාපේක්ෂ ව බන්ධනාගාරයට ඇතුළු වීමේ දී, ''පිළිගැනීමේ අතුල්පහර'' යනුවෙන් හැඳින්වෙන ශාරීරික ප්‍රහාරයකට ගොදුරු වීමට සිදු වේ. මත්ද්‍රව්‍ය, ස්ත්‍රී දූෂණ සම්බන්ධ වැරදි සහිත හා මින් පෙර බන්ධනාගාරගත ව සිටි සිරකරුවෝ විශේෂයෙන් එවැනි වධ හිංසනයන් පිළිබඳ පැමිණිලි කළහ.

02. නේවාසික තත්ත්වය

ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල සිටින සිරකරුවන් ප්‍රභේද කරනුයේ යල් පැන ගිය ජාතික නීතිකරණයකට අනුව ය. එය දැනට පවතින අන්තර්ජාතික ප්‍රමිතීන්ගෙන් බොහෝ වෙනස් වේ. ස්ත්‍රී හා පුරුෂ සිරකරුවන් වෙන් කර තැබීම තදින් ම ක්‍රියාත්මක වන අතර අවුරුදු 18ට අඩු සිරකරුවන් අවුරුදු 22 දක්වා වයස් සහිත වූවන් සමඟ එකට රඳවා තැබීමට දේශීය නීතියෙන් අවකාශ සැලසේ. එමෙන් ම සමාජයීය වශයෙන් බලපෑම් කළ හැකි යයි සැලකෙන පුද්ගලයන් අනෙකුත් සිරකරුවන්ගෙන් වෙන් කොට තැබීම ද ඒ හරහා නිර්දේශ කෙරේ.

වරදකරුවන් ලෙස තීන්දු කළ සිරකරුවන්ගේ පෙර වැරදි තිබේ ද නැද්ද යන්න මත ඔවුන් සිරගත කෙරෙන බන්ධනාගාරය තීරණය වුව ද, හැකිතාක් පවුලේ සාමාජිකයන්ට සමීප ව සිටිය හැකි සිය පදිංචි නගරයට ආසන්න බන්ධනාගාරවලට ප්‍රමුඛතාවය ලබා දෙයි.

සිරකරුවෙකුට හිමිවිය යුතු පෞද්ගලික ඉඩ අවකාශය සම්බන්ධයෙන් වාට්ටුවල ප්‍රමිතියක් නොමැති අතර වාතාශ්‍රය, ආලෝකය හා උෂ්ණත්වය බොහෝ අවස්ථාවල දී මනුෂ්‍ය වාසයට නුසුදුසු තත්ත්වයක් දක්වා පහත වැටේ. මෙයට ප්‍රධාන හේතුව සෑම බන්ධනාගාරයක ම දැකිය හැකි තදබදය පමණක් නොවේ, බොහොමයක් බන්ධනාගාර මීට දශක ගණනාවකට පෙර ඉදි කළ අබලන් තත්ත්වයේ පවතින ඒවා වීම යි. ගරාවැටෙමින් පවතින වහල හා බිත්ති සිරකරුවන්ගේ ජීවිත තර්ජනයට ලක් කරන අතර ස්වාභාවික විපතක දී මෙම බන්ධනාගාර ආරක්ෂිත පරිසරයක් ඇති නොකරයි. කොමිසම නිරීක්ෂණය කළ කිසිදු බන්ධනාග ාරයක ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති හෝ හදිසි අවස්ථාවක දී පුද්ගලයන් ඉවත් කිරීමේ ක්‍රමවේද දක්නට නොලැබිණ. එවන් අවස්ථාවක දී දැඩි අනතුරට පත් වන්නේ වයස්ගත හා ආබාධිත සිරකරුවන් ය. මෙවන් ගැටලු දක්නට ලැබෙනුයේ පැරණි බන්ධනාගාරවල පමණක් නොව අන්තර්ජාතික ප්‍රමිතීන්ට පටහැනි ව යමින් මෑතක දී ඉදි කළ බන්ධනාගාරවල පවා මෙම තත්ත්වය දැකගත හැකි ය.

වාට්ටුවල පවතින දැඩි තදබදය හේතුවෙන් අලුතින් රිමාන්ඩ් බන්ධනාගාරගත වූවන්ට බොහෝ විට කෙලින් සිටගෙන රැය පහන් කිරීමට සිදු වන්නේ නිදාගැනීමට තරම් ඉඩ පහසුකම් නොමැති බැවිනි. එසේ නොමැති නම් ඔවුනට වැසිකිළි අසල හෝ වැසිකිළි තුළ නින්දට යාමට බල කෙරේ.

කොමිසම නිරීක්ෂණය කළ පරිදි හා සිරකරුවන් බොහෝ විට පැමිණිලි කළ පරිදි මේ වාට්ටු තුළ විශාල ප්‍රමාණයෙන් මදුරුවන්, ඇඳ මකුණන්, මීයන් හා පරෙවියන්ගෙන් උවදුරු පැමිණේ. මෙය සිරකරුවන්ට ඉතා පීඩාකාරී වන අතර ඔවුනගේ සෞඛ්‍යයට ද බරපතල තර්ජන ඇති කරයි. නීතිමය වශයෙන් සිදු කළ යුතු වුව ද, වාට්ටු හා අනෙකුත් ස්ථානවල තත්ත්වය සෞඛ්‍ය නිලධාරීන් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ නිරන්තර පරීක්ෂාවකට ලක් නොවේ. බාහිර හා ස්වාධීන ආවේක්ෂණයන් නොමැති වීම හා අමාත්‍යාංශය මඟින් දක්වන ප්‍රතිචාර හේතුවෙන් සිරකරුවන්ගේ සෞඛ්‍යය හා ජීවන තත්ත්වය පිළිබඳ දැඩි නොසැලකිල්ලක් නිරීක්ෂණය කළ හැකි ය. මෙවැනි තත්ත්වයන් සිරකරුවන් අතර රෝග පැතිර යාමට හා පෙරළා දැනටමත් අසීරුතාවලට මුහුණ පා සිටින බන්ධනාගාර සෞඛ්‍ය හා ප්‍රවාහන පද්ධතියට අහිතකර බලපෑම් ඇති කිරීමට හේතු වේ.

03. ආහාර

අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරය හැරුණු කොට අනෙකුත් සියලු බන්ධනාගාරවල ආහාර කිසිදු රසයකින් තොර බවටත් බොහෝ විට නිසි ලෙස නොපිසින ලද බත් ලබා දෙන බවටත් පැමිණිලි ලැබිණ. බන්ධනාග ාර ආහාර මෙසේ ගුණාත්මක බවින් හීන වීමට බන්ධනාගාර මුළුතැන්ගෙවල් තුළ පවතින අපිරිසිදු තත්ත්වය බලපෑ හැකි බව කොමිසම නිරීක්ෂණය කළේ ය. විශේෂයෙන් අවහිර වූ කාණු හා තෙතමනය සහිත පොළොව හේතුවෙන් බැක්ටීරියා වර්ධනයට අභිජනන භූමියක් වන මේ මුළුතැන්ගෙවල්වල පිසින ලද ආහාර විවෘත ව තැබීමෙන් ඉක්මනින් පිළුණු වීම සිදු වේ.

වැඩ කඳවුරු හා විවෘත බන්ධනාගාරවල බරපතල වැඩවල නිරත වන සිරකරුවෝ ඔවුනට ලැබෙන ආහාර ප්‍රමාණවත් නොවන බවට බොහෝ විට පැමිණිලි කළහ.

විශේෂයෙන් රිමාන්ඩ් බන්ධනාගාරවල දිනපතා ආහාර විශාල ප්‍රමාණයක් අපතේ යන බව කොමිසමට නිරීක්ෂණය විය. එයට එක හේතුවක් ලෙස ආහාර රසවත් හා ගුණවත් බවින් අඩු වීම ද, තවත් හේතුවක් ලෙස රිමාන්ඩ් බන්ධනාගාරගත වූවන්ට නිවෙස්වලින් ආහාර ගෙන්වා ගැනීමට අවස්ථාව ලැබීම ද දැක්විය හැකි ය. ඒ පිළිබඳ සලකමින් බන්ධනාගාර තුළ ආහාර පිළියෙළ කිරීමේ දී ප්‍රමාණාත්මක අඩු කිරීමක් නිසි ලෙස සිදු නොවේ. ආහාර පිළියෙළ කිරීමේ දී සිදු වන මේ අකාර්යක්ෂමතා හේතුවෙන් ආහාර ද්‍රව්‍ය අපතේ යාම බහුල ව සිදු වේ.

බන්ධනාගාරවල ආහාර පිසින සිරකරුවන් හට ඉන් පෙර ඒ පිළිබඳ ව අත්දැකීම් නොමැති හෙයින් ආහාරවල ගුණාත්මක බවට අහිතකර බලපෑම් ඇති කරන බවත් කොමිසමට දන්වන ලදී. දේශීය නීති ප්‍රකාර ව සෞඛ්‍ය නිලධාරීන් මුළුතැන්ගෙවල්වල තත්ත්වය පරීක්ෂා නොකරන බැවින් ආහාර පිසීම පිළිබඳ තත්ත්ව පරීක්ෂණ කිසිසේත් සිදු නොවේ. මෙම නොසැලකිල්ල හේතුවෙන් නිලධාරීන් සිරකරුවන්ට හිමි ආහාර රසකාරක, ආහාර ද්‍රව්‍ය ආදිය තමන් වෙත ලබා ගන්නා බවට චෝදනා ඉදිරිපත් වන අතර මෙය ද ආහාරවල ගුණාත්මක තත්ත්වය කෙරෙහි අහිතකර ලෙස බලපායි.

කොමිසම ආවේක්ෂණය සඳහා පැමිණි දින කිහිපය තුළ බන්ධනාගාර ආහාරවල සැලකිය යුතු ගුණාත්මක ඉහළයාමක් දක්නට ලැබුණු බව ද බොහෝ බන්ධනාගාරවල රැඳවියෝ පවසා සිටියහ.

04. ජලය, සනීපාරක්ෂාව හා පෞද්ගලික ස්වස්ථතාවය

බන්ධනාගාරවල පවතින තදබදය හේතුවෙන් මෙපමණ විශාල රැඳවියන් සංඛ්‍යාවක් වෙනුවෙන් සැලසුම් නොකරන ලද යල්පිනූ බන්ධනාගාර ගොඩනැගිලි තුළ රැඳවියන් හට අඛණ්ඩ ජල සැපයුමක් හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීමට බාධා පමුණුවයි. වැසිකිළි, ජල සැපයුම් ස්ථානවලට සාපේක්ෂ ව සිරකරුවන් සංඛ්‍යාව ඉතා ඉහළ මට්ටමක පවතින අතර තමන්ට අවශ්‍ය තරම් ජලය නොලැබෙන බවට සෑම බන්ධනාග ාරයකින් ම පාහේ පැමිණිලි ලැබුණි. බන්ධනාගාර පද්ධතිය තුළ පවතින වැසිකිළිවල ස්වයංක්‍රීය ව අපද්‍රව්‍ය සේදී යාමේ තාක්ෂණය නොමැති බැවින් තමන්ට හිමි වන සීමිත ජල ප්‍රමාණය ද වැසිකිළි භාවිතයෙන් පසු එය සෝදා හැරීමට වැය වන බවට සිරකරුවෝ පැමිණිලි කළහ.

නගරයෙන් බැහැර ග්‍රාමීය ප්‍රදේශවල ස්ථාපිත බන්ධනාගාර සඳහා ප්‍රධාන ජල සැපයුමක් නොමැති බැවින් ස්වභාවික ජල ප්‍රභවවලින් ජලය සපයා ගැනීමට සිදු ව තිබේ. ඇතැම් බන්ධනාගාරවලින් තමන්ට ලැබෙන ජලයෙහි ගුණාත්මක තත්ත්වය පිළිබඳ පැමිණිලි ගණනාවක් ලැබුණි. විශේෂයෙන් ස්වභාවික ජල ප්‍රභව භාවිතයෙන් සැපයෙන ජලය මඩ සහිත හෝ අපිරිසිදු වන බවටත් කිවුල් හෝ ලවණමය රසයකින් යුක්ත බවටත් ඔවුහු පැමිණිලි කළහ.

බන්ධනාගාර වාට්ටු තුළ ස්ථාපිත වැසිකිළිවල දොරවල් හෝ වෙන් කළ කුටි නොපවතින බැවින් සිරකරුවන්ට ඒවා භාවිතයේ දී ලැබිය යුතු පෞද්ගලිකත්වය හිමි නොවේ. බන්ධනාගාර පද්ධතිය තුළ දක්නට ලැබෙන පොදු භාවිතාවක් වන්නේ රාත්‍රී කාලයේ දී සිරකරුවන් හුදකලා සිරමැදිරිවල අගුළුලන බැවින් හා එම සිර මැදිරි තුළ වැසිකිළි නොපවතින බැවින් වැසිකිළි යාමට අවශ්‍ය වූ විට ප්ලාස්ටික් බාල්දියකට හෝ පොලිතින් බෑගයකට සිය මළ මුත්‍ර පහකිරීම යි. මෙම බාල්දි හෝ බෑග රාත්‍රිය පුරා සිර මැදිරිය තුළ රඳවා තබා ගැනීමට ඔවුනට සිදු වේ. තනි සිර මැදිරියක පුද්ගලයන් කිහිපදෙනෙකු සිටින විට ඔවුනට මෙවන් එක් බාල්දියක් බෙදා ගැනීමට සිදු වන අතර සාමාන්‍යයෙන් සිර මැදිරියට අලුතින් ම පැමිණි සාමාජිකයාට පසුදින එය බැහැර කොට පිරිසිදු කිරීමේ රාජකාරිය පැවරේ.

සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම සඳහා බන්ධනාගාර තුළ මුදල් ප්‍රතිපාදන වෙන් නොකෙරෙන බැවින් රැඳවියන් හට තමන්ට හැකි අයුරින් බැහැරින් තමන් බැලීමට එන නෑදෑ හිතවතුන් මගින් ඒවා සපයා

ගැනීමට සිදු වේ. එහෙත් එසේ කිසිවෙකුත් බැහැරින් නොපැමිණෙන අය හා විදේශිකයන් හට තමන්ට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය සපයා ගැනීමේ හැකියාවක් නොමැත. මෙවන් අවස්ථාවල දී එවැනි ද්‍රව්‍ය ප්‍රමාණවත් තරම් ලබාගත හැකි රැඳවියෙකුගේ පෞද්ගලික කාර්යයන් ඉටුකර දීම මගින් තමන්ට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට ඔවුනට සිදු වේ. බන්ධනාගාරවලට මූල්‍ය ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් වැසිකිළි ආදිය පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ද බන්ධනාගාරයෙන් නොසැපයෙන බැවින් ඒවායෙහි සෞඛ්‍යයට අහිතකර තත්ත්වය තවදුරටත් ඉහළ යයි.

05. වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වීමේ හැකියාව

ජාත්‍යන්තර රෙගුලාසි අනුව බන්ධනාගාර තුළ සිටින්නන්ට ද බන්ධනාගාරවලින් පිටත සිටින්නන් හා සමාන ව සෞඛ්‍ය පහසුකම් ලැබිය යුතු වන අතර, දේශීය නීති ප්‍රතිපාදන අනුව ද බන්ධනාගාරගත වූවන්ට කාර්යක්ෂම ලෙස සෞඛ්‍ය පහසුකම් ලැබීමේ අවස්ථාව හිමිවිය යුතු වුව ද සත්‍ය වශයෙන් ම බන්ධනාග ාරගත වූවන්ට සෞඛ්‍ය පහසුකම් ලැබීමේ මට්ටම ඊට බොහෝ පහළ තත්ත්වයක තිබෙන බව කොමිසමේ අවධානයට යොමු වුයේය. බන්ධනාගාර සෞඛ්‍ය පහසුකම් ද ජාතික සෞඛ්‍ය සේවා පද්ධතියට අයත් වන බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ සඳහා අවශ්‍ය වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම මෙන් ම අවශ්‍ය ඖෂධ ද්‍රව්‍ය ආදිය සම්පාදනය පිළිබඳ ව ද වගකීම දරයි. බන්ධනාගාරවලට අවශ්‍ය හෙද නිලධාරීන් හා ඔසුහල් සේවකයන් බඳවා ගැනීම හා බන්ධනාගාර රෝහල් පාලනය සිදු කෙරෙනුයේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගිනි. බන්ධනාගාර රැඳවියන්ට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීමේ දී මෙන් ම එම කටයුතු පරිපාලනයේ දී මෙවන් දෝෂ පැවතීමට ප්‍රධාන හේතු වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය හා බන්ධනාග ාර දෙපාර්තමේන්තුව අතර පවතින වගකීම් හා රාජකාරි බෙදා ගැනීමේ දුර්වලතා හා මේ දෙපාර්ශ්වය අතර සහසම්බන්ධතාවයේ පවතින දුර්වලතාවන් ය.

බන්ධනාගාර රෝහල් තුළ සෞඛ්‍ය යටිතල පහසුකම් හා විශේෂ ඖෂධවල දැඩි හිඟයක් පවතී. ඒ හේතුවෙන් බන්ධනාගාර රෝහල්වලින් ලැබිය හැකි ප්‍රතිකාර සීමා වන අතර සිරකරුවන් රජයේ රෝහල්වලට මාරු කොට ප්‍රතිකාර කිරීමට හා රෝග නිශ්චය කිරීමට සිදු වේ. බන්ධනාගාර රෝහල්වල කාර්යමණ්ඩල හිඟයක් ද පවතී. විශේෂයෙන් බන්ධනාගාර සෞඛ්‍ය පද්ධතිය තුළ කාන්තා හෙද නිලධාරීන්ගේ උග්‍ර හිඟයක් පවතී. දිවා කාලයේ නිශ්චිත වේලාවන්හි දී වෛද්‍යවරු බන්ධනාගාර රෝගීන් පරීක්ෂාව සඳහා රැඳී සිටිති. රාත්‍රියේ දී දැනුම් දුන් විට පැමිණෙන නමුත් වෛද්‍යවරු බන්ධනාගාර පරිශ්‍රයේ රැඳී නොසිටිති. මේ හේතුවෙන් රාත්‍රී කාලයේ දී සෞඛ්‍ය පහසුකම් ලබා දීමක් සිදු නොවන තරම් වේ. රාත්‍රී කාලයේ දී යම් රෝග ලක්ෂණයක් පෙන්නුම් කරන බන්ධනාගාර රෝගීන්ට ඉන් පීඩා විඳිමින් පසු දා වෛද්‍යවරයා වෙත රැගෙන යනතුරු සිටීමට සිදු වේ. මෙසේ වෛද්‍ය ප්‍රතිකාර ප්‍රමාද වීම හේතුවෙන් සිරකරුවන් ගණනාවක් එම රෝගවල ගොදුරක් වූ බවට ද චෝදනා ඉදිරිපත් වේ.

රැඳවියන් නිසි වේලාවට රජයේ රෝහල් කරා රැගෙන යාම කෙරෙහි බලපාන ලෙස පද්ධතිය තුළ දැඩි ප්‍රවාහන පහසුකම් අර්බුදයක් හා නිලධාරීන්ගේ හිඟයක් ද පවතී. මේ හේතුවෙන් සෑම බන්ධනාගාරයක ම විශාල රැඳවියන් ප්‍රමාණයකගෙන් වසර ගණනාවක් හෝ මාස ගණනාවක් පුරා ශල්‍යකර්ම හෝ වෛද්‍ය ප්‍රතිකාර ප්‍රමාද වූ අවස්ථා පිළිබඳ ව කොමිසමට පැමිණිලි ලැබුණි. බන්ධනාගාර අධිකාරිවරුන් මෙයට හේතු වශයෙන් ඉදිරිපත් කරනු ලැබුවේ ප්‍රමාණවත් තරම් වාහන හෝ සිරකරු කැඳවාගෙන යාමට නිලධාරීන් නොමැති වීම යි. මෙසේ රෝහල්වලට රැගෙන යාම අධිකරණ රාජකාරි හා අනෙකුත් මාරු කිරීම අතරතුර ඉටු කිරීමට සිදු වේ. මෙය ඉතා බැරෑරුම් කාර්යයක් වන්නේ මරණයට තීන්දු වූ හෝ අධි අවදානම් සහිත සිරකරුවන් රජයේ රෝහලකට රැගෙන යාමට වැඩි බන්ධනාගාර නිලධාරීන් ප්‍රමාණයක්, පොලිස් නිලධාරීන් හා විශේෂ කාර්ය බලකා නිලධාරීන් පවා අවශ්‍ය වන බැවිනි. මේ නිසා අධිකාරිවරු මෙසේ වෛද්‍ය නිර්දේශ මත රෝගීන් මාරු කිරීමට ප්‍රමුඛතාවයක් නොදෙනුයේ රෝග ලක්ෂණවල බරපතල බවට වඩා අවස්ථාමය කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමිනි.

රැඳවියන්ගෙන් ඔවුන්ගේ වරද පිළිබඳ කරුණු විමසීම හා ඔවුනට වෙනස් කොට සැලකීම පිළිබඳ ව ද

වෛද්‍යවරුන්ට එරෙහි ව කොමිසමට පැමිණිලි ඉදිරිපත් වුයේ ය. මත්ද්‍රව්‍ය පිළිබඳ වරදකරුවන් වැන්නවුන් හට වෛද්‍යවරුන් විසින් ඔවුන් සිරගත කළ හෝ රිමාන්ඩ් බන්ධනාගාරගත කළ අපරාධය පිළිබඳ ව නිරන්තරයෙන් සිහි කැඳවමින් කටයුතු කරන බවටත් ඇතැම්විට ඔවුන්ගේ අපරාධයේ බරපතලකම නිසා ප්‍රතිකාර අවශ්‍ය නොමැති බව පවසමින් රෝගයෙන් පීඩා විඳිය යුතු බව ප්‍රකාශ කරන බවටත් පැමිණිලි ලැබුණි. මෙය බන්ධනාගාරගත වූවකුගේ මානසික සෞඛ්‍ය කෙරෙහි බරපතල ලෙස බලපෑම් සිදු කරන අතර ඔවුහු වෛද්‍ය සහාය පැතීමට අධෛර්ය වෙති. එහෙත් බලවත් සමාජ ආර්ථික පසුබිමක් සහිත සිරකරුවන් වෛද්‍ය නිලධාරීන්ගෙන් ඉතා ඉහළ සැලකීමක් සහිත ව ප්‍රතිකාර ලබන බවත් ඔවුන් බොහොමයක් බන්ධනාගාර රෝහල්වල නිත්‍ය සාමාජිකයන් වන බවත් වාර්තා විය.

පැහැදිලි ව පෙනෙන තුවාලයකට වෛද්‍ය නිලධාරියෙකු ප්‍රතිකාර කළ ද අදාළ සිරකරුවා අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම අනිවාර්ය නොවේ. මෙය 'රැඳවියන්ට පහරදීම් පිළිබඳ ව වෛද්‍ය නිලධාරීන් විසින් අදාළ බලධාරීන් වෙත වාර්තා කළ යුතු ය' යන ජාත්‍යන්තර මාර්ගෝපදේශවලට පටහැනි ව යාමකි. බාහිර පාර්ශ්වයන්ගේ ආවේක්ෂණයට කලාතුරකින් බඳුන් වන මෙවන් ආයතනවල වෛද්‍යවරු විෂයානු බද්ධ තුන්වන පාර්ශ්වයක් ලෙස වැදගත් භූමිකාවක් නිරූපණය කරති. ඔවුනට, පහරදීමක් පිළිබඳ ව පැමිණිලි කරන රැඳවියා හට අවශ්‍ය ප්‍රතිකාර හා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට මැදිහත් වී ක්‍රියා කළ හැකි ය.

බන්ධනාගාර පරිසරය මානසික ඇබ්බැහි වීම් කුප්පනු ලබන අතර අර්ථාන්විත කාර්යයක යෙදීමට නොහැකියාව හා පවුලෙන් වෙන් ව සිටීම සමඟ එක් වූ විට මේ මානසික තත්ත්වයන් තව දුරටත් කුළුගන්වනු ලබයි. එපමණක් නොව, බන්ධනාගාර සෞඛ්‍ය සේවාව තුළ මානසික සෞඛ්‍ය සේවා නොමැති බැවින් මානසික රෝගී තත්ත්වවලින් පෙළෙන රැඳවියන් සිරගත ව සිටින කාල සීමාව තුළ තව දුරටත් ඔවුන්ගේ මානසික සෞඛ්‍ය පිරිහීම සිදු විය හැකි ය. ඇතැම් බන්ධනාගාරවල අඛණ්ඩ මානසික රෝග සායනයන් පවතින අතර වරින් වර මානසික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරු ද ඒවාට පැමිණ සිය සේවාව සලසති. එහෙත් අභ්‍යන්තර උපදේශන නිලධාරීන් සිටිනුයේ බන්ධනාගාර අතළොස්සක පමණි. මානසික රෝගී රැඳවියෙකු විශේෂයෙන් ප්‍රචණ්ඩ ලෙස හැසිරෙන විට නිලධාරීහු ඔහු හෝ ඇය හුදකලා කිරීමට හෝ බැඳ තැබීමට පෙළඹෙති. එසේ ම මත්ද්‍රව්‍ය අපක්‍රමණ රෝග ලක්ෂණ පෙන්වන රෝගීන් පාලනය කිරීමේ අරමුණින් බොහෝ විට පහර දීම් සිදු කරන බවට ද වාර්තා වේ. බොහෝ බන්ධනාගාර මෙවන් මානසික රෝග සහිත රැඳවියන් එක ම වාට්ටුවක රඳවන අතර එය ''පිස්සු වාට්ටුව'' ලෙස හැඳුන්වන බවට වාර්තා වේ. මෙම කාමරයේ සිටින රැඳවියෝ බොහෝවිට ගර්හාවට බඳුන් වේ. මානසික රෝගී රැඳවියෙකු ප්‍රතිකාර සඳහා අංගොඩ මානසික සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය වෙත යොමු කිරීම තීරණය වන්නේ වාහන පහසුකම්වල ස්වභාවය මත ය.

06. බාහිර ලෝකය සමග සම්බන්ධතාවය

බන්ධනාගාරගත වූවන් හට ඔවුන්ගේ පවුල් හා සම්බන්ධ වීම සඳහා ක්‍රියාත්මක වන ක්‍රමවේදය එයින් අපේක්ෂිත අරමුණු ඉටු නොකරයි. රිමාන්ඩ් බන්ධනාගාරවල ආගන්තුකයන් මුණගැසීමේ කාමරවල යටිතල පහසුකම් සුහද පවුල් වාතාවරණයක් ගොඩනොනගන අතර ඉන් සිදු වන්නේ රැඳවියන්ගේ පීඩාවන් තවදුරටත් වර්ධනය වීම යි. මෙයට හේතුව ආගන්තුකයන් හමු වන කාමරවල පාරාන්ධ දැලකින් ඔවුන් වෙන් කර තිබීම යි. එබැවින් ඔවුන්ට සිය පවුලේ සාමාජිකයන් දැකීම හා ඔවුනට ඇහුම්කන් දීම ඉතා අසීරු වේ. මෙම ආගන්තුකයන් හමුවීමේ කාමරවල තදබදය අධික වන විට වාතාශ්‍රය හා ආලෝකය අඩු වී ඉතා ඉහළ උෂ්ණාධික පරිසරයක් ඇති වේ. සෑම දිනක ම ඉතා විශාල ආගන්තුකයන් පිරිසකට ඉඩ සැලසිය යුතු බැවින් එක් ආගන්තුකයෙකුට රැඳී සිටිය හැක්කේ මිනිත්තු කිහිපයක් පමණි. බොහෝ හමු වීම් ප්‍රමාණයක් එකවර සිදු වන බැවින් එකිනෙකාට තමන් පවසන දේ ශ්‍රවණය වීමට නම් අනෙකාගේ හඬ පරයා කෑ ගැසීමට පවා සිදු වේ. බන්ධනාගාර නිලධාරීන් බොහෝ විට මේ ආගන්තුකයන් හට අපහාසාත්මක හා අශීලාචාර අන්දමින් සලකන බවත්, කාන්තා ආගන්තුකයන් හට නිගා දෙන අන්දමින් සැලකීම හෝ ලිංගික වක්‍රෝක්ති ප්‍රකාශ සිදු කරන බවත් බන්ධනාගාරගත වූවෝ පැවසූහ.

රිමාන්ඩ් බන්ධනාගරගත වූවන්ට නිවෙස්වලින් ලැබෙන ආහාර බන්ධනාගාර නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක්වන අතර එසේ සිදු කරන පරීක්ෂාවන් කෙතරම් නොසැලකිලිමත් හා අපිරිසිදු ආකාරයෙන් සිදු වේ ද යත් එම ආහාර මුල් ලිහී විසිරී යාම හෝ ආහාරයට ගත නොහැකි සේ අපිරිසිදු වීම පවා සිදු වේ. මෙම තත්ත්වය ද රැඳවියන් තුළ ආතතියක් ඇති කරයි. මේ පිළිබඳ ව බන්ධනාගාර පරිපාලකයන්ගේ ප්‍රතිචාරය වූයේ තහනම් ද්‍රව්‍ය තිබේ දැයි පරීක්ෂාවට සුදුසු කාර්යක්ෂම තාක්ෂණික ක්‍රමවේදයන් හෝ ප්‍රමාණවත් තරම් නිලධාරීන් නොමැති බැවින් ඔවුනට මෙසේ කඩිනමින් දෑතින් පරීක්ෂා කිරීමට සිදු වන බව යි.

බොහෝ බන්ධනාගාරවල කාර්යක්ෂම තැපැල් සේවාවක් නොමැති වීම හේතුවෙන් පවුලේ සාමාජිකයන්ට හමු වීමට නොහැකි අවස්ථාවල දී රැඳවියන් හා පවුලේ සාමාජිකයන් අතර සන්නිවේදනය දැඩි සේ සීමා වේ. බන්ධනාගාරය මඟින් සෑම ලිපියක් ම පරීක්ෂා කොට වාරණය කළ යුතු බැවින් සිංහල බස හැරුණුකොට වෙනත් භාෂා පිළිබඳ අවබෝධය සහිත නිලධාරීන් නොමැති අවස්ථාවල දී එවන් ලිපි තැපැල් කිරීම සම්පූර්ණයෙන් ම නවතා දැමේ. දුරකථන කුටි දක්නට ලැබෙනුයේ වැලිකඩ බන්ධනාගාරයේ පමණි. සෑම දුරකථන ඇමතුමක ම ගාස්තු පවුලේ සාමාජිකයන් විසින් දැරිය යුතු ය. කෙසේ වෙතත් මේ දුරකථන කුටිවලින් විදේශයන් හට ඇමතුම් ලබාගත නොහැකි බැවින් විදේශිකයන්ට ඉන් ඇති වන්නේ අවාසිදායක තත්ත්වයකි.

බොහෝ බන්ධනාගාරවල නීතිඥවරුන්ට සිය සේවාලාභීන් මුණගැසීමට වෙන ම කාමරයක් වෙන් කෙරුණ ද එවන් හමුවීම් සඳහා අතිරේක ගාස්තු අය කෙරෙන බැවින් රැඳවියන් බහුතරයකට එසේ නීතිඥයන් හමුවීමට අවස්ථාවක් නොමැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සිරකරුවන් සිය නීතිඥවරුන් හමුවන්නේ අධිකරණයේ දී පමණි. ඒ අනුව බන්ධනාගාරවල ප්‍රමාණවත් සන්නිවේදන පහසුකම් නොමැති වීම හේතුවෙන් විත්තිකරුවන්ට තම නීතිඥවරුන් හමුවෙමින් නඩුවට අවශ්‍ය ප්‍රබල විත්තිවාචකයන් සුදානම් කර ගැනීමේ අවස්ථාව නොලැබී යයි.

07. දුක්ගැනවිලි යාන්ත්‍රණය

කොමිසමේ නිලධාරීන් බන්ධනාගාරවලට පැමිණි වහා රැඳවියෝ සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට සුදානම් ව සිටි බව නිරීක්ෂණය කළ හැකි විය. කෙසේ වෙතත්, පවතින ක්‍රියාදාමයේ ප්‍රමාදයන් හා මීන් පෙර පැමිණිලි ඉදිරිපත් කර දීර්ඝ කාලයක් ගත වුව ද ඊට පිළියම් නොල ද වෙනත් රැඳවියන් දකින ඔවුහු අන්තර් දුක්ගැනවිලි යාන්ත්‍රණය වෙත යොමු වීමට මැළි වෙති. බොහොමයක් රැඳවියන් අතර පවතින මතයක් වන්නේ බන්ධනාගාර අධිකාරිවරයාගේ පක්ෂග්‍රාහීත්වය හේතුවෙන් නිලධාරියෙකුට එරෙහි ව කරන පැමිණිලි නිසි ලෙස විභාග නොකෙරෙන බව හෝ සිය ඉල්ලීම් නිලධාරීන් විසින් අධිකාරිවරයා වෙත යොමු නොකෙරෙන බව යි. ඇතැම්හු මෙසේ පැමිණිලි කිරීමෙන් තමන් නිලධාරීන්ගේ උදහසට ලක් වේය යන බියෙන් පසු වෙති. කොමිසම වෙත පැමිණිලි ඉදිරිපත් කිරීම හේතුවෙන් තර්ජනයට හෝ හිංසනයට තමන් ලක් වූ බවට රැඳවියන් චෝදනා කළ අවස්ථා ද දක්නට ලැබිණ. අධිකාරිවරයා සිය ආවේක්ෂණයන් සිදු කරන විටක දී හෝ රැඳවියෙකු අධිකාරිවරයාගේ කාර්යාලයේ දී පැමිණිලි ඉදිරිපත් කරන විට එහි තවත් නිලධාරියෙකු රැඳී සිටීම නිසා හෝ රහස්‍යභාවය පිළිබඳ රැඳවියන් තුළ ගැටලු පැන නැගේ. බදුල්ල රිමාන්ඩ් බන්ධනාගාරයේ සෑම වාට්ටුවකම ඉල්ලීම් හා පැමිණිලි නිර්නාමික ව සටහන් කිරීමට පැමිණිලි පොතක් සපයා ඇත. යාපනය රිමාන්ඩ් බන්ධනාගාරයේ රැඳවියන්ගේ පැමිණිලි පෙට්ටියක් මේ වෙනුවෙන් ස්ථාපනය කර ඇත.

ඇතැම් විනිසුරුවරුන් මාසික ව බන්ධනාගාර වෙත පැමිණෙන බවත් එවිට බන්ධනාගාර වටා යමින් ආවේක්ෂණයන් සිදු කරන බවත් එම අවස්ථාවල දී රැඳවියන්ට තම දුක්ගැනවිලි මේ විනිසුරුවරුන් වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන බවත් කොමිසමට තොරතුරු ලැබිණ. කෙසේ වෙතත් රිමාන්ඩ් බන්ධනාගාරගත රැඳවියන්ට අධිකරණවල දී විනිසුරුවරුන් මුණගැසීමට අවස්ථාව ලැබෙන නමුත් දඬුවම් නියම කරන ලද රැඳවියන් හට විනිසුරුවරුන් හමුවීමට අවස්ථාවක් ලැබෙනුයේ මෙසේ කලාතුරකින් විනිසුරුවරයෙකු බන්ධනාගාරයට පැමිණියහොත් පමණි.

දුක්ගැනවිලි ගණනාවක් පිළිබඳ ව සිරකරුවන් හට කොමිසම වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට අවශ්‍ය වුව ද ඔවුන් විසින් කොමිසම වෙත යවන ලිපි නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක්වන බැවින් ස්ථිර විශ්වාසයකින් යුතු ව සිය පැමිණිලි ඉදිරිපත් කිරීමට ඔවුහු පැකිළුණහ. එසේ ම වැලිකඩ හැරුණුකොට අනෙකුත් බන්ධනාග ාරවල රැඳවියන්ට කොමිසමෙහි දුරකථන අංකයට ඇමතුම් ලබාදීමට ද හැකියාවක් නොමැත. වැලිකඩ බන්ධනාගාරයේ පවා දුරකථන ඇමතුම් පරීක්ෂාවට ලක් කෙරෙන හෙයින් රහසිගත ව පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැත.

08. සිරකරු-නිලධාරි සම්බන්ධතාවය

නිලධාරීන් රැඳවියන්ට දක්වන සැලකිල්ල බොහෝ විට පදනම් වනුයේ රැඳවියාගේ සමාජ මට්ටම, ජාතිය, ආගම හා ඔවුන් දඬුවම් ලැබූ හෝ චෝදනාවට ලක්ව සිටින වරද මත බව කොමිසමට නිරීක්ෂණය කළ හැකි විය. බොහෝ නිලධාරීහූ රැඳවියන් හට මනුෂ්‍යයන් ලෙස ඔවුනට හිමි විය යුතු ගෞරවය හා අභිමානය සුරැකෙන පරිදි නොසැලකූහ. එමෙන් ම නිලධාරීන්ගේ වාචික හිංසනයන් ද නිරන්තරයෙන් සෑම විටකම දක්නට ලැබුනකි. ඇතැම් බන්ධනාගාරවල අධිකාරිවරු තම යටත් නිලධාරීන් රැඳවියන්ට අසභ්‍ය වචනයෙන් කතා කරන බවත් ඒ පිළිබඳ ව යම් පියවර ගත යුතු බවත් පිළිගත්හ. බොහෝ අධිකාරිවරු බන්ධනාග ාර නිලධාරීන්ට රැඳවියන් සමඟ ගනුදෙනු කිරීමේ දී අසභ්‍ය වචන භාවිතයෙන් වැළකෙන ලෙස පැහැදිලි උපදෙස් ලබා දී ඇති බව වාර්තා කළහ.

නිලධාරීන් හා රැඳවියන් අතර බලය පිළිබඳ සාධකය ප්‍රකට වන්නේ මේ අන්තර් පුද්ගල සම්බන්ධතාවල දී ය. ඇතැම් අවස්ථාවල දී රැඳවියන් විසින් නිලධාරීන්ගේ දෙපා සම්භාහනය කරන ආකාරය, පාවහන් ඔපදමන ආකාරය දැකගත හැකි ය. රිමාන්ඩ් බන්ධනාගාර රැඳවියන් මෙසේ දරුණු සැලකීම්වලට ලක් වුව ද මරණ දඬුවමට යටත් වූ හෝ දීර්ඝ කාලීන සිර දඬුවම් විඳින සිරකරුවන් හට නිලධාරීහූ යම් සානුකම්පිත හා හිතවත් ස්වභාවයකින් සලකනුයේ කාලානුරූප ව ඔවුන් සමඟ දැන හැඳිනීමක් ඇති කරගෙන සිටින හෙයිනි. බන්ධනාගාර නිලධාරීහූ මරණ දඬුවම හිමි සිරකරුවන් පීඩාවට පත් කිරීමට පැකිළෙන ආකාරයක් පවා දැකිය හැක්කේ ඔවුන්ගේ දඬුවම හා දුෂ්කර සිරගත දිවිය හේතුවෙන් තවදුරටත් ඔවුනට අහිමි වීමට කිසිවක් නොමැති බැවින් බන්ධනාගාරයේ සාමයට බාධා කළේ යයි ඔවුනට පැනවිය හැකි වෙනත් සීමාවක් ද නොමැති බැවිනි.

කෙසේ වෙතත් උසස් සමාජ පසුබිමක් සහිත රැඳවියන් සම්බන්ධයෙන් මේ නිලධාරීහූ ගෞරවාන්විත ව කටයුතු කරන අතර අනෙකුත් රැඳවියන්ට නොලැබෙන විශේෂ පහසුකම් හා වරප්‍රසාද ද ලැබෙන ආකාරය දැකිය හැකි ය. මෙවැනි සිරකරුවන් හට පෙර කී වරප්‍රසාද ලැබීමේ තත්ත්වය යම් තාක් දුරකට බන්ධනාග ාර පද්ධතියේ දූෂණයට ද හේතු වන්නේ ඔවුනට ලබා දෙන වරප්‍රසාද වෙනුවෙන් නිලධාරීන් අල්ලස් ලබාග න්නා බවට වාර්තා වීම හේතුවෙනි.

රැඳවියන් අතර ජාතිය හා ආගම හේතුකොට ගත් වෙනස් කොට සැලකීම් ද පවතින බව රැඳවියෝ කොමිසමට දැන්වූහ. මෙවන් රැඳවියන් අතර වන පූර්ව විනිශ්චයන් පිළිබඳ ව බොහෝ පැමිණිලි ඉදිරිපත් කළේ දමිළ ජාතික හා විදේශික රැඳවියන් විසිනි.

වාට්ටුවල සිටින වාට්ටු නායකයන් හට සිය වාට්ටු සාමාජිකයන් නියාමනය හා පාලනය සඳහා බන්ධනාග ාර නිලධාරීන් විසින් යම් බලයක් පවරනු ලබා ඇත. එමෙන් ම ඔවුහු බන්ධනාගාර නිලධාරීන් සමඟ වඩා හොඳ සම්බන්ධතාවයක් ද පවත්වාගෙන යාමට සමත් වෙති. එයට හේතුව ඔවුන් විසින් තම වාට්ටු සාමාජිකයන්ගේ ක්‍රියාවන් පිළිබඳ ව නිලධාරීන්ට බොහෝ විට තොරතුරු සපයනු ලැබීම යි. මෙම තත්ත්වය හේතුවෙන් රැඳවියන් අතර අසමතුලිත බල ගලනයක් සිදුවන බැවින් එය තවදුරටත් බලය හඹායන රැඳවියන් විසින් අවභාවිත කළ හැකි අහිතකර තත්ත්වයකි.

09. විනය හා දඬුවම

බන්ධනාගාර තුළ සිදු කෙරෙන වැරදි සඳහා දඬුවම් ක්‍රමයක් ලෙස මෙන් ම විනය හා සාමය පවත්වාගෙන යාමේ මූලික අංගයක් ලෙස ශාරීරික පහරදීම් බොහෝ විට භාවිත වන බව කොමිසම නිරීක්ෂණය කළේය. හේතු ගණනාවකට බන්ධනාගාර නිලධාරීන් පහරදීම්වල නිරත වෙනු දැකිය හැකි වූ අතර මූලික වශයෙන් එසේ පහර ලැබුවේ දිළිඳු සමාජ පසුබිමකින් පැමිණෙන පුද්ගලයන් ය.

මෙසේ සිරකරුවන්ට පහරදීම සඳහා පොලු මුගුරු හා වයර් භාවිත කරනු දක්නට ලැබේ. අනෙකුත් සිරකරුවන් ඉදිරිපිට දණගස්වා හෝ දෑත් වලින් එල්ලා මේ පහරදීම් සිදු කෙරේ. අධිකාරිවරුන් හා ප්‍රධාන ජෙලර්වරුන් ඇතුළු සියලු ම තරාතිරම්වල නිලධාරීහු මෙසේ සිරකරුවන්ට පහර දෙමින් ප්‍රචණ්ඩත්වය මුදා හරින බව වාර්තා වේ. බොහෝ බන්ධනාගාරවල නිලධාරීහු බීමතින් මේ පහරදීම් සිදුකරන බවට චෝදනා ඉදිරිපත් විය. බන්ධනාගාරය තුළ සාමය පවත්වා ගැනීමේ මූලික උපක්‍රමය ලෙස ඔවුන් සලකනුයේ ප්‍රචණ්ඩත්වයයි. සිරකරුවන් හට ඉතා සුළු කරුණක දී පවා, නිලධාරීන්ගේ බලය පෙන්වීමට, ඔවුන් සතුව බලපෑම් කිරීමට හා විපාක ගෙනදීමට ඇති බලය පෙන්වීමට මෙසේ පහරදීම් සිදු කෙරේ.

බන්ධනාගාර නිලධාරීන් හට රැඳවියන් පාලනය කරමින් සාමය පවත්වාගෙන යාම සඳහා ප්‍රචණ්ඩකාරී නොවන උපාය මාර්ග භාවිතය පිළිබඳ පුහුණුවක් නොලැබේ. එසේ ම නිලධාරීන්ගේ රාජකාරි පරිසරය හා ඒ සම්බන්ධ ආතතිය මෙන්ම දැඩි වෙහෙස මෙසේ සිරකරුවන් කෙරෙහි ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරීමට හේතු වන බව ද කොමිසමට දන්වන ලදී. මින් පෙර සිරකරුනිලධාරි සම්බන්ධතාවය කොටසේ පෙන්වා දුන් පරිදි බලවත් සමාජආර්ථික පරිසරයකින් පැවතෙන්නෝ මෙසේ සිදු කෙරෙන පහරදීම් පිළිබඳ ව පැමිණිලි නොකරති.

මෙසේ නිලධාරීන් සිරකරුවන් කෙරෙහි ප්‍රචණ්ඩකාරී ව හැසිරීමට මූලික හේතුව වන්නේ එසේ ප්‍රචණ්ඩ ලෙස සිරකරුවන්ට සැලකීම සම්බන්ධයෙන් ඔවුනට කිසිදු දඬුවමක් ලබා නොදීම යි. එතුළින් මුක්තිය පිළිබඳ සංස්කෘතියක් ගොඩනැගේ. බන්ධනාගාර පිළිබඳ අධ්‍යයනයේ දී දිවයින පුරා බන්ධනාගාරවලට කොමිසමෙහි නිලධාරීන් නිරන්තරයෙන් පැමිණීමත් සමග ඇතැම් බන්ධනාගාරවල ප්‍රචණ්ඩත්වය මර්දනය වූ බව ද වාර්තා වේ. එයට හේතුව කොමිසම විසින් ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිලධාරීන්ට චෝදනා ඉදිරිපත් කරතැයි ඇති වූ බිය බව දැක්විය හැකිය. මින් පෙනී යන්නේ ප්‍රචණ්ඩත්වය සහමුලින් මැඩලීමේ ප්‍රතිපත්තිය මත නිලධාරීන්ට එරෙහි ව විනය ක්‍රියාමාර්ග හා/හෝ වධ හිංසන පිළිබඳ පනත යටතේ නඩු පැවරීම බන්ධනාගාර නිලධාරීන් ප්‍රචණ්ඩත්වය මුදා හැරීම කෙරෙහි නිවර්තක බලපෑමක් ඇති කර තිබෙන බව යි.

බහුල ව භාවිත කෙරෙන තවත් දඬුවම් ක්‍රමයක් වන්නේ හුදකලා සිරගත කිරීම යි. මේ සඳහා භාවිත කෙරෙන සිර මැදිරි ඉතා අඳුරු, තෙතබරිත, වාතාශ්‍රය අඩු, බොහෝවිට වැසිකිළි පහසුකම් පවා නොමැති ඒවා බව කොමිසමෙහි නිරීක්ෂණයට ලක් විය. මෙම තත්ත්වය එම දඬුවමෙහි ස්වභාවය තවදුරටත් දරුණු කරවයි. මෙය දඬුවම් පිණිස සිරගත කිරීමේ දී මනුෂ්‍යයන්ට නුසුදුසු පරිසරයක් ඇති කිරීම වැළක්වීම පිළිබඳ ව වූ ජාත්‍යන්තර නීතියට පටහැනිව යාමකි.

යම් රැඳවියෙකු බන්ධනාගාරය තුළ වරදක් සිදුකළ බවට චෝදනා එල්ල වූ විට ඒ පිළිබඳ විභාග කිරීම සඳහා බන්ධනාගාර විනිශ්චය සභාවක් කැඳවා දඬුවම් පැමිණවිය හැකි ය. මෙහි තීන්දු ලබාදීම සඳහා සාමාන්‍යයෙන් දිස්ත්‍රික් අධිකරණ විනිසුරුවරයෙකු කැඳවන අතර එසේ ලබාදිය හැකි උපරිම දඬුවම වසර 5ක සිර දඬුවම යි. මෙසේ විනිශ්චය සභාව මගින් ලබාදෙන දඬුවම චූදිතයා ඒ වනවිටත් විඳිමින් සිටින සිර දඬුවමෙහි ම දිගුවක් වන බව පෙන්වා දිය යුතු ය.

මෙම නඩු විභාගයන් අධිකරණයක නොපවත්වා බන්ධනාගාරය තුළ ම සිදු කෙරෙන විට එහි අපක්ෂපාතී බව පිළිබඳ ඔවුනට ගැටලු පැනනැගෙන බව සිරකරුවෝ පැවසූහ. සිරකරුවන්ට තමන් වෙනුවෙන් කතා කිරීමට ඉදිරිපත් විය හැකි කිසිවෙකු නොමැති බැවින් ඔවුහු දැඩි අවාසිදායක තත්ත්වයකට මුහුණ දෙන අතර විශාල බල අසමතුලනයක් එහි දී ඇති වේ. සිරකරුවන්ට තමන් වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥයන්

කැඳවීමේ අවස්ථාව සාමාන්‍යයෙන් ලබා දුන්න ද බන්ධනාගාරයට නීතිඥයන් කැඳවීම අතිරේක වියදමක් දැරීමට සිදු වන තත්ත්වයකි. ඒ හේතුවෙන් සාමාන්‍යයෙන් සිදු වන්නේ සිරකරු තමන් විසින් ම විනිසුරු ඉදිරියෙහි කරුණු දැක්වීම යි. සිරකරුවන්ගේ චෝදනාව වන්නේ විනිසුරුවරුන් කිසිදු කරුණු විමසීමකින් තොර ව හුදෙක් බන්ධනාගාර නිලධාරීවරුන්ගේ ප්‍රකාශයන් මත පදනම් ව තීන්දු ගන්නා බව යි. මෙය පක්ෂග්‍රාහිත්වයේ සලකුණකි.

පහර කෑමකට ලක්වීමට ප්‍රධානතම හේතුවක් ලෙස තහනම් ද්‍රව්‍යයක් තමන් සන්තකයේ තබා ගැනීම හැඳින්විය හැකි වුව ද බන්ධනාගාරයට තහනම් ද්‍රව්‍ය රහසේ ගෙන ඒමට නිලධාරීන් සම්බන්ධ බවත්, මේ පිළිබඳ ව නීතිය පිළිබඳ අමාත්‍යංශයේ හා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨයන් දැනුවත් බවත් සෑම බන්ධනාගාරයක ම රැඳවියෝ චෝදනා කළහ. තහනම් ද්‍රව්‍ය බන්ධනාගාර තුළට රැගෙන ඒමෙන් වැළකීම මේ වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මුහුණ දෙන බරපතල ම ගැටලුවක් බව කොමිසම වෙත විශේෂයෙන් දන්වනු ලැබිණ. එපමණක් නොව බන්ධනාගාරයට තහනම් ද්‍රව්‍ය ඇතුළු වීම වැළක්වීම සඳහා ශරීර හා පාර්සල් ස්කෑනර් යන්ත්‍ර හඳුන්වා දීම වැනි නව ප්‍රතිපත්ති ගෙන ඒම හා නිලධාරීන්ට එරෙහි ව විනය ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ ද තවදුරටත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට මෙම තත්ත්වය සාර්ථක ව සමනය කිරීමට හැකියාව ලැබී නැත. මේ අනුව තහනම් ද්‍රව්‍ය රහසේ ගෙන ඒම වැළක්වීමට නම් එවැනි දූෂණ ක්‍රියා වර්ධනය කෙරෙහි තුඩු දෙන මූලික හේතු හා පද්ධතියේ දෝෂ සැලකිල්ලට ගත යුතු බව පැහැදිලි ය. මෙවැනි නීති විරෝධී ක්‍රියාවන් සිදුවිය හැකි සංකීර්ණ පරිසරයක සිරකරු-නිලධාරි බල අසමතුලනය හා එක් වූ කළ බන්ධනාගාර නිලධාරීන් විසින් රහසේ ගෙන එන තහනම් ද්‍රව්‍ය සඳහා ඔවුනට දඬුවම් නොකර රැඳවියන් හට දඬුවම් පැමිණවීමේ විශාල අවදානමක් පවතී. මෙවැනි සංසිද්ධීන් බන්ධනාගාර තුළ තහනම් ද්‍රව්‍ය පැතිරීම වැළැක්වීමට බාධා පමුණුවනු ඇත.

10. බන්ධනාගාර තුළ සිදුවන මරණ

අධ්‍යයනයේ දී බන්ධනාගාර තුළ සිදු වන මරණ පිළිබඳ විමසුම් කරන අතරතුර කොමිසමට රැඳවුම් භාරයේ සිටින සිරකරුවන්ගේ මරණවලට හේතු වශයෙන් දැක්විය හැකි පොදු රටාවන් ගණනාවක් අනාවරණය කර ගත හැකි විය. බන්ධනාගාර නිලධාරීන් හා රැඳවියන් විසින් මුදා හරිනු ලබන ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අවසානයේ දී මරණය සිදු වන අවස්ථා ද දක්නට ලැබිණ. කොමිසම වෙත වාර්තා වූ මෙවන් සෑම සිදුවීමක දී ම අදාළ රැඳවියා බොහෝ විට මත්ද්‍රව්‍ය නොමැති වීමෙන් හෝ මානසික ව්‍යාධියක් හේතුවෙන් පීඩා විඳිමින් සිටි අයෙකු වුයේ ය. මේ හේතුවෙන් ඔවුන් නොසන්සුන්තාවයක් ඇති කළ විට එය මර්දනය සඳහා ප්‍රචණ්ඩත්වය මුදා හැර තිබුණි.

සිරකරුවෙකු බන්ධනාගාරයට ඇතුළත් වන අවස්ථාවේ දී ඉන් පෙර ඔහුගේ ශරීරයේ වන තුවාල කැළැල් ආදිය සටහන් කිරීම සඳහා ඔහු ඡායාරූපගත කිරීම හා හඳුනා ගැනීමේ සලකුණු සටහන් කිරීම ඉතා වැදගත් වන බව කොමිසමට අනාවරණය විය. ඒ අනුව යම් රැඳවියෙකුට පහරදීමක් සිදු වූයේ බන්ධනාගාරයට ඇතුළු වීමෙන් පසු ව ද නොඑසේ නම් ඉන් පෙරාතුව ද යන්න පිළිබඳ කාල නිර්ණයක් සිදු කළ හැකි ය. කෙසේ වෙතත්, සන්ධ්‍යා කාලයේ දී බන්ධනාගාරවලට රැගෙන එන රැඳවියන් පරීක්ෂාවට ලක් කෙරෙනුයේ පසු දිනයේ දී ය. ඒ නිසා නව සිරකරුවෙකු ලියාපදිංචියට පෙර පළමු රාත්‍රියේ දී පහර කෑමකට ලක් වූයේ ද යන්න තීරණය කිරීමට හෝ අත්අඩංගුවට පත් වීමේ දී තුවාල සිදු වූයේ ද යන්න තීරණය කිරීමට අපහසු වේ. තමන් විසින් තමන්ට ම හානි පමුණුවා ගන්නා හා සියදිවි නසාගැනීමේ නැඹුරුවක් ඇති රැඳවියන් සම්බන්ධයෙන් බන්ධනාගාර පාලනාධිකාරිය කටයුතු කරනුයේ ඔවුන් හුදකලා කිරීමෙනි. මානසික රෝගවලින් පීඩා විඳින්නවුන්ගේ රෝග ලක්ෂණ උත්සන්න වීමත් සමඟ ඔවුනට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නොලැබීමත් හේතුවෙන් සියදිවි නසාගැනීමේ නැඹුරුව තවදුරටත් වර්ධනය විය හැකි අතර රැඳවියෝ එයට ගොදුරු වෙති.

වෛද්‍ය ප්‍රතිකාර ප්‍රමාද වීම, විශේෂයෙන් රාත්‍රී කාලයේ දී හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා දිය යුතු අවස්ථාවල දී එම ප්‍රතිකාර ප්‍රමාද වීම නිසා රැඳවියන්ගේ මරණ සිදු වූ අවස්ථා වාර්තා වේ. සෞඛ්‍ය පහසුකම් පිළිබඳ

කොටසේ දී සාකච්ඡා කළ පරිදි රාත්‍රී කාලයේ දී අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නොලැබීම බන්ධනාගාර සෞඛ්‍ය සේවාවේ ඇති ප්‍රධාන දුර්වලතාවකි. මේ හේතුවෙන් රැඳවියන් මරණයට පත් වූ අවස්ථා පිළිබඳ රටාවක් කොමිසමේ අවධානයට ලක් විය. රැඳවියන් මරණයට ගොදුරු වූ බොහෝ අවස්ථාවන් වාර්තා වන්නේ රාත්‍රී කාලයේ දී වන අතර අධීක්ෂණ හා මුර සංචාර සඳහා අවශ්‍ය තරම් නිලධාරීන් නොමැති වීම මෙන් ම කඩිනමින් නිලධාරීන් අවශ්‍ය පියවර නොගැනීම හේතුවෙන් මෙම මරණ බොහොමයක් සිදු වූ බව නිරීක්ෂණය කළ හැකි ය.

රැඳවුම් භාරයේ දී සිදු වූ සෑම මරණයක් පිළිබඳ ව ම අධිකරණමය විමර්ශනයක් සිදු කෙරෙන බව කොමිසමට දන්වනු ලැබුව ද බන්ධනාගාර පාලනාධිකාරිය විසින් සකස් කෙරෙනුයේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම සඳහා මරණයට අදාළ මූලික පසුබිම සඳහන් කරමින් සැකසූ ලිපි ගොනුවක් පමණි. මරණයට පත් වූ තැනැත්තාගේ ලිපි ගොනුවෙහි මරණයට හේතුව හෝ ඒ පිළිබඳ විමර්ශන වාර්තා කිසිවක් ඇතුළත් නොවේ. මේ හේතුවෙන් වෛද්‍ය ප්‍රතිකාර නොලැබී යාම වැනි එයට හේතු වූ කරුණු හඳුනා ගැනීම මගහැරී යයි. බන්ධනාගාර තුළ නඩත්තු කෙරෙන මරණ වාර්තා පරිශීලනයේ දී එම මරණවලට හේතු සාධක වූ කරුණු පිළිබඳ ප්‍රමාණවත් දත්ත ඇතැම් වාර්තාවල නොතිබීමෙන් බන්ධනාගාර තුළ සිදුවන මරණ පිළිබඳ පූර්ණ අන්තර් ක්‍රියාවලියක් නොමැති වීමේ අඩුව මැනවින් පෙන්වා දෙයි. දත්ත නිවැරදි ව වාර්තා නොවන බැවින් එවන් සිදුවීම්වලින්, සිය දුර්වලතා හඳුනා ගනිමින් බන්ධනාගාරයේ ක්‍රියාවලිය හා පද්ධතිය නිවැරදි කර ගැනීමේ අවස්ථාව ද අහිමි වී යයි. දැඩි භෞතික හා මානව සම්පත් හිඟය සමග මෙවන් දුර්වලතා ද එක් වූ කල අවදානම් සහිත රැඳවියන්ට බන්ධනාගාරය තුළ ඉතා අනතුරුදායක පරිසරයක් ඇති කරයි. කොමිසමේ මහත් විස්මයට හේතු වූයේ බන්ධනාගාර තුළ සිදුවන මරණ පිළිබඳ ව ඔවුන් දක්වන උදාසීන ප්‍රතිචාරය යි. ඉන් ගම්‍ය වන්නේ සිරගත ව සිටින්නකුගේ ජීවිතය වටිනාකමින් අඩු බවක් නොවේ ද?

බන්ධනාගාර තුළ සිදුවන මරණ පිළිබඳ අධිකරණමය නොවන විමර්ශනයන් මූලික වශයෙන් සිදු කෙරෙනුයේ මානව හිමිකම් කොමිසම මඟිනි.

II කොටස : පුනරුත්ථාපන ක්‍රමවේදය

11. බන්ධනාගාරගත වූවන් පුනරුත්ථාපනය

ශ්‍රී ලංකාවේ දණ්ඩන ක්‍රමවේදයේ ප්‍රධාන දුර්වලතාවක් වන්නේ පුනරුත්ථාපනයේ දී තනිපුද්ගලායනය සිදු නොකිරීම යි. ශ්‍රී ලාංකික දණ්ඩන ක්‍රමවේදයේ දී රැඳවියන්ගේ පෞද්ගලික හැකියාව, කැමැත්ත හෝ පෙර වෘත්තීන් පිළිබඳ ව සලකමින් සුදුසු පුනරුත්ථාපන වැඩසටහන් වෙත යොමු කිරීමක් දක්නට නොමැත. බන්ධනාගාරවල පුනරුත්ථාපනය තනිපුද්ගලායනය වුවහොත් රැඳවියන් පුනරුත්ථාපනය කොට සමාජයට සාර්ථක ලෙස නැවත මුදා හැරීම ඉහළ යනු ඇත. කෙසේ වෙතත්, පවතින ක්‍රමවේදයේ දී නිදහස් වීමෙන් පසු ව සාර්ථක ලෙස ජීවනෝපායකට යොමු වීම සඳහා හැකියාවන් සංවර්ධනය කරගන්නේ සිය ගණනක් වූ සිරකරුවන්ගෙන් කිහිපදෙනෙකු පමණි. මේ වෙනුවෙන් තත්කාර්ය වැඩසටහන් කිහිපයක් පමණක් ඇතැම් බන්ධනාගාරවල ස්ථාපිත කර ඇති බව කොමිසම අනාවරණය කළේ ය. උදාහරණ ලෙස, මූලික භාෂාමය හා ලේඛනමය හැකියා සංවර්ධනය සඳහා සිරකරුවන්ට භාෂා පන්ති පැවැත්වුණ ද ඒ සඳහා උනන්දු වෙමින් අතර මඟ ඇණහිටි ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කර ජාතික විෂය මාලාව අනුව උසස් අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව උදා කර ගන්නේ කිහිපදෙනෙකු පමණි.

පුනරුත්ථාපනයේ මූලික මෙවලම ලෙස ආගමික හා අධ්‍යාත්මික දැනුම ලබා දීම සලකමින් බන්ධනාගාරයේ එවන් වැඩසටහන් සූදානම් කෙරුණ ද එම වැඩසටහන් ආමන්ත්‍රණය කරනුයේ බෞද්ධයන් හට පමණි. සමස්තයක් ලෙස සියලු බන්ධනාගාරවල කණ්ඩායම් උපදේශනය හා මත්ද්‍රව්‍ය පුනරුත්ථාපනය වැනි අනෙකුත් ක්‍රමවේදයන් උපයෝගී කර නොගන්නා අතර පාලනාධිකාරය බාහිර ආයතන සමග සම්බන්ධ වන කුඩා පරිමාණයේ ස්ථානවල පමණක් මෙවා ක්‍රියාත්මක වන ආකාරය දැකගත හැකි ය.

බන්ධනාගාරය තුළ ක්‍රියාත්මක කෙරෙන වෘත්තීය වැඩසටහන් ලෙස පෙදරේරු කර්මාන්තය, ගඩොල් සැකසීම, කෘෂිකර්මාන්තය හා වැල්ඩින් කර්මාන්තය පෙන්වා දිය හැකි ය. මෙම වැඩසටහන් අධ්‍යයනයේ දී පෙනී යන්නේ රැඳවියන් හට නිදහස ලැබීමෙන් පසු ප්‍රමාණවත් ආදායමක් ලබාගත හැකි ජීවනෝපායකට අවශ්‍ය හැකියා වර්ධනය සඳහා විවිධාකාර නව වැඩසටහන් හඳුන්වා දීමේ අවශ්‍යතාවය යි. එයට අමතර ව දැනට පවතින පුනරුත්ථාපන වැඩසටහන් සඳහා ද ප්‍රමාණවත් තරම් මුදල් ප්‍රතිපාදන නොලැබෙන බැවින් රැඳවියන් යල් පැන ගිය, අබලන් වූ මෙවලම් භාවිතයෙන් වැඩ කරන ආකාරය හා නිසි උපදෙස් ලබාදීමට දක්ෂ උපදේශකවරුන් නොමැති වීම දැකගත හැකි ය. මෙවන් හේතු නිසා රැඳවියන් කැපවීමෙන් එම වැඩසටහන්වලට එකතු වී කටයුතු කිරීමට අධෛර්යය වෙති. මේ සියල්ල නිසා බන්ධනාගාර පුනරුත්ථාපන වැඩසටහන් හරහා රැඳවියන් තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීමට හෝ සමාජයට මුදා හැරීමෙන් පසු ඔවුන් නැවත අපරාධ වෙත යොමුවීම වැළක්වීමට හෝ අසමත් වෙයි.

අපරාධ යුක්තිය පිළිබඳ පද්ධතියේ කොටසක් වන සියලු දෙනා අතරින් බන්ධනාගාර තුළ සාර්ථක පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් රැඳවියන් තුළ සැබෑ පරිවර්තනයක් ඇති කිරීම හා එයින් ලැබිය හැකි වාසි පිළිබඳ ව වඩාත් විශ්වාසය තබා ඇත්තේ බන්ධනාගාර නිලධාරීන් හා පුනරුත්ථාපන නිලධාරින් බව කොමිසමට පෙනී ගියේය. කෙසේ වෙතත්, ඔවුන්ගේ දැක්ම පද්ධතික බාධකයන් මගින් වළක්වා ඇත. ප්‍රතිපාදන හා සම්පත් හිඟය, විශේෂයෙන් පුනරුත්ථාපන හා උපදේශන නිලධාරීන්ගේ හිඟය බන්ධනාගාර තුළ ඵලදායි පුනරුත්ථාපනයක් සිදු කිරීමට නොහැකි වීමේ මූලික අවහිරතාවය ලෙස දැක්විය හැකිය. බන්ධනාගාර සමඟ සම්බන්ධ වීමට බාහිර සංවිධාන තුළ පවතින පැකිළීම මේ ගැටලුව තව දුරටත් සංකීර්ණ කරයි. එයින් පැහැදිලි වන්නේ විශෝධන ආයතන සිරකරුවන්ට දඬුවම් ලබා දීමේ ඒකක නොව ඔවුන් පුනරුත්ථාපනය කිරීමේ ඒකක ලෙස සැලකීමට සමාජය හා රජය තුළ ආකල්පමය වෙනසක් ඇති කළ යුතු බවයි. එවිට මේ පුනරුත්ථාපන වැඩසටහන් සඳහා ලබා දෙන මානව හා භෞතික සම්පත් අනාගත ආයෝජනයක් ලෙස සලකමින් වර්ධනය කළ හැකි ය. තමන්ට විශෝධන ප්‍රතිපත්තිවලට අදාළ වඩාත් ඵලදායි ක්‍රමවේදයන් පිළිබඳව වැඩිදුර පුහුණුව අවශ්‍ය බව පුනරුත්ථාපන නිලධාරීන් විසින් ම පිළිගනු ලැබුහ. වර්තමානයේ දී බන්ධනාගාර පුනරුත්ථාපන වැඩසටහන්වල කාර්යක්ෂමතාව නියාමනය කරමින් තව දුරටත් ඒවා සංවර්ධනය කළ හැකි ආකාර පිළිබඳ පසු විපරමක් හෝ ඇගයීමක් සිදු වන්නේ අල්ප වශයෙනි. මෙයට මූලික හේතුව වන්නේ පුනරුත්ථාපන අංශයේ බොහෝ කාර්යයන් සිදු කිරීමට තරම් ප්‍රමාණවත් පුනරුත්ථාපන නිලධාරීන් ප්‍රමාණයක්, බඳවා ගැනීමේ පටිපාටියේ නොසිටීම යි.

මෙම දුර්වලතා පිළිබඳ ව තමන් බන්ධනාගාරය තුළ ඵලදායි ලෙස කාලය නොගෙවන බවට හැඟෙන බව සිරකරුවන් විසින් ද පෙන්වා දෙනු ලබයි. බන්ධනාගාරගත කිරීමේ කේන්ද්‍රීය අරමුණ වන අපරාධ වැළැක්වීම මේ හරහා තර්ජනයට ලක් වේ.

12. බන්ධනාගාර වැඩ

බන්ධනාගාර වැඩවල මූලික අභිප්‍රාය යම් කුසලතාවයක් වර්ධනය කර ගන්නා අතරතුර සිරකරු තුළ වගකීම පිළිබඳ ව හැඟීමක් ඇති කරමින් සුදුසු අයුරින් දෛනික ව රාජකාරියක නිරත කරවීම යි. රැඳවියන්ට මේ ආකාරයෙන් බන්ධනාගාර කාර්යාලයේ සේවය කිරීම, බන්ධනාගාර කටයුතු සඳහා භාණ්ඩ බෙදා හැරීම හෝ වැඩ සඳහා මුදාහැරීමේ ක්‍රමවේදය යටතේ බන්ධනාගාරයෙන් පිටත වැඩ කිරීම ආදී විවිධ රාජකාරිවල නියැළිය හැකි ය. එසේ ම කෙටිකාලීන සිර දඬුවම් විඳින හෝ කෙටි කාලයකින් මුදා හැරීමට නියමිත, නිලධාරීන්ට අකීකරු වීම පිළිබඳ චෝදනා නොමැති සිරකරුවන් හට විවෘත සිර කඳවුරු හෝ වැඩ කඳවුරුවලට යා හැකි ය. විවෘත කඳවුරු තුළ වඩු වැඩ හෝ වැල්ඩින් වැඩ ආදී කර්මාන්ත කණ්ඩායම් දක්නට ලැබුණ ද එහි කේන්ද්‍රීය අවධානය යොමු වනුයේ කෘෂිකර්මාන්තය කෙරෙහි ය. මුදා හැරීමෙන් පසු ජීවනෝපාය සකස් කර ගැනීමට උපකාරයක් නොවන බැවින් මෙය සිරකරුවන් පුනරුත්ථාපනයෙහි ලා සීමාවන් ඇති කරයි. උදාහරණ ලෙස, විවෘත බන්ධනාගාර හෝ වැඩ කඳවුරුවල කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන සිරකරුවන් මුදා හැරීමෙන් පසු ජීවත් වන්නේ නාගරික ප්‍රදේශයක නම් ඔවුනට තමන් ලැබූ අත්දැකීම්වලින් නිසි ප්‍රයෝජන ගත නොහැකි වේ.

කාන්තා රැඳවියන්ගේ වැඩ බන්ධනාගාරය ඇතුළත පිරිසිදු කිරීම් හා වෙනත් සුළු කටයුතුවලට පමණක් සීමා වේ.

බන්ධනාගාර පරිශ්‍රවල වැඩ බිම් සඳහා අවශ්‍ය ස්වාභාවික හිරු එළිය, වාතාශ්‍රය හා ආරක්ෂාව වැනි සාධක අපේක්ෂිත මට්ටමට නොපවතිනුයේ ඒවා බොහෝ විට පැරණි අබලන් වූ ගොඩනැගිලි හා මඩු තුළ පවත්වාගෙන යන බැවිනි. කොමිසම විසින් මෙවන් වැඩ බිම්වල අනතුරුදායක ස්ථාන බොහොමයක් අනාවරණය කරගනු ලැබූ අතර ඒවායෙහි සේවය කරන රැඳවියන් හට ආරක්ෂිත උපාංග ආදිය නොමැති තරම් ය. රැඳවියන්ගේ වැඩ තත්ත්වය පිළිබඳ ව වෛද්‍යවරුන්ගේ නිසි නියාමනයක් සිදු නොවන බැවින් හා වැඩිදියුණු කරගත යුතු දේ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමක් නොවන බැවින් එම වැඩ පරිසර අහිතකර හා අනාරක්ෂිත ස්වභාවයෙන් ම පවතී. රැඳවියන් පවසන අන්දමින් ඔවුනට ප්‍රමාණවත් තරම් විවේකය හෝ සිය පෞද්ගලික කටයුතු කරගැනීමට අවස්ථාවක් නොලැබෙන බැවින් ඔවුහු එය දඬුවමක් ලෙස විනා තම කාලය ප්‍රයෝජනවත් ලෙස ගත කිරීමක් ලෙස නොසලකති. විවෘත හා වැඩ කඳවුරුවල සිටින රැඳවියෝ තමන්ට සතියේ දින 7ම වැඩ කිරීමට සිදු වන බවට පැමිණිලි කරති.

සුදුසු උපකරණ හා නවීන මෙවලම් නොමැති බැවින් වැඩි කාලයක් හා ශ්‍රමයක් වැයකරමින් දෑතින් සියලු වැඩ කිරීමට සිදු වන බවට ද රැඳවියෝ පැමිණිලි කරති. මෙයට පුහුණු උපදේශකවරුන්ගේ සේවය අවශ්‍ය බව කර්මාන්ත හා කුසලතා සංවර්ධන කොමසාරිස්වරයා පුන පුනා අවධාරණය කළ ද ඒ සඳහා අතිරේක මුදල් ප්‍රතිපාදන වෙන් කළ යුතු ව ඇත.

බන්ධනාගාරයෙන් පිටත වැඩ කිරීමේ ක්‍රමවේදය යටතේ ප්‍රමාණවත් තරම් වේතනයක් ලැබුණ ද බන්ධනාග ාරය ඇතුළත සේවය කිරීම වෙනුවෙන් රැඳවියන්ට හිමි වන්නේ දෛනික ව සත කිහිපයක් පමණි. පසුගිය වසර 35 පුරාවට රැඳවියන්ගේ දීමනා අනුපාතය පිළිබඳ ව සංශෝධනයක් සිදුකොට නොමැති අතර 1 ශ්‍රේණියේ රැඳවියෙකුට ලැබෙන්නා වූ අවම දෛනික වේතනය රුපියලකි. 4 ශ්‍රේණියේ රැඳවියන් ලබන ඉහළ ම දෛනික වේතනය රු. 2.50කි.

බන්ධනාගාරයෙන් පිටත වැඩ කරමින් ආදායමක් ලැබීමේ අවස්ථාවන් ඉතාමත් සීමා සහිත වේ. එසේ ම නිශ්චිත ප්‍රතිපත්තීන් තිබුණ ද වැඩ සඳහා මුදා හැරීමේ ක්‍රමවේදය නිසි ලෙස ප්‍රයෝජනයට නොගන්නා බව කොමිසමෙහි නිරීක්ෂණයට ලක් විය. වැඩ සඳහා මුදා හැරීමේ ක්‍රමවේදය අනුව රැඳවියන් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන මඟින් සේවයට යෙදවිය හැකි අතර ඔවුහු දිනපතා එම ආයතනවල සේවය කරමින් තම දඬුවම් කාලය තුළ දී ම සාමාන්‍ය සේවකයෙකුට හිමි වැටුප ලබා ගනිති. සේවයට මුදා හැරීම පිළිබඳ ක්‍රමවේදය යටතේ බන්ධනාගාරයෙන් පිටත නවාතැන් ගැනීමට සිරකරුට අවස්ථාව තිබුණ ද වර්තමානයේ දී මෙසේ පිටත සේවය කරන සෑම රැඳවියෙකුම දිනය අවසානයේ දී පෙරළා බන්ධනාගාරයට පැමිණෙයි.

මූලික වෛද්‍ය පරීක්ෂණයේ දී වැඩ කිරීමට නුසුදුසු යයි වර්ග කෙරෙන රැඳවියන් පවා සිය නිර්දේශයන් නොසලකා හරිමින් බන්ධනාගාරය තුළ සේවයේ යොදවන බව වෛද්‍ය නිලධාරීහු කොමිසමට දන්වා සිටියහ. රෝගාතුර ව සිටිය දී පවා තමන්ට වැඩ කිරීමට සිදු වන බවට ඇතැම් බන්ධනාගාරවල රැඳවියෝ පැමිණිලි කළහ.

13. නියමිත කාලයට පෙර මුදා හැරීමේ ක්‍රමවේදය

පුනරුත්ථාපන ක්‍රමවේදයේ අවසන් අරමුණ වන්නේ රැඳවියන් තුළ යහපත් හා ප්‍රතිසංස්කරණාත්මක චර්යාවක් ඇති කිරීම යි. ඒ හරහා නියමිත කාලයට පෙර බන්ධනාගාරයෙන් මුදා හැරීම යි. මරණ දඬුවම හිමි වූ හා ජීවිතාන්තය තෙක් සිර දඬුවම් නියම වූ සිරකරුවන් හට අනෙකුත් සිරකරුවන් මෙන් නියමිත කාලයට පෙර නිදහස ලැබීමට නම් ඔවුන් නිශ්චිත සිර දඬුවම් කොන්දේසිවලට මාරු විය යුතු ය. මෙම පියවර ගැනීම සඳහා දඩසමාව හා ඇගයීම් ක්‍රමවේදයක් භාවිත කෙරෙන අතර නිවාඩු ලැබ නිවෙසට ගොස් සිටින කාලයේ චර්යාව මත පදනම් ව සිරකරුවන් හට මෙසේ මුදා හැරීමේ බලපත්‍රයක් ලැබේ.

13.1 න්‍යාදේශ කම්ටු

න්‍යාදේශ කම්ටු යනු අධිකරණ අමාත්‍යංශය මගින්, මරණ දඬුවම ජීවිතාන්තය තෙක් සිර දඬුවමකටත්, ජීවිතාන්තය තෙක් සිර දඬුවම 20 වසරක සිර දඬුවමකටත් ලිහිල් කරමින් ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන කම්ටුව යි. පෙර කී ඇගයීම් ක්‍රමවේදය හා අනුබද්ධ ව මේ න්‍යාදේශ ක්‍රියාවලිය ද අතීතයේ දී අඛණ්ඩ ව ක්‍රියාත්මක කෙරිණ. එහෙත්, ඇගයීම් සමඟ ම මේ නිත්‍ය න්‍යාදේශ ක්‍රියාවලිය ද අහෝසි කරනු ලැබ ඇත. මේ වනවිට අමාත්‍යවරයාගේ අභිමතය අනුව හදිසි කම්ටු ස්ථාපිත කිරීම පමණක් සිදු වේ. රැඳවියෙකු විසින් සිදු කළ වරද ඉන් පසු ක්‍රියාත්මක වන පුනරුත්ථාපනය කෙරෙහි බලනොපාන අතර ඔහු පුනරුත්ථාපනය වී ඇති ද යන්න කෙරෙහි බලපානුයේ බන්ධනාගාරය තුළ ඔහුගේ විනය හා දඬුවම් කාල සීමාව අතරතුර ඔහු සහභාගී වූ වෘත්තීය පුහුණුව ආදිය යි.

න්‍යාදේශ ක්‍රියාවලිය තුළ දුර්වලතා ගණනාවක් නිරීක්ෂණය කළ හැකි ය. අමාත්‍යවරයාගේ මනාපය පරිදි හදිසි කම්ටු ස්ථාපනය කෙරෙන බැවින් වර්තමානයේ දී එහි විනිවිදභාවය පිළිබඳව යම් ගැටලු පැනනගියි. නිශ්චිත ව ම ස්ථාපනය කරන ලද කාර්ය පටිපාටියක් හා නිර්ණායකයන් නොවීම හේතුවෙන් අත්තනෝමතික තීරණවලට එළඹීමේ අවදානම හා විවිධ කම්ටු මගින් එකිනෙකට වෙනස් සාධකවලට ප්‍රමුඛතාවයක් ලබාදීමේ අවදානම ද මෙහි පවතී. බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්වරයාට අනුව න්‍යාදේශය වරප්‍රසාදයක් මිස අයිතියක් නොවන බැවින් සිරකරුට කම්ටුවේ තීන්දුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථාවද හිමි නොවේ. එසේ ම සිරකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු දැක්වීමක් ද මෙහි දී සිදු නොවේ.

13.2 ඇගයීම්

බන්ධනාගාර ආඥා පනත අනුව බන්ධනාගාරගත වූවකුගේ පුනරුත්ථාපන ප්‍රගතිය නියාමනය සඳහා සෑම සිව් වසරකට ම වරක්, එනම්, සිව්වන, අටවන, දොළොස්වන, දහසයවන හා විසිවන වසරවල දී ඇගයීම්වලට ඉදිරිපත් කළ යුතු ය. ඊට අදාළ ව අමාත්‍යංශය විසින් අදාළ රැඳවියාගේ දඬුවම ලිහිල් කිරීම, අඩුකිරීම හෝ පුනරුථාපිත පුද්ගලයන් මුදා හැරීම පිළිබඳ නිර්දේශ සකස් කොට ජනාධිපතිවරයාගේ අනුමැතියට ඉදිරිපත් කෙරේ. දඬුවම් කාල සීමාව පිළිබඳ ව නොසලකමින් සෑම රැඳවියෙකු සඳහා ම මෙම ක්‍රියා පටිපාටිය අදාළ වේ.

බරපතල අපරාධකරුවන් හා මරණයට තීන්දු වූවන් වේලාසනින් නිදහස් කෙරෙන බවට වූ මහජන මතය නිසා අධිකරණමය, සමාජමය හා දේශපාලනමය වශයෙන් සිදු කළ බලපෑම් හා විරෝධතා හේතුවෙන් මෙම ඇගයීම් ක්‍රමවේදය 2001 වසරේ දී අහෝසි කරනු ලැබිණ. කෙසේ වෙතත්, අනිවාර්ය අවශ්‍යතාවය හේතුවෙන් සෑම රැඳවියෙකු පිළිබඳව ම සියලූ බන්ධනාගාරවල මෙම ඇගයීම් වාර්තා සකස් කෙරෙන බව කොමිසමට දන්වා සිටින ලදී. මෙම වාර්තා අධිකරණ අමාත්‍යංශයට හා ජනාධිපති කාර්යාලයට පවා යොමු කරනු ලැබේ. එහෙත් ඒ පිළිබඳ කිසිදු ඉදිරි පියවර ගැනීමක් ඉන් ඔබ්බට සිදු නොවේ. රැඳවියන් හට යහපත් චර්යාවෙන් යුතු ව සිටීමට මෙන් ම පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු වීම සඳහා මෙසේ ඇගයීම් ක්‍රියාවලියෙන් පසු ව නියමිත කාලයට පෙර මුදා හැරීම අභිප්‍රේරකයක් ලෙස භාවිත කළ හැකි බැවින් මෙය ඉතාමත් ඵලදායි ක්‍රමවේදයක් වන බවත් කාර්යක්ෂම විශෝධන ප්‍රතිපත්තියක් වන බවත් ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර නිලධාරීහු කොමිසමට දැනුම් දුන්හ. නිරන්තරයෙන් ඉහළ යන රැඳවියන්ගේ ධාරිතාවය පාලනයට මෙන්ම දීර්ඝ කාලීන සිර දඬුවම් හේතුවෙන් ඇති වන ශාරීරික හා මානසික බලපෑම් අවම කිරීමටත් පිළියමක් ලෙස වරින් වර ක්‍රමානුකූල ව සිදුකෙරෙන ඇගයීම් ප්‍රතිස්ථාපනයෙහි වැදගත්කම ඔවුහු හුවා දැක්වූහ.

13.3 දඬුවමින් සමාව දීම

සමාව දීමේ ලකුණු යනු යහපත් චර්යාව හා ඵලදායිතාව වෙනුවෙන් දෛනික ව රැඳවියන් හට ලකුණු පිරිනැමීමේ ක්‍රමවේදයකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රැඳවියා හට ඔහුට හිමි දඬුවම් කාලයෙන් කොටසක්

අඩුකර ගනිමින් නිදහස ලැබිය හැකි ය. මේ සමාව දීමේ ලකුණු සෑම රැඳවියෙකු ම බන්ධනාගාරයට ඇතුළත් වන දින හා වේලාසනින් මුදාහැරීම වාර්තා කරන දින අතර කාලය තුළ ගණනය කෙරේ.

කෙසේ වෙතත්, මේ වන විට සමාව දීමේ ලකුණු පටිපාටිය රැඳවියන් හට යහපත් චර්යාවක් පවත්වා ගැනීමේ අභිප්‍රේරකයක් ආකාරයෙන් භාවිත නොවන බව කොමිසමට නිරීක්ෂණය කළ හැකි විය. උදාහරණ ලෙස රැඳවියන් දවස පුරා ප්‍රයෝජනවත් කාර්යයක නියැළුණි ද නොඑසේ නම්, ඔවුන් වැඩ කරන ස්ථානයේ මෙවලම් නොමැති වීම හේතුවෙන් අලස ව කල් ගත කළේ ද යන්න නොසලකමින් දිනපතා සියලු රැඳවියන්ට උපරිම ලකුණු පිරිනැමෙන බව කොමිසමට දැනුම් දෙන ලදී. මෙසේ නිකරුණේ ලකුණු පිරිනැමීම හේතුවෙන් රැඳවියන් තුළ යහපත් චර්යාවක් ඇති කිරීමේ උත්සාහය එලදැරීමේ ප්‍රතිශතය අවම වේ. එපමණක් නොව මෙම ලකුණු පිරිනැමීම පදනම් වන්නේ වැඩ කණ්ඩායමක දිනකට නිපදවන උපකරණ ප්‍රමාණය වැනි ප්‍රමාණාත්මක සාධක පදනම් කොටගෙන පමණි. මෙය ප්‍රතිඵල ඇගයීමේ සීමාසහිත ආකෘතියකි.

13.4 නිවාස බලා යාමේ නිවාඩු

තමන්ට හිමි දඬුවමින් නිශ්චිත ප්‍රමාණයක් ගෙවා දැමීමෙන් පසු ව රැඳවියන් හට නිවාඩු ලැබ සිය පවුල් වෙත ගොස් යම්කිසි කාලයක් ගත කිරීමට අවසර ලැබේ. මෙසේ නිවාඩු ලැබීම සඳහා සෑම බන්ධනාගාරයකින් ම සුදුසුකම් සහිත රැඳවියන්ගේ ලැයිස්තුවක් සකස් කොට බන්ධනාගාර ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබේ. සෑම බන්ධනාගාරයක ම නිවාස බලා යාමේ නිවාඩු ලැබීමට රැඳවියෙකුගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙන කමිටුවක් පවතී. මෙම කමිටුව සාමාන්‍යයෙන් ප්‍රධාන ජේලර්වරයා, ජ්‍යෙෂ්ඨ සුබසාධන නිලධාරියෙකු, විනය සම්බන්ධ ජේලර්වරයෙකු හා වෘත්තීය පුහුණුකරුගෙන් සමන්විත වන අතර මෙහි මුලසුන දරනුයේ බන්ධනාගාර අධිකාරිවරයා විසිනි. සුදුසුකම් ලබන රැඳවියන්ගේ ලැයිස්තුව ඉන් අනතුරු ව අධිකරණ අමාත්‍යංශය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ.

සමාජ වාර්තා සැකසීමට හා රැඳවියාගේ සංවර්ධනය ඇගයීමට ප්‍රමිතිගත ආකෘතියක් නොමැති වීම මෙන් ම රජයේ සිදු වන වෙනස්කම් මෙම ක්‍රියාවලියේ ප්‍රමාදයන් ඇති කරන බවට රැඳවියෝ චෝදනා කරති. එමෙන් ම නිවාඩු ප්‍රතික්ෂේප කෙරෙන ඉල්ලුම්පත් හිමි රැඳවියන් හට එසේ ප්‍රතික්ෂේප වීමට හේතු දැක්වීමක් සිදු නොවන බැවින් මෙම ක්‍රමවේදයෙහි විනිවිදභාවය පිළිබඳවද ගැටලු පැන නැගේ. කෙසේ වෙතත්, රැඳවියන් හට එම තීන්දුවට එරෙහි ව අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

13.5 බලපත්‍ර මණ්ඩලය

බන්ධනාගාරය තුළ රැඳවියෙකුගේ චර්යාව හා ඔහු නියමිත කාලයට පෙර නිදහස් කිරීමේ හැකියාව පිළිබඳ ව අගයමින් බන්ධනාගාර නිලධාරීන්, අධිකරණ අමාත්‍යංශය හා නීතිපති දෙපාර්තමේන්තු නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් වන බලපත්‍ර මණ්ඩලය මඟින් බලපත්‍රයක් නිකුත් කිරීමෙන් ඔවුන් මුදාහැරීමේ ක්‍රමවේදය මෙය යි. සුදුසුකම් ලබන රැඳවියන්ගේ පදිංචි ස්ථාන වෙත ක්ෂේත්‍ර පරීක්ෂණවල නියැලෙමින් ඔහුට පවුලෙන් හා සමාජයෙන් ලැබිය හැකි සහයෝගය පිළිබඳ ව පුනරුත්ථාපන නිලධාරීන් වාර්තා කළ යුතු වුව ද මානව හා භෞතික සම්පත් ඌනතාවය හේතුවෙන් මෙම ක්‍රමවේදයෙහි ද ප්‍රමාදයන් දැකිය හැකි ය.

බන්ධනාගාර තුළ කාන්තාවන් සඳහා පුනරුත්ථාපන ක්‍රියාකාරකම් සීමාසහිත වීම හා නායකත්ව භූමිකා හිඟ වීම හේතුවෙන් කාන්තා රැඳවියන් හට මුදා හැරීම පිළිබඳ සතුටුදායක හේතු දැක්වීම් කිරීමට අසීරු වීම නිසා ඔවුහු අවාසිදායක තත්වයකට මුහුණ දෙති. මෙම ක්‍රමවේදයෙහි දක්නට ලැබෙන තවත් දුර්වලතාවයක් නම්, රැඳවියෙකුගේ සුදුසුකම් පරීක්ෂාව සම්බන්ධයෙන් බලපත්‍ර මණ්ඩලයට භාවිතා කළ හැකි කිසිදු ලිඛිත ප්‍රතිපත්තියක් හෝ මාර්ගෝපදේශයක් නොවීම යි. එම කමිටුවල ක්‍රියාකාරීත්වය සම්මත ක්‍රියා පටිපාටියකට අනුව ස්ථිර ප්‍රතිපත්තියකින් ක්‍රියාත්මක නොවීම ද මෙහි දුර්වලතාවයකි. මෙසේ විෂයානුබද්ධ ප්‍රමිතීන් හා විනිවිදභාවයක් නොමැති වීම යනු කමිටු සාමාජිකයන්ගේ පක්ෂපාතිත්වයන් හා මතවාදයන් තීන්දුවලට

බලපෑ හැකි වීම යි. මෙම කමිටුව මඟින් ප්‍රතික්ෂේප කෙරෙන ඉල්ලුම් පත් සම්බන්ධයෙන් හේතු දැක්වීමක් ද සිදු නොවේ. දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව ප්‍රතික්ෂේපිත අයදුම්කරුවන්ට කැමති නම් අභියාචනා ඉදිරිපත් කළ හැකි වන සේ මුදා හැරුණු රැඳවියන්ගේ නම් ප්‍රදර්ශනය කළ යුතු ය. ඒ අනුව රැඳවියන් හට අභියාචනා ඉදිරිපත් කළ හැකි වුව ද අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති කටයුතු) විසින් ප්‍රකාශ කරන ලද්දේ එසේ අභියාචනා ඉදිරිපත් කිරීමට රැඳවියන්ට අයිතියක් නොමැති බව යි. රැඳවියෙකුගේ පුනරුත්ථාපිත මට්ටම වසර ගණනාව පුරා ඔහු සම්බන්ධව වූ ක්‍රියාවන් හා ඔහු හෙබවූ තනතුරු මත විනිශ්චය කෙරෙන බැවින් සත්‍ය වශයෙන් ම පුනරුත්ථාපනය වුව ද ස්වභාවයෙන් ම සමාජශීලි නොවන, සබකෝලී රැඳවියෙකු හට තමන් පිළිබඳ ශක්තිමත් ඉල්ලීමක් සිදු කළ නොහැකිවනු ඇත. මේ හේතුවෙන් බලපත්‍ර මණ්ඩල ක්‍රමවේදයේ එක් අංගයක් ලෙස මානසික තත්ත්වය පිළිබඳ ඇගයීමක් ද සිදු කිරීම එම ක්‍රියාවලියේ ගුණාත්මක තත්වය වැඩි දියුණු කිරීමට හේතුවනු ඇත. දඬුවම් කාලය තුළ තමන් පුනරුත්ථාපනය වූ බවට ශක්තිමත් කරුණු දැක්වීමක් සිදු කළ ද අදාළ රැඳවියා හට සහාය දිය හැකි, ඔහු භාරගත හැකි පවුලක් හෝ පෙරළා යාමට නිවසක් හෝ නොමැති කල නියමිත කාලයට පෙර මුදා හැරීමේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට සිදු වන බව ද කොමිසම වෙත වාර්තා කරනු ලැබිණ.

13.6 විශේෂ හා පොදු සමාව

ජනාධිපතිවරයාගේ මනාපය පරිදි විශේෂ හේතුවක් නිසා රැඳවියෙකු හෝ රැඳවියන් පිරිසකගේ දඬුවම් ලිහිල් කිරීමට මෙන් ම ඔවුන් මුදා හැරීමට වන බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් විධායකයට පවරනු ලබයි.

පොදු සමාව සාමාන්‍යයෙන් ආගමික උත්සව, රජයේ නිවාඩු හා අනෙකුත් විශේෂ අවස්ථාවල දී ලබා දේ. මෙම සමාව ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා රැඳවියන් විසින් පූර්ව නිශ්චිත නිර්ණායකයන් සම්පූර්ණ කළ යුතු ය. ඔවුන් හට පොදු සමාව ලැබීම වෙනුවෙන් පුනරුත්ථාපනය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. බරපතල අපරාධ සිදු කළ රැඳවියෝ මේ සඳහා සුදුසුකම් නොලබති.

ඉහත පියවර හදිසි ක්‍රියාවලියක් අනුව සිදු කෙරෙන අතර ජනාධිපතිවරයාගේ හෝ අමාත්‍යාංශයේ මනාපය මත එය රඳා පවතී. ඉන් පැහැදිලි වන්නේ එම අවස්ථාව වන විට පවතින දේශපාලනික වාතාවරණය මත සමාව දීමේ ක්‍රියාවලිය රඳා පවතින බව යි. මෙම ක්‍රියාවලියේ ස්ථායීතාව හා බන්ධනාගාර තුළ යහපත් චර්යාව වෙනුවෙන් ලබා දෙන පාරිතෝෂිකයක් ලෙස මෙම සමාව පැවතීමට නම්, ඒ සඳහා ඒකීය හා ප්‍රමිතිගත ක්‍රමවේදයක් පැවතිය යුතු ය. වාරාන්තර ව සිදු වන සමාව දීම් අහෝසි කිරීම කෙරෙහි සමාව දෙන පුද්ගලයින්ගේ අත්තනෝමතික ක්‍රියා බලපෑ බවට චෝදනාවක් පවතී. ඒ වෙනුවට අවශ්‍ය ආරක්ෂිත පියවර ඇතුළත් කරමින් කිසිදු බලාධිකාරයක් මගින් බලය අවභාවිත කිරීම වැළැක්වීම හරහා මෙම ක්‍රියාදාමය තවදුරටත් ශක්තිමත් කළ යුතු ය.

මෙසේ සමාව ප්‍රදානය කිරීම, ප්‍රතිෂ්ඨාපන යුක්තිය පිළිබඳ අපරාධ යුක්ති ප්‍රතිපත්තිය හා සමඟ බැඳෙන අතර බන්ධනාගාරවල තදබදය අවම කිරීමේ පියවරක් ද වේ.

III කොටස : බන්ධනාගාරගත වූවන්ගේ විශේෂ ප්‍රභේදයන්

14. මරණ දඬුවමට ලක් වූවන්

කෲර හා ආපසු හැරවිය නොහැකි කළ නොහැකි දඬුවමක් වන බැවින් ද, ජීවිතය පිළිබඳ අයිතිය හා වධ හිංසනයෙන් මිදීමේ අයිතිය උල්ලංඝනය කෙරෙන බැවින් ද, අමානුෂික හා අපහාසාත්මක දඬුවමක් වන බැවින් ද මරණ දඬුවම අහෝසි කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් නිරන්තරයෙන් ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා රජය විසින් මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ පමාසහනයක් අත්සන් කර තිබුණ ද තවදුරටත් පුද්ගලයන් මරණ දඬුවමට යටත් කරමින් ද, අනියත දඬුවම් කාලයක් ගෙවමින් ද සිටිති. මේ හේතුවෙන් ඔවුන් කාලානුරූප ව මුදා හැරීමේ ඵලදායී ක්‍රමවේදයක් ද නොමැති ව සමස්ත බන්ධනාගාර පද්ධතියට ම මහත් බරක් වෙමින් සිටිති. කෙටි කාලීන සිරදඬුවම් විඳින්නෙකුට පවා දරා ගත නොහැකි අන්දමේ කටුක බන්ධනාගාර තත්ත්වයනට මුහුණ දීමට මේ මරණ දඬුවමට ලක් වූ රැඳවියන්ට සිදු වේ. ඔවුනට ඒ දුෂ්කරතාවලට අසීමාන්තික ව ගොදුරු වෙමින් කාල නියමයක් නොමැති ව කල් ගත කිරීමට සිදු වේ.

මරණ දඬුවමට ලක් වූවන් දරුණු බන්ධනාගාර තත්ත්වයන් යටතේ රඳවා තැබේ. ඔවුනට දවසේ මුළු කාලයම බන්ධනාගාර වාට්ටු තුළ ගෙවීමට සිදු වන අතර ව්‍යායාම සඳහා බැහැරට ඒමට ලැබෙනුයේ මිනිත්තු 30ක කාලයක් පමණි. එය ද තීරණය වන්නේ ඔවුන් මුර කිරීමට අවශ්‍ය තරම් නිලධාරීන් සිටී ද යන සාධකය මත ය. මේ මරණ දඬුවමට ලක් වූවන් ගණනාවක් අඳුරු වාට්ටුවල ම කාලය ගත කිරීම හේතුවෙන් විවිධ දෘෂ්ටි ආබාධවලට ගොදුරු වී සිටින බව කොමිසමට දැන ගැනීමට ලැබිණ. බොහෝ බන්ධනාගාරවල මරණ දඬුවමට ලක් වූවන් රාත්‍රියේ දී අගුළුලන සිරකුටිවල වැසිකිළි පහසුකම් ද නොමැති ව රඳවා තැබෙන බැවින් ඔවුනගේ දඬුවම් කාලයේ අවසානයක් නොමැති වීම නිසා දශක ගණනාවක් පුරා සිර කුටිය තුළ ඇති ප්ලාස්ටික් බාල්දියකට ශරීර කෘත්‍ය කිරීමට සිදු වී ඇත.

දවස පුරා ප්‍රයෝජනවත් කාර්යයක නියැලීමට නොහැකි වීම, රැඳවුම් ස්ථානවල අහිතකර තත්ත්වය හා සිය පවුල පිළිබඳ සිතුවිලි හේතුවෙන් මරණ දඬුවම හිමි බොහෝ රැඳවියෝ බරපතල මානසික රෝග ලක්ෂණ පෙන්නුම් කරති. මරණ දඬුවමට යටත් ව ගෙවන කාලය දීර්ඝ වත් ම මේ රෝග ලක්ෂණ ද උත්සන්න වේ. පෙර ඉදිරිපත් කළ පරිදි බන්ධනාගාර තුළ ප්‍රමාණවත් තරම් මානසික සෞඛ්‍ය සේවා නොසැපයේ. එසේ ම මරණ දඬුවම හිමි වූවන් විශේෂ ගණයේ සිරකරුවන් ලෙස සැලකෙන බැවින් රජයේ රෝහල් කරා රැගෙන යාමට විශේෂ ආරක්ෂක විධිවිධාන යෙදීමට සිදු වීම හේතුවෙන් ඔවුනට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ දී ද දැඩි ප්‍රමාදයන්ට මුහුණ දීමට සිදු වේ.

මරණ දඬුවමට යටත් වූ රැඳවියන්ගෙන් ලබා ගත් ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත අනුව මූලික වශයෙන් ම අර්ථදායි නීති සහයක් ලබා ගැනීමට අසමත් වීම හේතුවෙන් ඔවුනගේ නඩු විභාගයන් පිළිබඳ පැන නැගුණු ගැටලු සමුදායක් අනාවරණය වේ. ඔවුන්ගේ නඩු විභාග වර්ෂ ගණනාවක් පුරා පවතින හෙයින් මුදල් ගෙවා පෞද්ගලික ව නීතිඥවරයෙකුගේ සහාය ලබා ගැනීමට නොහැකි වූ බවත් එබැවින් රජයේ නීතිඥවරුන් මත යැපීමට සිදු වූ බවත් ඔවුහු ප්‍රකාශ කළහ. තමන් වෙනුවෙන් පත් කළ නීතිඥවරයා බොහෝ නඩුවාරවල දී හා තීන්දුව ලබා දෙන දිනයේ දී පවා අධිකරණයේ පෙනී නොසිටි බවත් තමන් වෙනුවෙන් ශක්තිමත් විත්තිවාචක ගොඩනැගීමට කටයුතු නොකළ බවත් තව දුරටත් මේ රැඳවියෝ පෙන්වා දුන්හ. එහි ප්‍රතිඵලයක් ලෙස තමන්ට මරණ දඬුවම හිමි වීමට හේතුව ඔවුනට මුදල් ගෙවා නීතිඥවරයෙකු සපයා ගත නොහැකි වීම හා ඔවුනට ලැබුණු නීති සහාය ප්‍රමාණවත් නොවීම බව ඔවුන්ගේ මතය යි.

එපමණක් නොව අපරාධ නඩු හා අභියාචනා විභාග ඇතැම් විට දශකයකට අධික කාල සීමාවක් වැනි දිගු කාලයක් පුරා සිදු කෙරෙන බැවින් කාලානුරූප ව ඒවායේ භෞතික සාක්ෂි හා සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශනයන් ක්ෂය වීමකට හෝ වෙනස් වීමකට බඳුන් විය හැකි ය. නඩු විභාගයන් අතරතුර ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත නොවූ බවට මේ රැඳවියන් කරන චෝදනා අධිකරණ පද්ධතියේ දුර්වලතා පිළිබඳ ව අපට පෙන්වා දෙයි. නැවත හැරවිය නොහැකි ආන්තික දඬුවම් ක්‍රමයක් වූ මරණ දඬුවම අහෝසි කර දැමිය යුතු බවට මෙය ද එක හේතුවකි.

මරණ දඬුවම පැනවීමේ බරපතලම අවදානම වන්නේ නිර්දෝෂී පුද්ගලයෙකුට දෝෂ සහගත ව මෙම දඬුවම පැනවීමෙන් ඇති වන සමාජමය හා මානසික බලපෑම යි. එහි ප්‍රතිඵලයක් ලෙස අපරාධ නීති පද්ධතිය පිළිබඳ ව මහජනයා තුළ පවතින විශ්වසනීයත්වය බිඳී යයි. තීන්දුව ලබා දීමෙන් පසු නඩු විභාග යේ දී ඇති වූ දෝෂ සහගත තත්ත්වයන් නැවත විමර්ශනයට ඇති අවම ඉඩ පහසුකම් හේතුවෙන් මෙවන්

දෝෂ සහගත තීන්දු පිළිබඳ අවධානය යොමු කොට ඒවා හඳුනා ගනිමින් නිවැරදි කිරීම සම්බන්ධයෙන් ද බලාපොරොත්තු තැබිය නොහැකි ය.

මරණ දඬුවමට යටත් වූ සිරකරුවන්ගේ පවුල්වලට ඒ හේතුවෙන් වන බලපෑම අවබෝධ කර ගැනීමට ගැඹුරු අධ්‍යයනයක් හා බුද්ධිමත් ප්‍රතිපත්තීන් අවශ්‍ය වේ. ඒ ප්‍රතිපත්ති හරහා අදාළ දඬුවම හේතුවෙන් එම පවුල් පීඩාවට පත් නොවන බවට තහවුරු කළ යුතු ය. මරණ දඬුවම හිමි වූවන්ගේ පවුල්, සමාජය වෙතින් ගර්හාවට හා වෙන් කොට සැලකීමට බඳුන් වන අවස්ථා හා සිය මව හෝ පියා මරණ දඬුවමට යටත් බැවින් රාජ්‍ය සේවයට එක් වීමේ දී ගැටලු මතු වූ අවස්ථා පවා කොමිසම වෙත වාර්තා වී තිබේ. මරණ දඬුවම හිමි සිරකරුවෝ, විශේෂයෙන් පවුලක එක ම ආදායම් උපයන්නා වූ පිරිමි සිරකරුවෝ ඔවුන්ගේ දඬුවම සිය පවුල්වලට දරුණු බලපෑම් ඇති කරන ආකාරය හා එය ඔවුනට දැඩි මානසික පීඩාවක් ගෙන දෙන ආකාරය සාකච්ඡා කළහ. තවත් සිරකරුවෝ සිය පවුල් විසින් තමන් අත්හැර දමනු ලැබීම හා තමන් හමුවීමට පවා කිසිවෙකු නොපැමිණීම පිළිබඳ ව දුක්ගැනවිලි නැගූහ.

15. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තැබූ සිරකරුවන්

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් විශේෂ ගණයෙහි ලා සැලකෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ජාත්‍යන්තර මානව හිමිකම් ධර්මතා යටතේ සහතික කෙරෙන ඇතැම් අයිතීන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් වාරණයට ලක් කෙරෙන බැවිනි. එබැවින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් හට අනෙකුත් සිරකරුවන්ට හිමි අයිතීන් නොලැබී යාමේ අවදානමට මුහුණ පෑමට සිදු වේ. විශේෂයෙන් රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන්ට දීර්ඝ කාලය කෙරෙහි බලපානුයේ මේ හේතුව යි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන්ට සලකන ආකාරය හා ඔවුන් මුහුණ දෙන තත්ත්වය කෙරෙහි පීඩාකාරී බලපෑමක් කිරීමට මෙසේ රඳවා තැබීම හේතු වෙයි.

ඔවුනගේ චෝදනාවල ස්වරූපය හේතුවෙන් තමන්ට සහෝදර රැඳවියන්ගෙන් මෙන් ම බන්ධනාගාර නිලධාරීන්ගෙන් පවා හිංසනයට හා හිරිහැරයට පත් වීම හා වෙන් කොට සැලකීමට බඳුන් වීමේ අවදානමට මුහුණ පෑමට සිදු වන බව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවෝ පැමිණිලි කළහ. මෙසේ සැලකීම නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සෑම සිරකරුවෙකු ම ප්‍රකාශ කළේ තමන් සාමාන්‍ය සිරකරුවන් සමඟ නොව අනෙකුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් සමඟ රඳවා තබනු ලැබීම වඩා සාධාරණ බව යි. ඔවුනගේ 'විශේෂ' හෙවත්, වැඩි ආරක්ෂාවක් අවශ්‍ය තත්ත්වය හේතුවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම ආදී අයිතීන් කෙරෙහි මොවුනට බාධා පැමිණෙයි. මෙයට හේතුව බරපතල සේවක හිඟය හේතුවෙන් ප්‍රවාහන හා ආරක්ෂක විධිවිධාන සැපයීමේ අපහසුව නිසා කඩිනමින් රෝහල් කරා රැගෙන යාමට මෙන් ම අඛණ්ඩ ව සායන කරා රැගෙන යාමට හැකියාවක් නොමැති වීම යි. එයට අමතර ව සියලු බන්ධනාගාර පුරා මෙම සිරකරුවන්ගේ 'විශේෂ' තත්ත්වය හේතුවෙන් ඔවුනට වෘත්තිය/ හැකියා පුහුණු, අධ්‍යාපන අවස්ථා හා බන්ධනාගාර වැඩ ලබා ගැනීමේ හැකියාව මඟ හැරී යයි. එමෙන් ම ඔවුනට එළිමහනේ සිටීමට ලැබෙන කාලය, අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන භාෂා මාධ්‍ය ගැටලු හෝ ඔවුන් රඳවා තැබෙන බන්ධනාගාරයේ ස්වභාවය ද එයට හේතු වේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් බොහොමයක් උතුරු නැගෙනහිර පළාත්වලට අයත් බැවින් හා ඔවුන් රඳවා ඇත්තේ දකුණු පළාතේ බන්ධනාගාරවල බැවින් මෙම රැඳවියන් හට සිය පවුල්වල සාමාජිකයන් හමු වීමේ අවස්ථාව මඟ හැරේ. බොහෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවෝ තමන්ට නීති සහාය ලබා ගැනීමේ දී ඇති වූ ගැටලු පිළිබඳ සඳහන් කළහ. විශේෂයෙන් මෙම චෝදනාවල ස්වරූපය හා එවන් නඩුවක විත්තිය වෙනුවෙන් පෙනී සිටීම හේතුවෙන් සමාජයෙන් ලැබිය හැකි ගර්හාවන් මෙන් ම චෝදනා ගොනු කොට නඩු විභාගය ඇරඹීමට ගත වන දීර්ඝ කාලය හේතුවෙන් නීතිඥ සහාය ලබා ගැනීමට අසීරු වේ. අධ්‍යයනය අතරතුර රැස් කළ

ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත අනුව ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් මුහුණ දෙන දීර්ඝ කාලීන සිර දඬුවම්වල ඍණාත්මක බලපෑම් ඉස්මතු වන්නේ මෙවැනි බොහෝ සිරකරුවන් වසර 1520 ක් පුරා රිමාන්ඩ් බන්ධනාගාරගත ව සිටින බැවිනි.

සිරකරුවන්ගේ ප්‍රකාශ අනුව පෙනී යන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි 7(3) වගන්තිය අනුව ප්‍රශ්න කිරීම සඳහා රැඳවුම් භාරයෙන් මුදවා රැගෙන යාමේ අවකාශය හේතුවෙන් දිගින් දිගට ම ඔවුන්ගේ හිමිකම් උල්ලංඝනය කෙරෙන බව යි. ඉන් බොහොමයක් දෙනා එසේ බැහැරට රැගෙන යන අවස්ථාවල දී තමන්ට වධ හිංසාවලට ගොදුරු වීමට සිදු වන බවට පැමිණිලි කළහ. ඒ හරහා අධිකරණමය රැඳවුම් භාරය තුළින් ලබා දෙන ආරක්ෂාව අවතක්සේරුවට ලක් කෙරෙන අතර එසේ රඳවා තැබීමේ මූලික අරමුණ ද ගිලිහි යයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍යවරයාගේ කාර්යභාරය තීරණාත්මක වූවකි. ඔවුනට ශාරීරික හිංසනයන්වල බලපෑම හේතුවෙන් පාපොච්චාරණයන්ට අත්සන් තැබීමට සිදු වූයේ ද යන්න ඔප්පු කිරීම සඳහා ඔහුගේ සේවය අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, පොලිස් නිලධාරීන් හා අධිකරණ වෛද්‍ය නිලධාරීන් අතර කුමන්ත්‍රණයන් හා භාෂා ගැටලු හේතුවෙන් අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට මේ සිරකරුවන් සමඟ සන්නිවේදනය කිරීමට නොහැකි වීම පිළිබඳ බොහෝ පැමිණිලි කොමිසම වෙත ලැබී ඇත. ඒ අනුව රැඳවුම් භාරයේ සිටිය දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් පිළිබඳ ව පවතින අකාර්යක්ෂම ආරක්ෂණ විධිවිධාන හා එම කාලය තුළ ඔවුන්ගෙන් ලබා ගැනෙන පාපොච්චාරණ සම්බන්ධයෙන් ගැටලු පැන නගින අතර සාධාරණ නඩු විභාගයකට චූදිතයාට ඇති අයිතිය උල්ලංඝනය වේ. නඩු විභාගය අතරතුර දී පවා විවිධ ප්‍රමාදයන් හා නඩු විභාගයේ දී මුහුණ දෙන භාෂාමය ගැටලු ආදිය නිසා සාධාරණ නඩු විභාගයකට තමන්ට ඇති අයිතිය අහිමි වන බව හා අර්බුදවලට මුහුණ දීමට සිදු වන බවට මෙම රැඳවියෝ පැමිණිලි කළහ.

16. තරුණ වරදකරුවන්

වයස අවුරුදු 15ට වැඩි තරුණ වරදකරුවන් වැඩිහිටි බන්ධනාගාරවල රඳවා තැබෙන බවත් එය අවුරුදු 18ට අඩු සියලු දෙනා ළමයින් ලෙස සැලකිය යුතු බවට වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට එරෙහි ව යන බවත් කොමිසමට අනාවරණය විය. සත්‍ය වශයෙන් නම් මොවුන් වයස අවුරුදු 18ට වැඩි වැඩිහිටි සිරකරුවන් සමඟ වැඩිහිටි බන්ධනාගාරවල රඳවා තැබිය නොහැකි ය.

වයස අවුරුදු 22 දක්වා වූ තරුණ පුද්ගලයන් වටරැක පුහුණු පාසලේ රඳවා තැබිය හැකි ය. එහි දී ඔවුන් දඬුවම් ලබන සිරකරුවන් ලෙස නොසැලකෙන අතර සමාජ විරෝධී චර්යාවන් මර්දනය කරමින් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහනක් ලෙස අවුරුදු 3ක් දක්වා වූ ''පුහුණුවකට'' සහභාගි වීම අපේක්ෂා කෙරේ. වටරැක පුහුණු පාසල පිහිටන්නේ හෝමාගම වැඩ කඳවුර තුළ වුව ද මෙහි තරුණ වරදකරුවන් මුළුමනින් ම වැඩිහිටි වරදකරුවන්ගෙන් වෙන් කොට තැබේ. වයස අවුරුදු 18ත් 22ත් අතර වරදකරුවන් සංවෘත බන්ධානාගාර මෙන් ම විවෘත කඳවුරු තුළ ද දක්නට ලැබේ. එයට හේතුව අදාළ වරදකරු වටරැක ''පුහුණුව'' සඳහා යැවීමට හෝ සංවෘත බන්ධානාගාරයක දඬුවම් විඳීමට තීන්දු කිරීම නඩු විභාග කරන විනිසුරුවරයාගේ මනාපය පරිදි සිදු කළ හැකි හෙයිනි.

වටරැක පුහුණු පාසලෙහි චර්යාත්මක ගැටලු සම්බන්ධ විශේෂඥ නිලධාරීන් හා තරුණයන් පුනරුත්ථාපනය කෙරෙහි දිරි ගන්වමින් කටයුතු කරන වෘත්තීය මාර්ගෝපදේශකයන්ගේ හිඟයක් පවතී. ඒ වෙනුවට විනය ආරක්ෂා කිරීම හා දඬුවම් කිරීම සඳහා මෙම තරුණ වරදකරුවන් කෙරෙහි ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන ආකාරය දැක ගත හැකි ය. රැඳවියන් හා නිලධාරීන් අතර වන මේ අර්බුදකාරී සම්බන්ධය නිසා තරුණ වරදකරුවෝ තමන්ට මුහුණ පෑමට සිදු වන හිංසනයන් පිළිබඳ පැමිණිලි කිරීමට මැළි වන්නේ තව තවත් හිංසා සිදු වේය යන බිය නිසා ය. වටරැක සිටින තරුණ වරදකරුවන් දඬුවම් ලබන

සිරකරුවන් සේ නොසැලකිය යුතු බවට සඳහන් වුව ද ඔවුන් කිහිපදෙනෙකු බැගින් සිර කුටිවල රඳවා තැබෙන අතර රාත්‍රියේ දී ශරීර කෘත්‍ය සඳහා සිර කුටිය තුළ ඇති ප්ලාස්ටික් බාල්දියක් භාවිත කිරීමට සිදු වේ. මොවුනට ඉරිදා හැර සතියේ අනෙකුත් දින කිහිපයක සීමිත කාල සීමාවක් පමණක් එළිමහනේ කාලය ගත කිරීමට අවස්ථාව ලැබෙන අතර එය ඔවුන්ගේ කායික හා මානසික සංවර්ධනය කෙරෙහි බාධා පමුණුවයි.

වටරැක පුහුණු පාසල තුළ පිහිටි සුනීත පාසලෙන් මෙම තරුණ වරදකරුවන් හට සිය ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අවස්ථාව සලසා දී තිබේ. මෙහි 9 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා පන්ති පැවැත්වේ. බොහෝ තරුණ වරදකරුවන්ගේ දිළිඳු පවුල් පසුබිම හේතුවෙන් ඔවුනට 9 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අවස්ථාව ද නොලැබී ගොස් ඇති බව අධිකාරිවරයා පෙන්වා දුන්නේ ය. එහි පවතින වෘත්තීය පුහුණු පාඨමාලාවන්හි හිඟ බව නිසා නිදහස ලබන විට ඔවුනට ප්‍රයෝජනවත් පුහුණුවක් ලැබීමේ අවස්ථාව ද ගිලිහි යයි. කෙසේ වෙතත් තම ජීවිතවල මේ වන විට ඇති එක ම සාමාන්‍ය කාර්යය පාසලට යාම බව මේ තරුණයෝ කොමිසමට පැවසූහ. සිය පවුල්වලින් වෙන් ව ගෙවන කටුක ජීවිතයේ දී ඔවුනට තාවකාලික සහනයක් හෝ ලැබෙනුයේ මේ පාසල් ගමනින් පමණි.

වටරැක කඳවුරෙහි පවතින තත්ත්වයන් හේතුවෙන් තව දුරටත් උත්සන්න වන මේ තරුණයන්ගේ චර්යාමය හා මානසික ගැටලු පිළිබඳ ව කොමිසමට කරුණු අනාවරණය විය. උදාහරණ ලෙස, බොහෝ තරුණයන් තමන්ට ම හානි පමුණුවා ගන්නා බවත් එසේ කරනු හසු වූ විට ඊට අවශ්‍ය වෛද්‍ය හා මානසික ප්‍රතිකාර, උපදේශනය සපයනු වෙනුවට ඔවුනට පහර කෑමට සිදුවන බවත් කොමිසමට දැනගන්නට ලැබිණ. වටරැක දී යම් යම් වරද කොට හසුවන රැඳවියන් පල්ලන්සේන තරුණ විශෝධන මධ්‍යස්ථානය වෙත මාරු කෙරෙන අතර එහි දී ඔවුන් දඬුවම් ලබන සිරකරුවන් ලෙස සැලකේ.

බාල වයස්කාර රිමාන්ඩ් රැඳවියන් වැඩිහිටියන් වෙනුවෙන් වෙන් කළ රිමාන්ඩ් හා සංවෘත බන්ධනාගාරවල රඳවා තැබෙන බව කොමිසමට තොරතුරු ලැබුණි. මොවුන් තරුණ වරදකරුවන්ට වෙන් වූ වාට්ටුවල රඳවන අතර ඇතැම් විට මේවායේ වයස අවුරුදු 22 දක්වා වූ වැඩිහිටි රැඳවියන් ද සිටිති. මෙම රැඳවියන්ට ද වටරැක සිටින රැඳවියන් හා සමාන සැලකුම් ලැබේ. ඔවුනට අවශ්‍ය නීති සහාය, උපදේශනය හෝ නිදහස ලැබීමෙන් පසු අවශ්‍ය සහයෝගය ආදී කිසිවක් නොලැබේ. රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින වැඩිහිටි රැඳවියන් සමඟ මොවුන්ගේ සම්බන්ධතා වැළැක්වීම සඳහා එක වාට්ටුවකට සියලු දෙනා කොටු කිරීමත් එළිමහනේ ගත කිරීමට ලබා දෙන කාලය සීමා කිරීමත් සිදු වේ. පිරිසිදු වාතාශ්‍රය, ක්‍රීඩා හා ව්‍යායාම වෙනුවෙන් මෙසේ අවම කාලයක් ලැබීම මොවුන් අතර කලහයන් ඇති වීමට ප්‍රධාන හේතුවක් බවට තරුණ රැඳවියෝ පැමිණිලි කළහ.

බාල වයස්කාර පුද්ගලයන් වැඩිහිටියන් සමඟ එක ම බන්ධනාගාරයක රැඳවීම තුළින් ඔවුන් බන්ධනාගාරය තුළ දී අපරාධකාරී චර්යාවන්ට නිරාවරණය වීම හරහා අපරාධවලට පසු ව යොමු වීමේ ප්‍රවණතාවයක් ඇති වේ. එසේ ම බන්ධනාගාරගත වීම හේතුවෙන් ඇති විය හැකි සමාජමය අපකීර්තිය පසුකාලීන ව ඔවුනගේ ජීවිතවලට ලැබෙන අවස්ථා කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි ය. කිසිදු වෙන් කිරීමක් නොමැති කාන්තා බන්ධනාගාරවල මෙම තත්ත්වය වඩාත් බරපතල වේ.

17. විදේශිකයන්

ශ්‍රී ලාංකික බන්ධනාගාර පද්ධතිය තුළ සිටින විදේශිකයන් ද දේශීය සිරකරුවන් හා සමාන දුෂ්කරතාවලට මුහුණ දෙති. පවුලෙන් ලැබෙන සහාය නොලැබී යාම මෙන් ම භාෂාමය හා සංස්කෘතිකමය බාධාවන් හේතුවෙන් ඔවුන්ගේ ගැටලු තවදුරටත් උත්සන්න වේ. සාමාන්‍යයෙන් විදේශිකයෝ ඉතා දිගු කාලයක් රිමාන්ඩ් භාරයේ සිටිති. මෙසේ දිගු කාලයක් රිමාන්ඩ්ගත ව සිටීම සිය වරද පිළිගැනීමට පූර්ව නිමිත්තක් වන්නේ අනියත කාලයක් පුරා රිමාන්ඩ් භාරයේ සිටිනු වෙනුවට නිශ්චිත තීන්දුවක් ලැබීම යහපත් බැවින් අධිකරණ ක්‍රියාදාමය කඩිනම් කරනු වස් ඔවුන් වරද පිළිගන්නා බැවිනි.

ප්‍රධාන වශයෙන් ලංකාවේ අපරාධ අධිකරණමය ක්‍රියාවලිය සිංහල මාධ්‍යයෙන් ක්‍රියාත්මක වන බැවින් විදේශිකයෝ බොහෝ භාෂාමය බාධාවන්වලට මුහුණ දෙති. අධිකරණයේ දී භාෂා පරිවර්තකයන් ඉල්ලුම් කිරීම නඩු විභාගය වසර දෙකක පමණ කාලයකින් ප්‍රමාද කරවන බවත් එම කාලය තුළ ඔවුන්ගේ ඉංග්‍රීසි හා සිංහල භාෂා දැනුම වර්ධනය වන බැවින් අවසානයේ දී පෙර ඉල්ලීම ඵල රහිත වන බවත් ඔවුහු කොමිසමට දැනුම් දුන්හ.

විදේශිකයන් හමුවීමට පවුලේ සාමාජිකයන් නොපැමිණෙන බැවින් සිය සනීපාරක්ෂක ද්‍රව්‍ය හා අනෙකුත් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ඔවුනට දේශීය රැඳවියන් මත යැපීමට සිදු වේ. බන්ධනාගාරය මඟින් විදේශිකයන් හට එම රටවල පුද්ගලයන් හා සන්නිවේදනය කිරීමට අවස්ථාව ලබා නොදෙන බැවින් ඔවුන් මුළුමනින් ම පාහේ සිය පවුල්වලින් වෙන් වෙති, මුදල් ලබා ගැනීමට ද අවස්ථාව ඔවුනට අහිමි වේ. සෑම විදේශිකයෙකුම සිය පීඩාවන්ට බලපාන ප්‍රධානතම හේතුව ලෙස ඉදිරිපත් කළේ තම පවුල් සමඟ සම්බන්ධතාවයක් පැවැත්වීමට නොහැකි වීම යි.

භාෂාමය ගැටලු හේතුවෙන් තමන්ට බන්ධනාගාර නිලධාරීන් හා සන්නිවේදනය කළ නොහැකි බවටත්, විදේශිකයන් හා අනෙකුත් රැඳවියන් අතර ගැටුමක දී දේශීය රැඳවියන් ඉදිරිපත් කරන පැහැදිලි කිරීම නිලධාරීන් වැඩි වශයෙන් භාර ගන්නා බවටත් මොවුහු පැමිණිලි කළහ. මෙයට හේතුව විදේශිකයන් හට ඔවුන්ගේ පාර්ශ්වයෙන් පැහැදිලි ව කරුණු ඉදිරිපත් කළ නොහැකි වීම යි. සිය ජාතිකත්වය හේතුවෙන් තමන් කළ වරද වෙනුවෙන් බන්ධනාගාර නිලධාරීන්ගේ, රැඳවියන්ගේ හා වෛද්‍ය නිලධාරීන්ගේ පවා ගර්හාවට ලක් වීම හා වෙන් කොට සැලකීම පිළිබඳ ව විදේශිකයෝ විස්තර කළහ.

දේශීය අධිකරණ ක්‍රියාදාමය හා නීතිඥවරුන් පිළිබඳ තොරතුරු නොදන්නා බැවින් විදේශිකයන් හට නීති සහාය ලබා ගැනීමේ දී සීමාවන් පැනවේ. බොහෝ විදේශිකයෝ ප්‍රමාණවත් පසුබිම් තොරතුරු රහිත ව සේවය ලබා ගැනීමට සිදු වූ නීතිඥවරුන්ගෙන් තමන්ට සිදු වූ වංචාවන් පිළිබඳ පැමිණිලි කළහ. බන්ධනාගාරය තුළ සිට නීතිඥයන් හා සන්නිවේදනය කිරීමට නොහැකි වීම හා බැහැර සිට තමන්ට සහාය වීමට පවුලේ සාමාජිකයන් නොමැති වීම හේතුවෙන් තවදුරටත් පවතින තත්ත්වය උත්සන්න වෙයි. කොමිසමට හමු වූ බොහෝ විදේශික රැඳවියෝ සිය පවුල්වලට සමීප ව සිටිමින් දඬුවම නිම කිරීම හා නිදහසින් පසු නැවත සමාජගත වීමේ පහසුව නිසා සිය රටවලට පිටුවහල් කරනු දැකීමට වඩා කැමැත්තෙන් සිටිති. කෙසේ වෙතත්, පිටුවහල් කිරීමේ ක්‍රමවේදය අතිශයින් නිලධාරිවාදී වන බැවින් පවතින දේශපාලනික වාතාවරණය අනුව ප්‍රමාදයන් හා බාධාවන් ඇති වීමේ ප්‍රවණතාවක් පවතී.

18. කාන්තාවන්

බන්ධනාගාරවල කාන්තා ජනගහනය සැලකිය යුතු තරම් පහළ මට්ටමක පවතී. ඔවුනට පුරුෂ රැඳවියන් හා සමාන මට්ටමේ විශෝධන සේවාවන් නොසැපයීමට හේතුව ද එය විය හැකි ය. සිරගත ව සිටින කාලය තුළ කාන්තාවන්ට ලිංගිකත්වය මත පදනම් වූ ගැටලු ද පැනනඟින අතර එය ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානයට යොමු විය යුතු ය.

බන්ධනාගාරගත ව සිටින කාන්තාවන්ට පුනරුත්ථාපන අවස්ථා හිමිවනුයේ අවම වශයෙනි. ඔවුනට වඩුවීම හා කෘෂිකර්මය වැනි කර්මාන්තමය වැඩ සඳහා සහභාගි වීමට හෝ වැඩ සඳහා බැහැර යාමේ ක්‍රමවේදයට ඇතුළු වීමට ද අවස්ථාවක් නොමැත. ඒ වෙනුවට මූලික වශයෙන් ඔවුනට ලැබෙන්නේ ඇඳුම් මැසීම හා පරිශ්‍රයේ පිරිසිදු බව රැක ගැනීම පිළිබඳ කාර්යයන් ය. යම් හෙයකින් කාන්තාවන් හට විවිධ පරාසවල පැතිරුණු වැඩවල නිරත වෙමින් වෘත්තීය පුහුණුව ලැබීමේ අවස්ථාවක් හිමි වූයේ නම් නිදහස ලැබීමෙන් පසු ව වඩාත් හොඳ රැකියා අවස්ථා උත්පාදනය වනු ඇත.

බාහිර සංවිධානයකින් පරිත්‍යාගයක් කළහොත් මිසක බන්ධනාගාරය මඟින් බෙදාහැරීමක් නොකෙරෙන බැවින් තමන්ට ප්‍රමාණවත් තරම් සනීපාරක්ෂක තුවා නොලැබෙන බවට ද කාන්තා රැඳවියෝ පැමිණිලි කළහ.

රිමාන්ඩ් භාරයේ සිටින කාන්තාවන්ට පවුලේ සාමාජිකයන් හමු වන අවස්ථාවල දී මෙම සනීපාරක්ෂක තුවා සපයා ගත හැකි වුව ද සිර දඬුවම් විඳින කාන්තාවන් හා විදෙස් කාන්තාවන් හට ඒවා ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් සනීපාරක්ෂක ද්‍රව්‍ය සපයාගත හැකි වෙනත් රැඳවියන්ගේ පිඟන් හා ඇඳුම් සේදීම වැනි කාර්යයන්හි යෙදීමට සිදු වේ.

බොහෝ බන්ධනාගාරවල කාන්තා අංශයන්හි බන්ධනාගාර රෝහල් නොමැති බැවින් හා වෛද්‍යවරුන් කාන්තා අංශ කරා පැමිණෙන්නේ නිශ්චිත දින හා කාලවල පමණක් බැවින් ද ඉන් පිටස්තර වේලාවල දී ඔවුන් සම්බන්ධ කර ගත නොහැකි බැවින් ද තමන්ට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් නොලැබෙන බවට ඔවුහු පැමිණිලි කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස රාත්‍රී කාලයේ දී වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ හැකියාව ඉතා සීමිත වන අතර මෙම කාන්තාවන්ට නැවතත් වෛද්‍යවරයා පැමිණෙන තුරු රෝගයෙන් පීඩා විඳිමින් සිටීමට සිදු වේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අනුව කාන්තා සෞඛ්‍ය සේවක අයදුම් පත්‍ර අතළොස්සක් පමණක් ලැබෙන බැවින් බන්ධනාගාර සෞඛ්‍ය පද්ධතියේ කාන්තා සෞඛ්‍ය සේවක හිඟයක් ද පවතී. මෙයට හේතුව කාන්තාවන් බන්ධනාගාරයක සේවය කිරීමට ඇති අකමැත්ත විය හැකි ය.

මව්වරුන්ට තම වයස අවුරුදු 5ට අඩු දරුවන් ඔවුන් සමඟ බන්ධනාගාරය තුළ රඳවා ගැනීමට අවසර ලැබේ. කෙසේ වෙතත්, මෙම දරුවන්ට සෞඛ්‍ය සම්පන්න වර්ධනයක් සඳහා අවශ්‍ය පහසුකම් වන සුදුසු පෝෂ්‍යදායී ආහාර, පෙර පාසල් පහසුකම්, සෙල්ලම් බඩු හෝ පොත්පත් වැනි දෑ හිමි නොවේ. කාර්ය සම්පාදන ගැටලු හේතුවෙන් මෙම දරුවන් ළමා රෝග පිළිබඳ වෛද්‍යවරුන් වෙත වරින් වර ගෙන යාමේ අවස්ථා ද අහිමි වේ.

19. ආබාධ සහිත සිරකරුවන්

බන්ධනාගාර පද්ධතිය තුළ දක්නට ලැබෙන වඩාත් අවදානමට හා අවාසිදායක තත්ත්වයනට මුහුණ දෙන කණ්ඩායම්වලින් එකක් වන්නේ ආබාධ සහිත සිරකරුවන් ය. ඊට මූලික හේතුව ආබාධ සහිත වූවන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් බන්ධනාගාර තුළ නොපැවතීම යි. රෝගාබාධ හා සංචලනයේ අපහසුතා නිසා වයස්ගත සිරකරුවන් ද ආබාධිත සිරකරුවන් හා සමාන ව ම ගැටලුවලට මුහුණ දෙන බව කොමිසමට නිරීක්ෂණය කළ හැකි විය.

බන්ධනාගාර රෝහල්වල හා වාට්ටුවල අබලන් වූ හා අත්වාරු රහිත පියගැට පෙළ බහුල ව දැකගත හැකි ය. ශරීරයේ පහළ කොටසෙහි ආබාධ සහිත සිරකරුවෝ දිනපතා ඉතාමත් මූලික කාර්යයන් වන වැසිකිළි භාවිතය වැනි කටයුතුවල දී තමන් මුහුණදෙන අපහසුතා පිළිබඳ පැමිණිලි කළහ. එයට හේතුව බොහෝ බන්ධනාගාරවල ඇත්තේ මුත්‍ර කුටි හා උක්කුටිකයෙන් වාඩි වී භාවිත කළ යුතු වැසිකිළි පමණක් වීම යි. මෙවන් සිරකරුවන් හට සිය මූලික අවශ්‍යතාවන් ඉටුකර ගැනීම සඳහා මුළුමනින් ම තම වාට්ටුවල සාමාජිකයන්ගේ හොඳ හිත මත යැපීමට සිදු වේ.

දරාගත නොහැකි බන්ධනාගාර සෞඛ්‍ය සේවා පද්ධති වියදම් හේතුවෙන් කාලානුරූප ව වයස්ගත සිරකරුවන් තුළ මතු වන රෝගාබාධ සඳහා සුදුසු වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම ඉතා අසීරු කටයුත්තක් බවට පත් ව තිබේ. සාමාන්‍යයෙන් බන්ධනාගාරයට රෝද පුටු, කෘතිම පාද හා සුදු සැරයටි වැනි ආබාධිත සහාය උපකරණ රැඳවියන්ට සැපයීමට නොහැකි ය. ඒවා හිමි වන්නේ විවිධ පරිත්‍යාගයන් තුළින් ම පමණි.

රැඳවියකුගේ කායික හා මානසික දුබලතා හේතුවෙන් සානුකම්පිත හේතු මත සමාව ලබා දීමේ කාර්යය සිදු කරන වෛද්‍ය සභාව රැස් වන්නේ කලාතුරකින් බව කොමිසම වෙත දන්වා සිටින ලදී. මේ ක්‍රමවේදයේ දී අදාළ රැඳවියා වෙනුවෙන් ඉදිරිපත් කරන ඉල්ලීම සෞඛ්‍ය අමාත්‍යංශයට යොමු කිරීමෙන් පසු ව ඔහුගේ හෝ ඇයගේ තත්ත්වය මත ඊට අදාළ විශේෂඥයකුගෙන් සමන්විත වෛද්‍ය සභාව රැස් කෙරේ. මේ වන විට මෙම වෛද්‍ය සභාව රැස් නොවීමට හේතු වී ඇත්තේ එසේ රැස් වීමට ඒකක තුනක් අතර සිදු විය යුතු සම්බන්ධීකරණ හා සහාය කටයුතු හේතුවෙනි. එම ඒකක වන්නේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව,

අධිකරණ අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය යි. උදාහරණ ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් වෛද්‍ය සභාව රැස් කිරීම සඳහා ඔවුන් අනුගමනය කළ යුතු එකිනෙකට වෙනස් ක්‍රමවේදයන් දෙකක් පිළිබඳ ව කොමිසමට කරුණු දැක්වූයේ ඒ සම්බන්ධ පැහැදිලි ක්‍රියා පටිපාටියක් නොමැති බව පෙන්වා දෙමිනි. පරස්පර විරෝධී රාජකාරි හා අසාර්ථක සන්නිවේදනය හේතුවෙන් නැවත නැවතත් ඉල්ලීම් සිදු කළ ද සුදුසුකම් සහිත රැඳවියන් විශේෂඥයන්ගෙන් හෙබි සභාවක් වෙත ඉදිරිපත් කිරීම සිදු නොවේ.

IV කොටස : බන්ධනාගාර කළමනාකරණය

20. බන්ධනාගාර පරිපාලනය මුහුණ දෙන අභියෝග

දිවයින පුරා ඇති සියලු බන්ධනාගාරවල පරිපාලකයන් විසින් දෛනික රාජකාරි, රැඳවියන්ට සැපයිය යුතු සේවා හා බන්ධාගාර නිලධාරීන්ගේ ශුභසාධනය කෙරෙහි උග්‍ර ලෙස බලපාන බරපතල සේවක හිඟය පිළිබඳ ව පැමිණිලි කරන ලදී.

කාලානුරූප ව සිරකරුවන්ගේ ප්‍රමාණය ඉහළ ගිය ද නිලධාරී සේවක සංයුතිය ඊට අනුරූප ව සංශෝධනය වීමක් සිදු නොවී ය. එහි ප්‍රතිඵලයක් ලෙස රැඳවියන්ට සාපේක්ෂ ව නිලධාරීන්ගේ අනුපාතය ඉතා පහළ මට්ටමක පවතී. සේවක හිඟය හේතුවෙන් තනි නිලධාරියකුට විවිධ භූමිකා නිරූපණය කිරීමට, දීර්ඝ සේවා මුරවල යෙදීමට හා එක දිගට සේවා මුර කිහිපයක් රාජකාරි කිරීමට සිදු වේ. මෙය බන්ධනාගාර කාර්යක්ෂම ලෙස පාලනයට බරපතල අන්දමින් බලපාන අතර ආරක්ෂාව පිළිබඳව ද ගැටලු මතු වේ. රැඳවියන් රෝහල්වලට මාරු කිරීම, බලපත්‍ර මණ්ඩල ක්‍රමවේදය හා රැඳවියන්ට එළිමහනේ ගත කිරීමට ඇති කාලය අවම වීම වැනි කාර්ය පටිපාටි ප්‍රමාදයන් ඇති වීමට ප්‍රධානතම හේතුව මෙය යි.

හඳුන්වාදීමේ පුහුණුවකට යටත් කෙරුණ ද සේවා කාලය තුළ නිදහස් කළ නොහැකි බැවින් බන්ධනාග ාර නිලධාරීන් වෙත ලැබෙන පුහුණුව ප්‍රමාණවත් නොවන බව ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ අදහස යි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දීර්ඝ සේවා කාලයක් හිමි, හඳුන්වාදීමේ දී ගිනි අවි පුහුණුව ලද නිලධාරියෙකුට හදිසි අවස්ථාවක දී අවශ්‍යතාවය අනුව ආරක්ෂාකාරී ව ප්‍රතිචාර දැක්විය නොහැකි වනු ඇත.

නිලධාරීන්ට හිමි වන වත්මන් වැටුප අනුව සිය පවුල් පෝෂණය කළ නොහැකි බව බන්ධනාගාර නිලධාරීහු කොමිසමට දන්වා සිටියහ. දෙපාර්තමේන්තුවට ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් හා වැටුප් සංශෝධනයක් මේ වන තෙක් සිදු කර නොමැති බැවින් බොහෝ විට නිලධාරීන්ට අතිකාල දීමනා ගෙවීම ද සිදු නොවේ. දෛනික ව රාජකාරියේ දී මුහුණ දෙන අවදානම හා ජීවිතවලට ඇති තර්ජනය ඔවුනට ලැබෙන වැටුප හා දීමනා තුළින් පෙන්නුම් නොකෙරේ. ආතතිකාරී රාජකාරි පරිසරය, දීර්ඝ සේවා මුර හා අඩු වැටුප් හේතුවෙන් බන්ධනාගාර නිලධාරීහු රැකියාව පිළිබඳ අතෘප්තිය හා දැඩි වෙහෙසින් පීඩාවට පත් ව සිටිති. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුහු බොහෝ අවස්ථාවල දී මානසික ගැටලු පිළිබඳ රෝග ලක්ෂණ පෙන්වූව ද ඊට අවශ්‍ය උපදේශනය හෝ වෛද්‍ය ප්‍රතිකාර නොලැබී යයි. නිලධාරීන්ගේ නවාතැන්, විශේෂයෙන් අවිවාහක නිලධාරී නිල නිවාසවල තත්ත්වය පිළිබඳ පැමිණිලි ද ලැබුණු අතර මෙය ද ඔවුන්ගේ සේවා අතෘප්තිය තව තවත් උත්සන්න කරවයි.

විශේෂයෙන් කාන්තා නිලධාරීහු තම රැකියාව හේතුවෙන් පවුල් ජීවිතයට ඇති වන බලපෑම පිළිබඳ ව සඳහන් කළහ. එයට හේතුව ඔවුන් සිය පවුලට ලබා දිය යුතු අවධානය හා කාලය, විශේෂයෙන් නිවෙසින් දුර බැහැර ප්‍රදේශවල සේවයට අනුයුක්ත කර ඇති විට ලබා දීමට අසමත් වීම යි. කාන්තා නිලධාරීහු සේවා ස්ථානයේ දී තමන් මුහුණ දෙන ලිංගික හිංසනයන් පිළිබඳව ද සාකච්ඡා කළ නමුත් සේවා සුරක්ෂිතතාවයට හානි පැමිණෙන පරිදි විපාකවලට මුහුණ දීමට සිදු වේය යන බිය නිසා ඒවාට පිළියම් සෙවීමට මැළිකමක් දැක්වූහ.

විවෘත හා වැඩ කඳවුරුවල සේවය කරන නිලධාරීන් සාපේක්ෂ ව යහපත් තත්ත්වයක සිටින බව කොමිසමට

නිරීක්ෂණය කළ හැකි විය. එයට හේතුව එම කඳවුරු නගරයෙන් බැහැර විවෘත පරිශ්‍රයන් තුළ පිහිටා තිබීම යි. කඳවුරු තුළ සාමාන්‍යයෙන් තදබදයක් නොමැති අතර දඬුවම් ලබන සිරකරුවන් සිටින බැවින් ඔවුනට අධිකරණ රාජකාරිවල බර පැටවීමක් ද සිදු නොවේ. බන්ධනාගාර නිලධාරීන් රැඳවියන්ට සලකන ආකාරය කෙරෙහි ඔවුන්ගේ රාජකාරි පරිසරය, පෞද්ගලික ගැටලු හා ආතතිකාරී මානසික මට්ටම තීරණාත්මක සාධකයක් වන බව ජ්‍යෙෂ්ඨ නිලධාරීහූ නැවත නැවතත් පෙන්වා දුන්හ.

V කොටස : අපරාධ යුක්ති ක්‍රමවේදය

21. අත්අඩංගුවට ගැනීම හා රඳවා තැබීම

පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාකලාපය මෙම අධ්‍යයනයේ අරමුණක් නොවුව ද සිරකරුවන් විශාල ප්‍රමාණයකගෙන් පොලිස් රැඳවුම් භාරයේ සිටිය දී ඔවුනට සිදු වූ අසාධාරණකම් පිළිබඳ පැමිණිලි ගණනාවක් කොමිසමට ලැබුණි. එම පැමිණිලි පහත දැක්වෙන පරිදි වන අතර ඒ පිළිබඳ තව දුරටත් විමර්ශනයට ලක් කළ යුතු වේ.

මේ අතරින් පැමිණිලි ගණනාවක ම ඇතුළත් වූයේ පොලිස් නිලධාරීන් අත්අඩංගුවට ගැනීම්වල දී නිසි ක්‍රමවේදය අනුගමනය නොකළ බවට වන අතර විශේෂයෙන් අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට හේතු හෝ වරෙන්තුවක් ඉදිරිපත් නොකිරීමත් පොලිස් භාරයේ සිටිය දී පවුලේ සාමාජිකයන් සමඟ හෝ නීතිඥවරුන් සමඟ සම්බන්ධ වීමට අවස්ථාව නොදීමත් මින් ප්‍රධාන වේ. තමන්ට එරෙහි ව ඉදිරිපත් කරන චෝදනා පිළිබඳ ව පළමු වරට දැනුවත් වූයේ අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ දී බව ඇතැම් රැඳවියෝ ප්‍රකාශ කළහ. මහේස්ත්‍රාත්වරයෙකුට ඉදිරිපත් කිරීමට පෙර පොලිස් රැඳවුම් භාරයේ තබා ගත හැකි උපරිම කාලය වූ පැය 24ක කාලය ඉක්මවමින් ඔවුනට රැඳවුම් භාරයේ සිටීමට සිදු වූ බවට ද රැඳවියෝ පැමිණිලි කළහ. මෙම ක්‍රියාව පොලිස් වාර්තාවල හෝ අධිකරණ ලියවිලිවල දින වෙනස් කිරීම මඟින් සිදු වූ බවට ද ඔවුහු චෝදනා කළහ.

විශාල රැඳවියන් පිරිසක් තමන්ට හිස් කඩදාසියක අත්සන් තැබීමට බල කෙරුණු බවට ද පසු ව එම කඩදාසියෙහි පොලිස් නිලධාරීන් විසින් පාපොච්චාරණයක් ලිවීම හෝ යතුරුලියනය කිරීම සිදු කළ බවට ද එහි ඇතුළත් වන තොරතුරු කිසිවක් රැඳවියන්ට දැන ගැනීමට නොහැකි වූ බවට ද පැමිණිලි කළහ. ඔවුන් පොලිසියට අවශ්‍ය පරිදි ප්‍රකාශයන් සිදු කිරීම ප්‍රතික්ෂේප කළ විට ශාරීරික ප්‍රචණ්ඩත්වය පිළිබඳ බලපෑම් හෝ තර්ජන සිදු කිරීම, රැඳවුම් භාරයේ දී ආහාර ලබා නොදීම, ඇප නියම නොකරමින් දීර්ඝ කාලයක් රැඳවුම් භාරයේ තබා ගැනීම හා ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාවට තර්ජන පැමිණ වීම ආදියට මුහුණ දීමට සිදු වූ බවට රැඳවියෝ චෝදනා කළහ.

අත්අඩංගුවට ගැනීම හා රැඳවුම් භාරයේ තැබීම සම්බන්ධයෙන් නියමිත ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම පිළිබඳ ව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගැනෙන සිරකරුවන් බොහොමයකගෙන් පැමිණිලි ලැබිණ. සම්මුඛ සාකච්ඡාවලට බඳුන් කෙරුණවුන් පැහැදිලි කළ පරිදි අවශ්‍ය ආරක්ෂක පියවර ගැනීමක් සිදු නොවුණු බව පැහැදිලි වේ. බොහෝ අවස්ථාවල දී තම නිවෙස්, රැකියා ස්ථානවල දී හෝ අතරමග දී පැහැර ගැනීමකට ලක් වූ බවත්, පවුලේ සාමාජිකයන්ට අත්අඩංගුවට ගැනීම පිළිබඳ ලියවිල්ලක් හෝ රඳවා ගැනෙන ස්ථාන පිළිබඳ කිසිදු තොරතුරක් හෝ ලබා නොදුන් බවත්, අවසර නොලත් ස්ථානවල ඔවුන් රඳවා ගැනුණු බව හා වධ හිංසනයට ලක් කරමින් තමන් නොදන්නා භාෂාවකින් ලියවුණු පපොච්චාරණයන්ට අත්සන් තැබීමට බල කෙරුණු බවත් ඔවුහු ප්‍රකාශ කළහ. අත්අඩංගුවට පත් වීමෙන් පසු දින, සති හෝ ඇතැම් විට මාස ගණනාවක් පුරා පවුල හෝ නීතිඥවරුන් සමඟ සම්බන්ධ වීමට ඔවුනට අවසර ලබා නොදුන් අතර ඇතැම් අවස්ථාවල දී අත්අඩංගුවට ගැනීමෙන් මාස ගණනක් යන තුරු එසේ අත්අඩංගුවට ගත් බව පවුලට දැනුම් දීමක් පවා සිදු කර නොමැත. රැඳවියාගේ ශුබසාධනය පිළිබඳ නීතිමය නියාමනයකින් තොර ව මෙසේ දීර්ඝකාලීන ව හුදකලා රැඳවුම් භාරයේ තැබීම හරහා කායික පීඩනය හේතුවෙන් පාපොච්චාරණ ලබා දෙන තත්ත්වයට ඔවුහු පත්වෙති. නීතිමය වශයෙන් පනවා ඇති මාර්ගෝපදේශ හා ආරක්ෂණ නියාමන තිබිය දී පවා අත්අඩංගුවට ගැනීමේ බලධාරීන් පිළිබඳ

නියාමනයක් හෝ වගවීමේ යාන්ත්‍රණයක් නොමැති කල්හි හා කාර්යක්ෂම අධිකරණමය නියාමනයක් නොමැති කල්හි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනෙන වුන්ගේ ශුබසාධනය පිළිබඳ අපට බලාපොරොත්තු තැබිය නොහැකි ය.

කාන්තාවන් අත්අඩංගුවට ගැනීමේ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රවණතා කිහිපයක් දැකිය හැකි ය. අත්අඩංගුවට ගැනෙන හෝ පොලිසිය වෙත ප්‍රවාහනය සිදු වන අවස්ථාවේ දී එහි කාන්තා පොලිස් කොස්තාපල්වරියන් නොවූ බවට බොහෝ විට පැමිණිලි ලැබේ. එමෙන් ම කාන්තාවන් රාත්‍රිය පහන් වන තුරු පොලිස් ස්ථානයේ රඳවා තැබෙන අවස්ථාවල ද එහි පොලිස් කොස්තාපල්වරියන් නොවූ බවට ද චෝදනා ඉදිරිපත් කෙරේ. අත්අඩංගුවට ගැනීම් අතරතුර මත්ද්‍රව්‍ය පිළිබඳ සෝදිසියේ දී කාන්තා පොලිස් කොස්තාපල්වරියන් ආක්‍රමණකාරී ලෙස සිය ශරීර ස්පර්ශ කළ බවට කාන්තාවන් ගණනාවක් පැමිණිලි ඉදිරිපත් කළහ. එමෙන් ම තමන් පොලිස් නිලධාරීන් අතින් ලිංගික අතවරයට ලක් වූ බවට ද කාන්තා රැඳවියන් ගණනාවක් විසින් චෝදනා ඉදිරිපත් කරනු ලැබිණ. මෙවන් චෝදනා මඟින් පොලිස් භාරයේ සිටිය දී කාන්තාවන් මුහුණ දෙන අවදානම් සහගත තත්ත්වය පිළිබඳ ව මනාව හෙළිදරව් කෙරෙන අතර ඔවුනගේ පෞද්ගලික ආරක්ෂාව හා ආත්මාභිමානය සුරක්ෂිත කිරීමට ආරක්ෂක පියවර ගැනීමෙහි වැදගත්කම ද පෙන්වා දෙයි.

වර්තමානයේ දී මෙවන් ප්‍රකාශන හුදු චෝදනාවන් ලෙස පමණක් පවතිද්දී රට පුරා පොලිස් ක්‍රියාකලාපය පිළිබඳ ව ලැබෙන පැමිණිලිවල රටාවන් හා ප්‍රවණතා, විශේෂයෙන් අත්අඩංගුවට ගැනීම හා රඳවා තැබීමේ ක්‍රියාදාමය තුළ අන්තර්ගත වෙතැයි ප්‍රකාශ වන ප්‍රචණ්ඩත්වය අපට නොසලකා හැරිය නොහැකි අතර ඒ සම්බන්ධ බරපතල විමර්ශනයක් සිදු කළ යුතු ය. තර්ජනයනට යටත් ව ලබා ගන්නා පාපොච්චාරණයන් මඟින් අපරාධ යුක්ති ක්‍රියාදාමය හා සිරගත කිරීම තුළ විකෘතීන් ඇති කළ හැකි බැවින් ඵලදායි ලෙස අපරාධ මර්දනය කිරීමක් ඒ හරහා සිදු නොවේ. එයට අමතර ව රැඳවියන් හට පොලිස් නිලධාරීන්ට එරෙහි ව පැමිණිලි ඉදිරිපත් කිරීමේ හා බන්ධනාගාරගත ව සිටිය දී එම පැමිණිලි පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ද තිබිය යුතු ය.

22. නීති සහාය ලබා ගැනීමේ හැකියාව

දිළිඳු සමාජ පසුබිම්වලින් පැමිණෙන පුද්ගලයන් සම්බන්ධයෙන් පවතින එක් දුක්ගැනවිල්ලක් වන්නේ ඵලදායි නීතිමය නියෝජනයක් ලබා ගැනීමේ නොහැකියාව යි. ඔවුනට මෙම නීති සහාය ලබා ගැනීම සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීමට බොහෝ විට තම දේපළ පවා විකුණමින් සිය ජීවනෝපාය අනතුරේ හෙළමින් බලවත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වේ. ප්‍රමාණවත් සාක්ෂරතාවයක් නොමැති බැවින් නීතිමය ක්‍රියාදාමය වටහා ගැනීමට අපොහොසත් වන පුද්ගලයන් හට තම නීතිඥවරයා පිළිබඳ ව විශ්වාසය තැබිය නොහැකි ය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුනට තමන් වෙනුවෙන් කරුණු දැක්වීමේ අවස්ථාව අවම කෙරෙන අතර එවන් පුද්ගලයෝ වංචනික නීතිඥයන්ගේ ග්‍රහණයට ගොදුරු වෙති.

ශ්‍රී ලාංකික අධිකරණ පද්ධතියේ ස්වභාවය අනුව වසර 20ක පමණ කාලයක් දක්වා දිග්ගැස්සිය හැකි නඩු විභාගයන් හේතුවෙන් තව දුරටත් නීතිමය වියදම් දැරිය නොහැකි පුද්ගලයන් ද කොමිසමට හමු විය. ඒ හේතුවෙන් ඔවුනට රජයෙන් පත් කෙරෙන නීතිඥවරුන් මත යැපීමට සිදු වේ. රජයෙන් පත් කෙරෙන නීතිඥවරුන් සිය වගකීම බරපතල කොට නොසලකන බවටත් රිමාන්ඩ් රැඳවියන් සමඟ සාකච්ඡා කිරීම සඳහා බන්ධනාගාර වෙත යාම හෝ නඩු විභාගයට පෙර මිනිත්තු කිහිපයකට වඩා රැඳවියා සමඟ කතා නොකරන බවටත් සාමාන්‍ය මතවාදයක් පවතී. චූදිතයන් සමඟ කිසිදු සන්නිවේදනයක් නොමැති තරම් වන බැවින් ඔවුනට ප්‍රබල විත්තිවාචකයක් සකස් කිරීමට හැකියාවක් පවතී ද යන්න මහත් ගැටලුවකි. නඩු විභාගයේ දී නැගී සිට කතා නොකිරීම හා හරස් ප්‍රශ්න නොවිමසීම පිළිබඳ සිරකරුවන් බොහෝ විට පැමිණිලි කරන්නේ මේ නිසා විය හැකි ය. විත්තිකරුට ලැබෙන තීන්දුව කෙරෙහි ඔහුට හෝ ඇයට ලැබෙන නීතිඥ සහාය ඍජු බලපෑමක් ඇති කරන හෙයින් පහළ සමාජආර්ථික පසුබිම් සහිත චූදිතයන් හට වඩාත් බරපතල තීන්දු ලැබීම කෙරෙහි ඔවුන්ගේ සදොස් බවට වඩා ඔවුන්ගේ ආර්ථික තත්ත්වය බලපාන

බව පෙනේ. මෙයින් සිදු වන්නේ අපරාධ අධිකරණ පද්ධතියේ අවංකභාවය හා අභිප්‍රාය අවප්‍රමාණ වීම යි.

නීතිඥවරුන් හා රජයේ නීති පාර්ශ්වයන් අධිකරණයේ පෙනී සිටීම නඩු විභාගයේ දීර්ඝතාව කෙරෙහි ඍජු ව බලපායි. යම් නීතිඥවරයෙකු අධිකරණයේ පෙනී නොසිටි කල එම නඩුව වෙනත් දිනයකට කල් දැමේ. අභියාචනා විභාගවල දී මෙම දිනය 6 මසකට හෝ වසරකට පසු දිනයක් විය හැකි අතර එම මුළු කාලයම රැඳවියා බන්ධනාගාරයේ ගත කළ යුතු ය. විවිධ අසීරුතා මධ්‍යයේ නීතිඥවරුන් සඳහා මුදල් සොයා ගන්නා අවස්ථාවල මෙසේ නීතිඥවරුන් අධිකරණයට නොපැමිණෙන තත්ත්වය වැඩි වශයෙන් දක්නට ලැබේ. එමෙන් ම රැඳවියෙකු අධිකරණය වෙත ප්‍රවාහනය කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම සේවක හිඟයක් සහිත බන්ධනාගාර දෙපාර්තමේන්තුවට මෙන් ම බඳු ගෙවන්නන්ට ද මහත් බරක් වන්නේ ඔවුන් රැගෙන යාමට නිලධාරීන් හා බස් රථ වෙන් කළ යුතු වන බැවිනි. ඇතැම් අවස්ථාවල බන්ධනාගාරය පිහිටි නගරයෙන් බැහැර අධිකරණ පිහිටන බැවින් ඔවුනට විශාල දුර ප්‍රමාණයක් හා කාලයක් ද ඒ වෙනුවෙන් ගෙවීමට සිදු වේ. අදාළ පුද්ගලයා අධිකරණයට රැගෙන ඒමෙන් පසු ඔහුගේ නීතිඥවරයා හෝ රජයේ නීතිඥවරයා පැමිණ නොසිටියහොත් ඉන් සිදු වන්නේ විශාල මහජන මුදල් නාස්තියකි.

නීති ආධාර කොමිසම රිමාන්ඩ් බන්ධනාගාරගත රැඳවියන් හට ඇප ලබා ගැනීමට හා ඇප කොන්දේසි අඩු කිරීමට අවශ්‍ය නීතිමය සහාය ලබා දීමේ උත්සාහයන් ගත්ත ද ක්‍රමානුකූල ව බන්ධනාගාර තුළ නීති සායනයන් පැවැත්වීමට, නීති උපදෙස් ලබා දීමට හා ප්‍රාදේශීය බන්ධනාගාරවල සිටින රිමාන්ඩ් රැඳවියන්ට උපකාර කිරීමට ප්‍රමාණවත් තරම් මුදල් ප්‍රතිපාදන තමන්ට නොලැබෙන බව ඔවුහු ප්‍රකාශ කරති. එපමණක් නොව බරපතල අපරාධ පිළිබඳ චෝදනා ලැබූවන්ගේ නඩු විභාග වසර ගණනාවක් පුරා පැවැත්වෙන බැවින් එවන් පුද්ගලයන්ට නීතිමය සහාය ලබා දීමට ද මෙම කොමිසමට හැකියාවක් නොමැත. වර්තමාන කොමිසමෙහි ප්‍රතිපත්තියක් ලෙස මත්ද්‍රව්‍ය පිළිබඳ චෝදනාවලට අත්අඩංගුවට පත් චූදිතයන් හට ඔවුන්ගේ සහාය ලබා නොදේ.

23. නීතිමය හා අධිකරණමය ක්‍රියාවලීන්

බන්ධනාගාර තුළ සිටින නඩු විභාග මෙතෙක් නොපැවැත් වූ රැඳවියන්ගේ අධික ප්‍රමාණයෙන් පෙනී යන්නේ අපරාධ අධිකරණ ක්‍රමවේදයේ දුර්වලතාවය යි. එහි දී යම් අපරාධයකට දඬුවම් නියම නොවූ පුද්ගලයන් ඔවුන්ගේ නඩු විභාගය අවසන් කෙරෙන තෙක් දීර්ඝ කාලයක් සිරගත කර තැබේ.

මෙසේ රිමාන්ඩ් භාරයේ දිගුකාලීන ව රැඳී සිටීමට එක හේතුවක් වන්නේ ඉතා දැඩි ඇප කොන්දේසීන් ය. ඇප ලැබීමට සුදුසුකම් සහිත වුව ද ඔවුන් මත පැනවෙන දැඩි ඇප කොන්දේසි හේතුවෙන් බන්ධනාග ාරගත ව සිටින රැඳවියන් බොහොමයක් කොමිසමට හමු විය. ඇප කොන්දේසි සපුරා ගත නොහැකි රැඳවියන් හට එම කොන්දේසි වෙනස් කරන ලෙස ඉල්ලමින් තමන් වෙනුවෙන් මෝසමක් ගොනු කිරීම සඳහා නීතිඥවරයෙකු බන්ධනාගාරය තුළ සිට සම්බන්ධ කර ගැනීමේ අවස්ථාව ද ඇත්තේ ඉතා අල්ප වශයෙනි. විශේෂයෙන් තම පවුල්වලට සමීපයෙන් රඳවා නොමැති පුද්ගලයන් හා විදේශිකයන් තමන් වෙනුවෙන් ඉදිරිපත් වීමට නීතිඥවරයෙකු සම්බන්ධ කර ගැනීමට නොහැකි වීම නිසා අතිශයින් අසරණ තත්ත්වයකට පත් වෙති.

ඇප ඉල්ලුම් කිරීමට හෝ ඇප කොන්දේසි වෙනස් කිරීමට නීතිමය සහයක් නොමැති ව ඇප ලැබීමට සුදුසුකම් ලද්දවුන් පවා බන්ධනාගාරගත ව සිටිති. එබැවින් ඇප ප්‍රතික්ෂේප කිරීම හා සපුරා ගත නොහැකි මට්ටමේ ඇප කොන්දේසි පැනවීම බන්ධනාගාරවල තදබදය ඉහළ යාමට ඍජු බලපෑමක් ඇති කරයි. එමෙන් ම බරපතල අපරාධ පිළිබඳ වාර්තා සහිත පුද්ගලයන්ට සුළු වරද සහිත පුද්ගලයන් නිරාවරණය කෙරෙන ලෙසින් මෙසේ සුළු වරද සහිත පුද්ගලයන් බන්ධනාගාරගත කිරීම පිළිබඳව ද සියුම් පරීක්ෂාවක් අවශ්‍ය වේ. මෙම අවදානම අවම කර ගැනීම සඳහා බන්ධනාගාරගත කිරීමෙන් තොර ව ගත හැකි වෙනත් විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ව ගවේෂණය කළ යුතු ය.

මහේස්ත්‍රාත් අධිකරණයක් මඟින් ඇප ප්‍රතික්ෂේප කිරීම හෝ රැඳවුම් නියෝග දීර්ඝ කිරීම සඳහා අදාළ පුද්ගලයා තවදුරටත් බන්ධනාගාරගත කළ යුතු ද යන්න පිළිබඳ ව විනිසුරුවරයෙකු විසින් ප්‍රමාණාත්මක විමර්ශනයක් හා සමාලෝචනයක් කළ යුතු ය. කෙසේ වෙතත්, ඇප ප්‍රතික්ෂේප කිරීමට හෝ රැඳවුම් නියෝග දීර්ඝ කිරීමට පෙර තමන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලැබෙන බව බොහෝ රැඳවියෝ කොමිසමට දන්වා සිටියහ. තමන් අධිකරණයේ දී කතා කිරීමට ගත් උත්සාහයන් මහේස්ත්‍රාත්වරයා විසින් නොසලකා හැරි බවට බොහෝ දෙනා පැමිණිලි කළහ. නඩු විභාගයට පෙර දීර්ඝ කාලීන ව රඳවා තැබීම සම්බන්ධ ව ස්වාධීන හා අපක්ෂපාතී අධ්‍යයනයක් සිදු නොකිරීම නිසා එසේ රඳවා තැබීමේ තීරණය ගැනීම පිළිබඳ සත්‍ය වශයෙන් ම තීරකයන් ලෙස බොහෝ විට ක්‍රියා කරනුයේ පැමිණිලි පාර්ශ්වය හෝ පොලිසිය යි.

මිල අධික නීති සේවාවන් ලබා ගත නොහැකි හෝ ප්‍රමාණවත් ලෙස නීතිමය ක්‍රියාදාමය අවබෝධ කර ගැනීමට නොහැකි පුද්ගලයන් ඔවුන්ගේ නිදහස පිළිබඳ තීරණ ගැනීමේ දී හුදු ප්‍රේක්ෂකයකුගේ තත්ත්වයට ඇද වැටේ. තමන්ට එරෙහි චෝදනා වටහා ගැනීමට හෝ අධිකරණයේ සිදු වන දේ අවබෝධ කර ගැනීමට නොහැකි පුද්ගලයන් හට ප්‍රමාණවත් විත්තිවාචකයක් සුදානම් කර ගත නොහැකි ය. එපමණක් නොව තමන් නීතිඥවරයාගේ වංචාවන්ට හා දුශ්ක්‍රියාවලට ගොදුරු නොවෙමින් එම නීතිඥවරයා වගකීමෙන් බැඳ තැබීමට ද මෙම පුද්ගලයෝ අසමත් වෙති. නඩු විභාගයේ දී නෛතික ව්‍යවහාරයන් අවබෝධ නොවන හා අදාළ පළාතේ භාෂාව කතා නොකරන පුද්ගලයන් හට එම නඩු විභාග තේරුම් ගත නොහැකි වනු ඇත. මේ සඳහා භාෂා පරිවර්තකයෙකු ඉල්ලුම් කිරීම මඟින් බලවත් විත්තිවාචකයක් සුදානම් කිරීමේ චූදිතයාගේ හැකියාව වර්ධනය කරනු වෙනුවට නඩු විභාගයන් වසර ගණනාවකට කල් යාමට හේතු වේ.

ඉහත සඳහන් කළ කරුණු සියල්ලෙහි ම එකතුවෙන් සමාජයේ අඩු ආදායම් ලබන ස්ථරයට අයත් පුද්ගලයන් හට ඔවුනට හිමි අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය පැහැර ගනු ලබයි. අනවශ්‍ය ප්‍රමාදයන්ගෙන් තොර ව නඩු විභාගයක් ලැබීමේ හිමිකම වෙනුවට දීර්ඝ කාලීන නඩු විභාගයන්ට මුහුණ දීමට ඔවුනට සිදු වේ. එම මුළු කාලයම බොහෝ පුද්ගලයෝ බන්ධනාගාරගත ව සිටිති. මෙසේ නඩු විභාග කල් යාම කෙරෙහි නීතිපති දෙපාර්තමේන්තුවේ හෝ විශේෂයෙන් මත්ද්‍රව්‍ය සම්බන්ද නඩුවල දී රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ පරිපාලනමය ප්‍රමාදයන් හේතු වන බව කොමිසමට නිරීක්ෂණය කළ හැකි විය. ඒ අනුව මෙම පුද්ගල නිදහස අහිමි කිරීම රාජ්‍ය ආයතනවල අකාර්යක්ෂමතාවය හේතුවෙන් සිදු වන බව පැහැදිලි ය. එහි වගකීම ඔවුන් දැරිය යුතු ය. නිශ්චිත දඬුවම් කාලයක් ලැබීම අනියත රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීමකට වඩා යහපත් ලෙස සිතා මෙවන් දීර්ඝ නඩු විභාගවල දී හුදෙක් ම එය අවසන් කිරීම සඳහා චූදිතයන් සිය වරද පිළිගත් අවස්ථා පවා වාර්තා වේ.

දඩ මුදල් ගෙවීමට අපොහොසත් වීම, ණය මුදල් නොගෙවීම හා නඩත්තු මුදල් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් සිරගත ව සිටින රැඳවියන් බන්ධනාගාරවල තදබදය උත්සන්න වීමට තවත් හේතුවකි. බන්ධනාගාරගත කිරීමෙන් තොර ව යම් ආදායමක් උපයමින් සිය ණය ගෙවිය හැකි විකල්ප ක්‍රියා මාර්ග ගැනීම වෙනුවට එවන් පුද්ගලයන් සිරගත කිරීමෙන් පෙනී යන්නේ, දිළිඳු පුද්ගලයන් ඔවුන්ගේ දරිද්‍රතාවය හේතුවෙන් විසමානුපාතික ලෙස බන්ධනාගාරගත කෙරෙන බව යි.

බන්ධනාගාරවල සිට අධිකරණය දක්වා ප්‍රවාහනය කිරීමේ දී විශාල රැඳවියන් ප්‍රමාණයක් එක ම බස් රථයක ප්‍රවාහනය කිරීම හේතුවෙන් දිගු ගමන්වල දී පවා ඇතැම් විට වයස්ගත රැඳවියන්ට ද අසුනක් හිමි නොවන බවට ඔවුහු කොමිසමට පැමිණිලි කළහ. කොළඹින් බැහැර ප්‍රදේශවල සිට අභියාචනා විභාග සඳහා රැගෙන ඒමේ දී රැඳවියන්ට ආහාර පාන ලබා නොදෙන බවටත්, මාංචු දමා සිටිය දී ම පොලිතින් බෑග්වලට ශරීර කෘත්‍ය කිරීමට සිදු වන බවත් ඔවුහු තවදුරටත් චෝදනා කළහ. බන්ධනාගාර සතු ව ඇති රථවාහන හා නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් මෙසේ සිරකරුවන් ප්‍රවාහනය කිරීමට තමන්ට සිදු වන බව බන්ධනාගාර පරිපාලකයෝ කොමිසමට කරුණු දැක්වූහ.

මහේස්ත්‍රාත් අධිකරණයේ දී මෙම රිමාන්ඩ් රැඳවියන් මහේස්ත්‍රාත් අධිකරණ සිරකුටි තුළ රඳවා තැබේ. එහි

දී ඔවුනට දවස පුරා සිටගෙන සිටීමට සිදු වන අතර ඇතැම් විට දිවා ආහාර වේලක් ලැබුණ ද වැසිකිළි පහසුකම් නොලැබේ.

VI කොටස : ප්‍රචණ්ඩත්වයේ අඛණ්ඩතාවය

24. ප්‍රචණ්ඩත්වයේ අඛණ්ඩතාවය

ප්‍රචණ්ඩත්වය යනු, අපරාධ යුක්ති ක්‍රමවේදය තුළට කිඳා බැස ගිය ලක්ෂණයක් වන බව කොමිසමට දැක ගත හැකි විය. අත්අඩංගුවට ගැනුණු පුද්ගලයන් පොලිස් භාරයේ දී, රිමාන්ඩ් භාරයේ දී හා සිරගත ව සිටින අතරතුර ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම එහි පොදු අංගයකි. පොලිස් භාරයේ දී වධ හිංසාවට ලක් කිරීම විමර්ශන ක්‍රියාවලියේ අනිවාර්ය අංගයක් බවට පත් ව ඇත. රැඳවියන්ගෙන් සාක්ෂි, තොරතුරු හා පාපොච්චාරණ ලබා ගැනීමට මෙසේ ප්‍රචණ්ඩත්වය භාවිත කෙරේ. බන්ධනාගාර තුළ සිදු කෙරෙන ප්‍රචණ්ඩ ක්‍රියාවලට ශාරීරික හා වාචික හිංසනයන් මෙන් ම රැඳවියන්ගේ පෞද්ගලික අභිමානය කෙරෙහි කිසිදු තැකීමකින් තොර ව සිදු කෙරෙන ආක්‍රමණික ශරීර සෝදිසි කිරීම් ද අයත් වේ. මෙවැනි ක්‍රියාවල යෙදෙන්නවුන් හට බොහෝ විට කිසිදු දඬුවමක් නොලැබෙන බැවින් මෙම ප්‍රචණ්ඩකාරී චක්‍රයේ බිඳීමක් හෝ නැවතීමක් කිසි දිනෙක සිදු නොවේ. මෙයට හේතුව ඔවුන් සිදු කළ අපරාධවල ස්වභාවය හේතුවෙන් රජය හා සමාජය තුළ සිරකරුවන් පිළිබඳ ව ගොඩනැඟී ඇති අප්‍රසන්න හැඟීම විය හැකි ය. ඔවුනට මුහුණ දීමට සිදු වන ප්‍රචණ්ඩත්වය පිළිබඳ ව සමාජය වෙතින් විරෝධයක් පැන නොනැගෙන්නේ එබැවිනි. බන්ධනාගාර තුළ සාමය පවත්වා ගැනීමේ මූලික ක්‍රමවේදය ප්‍රචණ්ඩත්වය ලෙස සැලකෙන බැවින් රැඳවියන් යටත් කර ගැනීමට හා ඕනෑ ම විරෝධය දැක්වීමකට දඬුවම් ලබා දීමට මෙන් ම සිය බලය තහවුරු කිරීම සඳහා බන්ධනාගාර නිලධාරීහු මෙසේ ක්‍රියා කරති. ප්‍රධාන වශයෙන් මෙසේ හිංසනයට බඳුන් වන්නේ බලාධිකාරයට එරෙහි ව නැගී සිටිය නොහැකි එමෙන් ම ඔවුනට සිදු වන අසාධාරණයට එරෙහි ව පොදු මතයක් ගොඩ නොනැගෙන පහළ සමාජආර්ථික මට්ටමේ කණ්ඩායම්වලට එරෙහි ව බව නිරීක්ෂණය කළ හැකි ය.

සමස්ත බන්ධනාගාර පද්ධතියෙහි ම ප්‍රතිසංස්කරණය එහි මානසිකත්වය විපාක ඵලය පිළිබඳ සාධකයෙන් වෙනස් ව පුනරුත්ථාපනය හා විශෝධනය කෙරෙහි කේන්ද්‍රගත වීම හා දේශපාලනික ප්‍රවණතා මත සම්පත් බෙදා හැරීම මත රඳා පවතී. බන්ධනාගාර නිලධාරීන්ට ප්‍රචණ්ඩ නොවන ක්‍රම මඟින් සිරකරුවන් පාලනය හා සාමය පවත්වා ගැනීම මෙන් ම මානව හිමිකම් පිළිබඳ පුහුණුව ලබා දීම අත්‍යවශ්‍ය වේ. ඒ හරහා විශෝධන සේවා/කාර්යයන් සම්පාදනය පිළිබඳ අවබෝධය හා හැකියාව ඔවුන් තුළ වර්ධනය කළ යුතු ය.

VII කොටස : සිරගත විකල්ප

25. තීන්දු ලබා දීමේ පියවරේ දී ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග

සිරගත කිරීම වෙනුවට වෙනත් පියවර කරා යොමු වීම දණ්ඩනීය ප්‍රවේශයෙන් විතැන් ව පුනරුත්ථාපන හා ප්‍රතිසංස්ථාපනික ප්‍රතිපත්ති සම්පාදනයෙහි එක් පියවරකි. ඒ හරහා බන්ධනාගාර පද්ධතිය මුහුණ දෙන තදබදය හා ඒ සම්බන්ධ ගැටලුවලට ද පිළියම් යෙදිය හැකි ය. දේශීය නෛතික රාමුව තුළ සිරගත කිරීමෙන් තොර ව ගත හැකි පියවර ප්‍රධාන වැඩසටහන් තුනකින් සමන්විත වේ.

25.1 ප්‍රජා මූලික විශෝධනයන්

යම් වරදකට සිර දඬුවම් ලබා දීම අනිවාර්ය නොවන විට හෝ සිර දඬුවම වසර දෙකක් නොඉක්ම වන විට බන්ධනාගාරගත කිරීමේ තීන්දුවක් වෙනුවට විශෝධන නියෝගයක් නිකුත් කළ හැකි ය. එහි දී අධිකරණය

විසින් වරදකරුට වඩාත් ගැළපෙන විශෝධන නියෝගයක් නිකුත් කරයි. මෙයට මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදක දී නම් පුනරුත්ථාපනයට යටත් කිරීම, ප්‍රජා සේවා හෝ අධීක්ෂණය වැනි කොන්දේසි අයත් වේ.

කෙසේ වෙතත්, වර්තමානය වන විට අපරාධ යුක්ති ක්‍රමවේදය තුළ මෙම ප්‍රජාමය විශෝධනයන් දක්නට ලැබෙනුයේ ඉතාමත් අල්ප වශයෙන් වන අතර එය මෙම ක්‍රමයේ සාර්ථකත්වය අවප්‍රමාණ කරවයි. කොමිසමට දැනුම් දුන් පරිදි මෙයට එක හේතුවක් ලෙස, නඩුව වහා අවසන් කිරීමේ මාර්ගයක් ලෙස සිර දඬුවම් නියම කිරීම සලකන අතර මෙම ක්‍රමවේදයට අවශ්‍ය වන නඩු විභාගය තව දුරටත් දිග් ගැස්විය හැකි පුනර් තීන්දු වාර්තා ඉල්ලා සිටීමට විනිසුරුවරුන් දක්වන මැළිකම පෙන්වා දිය හැකි ය. එමෙන් ම ප්‍රජාමය විශෝධනයන්හි අන්තර්ගතය පිළිබඳ අවබෝධයකින් තොර වීම හා පුනරුත්ථාපනයට වඩා දඬුවම සිරකරුවන්ට ඔබින බවට වන මානසිකත්වය ආදිය ප්‍රජාමය විශෝධනයට එරෙහි ව මතයක් ගොඩ නැගීමට හේතු වී ඇත.

මේ වන විට ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව මුහුණ දෙන දැඩි මුදල් ප්‍රතිපාදන ගැටලු නිසා අනෙකුත් ආයතනවල පිහිට නොමැති ව ඔවුනට මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන/ප්‍රතිකාර වැඩසටහන් හෝ වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොමැත. මෙසේ ප්‍රතිපාදන සීමා කිරීම නිසා මේ වන විට ප්‍රජාමය විශෝධන වැඩසටහන්වලට සහභාගි වන්නන් ඵලදායී ලෙස නියාමනය හා ඇගයීමට ද බාධා පවතී.

25.2 මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් පුනරුත්ථාපනය

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් හා මත්ද්‍රව්‍ය අලෙවි කරන්නන් අතර කිසිදු වෙන් කිරීමක් නොකෙරෙන බව කොමිසමට නිරීක්ෂණය විය. මින් දෙවැනි කොටස සිරගත කළ හැකි වුව ද පළමු කොටසට අවශ්‍ය වන්නේ වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම යි.

ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය යටතේ පාලනය වන ප්‍රතිකාර මධ්‍යස්ථානයන්හි පුනරුත්ථාපනය වීම සඳහා වරදකරුවෙකු යොමු කිරීමට විනිසුරුවරයෙකුට බලය ඇත. මෙවන් ප්‍රතිකාර මධ්‍යස්ථානවල පවතින සෞඛ්‍ය කාර්ය මණ්ඩල හිඟය, සිරගත කිරීම වෙනුවට මෙසේ පුනරුත්ථාපනය සඳහා ලබා දෙන නියෝග සාර්ථක වීම කෙරෙහි අහිතකර ලෙස බලපායි. එම මධ්‍යස්ථානවල ම සේවය කරන වෛද්‍යවරුන් වෙනුවට වරින් වර එහි පැමිණ සේවය කරන වෛද්‍යවරුන් සිටීම එයට ප්‍රධාන හේතුවකි. එමෙන් ම මේ වෛද්‍යවරු අදාළ ඇබ්බැහි වූවන්ට දරා ගත නොහැකි මිලකින් යුතු ඖෂධ වර්ග නියම කිරීම ද සිදු කරති. දැනට පවතින ප්‍රතිකාර මධ්‍යස්ථාන කිහිපය තුළ ඉල්ලුමට සරිලන සේවාවක් සැපයීමේ හැකියාව ද නොමැත.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ට ප්‍රතිකාර තීරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන කොපමණ මට්ටමකින් එසේ ඇබ්බැහි වී ඇති ද යන්න නිර්ණය කළ හැකි ප්‍රමිතිගත ප්‍රතිපත්තීන් ද දක්නට නොලැබේ. කන්දකාඩු මත්ද්‍රව්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත යොමු කළ හා මේ වන විට එහි යාමට නියමිත ව වැලිකඩ බන්ධනාගාරයේ රැඳී සිටින පුද්ගලයෝ තමන් ව වෛද්‍යවරයකු විසින් කිසිදු පරීක්ෂාවකට ලක් නොකළ බවත් කන්දකාඩුහි පුනරුත්ථාපනයට යැවීමට පෙර ඇබ්බැහි වීමේ මට්ටම පරීක්ෂාව සඳහා වෛද්‍ය පරීක්ෂණ සිදු නොකළ බවත් කොමිසමට දන්වා සිටියහ. විනිසුරුවරයාගේ අත්තනෝමතික තීරණය මත ප්‍රතිකාර පිළිබඳ නියෝගය නිකුත් කෙරෙන බැවින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් සම්බන්ධයෙන් ඒකීය අධිකරණමය ප්‍රතිපත්තියක් නොමැති බව මනාව පැහැදිලි වේ.

25.3 පරිවාසය

දේශීය නීති රාමුව තුළ පවතින සිරගත කිරීමෙන් බැහැර තෙවන ක්‍රමවේදය පරිවාසය යි. මෙය සාපේක්ෂ ව අවම සීමාවන් සහිත විකල්පය වන අතර එහි දී අදාළ පුද්ගලයා වෙනුවෙන් නියම කළ පරිවාස කොන්දේසිවලට යටත් ව සිය නිවසෙහි ම ඔහුට හෝ ඇයට ජීවත් වීමට අවසර ලැබේ.

පරිවාස නියම කිරීමේ දී සපුරාලිය යුතු පූර්ව නිශ්චිත නිර්නායකයන් නොමැත. ඒ වෙනුවට වරදකරුගේ වරදෙහි ස්වභාවය, ලිංගිකත්වය හා තත්ත්වය පිළිබඳ ව අගයමින් නඩුවකින් නඩුවකට වෙනස් වන අන්දමේ පියවර අනුගමනය කිරීමක් සිදු වේ. මේ හරහා සිරගත කිරීමකට සාපේක්ෂ ව අදාළ වරදකරුට පරිවාස නියෝග පැනවීම වඩා සුදුසු වේ ද යන්න තීරණය කෙරේ. මෙය සිරගත කිරීමට විකල්පයක් ලෙස භාවිත කළ හැකි අත්‍යවශ්‍ය හා සංවර්ධනාත්මක ක්‍රමවේදයකි. එය බඳු ගෙවන්නන් හා සමාජය දැරිය යුතු සිරගත කිරීමේ වියදම් අඩු කිරීම පිළිබඳ ව යෙදිය හැකි හොඳ පිළියමකි. එහෙත් මෙම විකල්පය පිළිබඳ පවතින දැනුම අල්ප ය. පරිවාස ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට නීතියෙන් බැඳී සිටින ළමා හා පරිවාස දෙපාර්තමේන්තුව වැඩිහිටියන් පරිවාසයෙහි යෙදවීම පිළිබඳ ව කටයුතු නොකරන අතර ඒ වෙනුවට ළමුන් හා සම්බන්ධ පරිවාස කටයුතු කෙරෙහි පමණක් අවධානය යොමු කරයි. ඒ අනුව වර්තමානයේ දී වැඩිහිටි පරිවාසය පිළිබඳ කටයුතු භාර ගෙන කළමනාකරණය කිරීම සඳහා වෙන් වූ කිසිදු ඒකකයක් දක්නට නොලැබේ.

20. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින සිරකරුවන්

"ඔවුන් දඬුවම් ලබා දෙන විට සිරකරුවාගේ වයස සැලකිල්ලට ගත යුතු ය. මේ දේවල් පිළිබඳ ව ප්‍රායෝගික ව සිතිය යුතු ය. යමෙකු මෙතරම් තරුණ අවධියේ දී එල්.ටී.ටී.ඊ.යට බැඳුණේ නම්, ඔහු දැනුවත්භාවයෙන් යුතු ව එසේ කරයි ද? සිහිකල්පනාවෙන් යුතු ව එසේ බැඳෙයි ද?"

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් වරදකරුවෙකු වූවෙක්,
නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය
(මෙම රැඳවියා අත්අඩංගුවට ගනු ලැබුවේ ඔහුට වයස අවුරුදු දහසයක් වූ විට වන අතර, එතැන් පටන් මේ දක්වා ඔහු වසර විසිතුනක් බන්ධනාගාරයේ ගත කර ඇත.)

1. හැඳින්වීම

මෙම පරිච්ඡේදය මඟින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (මින්පසු පනත)[1] යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයින්ට බන්ධනාගාරවල සලකන ලද අන්දම, එම බන්ධනාගාරවල තත්ත්වයන් පිළිබඳ ව සහ ඔවුන් සිරගත ව සිටින කාලය මත බලපෑමක් ඇති කර තිබෙන අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය පිළිබඳ ව ඔවුන්ගේ අත්දැකීම් විමසා බැලීම සිදු කරනු ඇත.

මෙම පනත පැන වූ දා සිට ම, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම්, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නෛතික බැඳීම් යනාදී නීතිමය සම්මතයන් අසමානුපාතික ව හානියට ලක් කිරීම සම්බන්ධයෙන් පුළුල් ව විවේචනයට ලක් කිරීම සිදු කරමින් ඇත. පනත අහෝසි කරන ලෙස අදාළ අංශයන්ගෙන් යළි යළිත් ඉල්ලා ඇති කොමිෂන් සභාව[2] වෙත මෙම පනත යටතේ අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයින්ගෙන් මෙන් ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගෙන් මානව හිමිකම් උල්ලංඝනයන් ගැන චෝදනා නඟමින් විශාල පැමිණිලි ප්‍රමාණයක් ලැබී තිබේ.

ජාත්‍යන්තර නීතිය ප්‍රකාශ කරන්නේ, හදිසි අවස්ථාවක දී වුව ද, වධහිංසාවට එරෙහි අයිතීන්, නිදහස නීති විරෝධී ලෙස අහිමි කිරීම, සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය සහ නිසි ක්‍රියාවලිය තහවුරු කිරීම් දුර්වල කළ නොහැකි බවත්, එසේ සිදු කරනු ලබන ඕනෑ ම දුර්වල කිරීමක් ප්‍රමාණවත් අධීක්ෂණයට සහ අධිකරණමය සමාලෝචනයට යටත් විය යුතු බවත් ය. මෙම නෛතික සන්දර්භය තුළ, විශේෂ ආරක්ෂක නීති සම්පාදනයක් වන, නිසි ක්‍රියාවලියේ අයිතීන් ගණනාවක් සීමා කරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, ව්‍යවස්ථාමය රාමුව සහ ජාත්‍යන්තර නීතියෙහි මානව හිමිකම් ප්‍රමිතීන් සමඟ අනුකූල විය යුතු ය. පහත විස්තරාත්මක ව සාකච්ඡා කර ඇති පරිදි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගැන ප්‍රධාන විවේචනවලින් එකක් වනුයේ, පුද්ගලයෙකු ව බලයලත් අධිකරණයකට ඉදිරිපත් නොකර, මාස දහඅටක් දක්වා රැඳවුම් භාරයේ තබා ගැනීමට ඉඩ සලසන විධිවිධානවලට සම්බන්ධ ව ය. එබැවින්, පනතෙහි මෙම විධිවිධානය ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන්ට සහ සැකකරුවෙකු විනිසුරුවරයෙකු වෙත ඉදිරිපත් කර රිමාන්ඩ් භාරයට පත් කිරීමේ දී අදාළ වන්නා වූ ව්‍යවස්ථාමය ආරක්ෂාවන්ට අනුකූල නොවේ.[3]

මෙම පනත යටතේ අත්අඩංගුවට ගන්නා පුද්ගලයින් බන්ධනාගාරය තුළ විශේෂ සිරකරුවන් ලෙස වර්ගීකරණය කෙරේ. මේ හේතුව නිසා බන්ධනාගාරය තුළ ඔවුන්ට සලකන අයුරු සහ තත්ත්වයන් මෙන්

1 Prevention of Terrorism (Temporary Provisions) Act, No. 48 of 1979, as amended by Act Nos. 10 of 1982 and 22 of 1988

2 Human Rights Commission of Sri Lanka, 'Public Statement' (22 June 2016) <http://hrcsl.lk/english/wp-content/uploads/2016/06/Public-Statement-by-HRCSL.pdf>; Report of the Human Rights Commission of Sri Lanka to the Committee against Torture: Review of the 5th Periodic Report of Sri Lanka, (October 2016) < http://hrcsl.lk/english/2016/11/01/the-report-of-the-human-rights-commission-of-sri-lanka-to-the-committee-against-torture-for-the-review-of-the-5th-periodic-report-of-sri-lanka/> accessed 21 November 2018.

3 The Constitution of the Democratic Socialist Republic of Sri Lanka, art 13(2).

ම, ව්‍යවස්ථාමය මානව හිමිකම් ප්‍රමිතීන් දුර්වල කරන්නා වූ සුවිශේෂී නීති යටතේ ඔවුන් අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම නිසා ද ඔවුන්ගේ රැඳවුම් කාලය අතරතුර ඔවුහු නිශ්චිත දුක්ගැනවිලි ගණනාවකින් පීඩා විඳිති. මේවා පිළිබඳ පහත සාකච්ඡා කර ඇත.

2. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන්ට බන්ධනාගාරය තුළ සැලකීම සහ බන්ධනාගාර තත්ත්වයන්

2.1. වෛද්‍ය රැකවරණය සඳහා ප්‍රවේශය

මෙම පනත යටතේ රඳවා සිටින රැඳවියන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවලින් එකක් වන්නේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශය යි. මෙම රැඳවියන් විශේෂ වර්ගයක සිරකරුවන් ලෙස සලකන බැවින් ඔවුන් බන්ධනාග ාරයෙන් පිටතට රැගෙන යන විට දැඩි ආරක්ෂාව අවශ්‍ය කරයි. ඇතැම් සිරකරුවන් සම්බන්ධයෙන් ගත් විට, බන්ධනාගාර බස් රථයට රැකවල් පිරිවර ලෙස පොලිස් කණ්ඩායමක්/ විශේෂ කාර්යසාධක බලකායේ නිලධාරීන් ඔවුන්ට අවශ්‍ය කරනු ලැබේ. අදාළ බන්ධනාගාරයන්හි සිටිනා නිලධාරීන්ගේ පාලනයෙන් තොර කාරණයක් වන බන්ධනාගාර තුළ පවතින මානව සම්පත් සහ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොමැතිකම මත ඇතිවන ගැටලු හේතුවෙන් පනත යටතේ සිටින බොහෝ රැඳවියන් විසින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශ වීමේ ගැටලුවලට මුහුණ දෙති. මෙම පනතෙන් වරදකරු වූ නව මැගසීන් රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින හෘද රෝගයෙන් පෙළෙන සිරකරුවෙක් මෙසේ පැවසීය. "අපි ව රඳවා තිබෙන්නේ මෙහෙ විශේෂ වාට්ටුවක. වෛද්‍ය ප්‍රතිකාරවලට වුණත් පිටතට යාමට අපහසු යි. ඒ සඳහා බන්ධනාගාර රීති ගොඩාක් වගේ ම ලබා ගත යුතු අවසර රැසක් තිබෙනවා."

වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශය යන පරිච්ඡේදයෙහි සාකච්ඡා කර ඇති පරිදි, පනත යටතේ රඳවා සිටින රැඳවියන් කොළඹ බන්ධනාගාර මූලස්ථානයේ විශේෂ කුටිවල රඳවා තබා ඇත. මානසික රෝගීන්, සියදිවි නසා ගැනීමට නැඹුරු වූ රැඳවියන් සහ මරණ දඬුවමට තීන්දු වී ඇති සිරකරුවන් ද කොළඹ බන්ධනාග ාර මූලස්ථානයේ සිටින විට ඔවුන් ව ද මෙම කුටි තුළ රඳවා තබයි. කොළඹ බන්ධනාගාර මූලස්ථානයේ සිටින අනෙක් රෝගීන්ට ඇති නවාතැන් පහසුකම්වලට ප්‍රවේශය නොමැති වණ්ඩ කුටියක රඳවා තැබීම හේතුවෙන් තමන් පීඩාවට පත් ව ඇති බව පනත යටතෙහි රඳවා ඇති රැඳවියන් බොහෝ දෙනෙක් බොහෝ අවස්ථාවල දී කොමිෂන් සභාවට පැමිණිලි කළහ. පනත යටතෙහි රඳවා ඇති රැඳවියන් සිටින කුටිවල රඳවා ඇති මානසික රෝගී සහ/ හෝ අස්ථායී රෝගීන්ගෙන් තමන්ට ඇති අවදානම පිළිබඳ ව ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සමහර රැඳවියෝ කොමිෂන් සභාවට දැනුම් දුන්හ.

පනත යටතේ සිටිනා සිරකරුවන් මහ රෝහලකට මාරු කළ යුතු විට මුහුණ දෙන දුෂ්කරතා වඩාත් අයහපත් ය. වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශය යන පරිච්ඡේදයෙහි සාකච්ඡා කළ පරිදි, පෙනහලු පිළිකාවකින් පෙළෙන නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයෙහි රඳවා ඇති පනත යටතේ සිටින රැඳවියකු වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශය ලබා ගැනීමේ දී දුෂ්කරතා රාශියකට මුහුණ දී ඇත. මෙවැනි අවස්ථාවක දී, විශේෂ කාණ්ඩයේ රැඳවියන්ට බන්ධනාගාරයෙන් පිටතට රැගෙන යාමේ දී ලබා දෙන බන්ධනාගාර ආරක්ෂක පිරිවරට අමතර ව විශේෂ කාර්යසාධක බලකායේ/ පොලිසියේ ආරක්ෂක පිරිවරක් රැඳවියා හට ලබා දීම අවශ්‍ය කරයි. එවැනි පිරිවර ආරක්ෂාවක් විශේෂ කාර්යසාධක බලකාය/ පොලිසිය මඟින් ලබා නොදුන් විට රැඳවියා ව පිළිකා රෝහලේ නියමිත සායන හෝ ප්‍රතිකාර සඳහා රැගෙන යනු නොලබයි. කොළඹ බන්ධනාගාර රෝහලේ ක්‍රියාකාරීත්වය සඳහා වගකීම ඇත්තේ වැලිකඩ බන්ධනාගාරයට වන අතර කොළඹ බන්ධනාගාර තුන ම එය භාවිත කරයි. එයින් අදහස් කෙරෙන්නේ, මහ රෝහලට ගෙන යන අධික සිරකරුවන් සංඛ්‍යාව සහ දැඩි කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන්, කොළඹ මහ රෝහල වෙත සිරකරුවෙකු ගෙන යාමේ ක්‍රියාපටිපාටිය ප්‍රමාද වීම් සහ අකාර්යක්ෂමතාවලින් පිරී ඇත. රැඳවියා ව අදාළ බන්ධනාගාරයේ සිට වෛද්‍යවරයා හමුවීමට නියමිත දිනට පෙර දින හෝ එදින ම උදේ පාන්දරින් ම බන්ධනාගාර රෝහල වෙත ගෙන ගොස් කුටියක රඳවා, පසු දින වැලිකඩ බන්ධනාගාර නිලධාරීන් විසින් සිරකරුවා මහරෝහල වෙත රැගෙන යනු ලබයි. කෙසේ නමුත්, රැඳවියා රැගෙන යන බන්ධනාගාර නිලධාරීන්ට විශේෂ කාර්යසාධක බලකායෙ/ පොලිස් ආරක්ෂක පිරිවර

පැමිණෙන තුරු සිටිය යුතු අතර බොහෝ රැඳවියන් කොමිෂන් සභාවට දැනුම් දුන් පරිදි රැඳවියා මහ රෝහල වෙත පැමිණෙන විට, ඔවුන්ට වෛද්‍යවරයා හමු වීමට ලබා දුන් වේලාව පසු වී ඇත.

පනත යටතේ නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ පෙනහලු පිළිකාවෙන් පෙළෙන රැඳවියකු පැවසුවේ "නිලධාරීන් මාව ලියාපදිංචි කර මාව රෝහලට ගෙන යනවා. නමුත් මගේ ප්‍රතිකාර සඳහා මම මහරගමට ළඟා වන විට දවල් වෙලා. ඒ නිසා මට මගේ ප්‍රතිකාර කර ගැනීමට බැරි වුණා" යනුවෙනි. ඔහු තවදුරටත් පැවසුවේ, "මට අද යාමට අවශ්‍ය වුවහොත් ඔවුන් මාව රැගෙන යන්නේ දින තුනකට පසුව" බව යි. මෙවැනි ව්‍යුහාත්මක ගැටලු හේතුවෙන් බන්ධනාගාර නිලධාරීන්ට මෙසේ බෙහෙවින් අවශ්‍ය කරන වෛද්‍ය ප්‍රතිකාර අහිමි කිරීමට හෝ ප්‍රමාද කිරීමට සිදු වී ඇති බවයි. ඒ රැඳවියා තවදුරටත් මෙසේ ප්‍රකාශ කළේ යථ

> "සමහර විට මට නිරාහාර ව සිට පරීක්ෂණ කිරීමට සිදු වෙනවා. ඊළඟ සායන දිනයේ දී එම වාර්තාව මා ගෙන යා යුතු යි. පසු දින මම පැය 0830 වන විට සායනයේ සිටිය යුතු යි. සමහර අවස්ථාවල දී ඔවුන් මට පැය දොළහක් නිරාහාර ව සිට පරීක්ෂණ සඳහා පැමිණෙන ලෙස පවසනවා. මම රෝහලට එන විට ප්‍රමාද වීම් හේතුවෙන්, අවශ්‍ය කරන කාලයට වඩා මම නිරාහාර ව සිට තිබෙනවා. මේ ගැටලුව සැම විටම තිබෙනවා. මට පෙණහලු පිළිකාවක් තිබෙන නිසා මාව නිතිපතා වෛද්‍යවරයා වෙත රැගෙන යා යුතු යි. පිළිකාව වර්ධනය වන විට මගේ ඖෂධ ද වෙනස් කළ යුතු යි. නමුත් ආරක්ෂක පිරිවර සැපයීම ගැටලුවක් වෙනවා."

පනත යටතේ සිටින රැඳවියන් සඳහා අවශ්‍ය කරන විශේෂ ආරක්ෂාව සම්බන්ධ ව ඔවුන් මුහුණ දෙන ගැටලු සහ ඒ හේතුවෙන් වෛද්‍ය ප්‍රතිකාරවලට ප්‍රවේශ වීමේ දී ඇති වන අහිතකර බලපෑම මෙයින් ඉස්මතු කර පෙන්නුම් කරනු ලබයි.[4]

2.2. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන්ගේ මානසික සෞඛ්‍යය

පහත දැක්වෙන ප්‍රස්ථාරය (20.1) මඟින් ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දක්වනු ලැබූ පනත යටතේ සිටින පිරිමි රැඳවියන් අතරෙහි විශාදය, තමාට හානිකර ගැනීමට තැත්කිරීම සහ සියදිවි නසාගැනීමට තැත්කිරීම පැතිර පවතින ආකාරය විදහා දක්වයි.[5]

20.1 ප්‍රස්ථාරය – විශාදය, තමාට හානි කර ගැනීමට තැත් කිරීම සහ සියදිවි නසා ගැනීමට තැත් කිරීම පිළිබඳව පිරිමි PTA රැඳවුම් ප්‍රතිචාරකයින්



4 For a comparison of the conditions of PTA inmates and other special category prisoners, please refer chapter Access to Medical Treatment.

5 As the study came across only two female PTA prisoners their responses are not included in the quantitative data analysis due the inability to draw any significant conclusions.

අධ්‍යයනයේ ප්‍රමාණාත්මක දත්තවලට අනුව පනත මඟින් වරදකරුවන් වූ පිරිමි රැඳවියන් 86%ක් සහ පනත මඟින් රිමාන්ඩ් භාරයේ සිටින පිරිමි රැඳවියන් 76%ක් ඔවුන්ගේ දෛනික ක්‍රියාකාරීත්වයන් ඉටු කිරීමට ඔවුන්ට ඇති හැකියාවට බලපෑම් කරන මට්ටමට ඔවුහු විශාදය, සාංකාව සහ දුකින් පීඩා විඳින බව පැවසූහ. ඊට අමතර ව, පනත මඟින් වරදකරුවන් වූ පිරිමි රැඳවියන් 21%ක් සහ පනත මඟින් රිමාන්ඩ් භාරයේ තබා ඇති පිරිමි රැඳවියන් 19%ක් තමාට හානි කර ගැනීමට තැත් දැරූ බවත්, පනත මඟින් වරදකරුවන් වූ පිරිමි සිරකරුවන් 21%ක් සහ පනත මඟින් රිමාන්ඩ් භාරයේ සිටින පිරිමි රැඳවියන් 10%ක් සිරගත ව සිටිය දී තමන් සියදිවි නසා ගැනීමට තැත් දැරූ බවත් පැවසූහ. විශාදය පිළිබඳ හැඟීම්වලින් පීඩා විඳින ලද සහ තමාට හානි කර ගැනීමට තැත් දරන ලද පනත මඟින් වරදකරුවන් කළ පිරිමි සිරකරුවන්ගේ සංඛ්‍යාව පනත මඟින් රිමාන්ඩ් භාරයේ රඳවා සිටින පිරිමි රැඳවියන් සංඛ්‍යාවට වඩා වැඩි ය. පහත 20.1 වගුවෙන් පෙන්වා ඇති පරිදි, පනත මඟින් වරදකරුවන් වූ පිරිමි රැඳවියන් සාමාන්‍යයක් ලෙස ගත් කල පනත මඟින් රිමාන්ඩ් භාරයේ තබා ඇති සාමාන්‍ය පිරිමි රැඳවියෙකුට වඩා වැඩි කාලයක් සිරගත වී සිටීම යන කාරණය මත මෙය තේරුම් ගත හැකි ය.

20.1 වගුව - බන්ධනාගාරය තුළ ගතකර ඇති කාලය

	පනත මඟින් රිමාන්ඩ් භාරයේ රඳවා ඇති පිරිමි රැඳවියන්	පනත මඟින් වරදකරුවන් වී ඇති පිරිමි රැඳවියන්
සති 1 මාස 1 දක්වා	2%	4%[6]
වසරක් දක්වා	5%	7%[7]
වසර 5ක් දක්වා	32%	11%
වසර 10ක් දක්වා	37%	46%
වසර 10කට වැඩි	22%	29%

පොලිස් අත්අඩංගුවේ සිටිය දී ඔවුන් අත්විඳින ලද වධහිංසාවල දිගු කාලීන ප්‍රතිවිපාක වන ඔවුන්ගේ නඩුවල ප්‍රගතිය අනිසි ලෙස ප්‍රමාද වීම, ඔවුන්ට බන්ධනාගාරය තුළ කාලය ගෙවීම සඳහා අර්ථවත් ක්‍රියාකාරකම් නොමැති වීම, පවුල සමඟ සම්බන්ධයක් නොමැති වීම සහ ඔවුන්ගේ පවුල් අත්දකින ගැටලු ආදිය හේතුවෙන් යම් ආකාරයක මානසික අවපීඩනයක් අත්දකින බව සම්මුඛ සාකච්ඡාවට මුහුණ දුන් පනත යටතේ සිටින රැඳවියන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කළ බව ගුණාත්මක දත්ත මඟින් ද විදහා දක්වයි. විශාදයේ බලපෑම් මඟින්, තමන්ට හානි කර ගැනීමට ඇති නැඹුරුතාවන්, සහ සියදිවි නසා ගැනීමට තැත් කිරීම් මත්ද්‍රව්‍ය භාවිතය වැනි හානි කර ප්‍රතිවිපාකවලට මඟ පෑදිය හැකි බව පර්යේෂණ පෙන්වා දෙයි. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළ මත්ද්‍රව්‍ය අවභාවිතය කෙරෙහි මෙම අධ්‍යයනය විශේෂිත අවධානයක් යොමු නොකළ අතර ඒ සඳහා වඩා ගැඹුරු ඒ පිළිබඳ විශේෂිත ව අවධානය යොමු කළ පරීක්ෂණ අවශ්‍ය කරයි. පනත යටතේ දිගුකාලීන ව රිමාන්ඩ්ගත ව සිටින්නන් සහ වරදකරුවන් වී ඇති සිරකරුවන් විසින් මුහුණ දෙන මත්ද්‍රව්‍ය අවභාවිතයෙහි අවදානම පිළිබඳ සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූවෙකු විසින් පහත සඳහන් අයුරින් ඉස්මතු කරන ලදී:

> "මෙහි සිටින අපි බොහෝ දෙනෙක් අපේ නඩුවල ප්‍රතිඵල සහ ක්‍රියාවලිය පිළිබඳ ව පීඩාවට පත් වෙලා සිටින්නේ. ඉතින්, අපි දැඩි ව මානසික ව වැටී සිටින විට අනිත් සිරකරුවන් ඇවිත් අපට මෙම මත්ද්‍රව්‍ය දෙනවා අපේ මානසික තත්ත්වය යහපත් කරගන්න කියලා.

6 The question asked "How long have you been in this prison?". Respondents in this answer category had been sent to the prison where they answered the questionnaire recently.

7 ibid

නමුත් අපි ඒවා ගන්නේ නැහැ. ඇත්තෙන් අපි ඒවා අපි විසින් ම ජේලර්ගේ අතට භාර දෙනවා."

2.3. රැඳවියා සහ නිලධාරියා අතර සම්බන්ධතාව

රැඳවියා නිලධාරියා අතර සම්බන්ධතාව පිළිබඳ පරිච්ඡේදයෙහි ප්‍රකාශ කළ පරිදි, රැඳවියන් බන්ධනාගාරය තුළ ගත කරන කාලය ඔවුන් සහ නිලධාරීන් අතර සම්බන්ධතාවය කෙරෙහි පැහැදිලි බලපෑමක් ඇති කරන බව ද, දිගු කාලීන සිරකරුවන් වන අය නිලධාරීන් සමඟ වඩා යහපත් සහ වඩා සුහද සම්බන්ධතාවක් පවත්වාගෙන යන බව ද කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. මෙම පනත යටතේ සිටින සිරකරුවන් සම්බන්ධයෙන් ද එසේ ම ය.

අධ්‍යයන නියැදියේ සිටි අය අතර, පනත මඟින් වරදකරුවන් වූ පිරිමි රැඳවියන්ගෙන් 46%ක් සහ පනත මඟින් රිමාන්ඩ් භාරයේ රඳවා ඇති පිරිමි රැඳවියන්ගෙන් 37%ක් වසර පහක සිට දහයක් දක්වා බන්ධනාග ාරගත ව සිට ඇති අතර, පනත මඟින් වරදකරුවන් වී ඇති පිරිමි රැඳවියන්ගෙන් 29%ක් සහ පනත මඟින් රිමාන්ඩ් භාරයේ රඳවා ඇති පිරිමි රැඳවියන්ගෙන් 22%ක් වසර 10කට වඩා බන්ධනාගාරගත ව සිටි අය වෙති. එබැවින්, පනත යටතේ සිටින රැඳවියන් සහ බන්ධනාගාර නිලධාරීන් අතර සංකීර්ණ සම්බන්ධතාවක් ඇති බව පෙනෙන අතර, එය සමහර විට සුහද වන නමුත් බාහිර දේශපාලනික සන්දර්භයන් සමඟ ඇතැම් අවස්ථාවල දී භේදකාරී වූ බව ඔවුහු පැවසූහ. ගුණාත්මක දත්ත මඟින් මේ බව තවදුරටත් සනාථ කරන ලදී. පසුගිය වසර හත තුළ පනත යටතේ නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ රිමාන්ඩ් භාරයේ සිටි පුද්ගලයෙකු පැවසූ පරිදි:

> "ඔවුන් [බන්ධනාගාර නිලධාරීන්] අපෙන් ඇසුවා ඔබලා [කොමිෂන් සභාව] ඇසුවේ කුමක්ද යන්න සහ අපි ඔබට පැවසුවේ කුමක්ද කියා. මම පැවසුවේ බන්ධනාගාරයේ තිබෙන පොදු ප්‍රශ්න ගැන සහ බන්ධනාගාරය ගැන හොඳ දේවල් පමණයි කියා. ඔවුන් 'හොඳයි' කියා කිව්වා. අපි දැන් මෙහි දිගු කාලයක් ජීවත් වෙන නිසා, අපි [නිලධාරීන්ට] සුහද ව සහ ප්‍රියශීලී ව සිටිය යුතු යි."

නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින මෙම පනත මඟින් වරදකරුවෙකු වී ඇති පිරිමි සිරකරුවෙකු පැවසූවේ, "මුල දී වෙනස්කොට සැලකීම් තිබුණා, නමුත් පසු ව ඔවුන් [නිලධාරීන්] යහපත් වුණා. අපි එල්ටීටීඊ කියා ඔවුන් අපට බැණ වැදුණු නමුත් කාලයත් සමඟ එය වෙනස් වුණා. දැන් ඔවුන් අප සමඟ හොඳ සම්බන්ධතාවක් පවත්වා ගන්නවා."

කෙසේ නමුත්, මෙම පනත යටතේ සිටින රැඳවියන් බහුතරයට අනුව, නිලධාරීන් බොහෝ දෙනෙක් ඔවුන්ට ගෞරවයෙන් සලකන අතර, සමහර නිලධාරීහු වෙනස්කම් කරමින් ඔවුන් කෙරෙහි ජාතිවාදී ලෙස හැසිරෙති. මෙම තත්ත්වය, ප්‍රමාණාත්මක දත්ත මඟින් පිළිබිඹු කරන අතර, එයින් පෙන්වන්නේ ඇතැම් බන්ධනාගාරවල සමහරක් නිලධාරීන් විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන්ට අභිමානය සහ ගරුත්වය ඇති ව සලකන බව යි. එහෙත් කාලයත් සමඟ සියලු ම බන්ධනාගාරවල සිටිනා සියලු ම නිලධාරීන් සඳහා මෙය එසේ නොවී ඇත. පනත යටතේ සිටින රැඳවියන් අතර පිරිමි ප්‍රතිචාරකයන්ගෙන් 51%ක් පැවසුවේ බන්ධනාගාර කාර්ය මණ්ඩලය ඔවුන්ට ගරුත්වය සහ අභිමානය ඇති ව සලකන බව යි. මෙයින් අඟවනු ලබන්නේ බන්ධනාගාර නිලධාරීන්ගේ පෞද්ගලික පක්ෂපාතිත්වයන් සහ අගතීන් ඔවුන් රැඳවියන් සමඟ ඇති සම්බන්ධතාවයට සෘජු ව ම බලපාන බව, සහ එහි ප්‍රතිඵලයක් ලෙස බන්ධනාගාර නිලධාරීන් වශයෙන් ඔවුන්ගේ රාජකාරී වෙත බලපෑමක් එල්ල කරන බව යි. නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටිනා පනත යටතේ වරදකරුවකු වී ඇති පිරිමි සිරකරුවෙකු විසින් පවසන ලද්දේ:

> "ගැටලුව වන්නේ බොහෝ බන්ධනාගාර නිලධාරීන් සිංහල වීම යි. දෙමළ අය සිටින්නේ ඉතාමත් ටික දෙනයි. සිංහල නිලධාරීන් අතර සමහරු බෙහෙවින් ජාතිවාදි යි. විශේෂයෙන්

> අපි එල්ටීටීඊයට සම්බන්ධ සිද්ධීන් සඳහා සිටින බව දැනගත් විට ඔවුන් වැඩියෙන් එදිරිවාදී වෙනවා."

අනෙකුත් විස්තරයන් පෙන්වා දෙන්නේ පනත යටතේ සිටින රැඳවියෙකුට නිලධාරීන් සමඟ ඇති සම්බන්ධතාව ඔවුන් වඩා ඉහළ ශ්‍රේණිවල නිලධාරීන් සමඟ දක්වන සම්බන්ධතාව මත ද රඳා පැවතිය හැකි බව යි. උදාහරණයක් වශයෙන්, පහත දූක්ගැනවිලි යාන්ත්‍රණවල පැහැදිලි කර ඇති පරිදි, අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයේ සහ නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ රැඳවියන් පැවසුවේ, පනත යටතේ සිටින රැඳවියන්ට ඔවුන් නවතා සිටින බන්ධනාගාරවල බන්ධනාගාර අධිකාරිවරුන් සහ ප්‍රධාන ජේලර්වරුන් සමඟ හොඳ සම්බන්ධතාවක් ඇති බවත්, ඒ හේතුවෙන් වඩා පහළ ශ්‍රේණිවල නිලධාරීන් වෙතින් ඔවුන් ව අපයෝජනය කෙරෙන හැසිරීම් වළක්වන බව යි.

මෙම තත්ත්වය ප්‍රමාණාත්මක දත්තවලින් පිළිබිඹු කරයි. ඒවායින් පෙන්වා දෙන්නේ පනත යටතේ ඇතැම් බන්ධනාගාරවල සිටිනා සමහර රැඳවියන්ට අභිමානයෙන් සහ ගෞරවයෙන් යුතු ව සලකන බව යි. එහෙත් කාලයත් සමඟ සියලු ම බන්ධනාගාරවල සිටිනා සියලු ම නිලධාරීන් සඳහා මෙය එසේ නොවී ඇත. බන්ධනාගාර නිලධාරීන් ඔවුන්ට ගෞරවයෙන් සහ අභිමානයෙන් සලකන බව පැවසූ පනත යටතේ සිටින රැඳවියන් අතර සිටිනා පිරිමි ප්‍රතිචාරකයින්ගෙන් 51%ක් දැක්වූ ප්‍රතිචාර මඟින් මෙය හෙළිදරව් විය.

ගුණාත්මක දත්ත හරහා හඳුනාගත් වැදගත් රටාවක් වන්නේ පනත යටතේ සිටින රැඳවියන් සහ නිලධාරීන් අතර සම්බන්ධතාව වසර ගණනාවක් ඔස්සේ වර්ධනය වී ඇති බව යි. ප්‍රථමයෙන් මෙය පනත යටතේ සිටින රැඳවියන් බන්ධනාගාරය තුළ ගත කර ඇති කාලය හේතුවෙනි. එනම්, සාමාන්‍ය රිමාන්ඩ් රැඳවියන්ට වඩා වැඩි කාලයක් මොවුන් රිමාන්ඩ් බන්ධනාගාර තුළ නිලධාරීන් සමඟ සබඳතා පවත්වා ඇති බව යි. සමහර අවස්ථාවල දී මෙය වරදකරුවන් වී ඇති සිරකරුවන් ගත කරන කාලයට වඩා වැඩි ය. දෙවනු ව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් බන්ධනාගාරය තුළ දීර්ඝ කාලයක් ගත කර, ඔවුන් තමන් ව විධිමත් සහ විනය ගරුක අය ලෙස බන්ධනාගාර නිලධාරීන් විසින් සලකන බවට සවිඥානික උත්සහායක් දරා ඇති බව, කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් තමන් ව හඳුනා ගන්නේ "කරදරකාරයින් නොවන්නන්" ලෙස වන අතර, බන්ධනාගාර නිලධාරීන් විසින් මෙය සනාථ කර ඇත. අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින රැඳවියෙක් පැවසුවේ, "අපි කිසි දිනෙක බන්ධනාගාර නිලධාරීන්ට හෝ බන්ධනාගාරයට ප්‍රශ්න ඇති කර නැහැ. ඔබට මෙය බන්ධනාගාර අධිකාරී සර්ගෙන් වුව ද අසා දැනගත හැකි ය" යනුවෙනි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදකරුවෙකු වී නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටිනා දීර්ඝතම කාලය ගත කර ඇති සිරකරුවා ප්‍රකාශ කළේ:

> "ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සිරකරුවන් ලෙස, අපි ස්වයංවිනයක් පවත්වා ගන්නවා. යුද්ධය කාලයේ දී අපිට අපේ පවුල් අහිමි වුණා. එමෙන් ම අපට මූල්‍යමය ගැටලු තිබෙනවා. මේ අය [ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නොවන රැඳවියන්] නිලධාරීන්ට මුදල් [අල්ලස්] දෙනවා. ඒ මුදල අපේ නිවසක මාසය පුරාවට භාවිත කළ හැකි යි. ඔවුන්ට එය හරි ම සරලයි [අපට වගේ නොවෙයි]."

මෙම පනත යටතේ සිටින රැඳවියන් කෙටි කාලීන සිරකරුවන්ට වඩා වැඩියෙන් නිලධාරීන් මත යැපෙන බව මෙයින් අවධාරණය කෙරේ. දිගුකාලීන රැඳවියන් විසින් පිරික්සුම් සහ වැරදීම් න්‍යාය අත්හදා බැලීම ඔස්සේ බන්ධනාගාරයේ බලයේ පවතින වෙනස්කම් තුළ සාමකාමී ව බන්ධනාගාරය තුළ ජීවත් වීමේ සමතුලිතතාව සොයා ගැනීමට උත්සාහ දරා ඇති බව අධ්‍යයනය අතරතුර කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින පනත යටතේ වරදකරුවෙකු වී ඇති සිරකරුවෙකු ප්‍රකාශ කළේ, එය "[බන්ධනාගාර පොලිසිය විසින් සිදු කරන නොහොබිනා ශරීර සෝදිසි කිරීම්] හැමෝටම සිදු වෙනවා. බන්ධනාගාර නිලධාරීන් සමඟ අපේ සම්බන්ධතාවය පළුදු කර ගැනීමට අවශ්‍ය නැති නිසා, අපි ඒ ගැන කිසිවක් පවසන්නේ නැහැ."

මෙම පනත යටතේ සිටින රැඳවියන්ගේ විස්තර කිරීම් මඟින් පෙන්නුම් කරන්නේ කෙටි කාලීන රැඳවියන් සමඟ සන්සන්දනය කරන විට, ඔවුන් තමන් කරන දේ බෙහෙවින් සිතා බලා සිදු කරන බවයි. දිගුකාලීන රැඳවියෙකුට හැඟෙන්නේ නිලධාරීන් සමඟ කලහකාරී සම්බන්ධතාවක් පැවැත්වීමෙන් තමන්ට අහිමි කර ගැනීමට බොහෝ දේ ඇති බව ය. කෙසේ නමුත්, ඔවුන් විවෘත ව ම විරෝධය නොපාන බව මෙයින් අදහස් නොකෙරේ. පනත යටතේ සිටින රැඳවියන් ගැටලු ගැන, විශේෂයෙන් පොදු ගැටලු සම්බන්ධයෙන්, ඔවුන් බෙහෙවින් හඬ නඟන බවත්, ඒවා විශ්වාසයෙන් යුතු ව බන්ධනාගාර නිලධාරීන් ඉදිරියේ මතු කරන බවත් සොයාගැනුණි. තවද, ගුණාත්මක දත්ත හරහා හඳුනා ගත් තවත් රටාවක් වූයේ, බන්ධනාගාර නිලධාරීන් සහ පනත යටතේ සිටින රැඳවියන් අතර සම්බන්ධතාව පසුගිය වසර කිහිපය තුළ සාමාන්‍යයෙන් වැඩිදියුණු වී ඇති බව ය. අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ සිටින්නෙකු පැවසුවේ "අප ව මෙතරම් තරුණ වයසක දී අත්අඩංගුවට ගැනීම ගැන ඔවුන් බෙහෙවින් කණගාටු වන බව ඔවුන් අපට දැන් පවසනවා. මීට පෙර අපි දේශපාලන තන්ත්‍රය ගැන බිය වුවා. නමුත් දැන් එය හොඳයි." පනත යටතේ සිටින ඇතැම් රැඳවියන් මෙය හැඳින්වූයේ බන්ධනාගාර නිලධාරීන් සහ රැඳවියන් අතර පවත්නා වඩා ධනාත්මක සම්බන්ධතාවයෙහි සාමාන්‍ය වර්ධනයක් ලෙස ය.

කෙසේ නමුත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් කෙරෙහි නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්ව යන් බාහිර වාතාවරණයන් හේතුවෙන් හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියා රිමාන්ඩ් කිරීමට/වරදකරුවකු වීමට හේතු වූ වරදෙහි නිශ්චිත ස්වභාවය හේතුවෙන් වෙනස් විය හැකි ය. උදාහරණයක් ලෙස, පනත යටතේ සිටින එක් රැඳවියෙක් පැවසුවේ "XX ඝාතනය කිරීමට තැත් කිරීම වෙනුවෙන් සමහරුන් රඳවාගෙන තිබෙනවා. ඔවුන් ව අප සමඟ [ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ වාට්ටුවෙහි] තැබුවේ නැහැ. ඔවුන් ව තැබුවේ පිට [සාමාන්‍ය] වාට්ටුවක. ඔවුන්ගේ වාට්ටුවට හැන්දෑවේ අගුළු දැමූ පසු, වාට්ටුව භාරව සිටින නිලධාරියා ගේට්ටුව විවෘත කර අනෙකුත් නිලධාරීන් සමඟ දරුණු ලෙස පිරිමි ළමයින්ට පහර දුන්නා" යනුවෙනි.

කෙසේ නමුත්, පනත යටතේ සිටින සමහර රැඳවියන් පැවසුවේ, මානව හිමිකම් කොමිෂන් සභාව වැනි ස්වාධීන ආයතන සහ පාර්ලිමේන්තු මන්ත්‍රීන් වැනි අන් අය, දැන් බන්ධනාගාරය තුළ සිටින පනත යටතේ සිටින රැඳවියන්ගේ තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කරන බැවින්, බන්ධනාගාර නිලධාරීන් විසින් සිදුකෙරෙන්නා වූ අනිසි හිරිහැර කිරීම්වලින් ඔවුන් ආරක්ෂා වී තිබෙන බව ය. උදාහරණයක් ලෙස, අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ සිටින්නෙකු පැවසුවේ, "ඔවුන් දැන් අපට අගතිගාමී ව සලකන්නේ නැහැ. මන්ද පාර්ලිමේන්තු මන්ත්‍රීන් සහ ඔබ වැනි අය [කොමිෂන් සභාව] නිතරම අප ව බැහැදැකීමට පැමිණෙනවා. අපි ඔබට සෑම දෙයක් ම පවසන බව නිලධාරීන් දන්නවා. එමනිසා, ඔවුන් විවෘත ව වෙනස්කොට සැලකීම් කරන්නේ නැහැ."

2.4. රැඳවියන් රැඳවියන් අතර සම්බන්ධතාව

නිලධාරීන් සහ පනත යටතේ සිටින රැඳවියන් අතර සම්බන්ධතාව දැන් සුහද එකක් වන අතර, බොහෝ විට පනත යටතේ සිටින රැඳවියන් සහ අනෙක් රැඳවියන් අතර සම්බන්ධතාව නිතර ම එකිනෙකාට ප්‍රතිවිරුද්ධතාවක් දක්වන ආකාරයේ සබඳතාවක් වේ. තව ද, පනත යටතේ සිටින රැඳවියන් සෑම බන්ධනාගාරයකම පාහේ අනෙක් රැඳවියන්ගෙන් වෙන්කර තැබීමට හේතුව ද මෙය වේ. බන්ධනාගාර ඉතිහාසයේ ජාතිවාදී හේතු මත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් ඉලක්ක කර ගනිමින් ඇති වූ කැරලි කෝලාහල රාශියක් සිදු වී ඇති අතර, ඉන් සමහරක් මරණවලින් අවසන් වී ඇත. අනෙකුත් රැඳවියන් පනත යටතේ සිටින රැඳවියන්ට සලකන ආකාරය අගතිගාමී අදහස් මත පදනම් ව කෙරෙන වෙනස්කොට සැලකීමේ සිට විවෘත ව ම දක්වන ප්‍රචණ්ඩත්වය දක්වා වෙනස් විය හැකි ය. උදාහරණයක් ලෙස, නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ පනත යටතේ මේවන විට සිටිනා රැඳවියෙක් ඔහු රිමාන්ඩ් භාරයට පත් වූ විගස කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය තුළ දී මුහුණ දීමට සිදු වූ අත්දැකීම විස්තර කළේය:

"මට හැඟෙන්නේ මෙවැනි දේ අපේ රටේ සිදු නොවිය යුතු බව යි. මම දමිළ තැනැත්තෙකු බව සහ එල්ටීටීඊ සැකකරුවෙකු බව අනෙක් අය දැන සිටි නිසා ඔවුන් මට වෙනස් ව සැලකුවා. තවත් පිරිමි ළමයෙක් හිටියා [මා සමඟ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩුවක් සඳහා ම සිරගත ව සිටි]. ඔහු දැන් ඉන්නේ මහර. පළමු දින 5 තුළ ඔවුන් මට නිදාගන්න දුන්නේ වැසිකිළිය ළඟ යි. එතැන දවස් පහක් නිදා ගත්තා. මෙයින් පස්සේ මට ඔවුන්ට සමාව දීමට නොහැකි වුණා [අනෙක් රැඳවියන්ට]. බන්ධනාගාරය පොදු ස්ථානයක්. එය ඔවුන්ට [අනෙක් රැඳවියන්ට] අයිති නැහැ. මටත් ඒ පිළිබඳ ව ගැටලුවක් සහ අයිතියක් තිබෙනවා. මට අයිතිය තිබෙන විට වෙනත් අයෙකුගෙන් විමසීමට මට අවශ්‍ය නැහැ. එවිට ඔවුන් [අනෙක් රැඳවියන්] ප්‍රශ්නයක් ඇති කිරීමට උත්සාහ කළා. නමුත් මම රණ්ඩු වෙන්නට ගියේ නැහැ. මම ඔවුන්ට කට වසා ගන්න කියා නිදා ගත්තා. ඉන්පසු ව ඔවුන් මා සමඟ රණ්ඩුවට පැමිණියේ නැහැ."

යාපනයේ රිමාන්ඩ් බන්ධනාගාරය තුළ පනත යටතේ රිමාන්ඩ් භාරයේ සිටි අයෙක් මීට සමාන අත්දැකීමක් විස්තර කළේය. මෙම විස්තර කිරීම්වලින් පෙන්වා දෙන්නේ පනත යටතේ සිටින රැඳවියන් පනත යටතේ නොවන රැඳවියන්ගේ ක්‍රියාවල අවදානමට ලක්වන බව ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටිනා රැඳවියෙකු ඔවුන් නිලධාරීන්ගේ විශ්වාසය භුක්ති නොවිඳින හා නිලධාරීන් සමඟ කාලයත් සමඟ වර්ධනය කර ගනු ලබන සුහද සම්බන්ධතාවයක් නොමැති ව සිටින අවස්ථාවක ඔහුගේ/ ඇයගේ මුල් රිමාන්ඩ් දිනවල සිටින විට මෙම අවදානම සමහර විට එහි උච්චතම අවස්ථාවේ තිබිය හැකි ය.

වසර පහකට හෝ දහයකට වඩා බන්ධනාගාරගත ව සිට ඇති පනත යටතේ සිටින රැඳවියන්ගෙන් බහුතරය පැවසුවේ සුරක්ෂිතතාව සහ ආරක්ෂක ගැටලු හේතුවෙන්, විශේෂයෙන් අනෙක් රැඳවියන් සමඟ ඇති ගැටලු සම්බන්ධ ව, ඔවුන් ව අවස්ථා කිහිපයක දී ම එක් බන්ධනාගාරයක සිට තවත් බන්ධනාගාරයකට මාරු කර ඇති බව ය. විශේෂයෙන් ජනවාර්ගික ගැටලුවට සම්බන්ධ ප්‍රචණ්ඩ සිද්ධියක් රට තුළ සිදු වූ විට, පනත යටතේ සිටින රැඳවියන් ප්‍රධාන වශයෙන් සිංහල සිරකරුවන්ගේ 'පලිගැනීමට උත්සාහ දරන හැසිරීමෙහි' ඉලක්ක බවට පත් විය හැකි ය. මෙලෙස, බොහෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියෝ අතීත අත්දැකීම් හේතුවෙන් නිරන්තර ව බියෙන් ජීවත් වන බව ප්‍රකාශ කළහ. උදාහරණයක් ලෙස, 1983 ජුලි 25 සහ 27 යන දිනවල, පනත යටතේ අත්අඩංගුවට ගෙන සිටි දමිළ රැඳවියන් පනස් තුන් දෙනෙක් රටේ ජනවාර්ගික කෝලාහල ඇති වූ වහා ම බන්ධනාගාරය තුළ ඇති වූ කෝලාහලයකින් අනෙකුත් සිරකරුවන් විසින් ඝාතනය කරන ලදී. නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයාගේ සහාය ඇති ව, කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කළ පශ්චාත් මරණ පරීක්ෂණයක් මඟින් එම මරණ බන්ධනාගාර කෝලාහල හේතුවෙන් සිදු වූ මනුෂ්‍ය ඝාතන ලෙස තීන්දු විය.[8]

බන්ධනාගාරවලින් පිටත පවතින නොසන්සුන්කාරී තත්ත්වයන් හේතුවෙන් බන්ධනාගාරය තුළ පනත යටතේ සිටින රැඳවියන් මුහුණදෙන අවදානම් ඉස්මතු කරමින් පනත යටතේ සිටින කාන්තා රැඳවියෙකු පැවසුවේ, "අනෙක් රැඳවියන්ගෙන් බොහෝ දෙනෙක් මා දෙස තවමත් බලන්නේ ත්‍රස්තවාදියෙකු ලෙස යි. පසුගිය සතියේ සිට තත්ත්වය තවත් නරක අතට හැරී තිබෙනවා."[9]

ජීවිතාන්තය දක්වා සිරදඬුවමට ලක් කර ඇති, සහ 1998 සිට බන්ධනාගාරයේ ගත කර ඇති, අධ්‍යයනයේ දී හමු වූ වැඩි ම කාලයක් බන්ධනාගාරයේ ගත කර ඇති පනත යටතේ සිටින රැඳවියා, 1998 සිට තමන් දුටු පනත යටතේ සිටින රැඳවියන් ඉලක්ක කරගෙන බන්ධනාගාර තුළ සිදු වූ කෝලාහල සහ මිනීමැරුම් මාලාව විස්තර කළේ ය. මෙහි දී පනත යටතේ සිටින රැඳවියන් අවදානමට ලක්වීමට ඇති හැකියාව සහ බන්ධනාගාරය තුළ අනෙක් රැඳවියන් සමඟ ඔවුන්ට නොසන්සුන්කාරී ස්වභාවයෙන් යුතු සම්බන්ධතාව පිළිබඳ ඔහු අවධාරණය කළේ යඃ

8 Department of Prisons, Prison Statistics of Sri Lanka, 2018, p 92.

9 The female PTA inmate is referring to an incident where on 22 June 2018 a cache of arms, ammunition and explosives alleged to have connections to the LTTE were discovered by the police in a trishaw, in Oddusudan, Mullaitivu.

"කළුතර දී අපට බොහෝ ආරක්ෂක ගැටලු තිබුණා. අපි පහුවදා ජීවත් ව සිටියි ද යන්න ගැනවත් අපි දැන සිටියේ නැහැ... අපට [ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන්] එරෙහි ව ගැටලු සහ කෝලාහල ගණනාවක් සිදුවුණා [උතුරේ සහ දකුණේ ගැටලු නිසා]. එක් වතාවක්, [12/12/1997], සිංහල සිරකරුවෝ දොරවල් කඩාගෙන කුටිවලට ඇතුළු වෙන්න උත්සාහ දැරුවා. ඔවුන්ට අවශ්‍ය වුණා අපට පහර දෙන්න. අපි හැමෝම ඇතුළට දිව්වා. නමුත් එක්කෙනෙක් බිම වැටුණා. ඔහුගේ කකුල පොරොවකින් කපා දමා, ඔහුට කෲර ලෙස වධහිංසා දුන්නා."

පනත යටතේ සිටින රැඳවියන්ගේ බොහෝ විස්තරවලින් පෙන්වා දෙන්නේ ඔවුන්ගේ ජීවිත පිළිබඳ ව ඇති බිය බන්ධනාගාර තුළ ඔවුන්ගේ ජීවිතවල නිරන්තර දෙයක් වී ඇති බව ය. නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ පනත යටතේ නොවන රැඳවියන්ගේ වාට්ටුවේ නවතා ඇති පනත යටතේ වරදකරුවෙක් වූ එක් සිරකරුවෙක් පවසා සිටියේ, ඔහු තම සෙසු රැඳවියන් කෙරෙහි නිරන්තරයෙන් බියෙන් සිටින බව ය. "ඔවුන් සිංහල සිරකරුවන් නිසා අපි බය යි. අපි කිසි විටක ඔවුන්ගේ මානසික තත්ත්වය දන්නේ නැහැ. යම් ගැටලු හෝ කෝලාහල ඇති වුවහොත් අපේ ජීවිතයට තර්ජනයක් විය හැකි යි. අපට පහරදීම හෝ මරා දැමීම ඔවුන්ට අපහසු නැහැ."

බන්ධනාගාර තුළ ශාරීරික වශයෙන් වෙන් කිරීම යම් තරමකට එදිනෙදා ප්‍රශ්න අඩු කළත්, පනත යටතේ සිටින රැඳවියන් ඉලක්ක කරගත් කෝලාහල වැනි මහා පරිමාණ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වන අවස්ථාවල දී පනත යටතේ සිටින රැඳවියන්ගේ ආරක්ෂාව රඳා පවතින්නේ බන්ධනාගාර බලධාරීන්ගේ අනුකම්පාව මත ය.

2.5. දුක්ගැනවිලි යොමු කිරීමට ඇති යාන්ත්‍රණවලට ප්‍රවේශය

පනත යටතේ සිටින රැඳවියන් හට දුක්ගැනවිලි යාන්ත්‍රණවලට ඇති ප්‍රවේශය බන්ධනාගාර නිලධාරීන් සමඟ ඔවුන්ට ඇති සම්බන්ධතාවයට සහසම්බන්ධ වේ. මීට පෙර සඳහන් කළ පරිදි, මරණීය දණ්ඩනය නියම වූ සිරකරුවන් මෙන්, පනත යටතේ සිටින රැඳවියන් ද බන්ධනාගාරය තුළ ඔවුන් ගත කර ඇති වසර ගණන හා සලකා බලන විට බන්ධනාගාර නිලධාරීන් සමඟ සුහද සම්බන්ධතාවක් වර්ධනය කර ගැනීමට වැඩි ඉඩක් ඇති නිසා තමන්ගේ දුක්ගැනවිලි වාර්තා කිරීමට ඔවුන්ට හැකියාව ලැබී ඇත. තව ද, බන්ධනාගාරය තුළ ගත කර ඇති දීර්ඝ කාලපරිච්ඡේද හේතුවෙන්, ඔවුන්ගේ දුක් ගැනවිලි අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කරන්නේ කෙසේ ද යන්න ගැන අනෙක් සිරකරුවන්ට වඩා දැනුවත්භාවයක් ද ඔවුන් සතුව පවතී. උදාහරණයක් ලෙස, නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයේ දිගුකාලීන ව පනත යටතේ වරදකරුවකු ව සිටින සිරකරුවෙකු පැවසුවේ, "අපට සාමාන්‍ය නිලධාරීන් සමඟ ගැටලුවක් ඇත්නම්, බන්ධනාගාර අධිකාරි හෝ ප්‍රධාන ජේලර් වෙත දැනුම් දිය හැකි බව ය. බොහෝ විට ඔවුන් [නිලධාරීන්] බයයි බන්ධනාගාර අධිකාරී හෝ ප්‍රධාන ජේලර්වරයා වාට්ටු වටේ යන විට [අපට තිබෙන ගැටලු ගැන] ඔවුන්ට දැනුම් දෙයි කියා.□ විශේෂයෙන් නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ සහ අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරය තුළ පනත යටතේ සිටින රැඳවියන් ඒ අවස්ථාවේ සිටි බන්ධනාගාර අධිකාරි සහ ප්‍රධාන ජේලර්වරයා ඔවුන්ගේ දුක්ගැනවිලිවලට ඉහළ ප්‍රතිචාරයක් දක්වන බවට කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. මෙම බන්ධනාගාර දෙකෙහි ම බන්ධනාගාර අධිකාරි සහ ප්‍රධාන ජේලර්වරයා නිතිපතා වාට්ටු වටා යන අතර, ඒ අවස්ථාවේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන්ට තමන් මුහුණදෙන ගැටලු පිළිබඳ ව ඔවුන්ට කතා කළ හැකි වූ බව සඳහන් කළ යුතු ම ය.

පනත යටතේ සිටින රැඳවියන් කණ්ඩායමක් නවතා ඇති සියලු ම බන්ධනාගාර තුළ, කණ්ඩායම් අතර ඉහළ මට්ටමක එකමුතුකමක් ඇති බව අධ්‍යයනය අතරතුර දී නිරීක්ෂණය විය. මෙය විශේෂයෙන් ඔවුන්ගේ දුක්ගැනවිලි සැලකිල්ලට ගැනීම සහතික කිරීමට අදාළ ව එසේ විය. උදාහරණයක් ලෙස, නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ රිමාන්ඩ්භාරයේ සිටින පිරිමි රැඳවියෙක් පැවසුවේ, "අපි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සිරකරුවන් බැවින් අප අතර එකමුතුකම පවත්වා ගන්නවා. එක් පුද්ගලයෙක් ගැටලුවකට මුහුණ දෙන්නේ නම්, අපි සියලු දෙනා ම එම තැනැත්තා වෙනුවෙන් පෙනී සිටිනවා" යනුවෙනි.

අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරය තුළ නවතා ඇති තවත් රිමාන්ඩ් භාරයේ සිටින්නෙක්, "අප අතර මෙහි හොඳ එකමුතුකමක් තිබෙනවා" යනුවෙන් පැවසුවේ ය.

පනත යටතේ සිටින රැඳවියෝ, නඩු විභාග දීර්ඝ ලෙස ප්‍රමාද වීම වැනි ඔවුන් මුහුණදෙන පොදු ගැටලු කෙරෙහි අවධානය යොමු කර ගැනීම සඳහා උපවාසවල නිරත වීම ද සිදු කරති. තමන්ගේ නඩුවලට සම්බන්ධ ගැටලු වෙනුවෙන් පනත යටතේ සිටින රැඳවියන් උපවාසවල නිරත වනවිට ඔවුන් බන්ධනාගාරය වෙත පූර්ව ලිඛිත දැනුම් දීමක් කරන බව ද එසේ කරනු ලබන්නේ බන්ධනාගාර බලධාරින් අපහසුතාවයට පත් නොවී සුදානම් ව සිටීම සහතික කිරීම උදෙසා බව ද කොමිෂන් සභාව නිරීක්ෂණය කරන ලදී. නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ පනත යටතේ රිමාන්ඩ් භාරයේ සිටින පිරිමියෙකු ප්‍රකාශ කළේ, "එම උපවාසයන් පෞද්ගලික පරමාර්ථ සඳහා නොව, පොදු පරමාර්ථයක් වෙනුවෙන්, සියලු ම දේශපාලන සිරකරුවන් විසින් කරන ලද්දක්" යනුවෙනි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ බන්ධනාගාරවල සිටින රැඳවියන් ඔවුන්ගේ දේශපාලන නියෝජිතයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීන් විසින් ඔවුන්ගේ දුක්ගැනවිලිවලට ප්‍රතිචාර දැක්වීම සිදු කළ යුතු බවට අපේක්ෂා කරන බවත්, ඔවුන් මුහුණ දෙන ගැටලු කෙරෙහි අවධානය යොමු කර ගැනීමේ උත්සාහයක් වශයෙන් ඔවුහු බන්ධනාගාර බලධාරීන් හරහා ඔවුන්ගේ දේශපාලන නියෝජිතයින් වෙත ලිපි යවන බවත් පැවසූහ.

2.6. බන්ධනාගාරය තුළ පුනරුත්ථාපනය

පනත යටතේ රිමාන්ඩ් භාරයේ සිටින්නන් සහ වරදකරුවන් වී ඇති පිරිමි රැඳවියන්ගෙන් බහුතරය කිසිදු වෘත්තීය/ කුසලතා පුහුණු, අධ්‍යාපනික අවස්ථා හෝ බන්ධනාගාර වැඩවලට සම්බන්ධ නොවන බව පහත 20.2 ප්‍රස්තාරයෙන් පෙන්වා දෙයි. පහත එක් එක් තේමාත්මක උපකොටස තුළ සාකච්ඡා කර ඇති ගුණාත්මක දත්ත මඟින් ප්‍රමාණාත්මක දත්ත සනාථ වේ.

20.2 ප්‍රස්තාරය සිරකරු බාණ්ඩ අතර යම් ආකාරයක බන්ධනාගාර වැඩ හෝ කුසලතා සංවර්ධනයෙහි නියැලෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් අතර පිරිමි ප්‍රතිචාරකයින්[10]



වෘත්තීය/ කුසලතා පුහුණු

පනත යටතේ සිටින රැඳවියන් දීර්ඝ කාලයක් රිමාන්ඩ් භාරයේ තබා ගන්නා නමුත්, පුනරුත්ථාපනය පරිච්ඡේදයේ සාකච්ඡා කළ පරිදි, රිමාන්ඩ් භාරයේ සිටින්නන්ට කිසිදු අධ්‍යාපනික, වෘත්තීය හෝ කුසලතා පුහුණු ලබා දීමක් නැත. මින් අදහස් කෙරෙන්නේ වසර දහයක් රිමාන්ඩ්ගත වී සිටි පුද්ගලයෙක් ඔවුන්ගේ

10 Of the two PTA convicted women in our study, one engages in a sewing class in PCP while the other engaged in sewing party at WCP.

සිරගත වීමේ කාලය අවසන් වීමේ දී පුනරුත්ථාපනය වීමට හෝ යළි සාර්ථක ව සමාජගත වීමට උපකාරී වන කිසිදු අර්ථවත් කුසලතා ලබාගෙන නොමැති බව යි. එවැනි වැඩසටහන්වලට ප්‍රවේශය තිබිය යුතු වරදකරුවන් වී ඇති සිරකරුවන් පවා අභියෝගවලට මුහුණදුන් බවට, පල්ලේකැලේ සංවෘත බන්ධනාගාරයේ සිටිනා පනත යටතේ වරදකරුවෙකු වූ සිරකරුවෙකු පැවසූ ආකාරයෙන් පැහැදිලි වේ. "පාඨමාලා සිංහලෙන් පවත්වන බැවින්, මට පාඨමාලාවට සහභාගී වීමට හැකියාවක් නැහැ. මට සිංහල කියවීමට හෝ ලිවීමට බැහැ."

අධ්‍යයනයේ දී, පනත යටතේ වරදකරුවන් වූ පිරිමි රැඳවියන්ගෙන් 11%ක් සහ රිමාන්ඩ්භාරයේ සිටින්නන්ගෙන් 3%ක් ඔවුන් වෘත්තීය/ කුසලතා පුහුණුවල නිරත වන බව පැවසූහ. මෙම 3% සමන්විත වන්නේ බන්ධනාගාර අධිකාරිවරයාගේ විශේෂ අවසරය ඇතුව, කලාශිල්ප පන්තියට සහභාගී වන අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින පනත යටතේ රිමාන්ඩ්ගත වූවන්ගෙන් බව සටහන් කළ යුතු ය. සෑම බන්ධනාගාරයක ම සිටිනා පනත යටතේ රඳවා සිටින රැඳවියන් ඉගෙනීමට සහ කුසලතා වැඩිදියුණු කර ගැනීමට කැමැත්තක් ඇති බව ප්‍රකාශ කළහ. ඔවුන්ගේ ම උවමනාවට හස්ත කර්මාන්ත ක්‍රියාකාරකම්වල යෙදෙන රැඳවියන් කිහිපදෙනෙකු කොමිෂන් සභාවට හමු විය. මෙයින් ඔවුන්ට ඉමහත් මානසික සහනයක් ලැබෙන බව ඔවුහු විශ්වාස කරති. උදාහරණයක් වශයෙන්, අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ්ගත වූවෙක් භාණ්ඩ නිර්මාණය කිරීමට බන්ධනාගාරයෙන් සහ ඔහුගේ පවුලෙන් ඔහුට සපයා දෙන අමුද්‍රව්‍ය භාවිත කරයි. මෙම රැඳවියා අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයෙහි පැවැත්වෙන හස්ත කර්මාන්ත පන්තියකට ද සහභාගී වෙයි. මීට අමතර ව, ප්ලාස්ටික් සහ පොලිතීන් විස්කෝතු ආවරණ භාවිත කර, කුඩා බෑග් සහ පසුම්බි නිෂ්පාදනය කරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් බොහෝ දෙනෙකු ද කොමිෂන් සභාවට හමු විය. ඔවුන්ගේ පවුල්වල අය ඔවුන් බැහැදැකීමට පැමිණෙන විට මෙම භාණ්ඩ ඔවුන්ට ලබා දෙති.

නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ සිටින පනත යටතේ සිටිනා වරදකරුවකු වන පිරිමි සිරකරුවෙක් දැනට පවතින සිරගත කිරීමේ ක්‍රමවේදය තුළ ඇති දෝෂ පෙන්වා දුන්නේය. එම ක්‍රමවේදය තුළ දී රැඳවියා සහ සමාජය යන දෙපාර්ශ්වය ම වටිනා කාලය සහ මානව සම්පත් අහිමි කරගෙන, ඒවා නිෂ්ඵල ලෙස වැය කරනු ලබයි. වරදකරුවකු ව සිටින මෙම සිරකරු අවධාරණය කළේ කිසිදු පුනරුත්ථාපනයක් හෝ ප්‍රතිසංස්කරණයක් ළඟා කර ගැනීමට උපකාරී වන ලෙස පවතින ක්‍රමවේදය සැලසුම් කර නොමැති බව යිඃ

> "මගේ අදහසට අනුව, ඔවුන්ට හුදෙක් වුවමනා කරන්නේ මිනිසුන් ව බන්ධනාගාරගත කර, පසු ව කාලය පැමිණි විට ඔවුන් නිදහස් කිරීමට යි. ඔවුන් ව ප්‍රතිසංස්කරණය කිරීමට ඒ අයගේ අභිප්‍රායක් නැත. [උදාහරණයක් ලෙස,] දෙමළ දේශපාලන සිරකරුවන් යම් ආකාරයක අධ්‍යාපනයක් හෝ රැකියා පුහුණුවක් ලබා ගැනීමට කැමති වේවි [මන්දයත් අපි දීර්ඝ කාලයක් බන්ධනාගාරගත ව සිට ඇති බැවින්]. අපි ඒ සඳහා ඉල්ලීම් පවා කර තිබෙන නමුත්, අපට කිසිවක් ලැබුණේ නැහැ."

බන්ධනාගාර වැඩ

පනත යටතේ සිටින රැඳවියෙකු එල්ටීටීඊයට සම්බන්ධ බව සහ එල්ටීටීඊ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වූ බවට ඇති පොදු මතය බන්ධනාගාර වැඩවල යෙදීමේ දී එම වැඩ කරනා පරිසරයේ තත්ත්වයන් කෙරෙහි ද අහිතකර බලපෑමක් ඇති කළ හැකි ය. උදාහරණයක් ලෙස, නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදකරුවකු වී මේවන විට අභියාචනා මත සිටින එක් පිරිමි සිරකරුවකු පැවසුවේඃ

> "මට තීන්දුව ලැබුණු පසු, මාව වැලිකඩ බන්ධනාගාරයට ගෙන ගොස් දින දහයක් එහි රඳවා තැබුවා. එහි සිටි අවසාන දින තුනේ දී ඔවුන් මාව වේවැල් කණ්ඩායමට පැවරුවා. මම එහි දී වේවැල් සෑදුවා. එහි දී ද මට පැවසුවා ඔවුන්ගේ [සිංහල] අයව මරපු නිසා මට

> දඬුවම් දී තිබෙන බව. මම මීට වඩා තරුණ වුණා නම්, ඔවුන් මට පහර දෙන බවත්, මම මහලු නිසා, දවස් තුනක් තද අව්වේ වේවැල් හදන්න කියලාත් ඔවුන් මට කිව්වා. මෙහාට [නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය] ආවට පස්සේ, මාව රෙදි සෝදන කණ්ඩායමට යැව්වා. මෙහි දී සති දෙකක් මට ඇඳ ඇතිරිලි සහ වෙනත් රෙදි සෝදන්න සිදු වුණා. නමුත් මම අභියාචකයෙක් බවට දැනුම් දීම ලැබුණට පස්සේ, ඔවුන් මට වැඩ දීම නැවැත්තුවා."

බන්ධනාගාරයේ වැඩ කරනා ස්ථානවල සාමාන්‍ය තත්ත්වය වුව ද සෑහීමකට පත්විය හැකි අන්දමින් නොමැති අතර බන්ධනාගාර වැඩ පිළිබඳ පරිච්ඡේදයේ සාකච්ඡා කළ පරිදි පිළිගත් කම්කරු ප්‍රමිතීන්ට අනුකූල ව නොවේ. මේ අවස්ථාවේ දී, සිරකරුවා චෝදනා කරන්නේ, ඔහු ව පනත යටතේ වන රැඳවියෙක් ලෙස හඳුනා ගත් බැවින් ඔහුගේ බන්ධනාගාර කණ්ඩායම් වැඩවල දී ඔහු ව වෙනස්කොට සැලකීමට ලක් වූ බව ය.

නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ පනත යටතේ සිටින රැඳවියන් කිහිප දෙනෙක් මුළුතැන්ගෙයි කණ්ඩායමේ සහ රෙදි සෝදන කණ්ඩායමේ වැඩ කරන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කළේ ය. පනත යටතේ රිමාන්ඩ්ගත වී සිටින පිරිමි රැඳවියන්ගෙන් 10%ක් පැවසුවේ දීර්ඝකාලීන ව රිමාන්ඩ්ගත වී සිටින සමහර පිරිමි RC අංශයේ නිලධාරීන්ට සහාය වීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම හේතුවෙන් ඔවුන් බන්ධනාගාර වැඩවල නිරත වී සිටින බවයි. අධ්‍යයන නියැදියේ දී පනත යටතේ සිටින රැඳවියන් බහුතරය ලබා ගනු ලැබුවේ පනත යටතේ රැඳවියන් විශාල බහුතරය රඳවා සිටින නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය වෙතිනි. නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය යනු පනත යටතේ වරදකරුවන් වූ සිරකරුවන් හැර වෙනත් කිසිදු වරදකරුවෙකු වූ සිරකරුවෙකු රඳවා නොගන්නා රිමාන්ඩ් බන්ධනාගාරයක් බැවින් වරදකරුවන් වූ සිරකරුවන් විශාල සංඛ්‍යාවක් නවත්වා සිටින සංවෘත බන්ධනාගාර හෝ වෙනත් රිමාන්ඩ් බන්ධනාගාර මෙන් මනාව ව්‍යුහගත කර ඇති වෘත්තීය/ කුසලතා පුහුණු වැඩසටහන් හෝ කණ්ඩායම් වැඩ එහි නොමැත.

අධ්‍යයනයෙහි පනත යටතේ සිටින කාන්තා රැඳවියන් දෙදෙනා ම යම් වැඩක යෙදී සිටියහ. පනත යටතේ සිටින එක් කාන්තා සිරකාරියක් වැලිකඩ බන්ධනාගාරයේ මැහුම් කණ්ඩායමේ නිරත වී සිටි අතර, අනෙක් කාන්තා රැඳවියා පල්ලේකැලේ සංවෘත බන්ධනාගාරයේ විවීමේ කණ්ඩායමට සම්බන්ධ වූවා ය. පනත යටතේ පිරිමි රිමාන්ඩ්ගත වූවන් සමග සංසන්දනය කරන විට, පනත යටතේ සිටින වරදකරුවන් වූ පිරිමි සිරකරුවන් අතර ප්‍රතිචාරකයින් වැඩි දෙනෙක් පැවසුවේ ඔවුන් බන්ධනාගාර රැකියාවක, වෘත්තිය/ කුසලතා පුහුණු හෝ කණ්ඩායම් වැඩවල නිරත වන බව යි. කිසිදු රිමාන්ඩ් සිරකරුවෙකුට බන්ධනාගාරය මගින් වෘත්තිය/ කුසලතා පුහුණු ලබා දීම අපේක්ෂා නොකරන බවත්, ඔවුන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් නොවුවහොත්, ඔවුන් ව බන්ධනාගාර ශ්‍රමය සඳහා භාවිත නොකළ හැකිය යන කරුණ මගින් මෙය පැහැදිලි වේ.

අධ්‍යාපනය

බන්ධනාගාර හරහා රැඳවියන් හට සාමාන්‍යයෙන් ලබාගත හැක්කේ සීමිත අධ්‍යාපන අවස්ථා වන අතර, පුනරුත්ථාපනය පිළිබඳ පරිච්ඡේදයේ සාකච්ඡා කළ පරිදි, එවැනි අවස්ථාවන් සඳහා පනත යටතේ සිටින රැඳවියන්හට එහි දී විශේෂයෙන් ම රිමාන්ඩ්ගත වූවන් හට ඇති ප්‍රවේශය ඊටත් වඩා සීමිත වේ. නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ පනත යටතේ රිමාන්ඩ්ගත වූවෙක් පැවසුවේ, "මම ඔවුන්ගෙන් නිතර ම ඉල්ලා සිටිනවා මට යම් පාඨමාලා හැදෑරීමට ඉඩ දෙන ලෙසට. නමුත් ඔවුන් ඒ සඳහා කටයුතු කරන්නේ නැහැ. ඔවුන්ට භාෂා පාඨමාලා තිබේ නම්, අපට ඒවා කළ හැකි යි." කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින පනත යටතේ රිමාන්ඩ්ගත වූවකු පැවසුවේ, "මෙහි මාස්ටර් XX (රිමාන්ඩ්ගත වී සිටින තවත් අයෙක්)* ඉංග්‍රීසි පන්ති පවත්වනවා. මම එයට සහභාගි වෙනවා" යනුවෙනි.

වෘත්තීය/ කුසලතා, අධ්‍යාපනික සහ බන්ධනාගාර වැඩවලට ප්‍රවේශය නොමැති වීම, ව්‍යුහාත්මක ගැටලුවක් වනුයේ, රිමාන්ඩ් භාරයේ සිටින්නන් හට එවැනි ඉඩ ප්‍රස්ථා ලබා දීම බන්ධනාගාරවලින් අපේක්ෂා නොකරන

බැවිනි. එහෙත් අපගේ අධ්‍යයනයේ දත්ත මගින් විදහා දක්වන්නේ පනත යටතේ වසර පහකට හෝ දහයකට වඩා බන්ධනාගාරගත ව සිටින්නන් ගණන, වරදකරුවන් වී ඇති සිරකරුවන්ට වඩා වැඩි බවයි.[11] නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ වරදකරුවකු වී ඇති පනත යටතේ සිටින සිරකරුවකු මෙසේ පැවසීය:

> "දෙමළ දේශපාලන සිරකරුවන් ඇත්තෙන් ම කැමතියි යම් ආකාරයක අධ්‍යාපනය හෝ රැකියා පුහුණුවක් ලබා ගැනීමට. අපි ඒ සඳහා ඉල්ලීම් පවා කර තිබෙනවා. නමුත් අපට කිසි දෙයක් ලැබී නැහැ. ඒ පිළිබඳ ව කිසි ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ. ඉගෙනීමට කැමති සිරකරුවන්ට ඔවුන් අධ්‍යාපනය සහ පුහුණුව ලබා දිය යුතු යි."

පනත යටතේ බන්ධනාගාරවල සිටින රිමාන්ඩ්ගත වූවන් සහ වරදකරුවන් වී ඇති සිරකරුවන් පැවසුවේ ජලනල වැඩ, විදුලි වැඩ, මෝටර් කාර්මික වැඩ, පරිගණක, රූපවාහිනී, වායුසමීකරණ අලුත්වැඩියා කිරීම වැනි ඉල්ලුමක් ඇති වැඩ සඳහා ඔවුන් ව සූදානම් කළ හැකි වෘත්තීය පුහුණුවල ඔවුන්ට නිරත විය හැකි නම්, බන්ධනාගාරයෙන් නිදහස් වූ පසු ඔවුන්ට ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීමට හැකි වනු ඇතැයි යනුවෙනි. රිමාන්ඩ්ගත වූවන් වරදකරුවන් ලෙස නොසැලකෙන බැවින්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් ඔවුන් ව පුනරුත්ථාපනය කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම අපේක්ෂා නොකළ ද, පනත යටතේ සිටින රිමාන්ඩ්ගත වූවන් කරනා ලද ප්‍රකාශයන්හි දී මතු කරනා ලද වැදගත් කාරණයක් වන්නේ ඔවුන්ගේ වැඩිහිටි ජීවිතවලින් වැඩි කාලයක් සිරගත ව සිටීමෙන් පසු ව අර්ථවත් කුසලතා ඇති ව සමාජයට යළි ඒකාබද්ධ වීමට හැකියාව තිබීමේ ඇති වැදගත්කම යි.

පුනරුත්ථාපනය කළ සිරකරුවන් නිවාස නිවාඩු සහ බලපත්‍ර මණ්ඩලය හරහා නිදහස් කිරීම[12]

පනත යටතේ සිටින සිරකරුවෝ ද නිවාස නිවාඩු සහ බලපත්‍ර මණ්ඩලය හරහා නිදහස් වීමට සුදුසුකම් ලබති. බදුල්ල රිමාන්ඩ් බන්ධනාගාරයේ, හින්දු කෝවිල රැක බලා ගැනීම පවරා තිබූ පනත යටතේ වරදකරුවෙකු ව සිටි එක්තරා සිරකරුවෙකු බලපත්‍ර මත නිදහස් කරන ලද බව පුනරුත්ථාපන නිලධාරීහු කොමිෂන් සභාවට දැන්වූහ. කොමිෂන් සභාව විසින් විමසීමෙන් අනතුරු ව නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයෙහි පුනරුත්ථාපන අංශය පැවසුවේ, පනත යටතේ වරදකරුවන් වූ සිරකරුවන් කිහිප දෙනෙකු ම නිවාස නිවාඩු ලබා ගොස් ඇති බව සහ බලපත්‍ර මත නිදහස් කර ඇති බව යි. පනත යටතේ වරදකරුවකු වන සිරකරුවකු සහ වෙනත් වරදකරුවකු වන සිරකරුවකු අතර මේ සඳහා ඇති එක ම පටිපාටිමය වෙනස වන්නේ, පෙර සඳහන් කළ වූවන් සඳහා ධනාත්මක පොලිස් වාර්තාවක් අනිවාර්ය වීම වන බව ද පුනරුත්ථාපන නිලධාරියා පැහැදිලි කළේ ය. පොලිස් වාර්තාවේ අවධානය වන්නේ, පොලිසිය විසින් විමර්ශනය කළ යුතු පනත යටතේ සිටින වරදකරුවකු වූ සිරකරුවාගේ පවුල ය. එම පවුල එල්ටීටීඊයට හෝ වෙනත් යම් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට යම් සම්බන්ධතාවක් තිබේ ද නැතහොත් එසේ සැකකර තිබේ ද යන්න විමර්ශනය කර නිරවුල් කිරීම ය. තමන්ගේ පවුල්වල සාමාජිකයින් ද, තමන් සමඟ ම අත්අඩංගුවට ගෙන රඳවා තබා ගත් බව ද, මාස කිහිපයකට පසු ව නිදහස් කළ බව ද, නැතහොත් ඔවුන් රිමාන්ඩ් භාරයට ගෙන පසු ව නිදහස් කළ බව ද සමහර පනත යටතේ සිටින රැඳවියෝ පැවසූහ. එබැවින්, 'එල්ටීටීඊයට සම්බන්ධකමක් නොමැති ලෙස හෝ' එල්ටීටීඊ සැකකරුවෙක් වී නොසිටි බව' ඔවුන්ට සුදුසුකම් නොලැබේ. එහි ප්‍රතිඵලය වන්නේ නිවාස නිවාඩු මත හෝ බලපත්‍ර මණ්ඩලය හරහා යාමේ අවස්ථාව සිරකරුවාට අහිමි වීම යි. පුනරුත්ථාපන නිලධාරියාට අනුව, තමන්ගේ පවුල් පිළිබඳ පොලිස් වාර්තා 'එල්ටීටීඊ ක්‍රියාකාරකම්වලින් තොරය' යනුවෙන් ලැබී, ඒ හේතුවෙන් නිවාස නිවාඩු සහ බලපත්‍ර මණ්ඩලය හරහා ගිය අය සිටිති.

---

11 In our study, 44% of the convicted men have been in prison for one month to– one year, 30% have been in prison for one -to five years, 10% have been in prison for less than a month. However, 37% of the PTA male remandees have been in prison for five to ten years while 22% of PTA male remandees have been in prison for more than ten years. 46% of PTA convicted men have been in prison for five to ten years and 29% for more than ten years.

12 For a detailed discussion on Home Leave and License Board schemes, please refer chapter Early Release Measures.

බලපත්‍රයක් මගින් කලින් නිදහස් කිරීමට පෙර රැඳවියා පිළිබඳ පසුබිම් පරීක්ෂාවක් කිරීම අවශ්‍ය ලෙස සලකන අතර, සිරකරුවාගේ පවුල එල්ටීටීඊය සමඟ සම්බන්ධකම්වලින් නිදහස් බව අවශ්‍ය වීම, පුනරුත්ථාපනය කර ආපසු සමාජයට නිදහස් කිරීමට සුදුසු ලෙස සලකන සිරකරුවකුගේ පවුල දෙස සැකයෙන් බැලීමකි. එමගින් නිර්දෝෂීභාවය පිළිබඳ ව කෙරෙන පූර්ව නිගමනය කෙරෙහි සහජයෙන් ම පවතින අගතියන් මගින් ඇති කරන ගැටලු පෙන්වා දෙනු ලැබේ.

සමාජයට සාර්ථක ව යළි සම්බන්ධ කිරීමේ දුෂ්කරතා

වරදකරුවකු වී ඇති සිරකරුවෙකු නිවාස නිවාඩු යවන විට, සමාජය තුළට යළි සම්බන්ධ වීම සඳහා සූදානම් වීම ආරම්භ කිරීමට ඔහුට අවස්ථාවක් ලබා දෙන අතර, බලපත්‍රයක් මගින් නිදහස් කරන වරදකරුවකු වී ඇති සිරකරුවෙකු පූර්ණ ව පුනරුත්ථාපනය වී සමාජයට යළි ඒකාබද්ධ වීමට හැකියාව ඇති බව අපේක්ෂා කෙරේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුනරුත්ථාපන අංශයට අනුව, යළි යළිත් බන්ධනාගාරගත වීමේ අනුපාතය සහ නිවාස නිවාඩු හෝ බලපත්‍ර උල්ලංඝන සංඛ්‍යාව ඉතා අවම වීමට හේතුව මෙය වේ. පනත යටතේ සිටින සිරකරුවෝ නිදහස් වීමෙන් පසු ව වුව ද, තමන්ට සමාජමය වශයෙන් යළි ඒකාබද්ධ වීමට සහ තම ජීවිත යළි ගොඩනගා ගැනීමට ඉඩ නොදෙනු ඇතැයි දැඩි ලෙස බිය වූහ. අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටිනා පනත යටතේ සිටින රිමාන්ඩ්ගත වූවකු විස්තර කළ පරිදි:

> "ත්‍රස්ත විමර්ශන අංශය විසින්ම මට කියා තිබුණා ඔවුන්ට හැකිතාක් කල් මාව බන්ධනාගාරය තුළ තබාගන්නා බවත්, හැකි සෑම පළිගැනීමක් ම ගන්නා බවත්, අපි මොන යම් ලෙසකින් හෝ පිටතට ගියත්, [දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් පසු නිදොස් කොට හෝ නිදහස් කළ විට] ඔවුන් අපට සැනසීමෙන් ජීවත් වීමට ඉඩ නොදෙන බවත් පැවසුවා.
>
> මට මෑතක දී අසන්නට ලැබුණා ත්‍රස්ත විමර්ශන අංශය මියගිය යුද හමුදා සේවක පිරිස්වල පවුල්වල සාමාජිකයින්ට අප ගැන දැනුම් දෙන බව. නියම සත්‍යය කුමක් දැයි පවුල් දන්නේ නැහැ. අපෙන් පළි ගැනීමට ඕනෑ කරන එක්කෙනෙක් හෝ අවම වශයෙන් සිටිය හැකි යි. ඔවුන් අපව මරන්නට උත්සහා කර එය හදිසි අනතුරක් ලෙස පෙන්විය හැකියි. මට මගේ ජීවිතය ගැන බියක් තිබෙනවා. මම එළියට ගියොත් මාව මරන්න 90%ක අවස්ථාවක් තිබෙන බව මම දන්නවා.
>
> එම නිසා, මට දැනගන්නට අවශ්‍යයි, මගේ ජීවිතය ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි කුමක් ද? කියා. මට බන්ධනාගාරය ඇතුළේ ගැටලුවක් නැහැ [මේ වනතුරු] මම තවමත් මගේ නඩුව වෙනුවෙන් රිමාන්ඩ් භාරයේ සිටින නිසා. ගැටලුවක් ඇති වෙන්නේ මම මගේ නඩුව සඳහා යන විට යි."

පනත යටතේ සිටින ඇතැම් රැඳවියෝ, ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වුවහොත්, හෝ නිදහස් වීමෙන් පසු උල්ලංඝනය වේ යැයි ඔවුන් බිය වේ නම්, ඔවුන්ට කොමිෂන් සභාව සමඟ සම්බන්ධ ව සිටිය හැකි දැයි තමන් තුළ පවත්නා බිය මත පදනම් ව විමසූහ.

දීර්ඝ සිරදඬුවමක් විඳීම හෝ දිගු කාලයක් සිරගත ව සිටීම සමාජයීය ව හුදෙකලා වීමට හේතු වේ. මෙය සමාජයට නැවත සම්බන්ධවීමේ දී අභියෝගයක් බවට පත් වේ. ඊට අමතර ව, අත්අඩංගුවට ගැනීමට, රඳවා ගැනීමට සහ නඩු පැවරීමට භාවිත කරනු ලබන නීතියේ ස්වභාවය සහ එය බොහෝ අවස්ථාවන්හි දී අපයෝජනය කර සහ අවභාවිත කර ඇති හේතුවෙන් පනත යටතේ සිටින රැඳවියන් තවදුරටත් දුෂ්කරතාවලට මුහුණ දෙති. නිදහස් වීමෙන් පසු, ඔවුන් නිරන්තර බියෙන් ජීවත් විය යුතු නම්, සිරගත කිරීමේ පරමාර්ථය ලෙස අපේක්ෂා කරන පුනරුත්ථාපනය සහ යළි සාර්ථක ව සමාජයට ඒකාබද්ධ කිරීම ඉටුවේ දැයි යන්න සැක සහිත ය.

3. රිමාන්ඩ් භාරයේ සිටිය දී ප්‍රශ්න කිරීම සහ විමර්ශනය කිරීම.

අධ්‍යයනය අතරතුර එක් රැස් කරන ලද ගුණාත්මක දත්තවලින් හෙළිදරව් වූයේ, රිමාන්ඩ් භාරයේ සිටිය දී සමහර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි 7(3) කොටස යටතේ, ත්‍රස්ත විමර්ශන ඒකකය සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වැනි ආයතනවල අත්අඩංගුවට ගැනීමේ නිලධාරීන් විසින් ප්‍රශ්න කිරීම සඳහා බන්ධනාගාරයෙන් පිටත වෙනත් ස්ථානවලට, බලයලත් සහ අනවසර රැඳවුම් ස්ථාන යන දෙක ම වෙත ගෙනගොස් ඇති බව යි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි 7(3)(අ) සඳහන් කරන්නේ:

6 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ අත්අඩංගුවට ගත් හෝ මෙම වගන්තියේ (1) වන උප වගන්තිය හෝ (2) වන උප වගන්තිය යටතේ රිමාන්ඩ් කර ඇති ඕනෑ ම පුද්ගලයෙකු සම්බන්ධයෙන් මෙම පනත යටතේ විමර්ශනයක් කිරීම පවත්වන පොලිස් නිලධාරියෙකුටත

> (a) එවැනි පුද්ගලයෙකු වෙත ප්‍රවේශය සඳහා අයිතිය සහ එවැනි පුද්ගලයෙකු ප්‍රශ්න කිරීමේ පරමාර්ථය උදෙසා සාධාරණ කාල වේලාවල් තුළ ඕනෑ ම ස්ථානයකට රැගෙන යාමට සහ විමර්ශනය කිරීමේ පරමාර්ථ උදෙසා තැනින් තැනට ගෙනයාමට අයිතිය තිබෙනු ඇතත

රිමාන්ඩ් භාරයෙන් ඔහු ව/ ඇය ව ඉවතට ගත් පසු, ප්‍රශ්න කිරීම සඳහා පුද්ගලයෙකු ව කෙතරම් කලක් රඳවා ගත හැකි දැයි 7 (3) විධිවිධානය ප්‍රකාශ කරන්නේ නැත. තව ද, පුද්ගලයෙකු ව රඳවා තබාගත හැකි උපරිම කාල පරිච්ඡේය ද මෙම විධිවිධානය ලබා දී නොමැත. උදාහරණයක් වශයෙන්, ඇය ව/ ඔහු ව රිමාන්ඩ් භාරයෙන් ඉවතට ගත් පසු ප්‍රශ්න කිරීම සඳහා මාස 18ට වඩා රඳවා තබා ගත හැකි ද යන්න විශේෂිත ව ප්‍රකාශ කර නොමැත. මීට අමතර ව, "රිමාන්ඩ් භාරයේ සිටින" "ඕනෑ ම පුද්ගලයෙකු" "ප්‍රශ්න කිරීම සඳහා ඕනෑ ම ස්ථානයකට" ගෙන යාමේ අභිමතානුකූල බලය ප්‍රශ්න කිරීමේ බලධාරියා හට මෙම විධිවිධානය ලබා දෙයිග

වැඩිදුර ප්‍රශ්න කිරීම සඳහා තමන් ව රිමාන්ඩ් භාරයෙන් පිටතට ගත් විට තමන්ට ශාරීරික ව නුසුදුසු ලෙස සලකන ලද බව පනත යටතේ සිටින රැඳවියෝ කොමිෂන් සභාවට දැනුම් දුන්හ. නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයෙහි සිටිනා පනත යටතේ වරදකරුවකු වූ පිරිමි සිරකරුවෙක් මෙසේ පැවසී යː

> "මාව රිමාන්ඩ් කිරීමෙන් අනතුරු ව මහේස්ත්‍රාත් උසාවියේ අවසරය ඇතුව පැය හැත්තෑ දෙකකට ඔවුන් මාව යළි අත්අඩංගුවට ගත්තා. එදා 2000/11/XX දිනය යි. මට ඔවුන් නරක ලෙස වධහිංසා දුන්නා.... දින 4කට පසු මාව අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කළා. [බන්ධනාගාරයෙන් මාව ගෙනගොස් දින දහයකට පසු] මාව ආපසු කළුතර බන්ධනාගාරයට ගෙන ආවා"
>
> අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව 2000/12/XX දින මාව නැවත වරක් [දෙවන වතාවට] ඔවුන්ගේ අත්අඩංගුවට ගත්තා. ඔවුන් මාවත්, මගේ බිරිඳවත් ඉවතට ගෙන [රිමාන්ඩ් භාරයෙන්] අපේ පාපොච්චාරණ ප්‍රකාශ ලබා ගත්තා. ඔවුන් මාව ඔවුන්ගේ භාරයට [රිමාන්ඩ් භාරයෙන්] ගත් පසු නැවතත් වධ හිංසා කළා. දින හතරකට පසු 2000/XX/XX දින මාව අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ගෙන ගියා. එදින ම මාව ආපසු කළුතර බන්ධනාග ාරයට ගෙන ආවා. මගේ අත්වල අලුත් තුවාල තිබුණා.
>
> පසු ව තුන්වන වතාවට, 2000/12/XX දින අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මාව ඔවුන්ගේ භාරයට ගෙන [දින තුනකට පසු] මාව අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කළා. අධිකරණ වෛද්‍ය නිලධාරියා මගේ සියලු ම තුවාල සටහන් කර ගත්තා. මාව වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කළ දින, ඔවුන් මාව ආපසු කළුතර බන්ධනාග ාරය වෙත ගෙන ආවා.

අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මාව හතර වැනි වතාවට 2000/12/XX දින ගෙන ගොස්, වධ හිංසා පමුණුවා, මගෙන් පාපොච්චාරණ ප්‍රකාශ ලබා ගෙන දින තුනකට පසු අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත ඉදිරිපත් කර, එදින ම ආපසු බන්ධනාගාරය වෙත ගෙන ආවා."

ප්‍රශ්න කිරීම සඳහා සිරකරුවකු රිමාන්ඩ් භාරයේ සිට ගෙන යාම මඟින් අධිකරණමය අධීක්ෂණය මෙන් ම සිරකරුවාගේ ශාරීරික ශුභ සිද්ධිය සඳහා වගකීම සහ නුසුදුසු ලෙස සලකා ඇති යම් අවස්ථාවක දී වගවීම් සම්බන්ධයෙන් බොහෝ ගැටලු මතු කරයි. විනිසුරුවරයෙකු විසින් රිමාන්ඩ්ගත කරන ලද සහ/ හෝ වරදකරුවකු කර ඇති සහ ෆිස්කල් භාරයට යවන ලද පුද්ගලයින් සඳහා බන්ධනාගාර වගකිව යුතු ය. එබැවින්, බන්ධනාගාර බලධාරීන් පුද්ගලයා රිමාන්ඩ්ගත කර ඇති/ වරදකරුවකු කර ඇති විනිසුරුවරයාට/ අධිකරණයට ඔවුන්ගේ යහපැවැත්ම වෙනුවෙන් වගවිය යුතු ය. එහෙත්, තෙවැනි පාර්ශ්වයක් මඟින් පුද්ගලයෙකු ව ප්‍රශ්න කිරීම සඳහා බන්ධනාගාරයෙන් පිටතට රැගෙන යන විට, එම පුද්ගලයාට කුමක් සිදු වන්නේ ද යන්න ගැන බන්ධනාගාර බලධාරීන්ට පාලනයක් නොමැත.

ඉහත ලබා දුන් උදාහරණ දෙකින් විදහා දක්වන පරිදි, බන්ධනාගාර බලධාරීන්ගේ සහ පොලිසියේ වගකීම සම්බන්ධ ව පැහැදිලි කමක් නොමැති වීම හේතුවෙන් සිරකරුවාගේ යහපැවැත්ම සඳහා වගවිය යුත්තේ කුමන බලධාරියා ද යන්න පිළිබඳ ව මෙවැනි අවස්ථාවල දී ගැටලු තිබිය හැකි ය. මෙය විශේෂයෙන් අදාළ වන්නේ නුසුදුසු ලෙස සැලකීම සම්බන්ධයෙන් ය. මන්ද යත්, පනත යටතේ රිමාන්ඩ්ගත ව සිටින්නෙකු හට සිදු කර ඇති තුවාල බන්ධනාගාර නිලධාරීන් හෝ පොලිස් නිලධාරීන් විසින් සිදු කරන ලද්දේ ද යන්න නිර්ණය කිරිමේ දී මෙය අභියෝගාත්මක විය හැකි නිසා ය. උදාහරණයක් ලෙස, පනත යටතේ සිටින සිරකරුවන් පොලිස් විමර්ශනයක් සඳහා බන්ධනාගාර භාරයේ සිට පිටතට රැගෙන යාමට පෙර සහ පසු ව ශාරීරික පරීක්ෂණය පැවැත් වීම සහ දෘශ්‍යමාන ව ඇති තුවාල වාර්තා කිරීම අවශ්‍ය නොකෙරේ. එහෙත්, ප්‍රශ්න කිරීම සඳහා බන්ධනාගාරයෙන් පිටතට ගෙන යන පුද්ගලයෙකු ගෙනා පසු, වධහිංසාවල බලපෑමෙන් බන්ධනාගාරය තුළ මිය ගියහොත්, බන්ධනාගාර නිලධාරීන්ගේ භාරයේ සිටිය දී මරණය සිදු ව ඇති බැවින්, ඔවුන් වගකිව යුතු වනු ඇත. තව ද, නීතියට අනුව, රිමාන්ඩ්ගත වීමට පෙර පහර දීමේ ප්‍රතිඵලයක් ලෙස මරණයට පත් වීම හෝ සිදු වී ඇති යම් හානි වෙනුවෙන් වගකිව යුතු වීමට බන්ධනාගාර බලධාරීන් අකැමති බැවින් ඇතුළු කිරීමේ දී, වධහිංසා පිළිබඳව විමර්ශනය කිරීම අපේක්ෂා කෙරේ.[13]

විමසීම් කිරීමේ දී, නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයෙහි ප්‍රධාන ජේලර්වරයා ප්‍රකාශ කළේ, ඔහුගේ අත්දැකීමට අනුව පනත යටතේ සිටින රැඳවියෙකු ත්‍රස්ත විමර්ශන අංශයේ/ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ/ පොලිසියෙහි භාරය වෙත නිදහස් කරනු ලබන්නේ එසේ කළ යුතු බවට අධිකරණ නියෝගයක් ලැබීමෙන් පසු ව පමණක් වන බව යි. අධිකරණ නියෝගයකින් තොර ව තෙවැනි පාර්ශ්වයක භාරයට කිසි ම විටක ඔවුන් පනත යටතේ සිටින රැඳවියෙකු නිදහස් කර නොමැති බව කළුතර බන්ධනාගාරයේ දීර්ඝතම සේවා කාලය සහිත බන්ධනාගාර නිලධාරියා සනාථ කළේ ය. කෙසේ වෙතත්, අධිකරණ නියෝගයෙන් කියැවෙන්නේ රැඳවියා ප්‍රශ්න කිරීම් සඳහා XX වෙත භාර දිය යුතු බව පමණක් බැවින්, ප්‍රශ්න කරන බලධාරීන්ගේ විස්තර බන්ධනාගාරයට ලබා දෙන්නේ නැත. තව ද රැඳවුම් ස්ථාන හෝ රැඳවුම් කාල පරිච්ජේදය නියෝගය තුළ නිශ්චිත ව සඳහන් කර නොමැත. මෙම භාවිතයෙන් පෙන්නුම් කරනු ලබන්නේ ඉහත සඳහන් බන්ධනාගාර ආඥා පනතේ 99 වැනි වගන්තිය මෙවැනි සිද්ධිවල දී අනුගමනය කරනු ලබන්නේ එක ම ක්‍රියාපටිපාටිය බව යි. ප්‍රශ්න කරන බලධාරීන් පුද්ගලයා ව ආරම්භයේ දී ගෙන ගිය ස්ථානයට වඩා වෙනස් ස්ථානයකට මාරු කරන්නේ නම්, පුද්ගලයා ව රිමාන්ඩ් ගත කළ අධිකරණයට හෝ වෙනස් යම් අධිකරණයකට දැනුම් දී අවසර ලබා ගත යුතු බවට හෝ පුද්ගලයා ආපසු බන්ධනාගාරයට රැගෙන යන විට අධිකරණයට සහ/ හෝ බන්ධනාගාරයට එම මාරු කිරීම පිළිබඳ ව දැනුම් දිය යුතු බවට කොන්දේසියක් නොමැති බව සටහන් කළ යුතු ය.

13 For a detailed discussion on Home Leave and License Board schemes, please refer chapter Early Release Measures.

රිමාන්ඩ් භාරයේ සිටිය දී පරිපාලන රැඳවුම් භාරයට ගන්නා, සමහර විට බහුවිධ රැඳවුම් ස්ථානවල තබා ගෙන, බන්ධනාගාරයට ආපසු රැගෙන එන රැඳවියෙකුගේ භාරකාරත්වය සම්බන්ධයෙන් ක්‍රියාපටිපාටියක් නොමැතිකම මෙයින් ඉස්මතු කරයි. තව ද, තමන් සුදුසු යැයි දකින අන්දමට කිහිප වරක් වුව ද ප්‍රශ්න කිරීම සඳහා පුද්ගලයින් රිමාන්ඩ් භාරයේ සිට පිටතට ගෙන යාමට හැකියාව ඇති ප්‍රශ්න කිරීමේ බලධාරීන්ට රැඳවියන් ව අපයෝජනය කිරීම සඳහා අවකාශය මෙයින් නිර්මාණය කරයි. එමගින්, පරිපාලන රැඳවුම් ක්‍රමවේදය තුළට පුද්ගලයා ව ගෙනැවිත් ඒ මඟින් අධිකරණමය භාරකාරත්වයේ පරමාර්ථය සහ එයින් සපයන ආරක්ෂාව අඩපණ කිරීම සිදු කරයි. පුද්ගලයා ව අධිකරණමය භාරයෙන් පිටතට සහ සියලු අභිප්‍රායයන් සහ පරමාර්ථයන් සඳහා පරිපාලන රැඳවුම ලෙස පෙනෙන දෙයක් වෙතට ගෙන ගියත්, කිසිදු රැඳවුම් නියෝගයක් නිකුත් කිරීමක් හෝ අනෙකුත් සෑම රිමාන්ඩ් භාරයේ සිටින්නෙක් මෙන් පුද්ගලයාව සෑම දෙසතියකට වරක් විනිසුරුවරයෙක් ඉදිරිපිටට ගෙන යාමක් ද සිදු නොවන බව සටහන් කළ යුතු ය. ඒ අනුව, මෙම කාලය තුළ රැඳවියා නෛතික කළු කුහරයක් තුළ වාසය කරන ලෙස දිස් වන අතර, කිසිදු ක්‍රියාපටිපාටිමය ආරක්ෂාවක් භුක්ති විඳින්නේ නැත.

සිව් වරක් බන්ධනාගාරයෙන් පිටතට රැගෙන ගිය නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ වරදකරුවකු ව සිටින පිරිමි සිරකරුවකු රිමාන්ඩ් භාරයේ සිටිය දී, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මගින් සිව්වැනි වටයේ ප්‍රශ්න කිරීමෙන් පසු, එම වධහිංසාව තව දුරටත් දරාගත නොහැකි බව බන්ධනාගාර නිලධාරීන් වෙත දැනුම් දුන් බව ප්‍රකාශ කළේ ය. ඔහු ප්‍රකාශ කළේ:

> "ඉන් පසු ව, වධහිංසාව දරා ගැනීමට නොහැකි ව, නැවතත් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මගින් වධහිංසාවට ලක්වීමට අවශ්‍ය නැති බව පවසා කළුතර බන්ධනාග ාර බලධාරීන්ට මම පැමිණිල්ලක් කළා. නිලධාරීන් මගේ පැමිණිල්ල අධිකරණයට ඉදිරිපත් කළ පසු, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මට වධහිංසා නොකළ යුතු බවට සහ බන්ධනාගාර නිලධාරීන් මට ආරක්ෂාව ලබා දිය යුතු බවට විනිසුරුවරයා නියෝග කළා."

තවත් සිද්ධියක දී, ප්‍රශ්න කිරීම සඳහා රිමාන්ඩ් භාරයේ සිට සිව් වරක් ගෙන ගිය, අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රිමාන්ඩ්ගත වූවෙක් පැවසුවේ:

> "...මගේ පසුගිය ප්‍රශ්න කිරීමේ දී ඔවුන් [අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව] මට පහර දුන්නා. එම නිසා, මම පෙරළා බන්ධනාගාරයට පැමිණි පසු, මම බන්ධනාගාර නිලධාරීන්ට පැමිණිළි කළා. මම බන්ධනාගාර අධිකාරී XX හට දැනුම් දුන්නා. ඔහු ශුභසාධන කාර්යාලය හරහා විනිසුරුවරයාට ලිපියක් යැව්වා. එවිට පහර දීම පිළිබඳ ව මගෙන් ප්‍රකාශයක් ලබා ගන්නා ලෙස විනිසුරුවරයා බන්ධනාගාරයේ ජේලර්වරුන්ට නියෝග කළ අතර, අවශ්‍ය වුවහොත්, ඔවුන් [අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව] මෙහි [බන්ධනාගාරයට] පැමිණ [බන්ධනාගාර නිලධාරීන් ඉදිරියේ] මගෙන් ප්‍රශ්න කිරීම කළ යුතු බවටත් නියෝග කළා."

මෙම උදාහරණ දෙක මගින් බන්ධනාගාර නිලධාරීන්හට නිත්‍යානුකූල ව තමන්ගේ භාරයේ සිටින පුද්ගලයින්ගේ යහපැවැත්ම සහතික කිරීමට ඇති වැදගත් කාර්යභාරය සහ නුසුදුසු ලෙස සැලකීම වැළැක්වීමට අධිකරණ අධීක්ෂණයෙහි ඇති වැදගත්කම අවධාරණය කරයි. නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයෙහි වරදකරු ව සිටි සිරකරු විසින් කරන ලද විස්තරයට අනුව බන්ධනාගාර නිලධාරීන් රැඳවියාගේ ආරක්ෂාවට නොසිට අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි ඉවත් ව ගිය අතර, ඔවුන් ඒ අවට හුදෙක් රැඳී සිටීමෙහි ප්‍රතිඵලය වූයේ වධහිංසාවෙන් නිදහස් වීමට රැඳවියාට තිබුණු මූලික අයිතිවාසිකම ආරක්ෂා වීම ය. අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයෙහි පනත යටතේ රිමාන්ඩ්ගත ව සිටි පුද්ගලයා ද පැවසුවේ ප්‍රශ්න කිරීම අතරතුර ඔහු ව තව දුරටත් වධ හිංසාවලට යටත් නොකළ බව සහ බන්ධනාගාර නිලධාරීන් විසින් ප්‍රශ්න කිරීම් අධීක්ෂණය කළ යුතු බවට වන අධිකරණ නියෝගයෙන් පසු එවැනි ප්‍රශ්න කිරීම් සිදු නොවූ බවත් ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති පුද්ගලයෙකුගේ මූලික අයිතිවාසිකම් පිළිග ැනීම සහතික කිරීම සඳහා නීතියෙහි හිදැස් ඇති අවස්ථාවල සහ ක්‍රියාපටිපාටිමය ආරක්ෂාවන් නොමැති

අවස්ථාවල ඒවා ආමන්ත්‍රණය කිරීමට බන්ධනාගාර බලධාරීන් සහ අධිකරණය විසින් ඉටු කළ හැකි වැදගත් කාර්යභාරය, අධ්‍යයනය අතරතුර කරන ලද නිරීක්ෂණයකි.

1982 අංක 10 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධනය) පනත හරහා ගෙන එන ලද තවත් විධිවිධානයක් වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි 15අ වගන්තිය 'ජාතික ආරක්ෂාවෙහි අවශ්‍යතා වෙනුවෙන් ...... අවශ්‍ය සහ යෝග්‍ය' ලෙස ආරක්ෂක ලේකම් සලකනු ලබන්නේ නම්, පුද්ගලයෙක් රිමාන්ඩ් ගත කළ පසු ව වුව ද රැඳවුම් ස්ථානය තීරණය කිරීමට ආරක්ෂක ලේකම්හට අභිමතය ලබා දෙයි. 'එවැනි සලකා බැලීම් සම්බන්ධයෙන් ඕනෑ ම බලධාරියෙක් විසින්, ඔහු විසින් තීරණය කරනු ලබන ස්ථානයක සහ කොන්දේසිවලට යටත් ව පුද්ගලයා ව තබා ගත යුතු බවට' නියෝග කිරීමට ඇයට/ ඔහුට හැකි වන පරිදි මේ අවස්ථාවේ දී ලේකම් වෙත ලබා දී ඇති බලතල පුළුල් වේ. මෙම තීරණය කිරීම සිදු කිරීම සඳහා කිසිදු නිර්ණායකයක් මෙම විධිවිධානය මඟින් නියම කර නැති අතර, නියෝගය 'මහාධිකරණයට සහ බන්ධනාගාර කොමසාරිස්වරයාට සන්නිවේදනය කිරීමට' පමණක් අවශ්‍ය කරන බැවින් තීරණය අධිකරණ සමාලෝචනයකට හෝ යටත් නොවේ.

මෙම විධිවිධාන යටතේ, බූස්ස සහ ත්‍රස්ත විමර්ශන අංශයේ සයවැනි මහල වැනි, විවිධ රැඳවුම් ස්ථානවල තමන් රඳවා තබාගත් බව පැවසූ පුද්ගලයින් තිදෙනෙකු අධ්‍යයන අතරතුර දී කොමිෂන් සභාවට හමු වූ අතර, ඔවුන් සියලු දෙනා ම පැවසුවේ රැඳවුම් කාලය තුළ වධහිංසාවට ලක් වූ බව යි. ඔවුන්ගෙන් එක් පුද්ගලයෙකු වසර 7කට ආසන්න කාලයක් එවැනි ස්ථානවල රඳවා තබා ගෙන තිබුණි.

4. වධ හිංසා හඳුනා ගැනීම සහ වැළැක්වීම තුළ අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ කාර්යභාරය

> "අපට පහර දුන් අවස්ථාවේ අප ව අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ගෙන යා යුතු ව තිබුණා. අපේ තුවාල ඔවුන් ලේඛනගත කළා නම් සහ අප භාෂාව දැන සිටියා නම්, අපට යමක් කළ හැකි ව තිබුණා. ඔවුන් කථා කරන්නේ සිංහල පමණයි. අපි දෙමළ. අපට කිසි ම දෙයක් තේරෙන්නේ නැහැ. වෛද්‍ය නිලධාරියා වෙත අප ව රැගෙන යාමට පෙර, නිලධාරීන් පවසනවා, 'ඔවුන්ට කිසිදෙයක් කියන්න එපා. ඔවුන් අසන සෑම දෙයකට ම ඔව් නැත්නම් නැහැ කියන්න. ඔබට පහර දුන්නා ද කියා ඔවුන් ඇසුවොත්, නැහැ කියන්න. ඔබට ආහාර ලබා දුන්නා ද, අපි ඔබ ව හොඳින් රැක බලා ගත්තා ද කියා ඇසුවොත්, ඔව් කියන්න. අපි ගිහින් කියන්නේ එහෙම තමයි. නැත්නම්, ඔවුන් ආපසු පැමිණ, අපට නැවත පහර දෙනවා."
>
> වරදකරු වූවෙක්, නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

රඳවා තබා ගැනීමේ අඛණ්ඩ අවශ්‍යතාව විනිසුරුවරයෙකු විසින් පරීක්ෂා කිරීම අවශ්‍ය වීමකින් තොර ව, පරිපාලනමය රඳවා ගැනීමේ කාලය දීර්ඝ කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධාන මඟින් ඉඩකඩ ලබා දෙයි. මේ මඟින් පොලිස් භාරයේ රඳවා තබා ගෙන ඇති රැඳවියෙකු විනිසුරුවරයෙකු වෙත ඉදිරිපත් කිරීමේ වැදගත් අවශ්‍යතාව ඉවත් කරනු ලබ යි. විනිසුරුවරයෙකු විසින් රැඳවියෙකුගේ යහපැවැත්ම අධීක්ෂණය කිරීමට ඇති අවස්ථාවන් දීර්ඝ පරිපාලනමය රඳවා ගැනීම මඟින් අඩු කරන බැවින්, පරිපාලනමය රඳවා ගැනීමේ කාලය අතරතුර දී රැඳවියෙකු වධ හිංසාවට ලක් ව තිබේ දැයි නිශ්චය කිරීමේ දී අධිකරණ වෛද්‍ය නිලධාරියා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. පනත යටතේ සිටින රැඳවියන් සම්බන්ධයෙන් පරිපාලනමය රැඳවුම් කාලය තුළ ඔවුන් වධ හිංසාවට ලක් වූ බවත්, පාපොච්චාරණයන් ලබා දීමට බල කරන ලද බවත්, අධික ලෙසින් වාර්තා වූ විට රැඳවියෙකු පාපොච්චාරණයක් සිදු කළේ කුමන තත්ත්වයන් යටතේ සිට ද යන්න වාර්තාගත කිරීමට අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු හට හැකි වීම අත්‍යවශ්‍ය වේ. වසර ගණනාවකට පසු ඔවුන් නඩු විභාගයට මුහුණදෙන විට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටි රැඳවියා වධ හිංසාවට ලක් වූ බවට චෝදනා කරනු ඇති මුත්, බොහෝ තුවාල කාලයත් සමඟ සුව වී තිබිය හැකි බැවින් රැඳවියා හට තමන්ගේ චෝදනා ඔප්පු කිරීමට නොහැකි වනු ඇත. මෙහි

ප්‍රතිඵලයක් ලෙස, අධිකරණ වෛද්‍ය නිලධාරියෙකුගේ ස්වාධීන සහ පැහැදිලි තක්සේරුවක් අවශ්‍ය වනුයේ, රැඳවියාගේ පාපොච්චාරණයෙහි විශ්වාසනීයත්වය ඒ මඟින් තීරණය කරනු ලබන බැවිනි.[14]

වධ හිංසාවලට ලක් වීමෙන් පසු ඔවුන් ව අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කරනු ලැබුවේ ද සහ පසු ව වෛද්‍ය රැකවරණය ලබා දුන්නේ ද යන්නට ප්‍රතිචාර වශයෙන්, තමන් ව අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කරන ලද බව පැවසුවේ ප්‍රතිචාරකයින්ගෙන් 44%ක් පමණක් වන අතර, තමන් වධ හිංසාවට ලක් වූ පසු වෛද්‍ය ප්‍රතිකාර ලබා දුන් බව පැවසුවේ පිරිමි රැඳවියන්ගෙන් 38%ක් පමණි.

ත්‍රස්ත විමර්ශන අංශයේ සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත රැඳවියන් ඉදිරිපත් කිරීම පිළිබඳ දත්තවල ඔවුන් පාපොච්චාරණයක් අත්සන් කිරීමට පෙර සහ පසු ව ලෙස රටාවක් ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කළේ ය. ප්‍රථමයෙන් ම අත්අඩංගුවට ගන්නා නිලධාරියා ඔවුන් අත්විඳින ලද නුසුදුසු සැලකීම් පිළිබඳ ව අධිකරණ වෛද්‍ය නිලධාරියාට සත්‍යය හෙළිදරව් කිරීමට එරෙහි ව ඔවුන්ට අනතුරු අඟවා, තව දුරටත් වධ හිංසා පමුණුවන බවට ඔවුන්ට තර්ජනය කරන බව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූවෝ කොමිෂන් සභාවට දැනුම් දුන්හ. එහෙත් පසු ව, ඔවුහු අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත රැඳවියෙකු ඉදිරිපත් කර, ඔහුට අධිකරණ වෛද්‍ය නිලධාරියාට අසත්‍යය ප්‍රකාශ කරන ලෙස බල කර, පාපොච්චාරණයක් අත්සන් කර නැති විට පවා ඔහු දැනටමත් එසේ කර ඇති බව ප්‍රකාශ කරන ලෙස පවසනු ලබති. වෛද්‍ය නිලධාරියා පරීක්ෂා කිරීමෙන් පසු රැඳවියා කොළඹ ත්‍රස්ත විමර්ශන අංශය/ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත ආපසු යවා ශාරීරික ප්‍රචණ්ඩත්වයට යටත් කරන අතර පාපොච්චාරණය අත්සන් කරන ලෙස බල කරනු ලබයි.

අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරය තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ සිටින්නෙකුට අනුව:

> “මම අත්සන් කිරීමට පෙර, ඔවුන් මාව අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ගෙන ගියා. ඔවුන් මාව ගෙන ගියේ කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත යි. වෛද්‍යවරයා සිංහල වුණ නමුත්, හෙදියට දෙමළ ටිකක් කථා කළ හැකි යි. සිදු වූයේ කුමක් ද? කියා ඔවුන් මගෙන් ඇසුවා. ඔවුන් අපට පහර දෙන සැටිත්, මට පහර දී මගෙන් පාපෙච්චාරණයක් ගැනීමට මාව කොළඹ ගෙන ආ සැටිත්, මම ඔවුන්ට පැවසුවා. ඔවුන්ට අවශ්‍ය දේ ලියා මා ලවා අත්සන් කර ගන්නා නිසා මම ප්‍රකාශයක් දීමට අකැමති බව කීවා. මේ සියල්ලට ඇහුම්කන් දුන් හෙදිය, මා කියූ හැම දේ ම ත්‍රස්ත විමර්ශන අංශයට කිව්වා. වෛද්‍යවරයා ආකෘතිය (පෝරමය) ත්‍රස්ත විමර්ශන අංශයට දුන්නා. ඉන් පසු ව ඔවුන් මාව පිටතට යැව්වා. ත්‍රස්ත විමර්ශන අංශයයි, හෙදියයි සිංහලෙන් එකිනෙකා සමග කතා කළා. ඔවුන් මා ගැන කථා කරන බව මට තේරුම් ගියා. ත්‍රස්ත විමර්ශන අංශය මා දිහා බලාගෙන ම සිටියා. ත්‍රස්ත විමර්ශන අංශය මාව ආපසු හයවෙනි තට්ටුවට ගෙන ආවා. ඔවුන් ඇවිත් අපට පහර දුන්නා. ‘අධිකරණ වෛද්‍ය නිලධාරියාට ආවාට ගියාට දේවල් කියන්න ඔබට බැහැ. ඔබට පුළුවන් ඔවුන් අහන දේට උත්තර දෙන්න පමණ යි. ඔවුන් සමග අමතර සංවාදයක් කිරීමට ඔබට අවසර නැහැ’ යනුවෙන් ඔවුන් කිව්වා. ඔහු මුස්ලිම් නිලධාරියාට කිව්වා එය පරිවර්තනය කර අපට පවසන ලෙස. ඒ අතරත් ඔහු අපට පහර දුන්නා.”

අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත පොලිසිය විසින් රැඳවියන් ඉදිරිපත් කළ විට, අධිකරණ වෛද්‍ය නිලධාරීන් ඔවුන්ගේ රාජකාරිය ඉටු නොකළ බවට සහ/ හෝ අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ පරීක්ෂාවට පොලිසිය විසින් බාධා කළ බවට චෝදනා පැවති අවස්ථා කිහිපයක් ගැන කොමිෂන් සභාවට පවසා තිබුණි. උදාහරණයක් ලෙස, අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් රැඳවියන් පරීක්ෂා කරන කාමරය තුළ නිලධාරීන්

[14] For a detailed discussion on the role played by a JMO when detainees have been subject to torture in custody, please refer chapter Access to Medical Treatment.

රැඳී සිටින බවත්, සහ මෙය නිතැතින් ම සත්‍යය හෙළි කිරීමෙන් ඔවුන් ව වළක්වන බවත් වාර්තා විය.

අධිකරණ වෛද්‍ය නිලධාරීන් වුව ද, අත්අඩංගුවේ සිටිය දී රැඳවියන් අත්විඳින ලද නුසුදුසු ලෙස සැලකීමක් ගැන කිසිදු ප්‍රශ්නයන් නොඅසන අතර, බොහෝ විට ඔවුන්ගේ නම පමණක් විමසා මිනිත්තු කිහිපයක් ඇතුළත පරීක්ෂා කිරීම අවසන් කළ බවට චෝදනා නැගුණි. අධිකරණ වෛද්‍ය නිලධාරියා සහ අත්අඩංගුවට ගත් නිලධාරියා අතර යම් යම් එකඟතාවන් පැවති බවට ප්‍රබල ඇඟවීම් රැඳවියන්ගේ විස්තර කිරීම් මඟින් නිරීක්ෂණය විය. තමන් අත්අඩංගුවේ සිටිය දී වධ හිංසා දුන් බවට අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත දැනුම් දුන් විට, ඒ පිළිබඳ ව තමන්ට පැමිණිලි නොකරන ලෙස හෝ එවැනි සිදු වීම් ගැන ඔවුන්ට දැනුම් නොදෙන ලෙස අධිකරණ වෛද්‍ය නිලධාරීන් කියා සිටි බව රැඳවියන් පැවසූහ. සාවද්‍ය වෛද්‍යනෛතික වාර්තාවක් වාර්තාගත කර ඉදිරිපත් කිරීමෙන් විමර්ශනයේ දී වධ හිංසා පැමිණූ බවට තිබිය හැකි යම් චෝදනා වැළැක්වීම පිණිස නිලධාරීන් විසින් අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත පුද්ගලයෙකු ඉදිරිපත් කළ බවට අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් පරීක්ෂා කරන ලද පුද්ගලයින් විසින් කරන ලද විස්තරවල සමානතාවන් මත පදනම් ව නිගමනය කළ හැකි ය. එක් සිරකරුවෙකු විස්තර කළ පරිදි:

> "අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් බරපතල තුවාල යන්න සලකුණු නොකරන ලෙස වෛද්‍යවරුන්ගෙන් ඉල්ලා සිටින අතර, පහර දීම හෝ වධ හිංසා පිළිබඳ ව කිසිවක් අධිකරණ වෛද්‍ය නිලධාරියාට පැවසීම හෝ හෙළිදරව් කිරීම නොකරන ලෙසට ඔවුන් අපට තර්ජනය කර තිබුණා. මම වෛද්‍ය නිලධාරියාට කිසිවක් කීවොත්, මාව කැලණි ගඟට විසි කිරීමට හෝ බන්ධනාගාරය තුළ මරා දැමිය හැකි බව ඔවුන් (අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව) පැවසුවා. ඔවුන් මාව වෛද්‍යවරියක් වෙතට ගෙන ගොස් අපි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් බවත්, අපට වෙඩි තැබිය යුතු බවත්, අප ව අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කිරීම වැරදි බවත්, ඇයට පැවසුවා. තුවාල ගැන සඳහන් නොකර වාර්තාව ලියන ලෙස ඔවුන් ඇයට පැවසුවා."
>
> පනත යටතේ ජීවිතාන්තය දක්වා සිරගත වූවෙක්,
> නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

දෙමළ භාෂාව කථා කරන අධිකරණ වෛද්‍ය නිලධාරීන් ක්‍රමවේදය තුළ නොමැති වීම පිළිබඳව ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සිරකරුවන් පැමිණිලි කළ අතර, වාර්තා වූ පරිදි භාෂාමය බාධක හේතුවෙන් බොහෝ රැඳවියන්ට අධිකරණ වෛද්‍ය නිලධාරියා සමඟ සන්නිවේදනය කිරීමට නොහැකි විය:

> "මාස හයකුත් දින තුනකට පමණ පසු ව, අධිකරණයට යාමට පෙර, ඔවුන් මාව වෛද්‍ය නිලධාරියෙක් වෙත ගෙන ගියා. නමුත් ඔහු සිංහල පමණක් කථා කළ නිසා ඔහුට කිසිවක් කීමට අපට බැරි වුණා. අපි සිංහල දැන සිටියේ නැහැ. ඉතින් අපි ඔවුන්ට කියන්නේ මොනවා ද? අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ නිලධාරින් අප ළඟ ම සිටිනවා. ඉතින් අපට අත් සලකුණු භාවිත කර පවා සන්නිවේදනය කිරීමට නොහැකි වුණා. ඔවුන් ලිව්වේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔවුන්ට කියූ දේ පමණ යි. ඔවුන් කිසිවෙක් දෙමළ දැන සිටියේ නැහැ."
>
> පනත යටතේ වරදකරුවකු වූවෙක්,
> නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

කෙසේ නමුත්, අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ පරීක්ෂණයට පහසුකම් සැලසීමට රැඳවියාට පරිවර්තකයින් ලබා දුන් විට වුව ද, අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයෙහි පනත යටතේ රිමාන්ඩ්ගත වූවකු විස්තර කළ පරිදි, මෙය සාර්ථක ප්‍රතිඵලයක් ලබා නොදුන්නේ යඃ

> "වරක් ඔවුන් අප ව අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ගෙන ගියා. ඔවුන් අපගේ නම්

සහ වයස ලියාපදිංචි කළා. එක් මුස්ලිම් පුද්ගලයෙක් මා සමඟ පැමිණියා. ඇය [අධිකරණ වෛද්‍ය නිලධාරිනිය] සිංහලෙන් කථා කළා. මුස්ලිම් පුද්ගලයා මට එය පරිවර්තනය කළා. ඔහු නිලධාරියෙක් නොවෙයි. ඔහු එහි සිටි තවත් සිරකරුවෙක් පමණයි. ඔහු සිංහල දැන සිටියා. වෛද්‍යවරිය අපිව පරීක්ෂා කළා. ඇය අපගේ නම් සහ වයස ඇසුවා. පසු ව අපට යම් රෝගයක් තිබේදැයි ඇසුවා. ඔවුන් අපට පහර දෙන බව මම ඇයට පැවසුවා. එවිට ඇය නිලධාරියාට පිටතට යන ලෙස පැවසුවා. අනෙක් මුස්ලිම් පුද්ගලයා පමණයි එහි සිටියේ. එවිට ඇය මගෙන් ඇසුවා මගේ ප්‍රශ්න මොනවාද කියා. සෑම ප්‍රශ්න කිරීමක දී ම ඔවුන් අපට පහර දෙන අන්දම මම ඇයට පවසා පහර දීම්වලින් ඇති වූ තුවාල පෙන්නුවා. ඇය සෑම දෙයකට ම ඇහුම්කන් දුන් නමුත් කිසි දෙයක් කිසි ම විටක වාර්තා කළේ නැහැ. එම පිටුවේ ලියා තිබුණේ අපේ නම සහ වයස පමණ යි. එය ඉංග්‍රිසියෙන් ලියා තිබුණේ.

ප්‍රශ්නයඃ ඔබට පහර දුන්නා දැයි ඇය ඔබෙන් ඇසුවා ද?

පිළිතුරඃ ඔව්. ප්‍රශ්න කිරීම් අතරතුර දී සෑම විටම විවිධ ආයතනවල නිලධාරීන් අපට පහර දුන් බව අපි ඇයට කිව්වා. අපි ඇයගෙන් ඇසුවා ඒ ගැන ඇයට යමක් කළ හැකි ද කියා, නමුත් ඒ කිසිවක් ඇය වර්තා කළේ නැහැ. අපි කියූ දේ ඇය සටහන් කළ යුතු ව තිබුණා, නමුත් ඇය එසේ කළේ නැහැ. ඔවුන් එම ලියවිල්ල ආපසු බූස්සට ගෙන ආවා. එවිට ඔවුන්ට අවශ්‍ය ඕනෑ ම දෙයක් එහි ලිවිය හැකි යි. සමහර විට ඔවුන් ලියන්න ඇති මම නිරෝගි බව. තුවාල නොමැති බව සහ හොඳ මානසික සෞඛ්‍ය තත්ත්වයක සිටින බව. මට සිතන්නේ අර වෛද්‍යවරිය ත්‍රස්ත විමර්ශන අංශය සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සමඟ යම් එකඟතාවක් තිබූ කෙනෙක් කියා. නැත්නම් ඇයට අප කියූ දේ ලියා අප වෙනුවෙන් පැමිණිලි කළ යුතු ව තිබුණා."

අනෙක් අතට, සමහර අධිකරණ වෛද්‍ය නිලධාරීහු අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ හෝ ත්‍රස්ත විමර්ශන අංශයේ නිලධාරීන්ගේ උපදෙස් නොතකා තම කාර්යයන් අවංක ව ඉටු කළ අතර රැඳවියාට ආධාර දුන් බව වාර්තා විය. අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයෙහි රිමාන්ඩ්ගත වූවෙක් පැවසුවේ:

ප්‍රශ්නයඃ "ඔබට පහර දුන් බව ඔබ අධිකරණ වෛද්‍ය නිලධාරියාට පැවසුවා ද?

පිළිතුරඃ ඔව්. ඔව්. ඔහු අපෙන් ඇහුවා කී දෙනෙකුට පහර දුන්නා ද කියා. මම ඔහුට කිව්වා තව පිරිමි ළමයි හය දෙනෙක් සිටියා, අපි දෙදෙනාත් සමඟ අට දෙනෙක් සිටි බව. එවිට ඔහු අධිකරණයට යන ලෙස අපෙන් ඉල්ලුවා. ඔහු වර්තාව අධිකරණයට ඉදිරිපත් කරන බව පැවසුවා ."

"අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මට කිව්වා මාව නාන කාමරයේ ලිස්සා වැටීමෙන් මෙම තුවාල සිදු වූ බව අධිකරණ වෛද්‍ය නිලධාරියාට පවසන ලෙස. මගේ නළලේ දකුණු පැත්තේ තුවාලයක් තිබුණා. මට කියා දුන් ආකාරයට මම සිදු කළා. නමුත් අධිකරණ වෛද්‍ය නිලධාරියා මට කිව්වා සත්‍යය පවසන්න. ඔහු අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට නොකියන බව කිව්වා. මම ඔහුට සත්‍යය පැවසුවා. ඔහු මට එක්ස්රේ එකක් ගන්න කියා, බෙහෙත් දී, පසු ව මට කාඩ් එකක් දුන්නා. එහි තිබුණේ මට රෝගී බවක් දැනුණොත්, නැත්නම් කන් ඇසෙන්නේ නොමැති නම්, මාව ප්‍රතිකාර සඳහා ගෙනෙන ලෙස. අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ දී මට කන් ඇසෙන්නේ නැති ව ගොස්, මාව වෛද්‍යවරයා වෙත ගෙන යන ලෙස ඉල්ලූ නමුත්, ඔවුන් ප්‍රතික්ෂේප කළා. ඔවුන් මට එක්ස්රේ එක දුන්නේ නෑ, රෝග විනිශ්චය කාඩ්පත විසිකර දැම්මා."

පනත යටතේ රිමාන්ඩ්ගත වූවෙක්,
නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

5. පහර දීමෙන් පසු සන්දර්භය වධ හිංසා හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීම: බන්ධනාගාරයට ඇතුල් කිරීමේ දී පහර දීම් වාර්තා කිරීම.

ඇතුළු කිරීමේ සහ පිට වීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ පරිච්ජේදයෙහි සාකච්ඡා කළ පරිදි, ඇතුල් කිරීමේ දී, පෙනෙන්නට ඇති තුවාල සහ පූර්ව නුසුදුසු ලෙස සැලකීම් ගැන පැමිණිලි වාර්තා කිරීම බන්ධනාගාර විසින් සිදු කිරීම SMR 7(d) මඟින් අවශ්‍ය කරයි. මේ අනුව, රිමාන්ඩ්ගත කිරීමට පෙර ඔවුන්ගේ රැඳවුම් ස්ථානවල ඔවුන් අත්දුටු යම් නුසුදුසු ලෙස සැලකීම් හෝ වධ හිංසා ගැන, බන්ධනාගාරයට ඇතුල් කිරීමේ දී, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන්ගෙන් විමසා බැලීම බන්ධනාගාර නිලධාරීන්ගෙන් අපේක්ෂා කරයි. වෙනත් ඕනෑ ම නවකයෙකුගෙන් නුසුදුසු ලෙස සැලකීම පිළිබඳ ව විමසන පරිදි ම මෙය සිදු කිරීම ඔවුන්ගෙන් අපේක්ෂා කෙරේ.

අධ්‍යයනයේ ප්‍රමාණාත්මක දත්තවලින් හෙළිදරව් වූයේ, සිරකරුවන් කාණ්ඩවලින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන්ගෙන් ඉතා විශාල ප්‍රමාණයක් පොලිසිය/ අත්අඩංගුවට ගන්නා බලධාරීන් වෙතින් නුසුදුසු ලෙස සැලකීම අත්විඳ ඇති බව යි. මෙය ප්‍රතිශතයක් ලෙස 92%ක් විය. කෙසේ නමුත්, බන්ධනාගාරයට ඇතුල් කිරීමේ දී, නුසුදුසු ලෙස සැලකීම පිළිබඳ ව අසා තිබුණේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින පිරිමි රැඳවියන්ගෙන් 15%කින් පමණි. මෙය, පොලිසිය/ අත්අඩංගුවට ගන්නා බලධාරියා සිදු කළ නුසුදුසු ලෙස සැලකීම ගැන බන්ධනාගාරයට ඇතුළු කිරීමේ දී, තමන්ගෙන් විමසූ බව පැවසූ මුළු සිරකරුවන්ගේ ප්‍රතිශතයට බෙහෙවින් අඩු බව සඳහන් කළ යුතු ය. ඇතුල් කිරීමේ සහ පිට වීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ පරිච්ජේදයෙහි සඳහන් කළ පරිදි පිරිමි රැඳවියන්ගෙන් 49%ක් පොලිස් ස්ථානයේ දී නුසුදුසු ලෙස සැලකීම් පිළිබඳ ව තමන්ගෙන් ප්‍රශ්න කළ බව ප්‍රකාශ කළහ.

ප්‍රස්තාරය 20.3 අත්අඩංගුවට ගත් බලධාරියා/ රැඳවුම් ස්ථාන වෙතින් නුසුදුසු ලෙස සැලකීම් අත්විඳීම හේතුවෙන් ඇතුළු කිරීමේ දී වෛද්‍ය අවධානය අවශ්‍ය වූ පනත යටතේ සිටින රැඳවියන් අතර පිරිමි ප්‍රතිචාරකයින්[15]



[15] Responses to "Did you request medical treatment from prison, due to ill treatment prior to remand?" are taken only from those who said yes to "Did the prison authorities inquire from you whether you were ill-treated at the police/ detention place?"
Responses to "Were you provided with medical treatment you requested?" are taken from only those who said yes to "Did you request medical treatment from prison, due to ill treatment prior to remand?"

මීට අමතර ව, ගුණාත්මක සම්මුඛ සාකච්ඡාවල දී, අත්අඩංගුවට ගන්නා බලධාරියා විසින් නුසුදුසු ලෙස සැලකීම ගැන විමසා බැලීම සම්බන්ධයෙන් විශේෂයෙන් ම පනත යටතේ සිටින රැඳවියන්ට අදාළ ව ක්‍රියාපටිපාටිමය ආරක්ෂාවන් නොමැති වීම ඉස්මතු විය. ගුණාත්මක දත්තවලින් සනාථ කරනු ලැබූ ප්‍රමාණාත්මක දත්ත මගින් බන්ධනාගාරවල ක්‍රියාත්මක වන ක්‍රියාපටිපාටිය පිළිබඳ සහ නුසුදුසු ලෙස සැලකීම ගැන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් බහුතරයෙන් විමසීම් නොකිරීමට හේතුව පිළිබඳ ප්‍රශ්න ඉස්මතු කරයි.

නුසුදුසු ලෙස සැලකීම පිළිබඳ ව බන්ධනාගාරය විසින් විමසීම සිදු කරන ලද පනත යටතේ සිටින පිරිමි රැඳවියන්ගෙන් 46%ක් වෛද්‍ය ප්‍රතිකාර ඉල්ලා සිටි බව 20.3 ප්‍රස්තාරය විදහා දක්වයි. වෛද්‍ය ප්‍රතිකාර ඉල්ලා සිටි අයගෙන් ප්‍රතිකාර ලබා තිබුණේ 46%කට පමණි.

ප්‍රස්තාරය 20.4 තමන්ගේ නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ ව පනත යටතේ සිටින පිරිමි රැඳවියන් අතර ප්‍රතිචාරකයින්



A1 – B වාර්තාව අධිකරණයේ ගොනු කර ඇත.

A2 – විමර්ශන අවසන් කර ඇත. ලිපිගොනුව නීතිපති දෙපාර්තමේන්තුවට යවා ඇත.

A3 – අධිචෝදනා ගොනු කර ඇත. නඩු විභාගය තව ම ආරම්භ කර නැත.

A4 – නඩු විභාගය සිදු වෙමින් පවතී.

A5 – වරදකරු වී ඇත.

A6 – අභියාචනය මත.

A7 – නොදනිමි.

6. නීතිමය සහ අධිකරණ කටයුතු

"මෙය සිදු වුණේ වවුනියා මහාධිකරණයේ. එක ම අපරාධය සඳහා යම් කෙනෙකුට දෙවරක් දඬුවම් දිය නොහැකි යැයි විනිසුරුවරයා පවසා මාව ඇප මත නිදහස් කළා. මගේ රැකියාව දිගට ම කරගෙන යන ලෙස විනිසුරුවරයා මට පැවසුවා. මම එසේ කර, නඩුව සඳහා මසකට වරක් අධිකරණයට පැමිණියා. ඔවුන් මට අධිචෝදනාව කියෙව්වේ මම හයවැනි වතාවට පැමිණි විට යි. මට යුක්තිය ඉටු වේවි යැයි සිතූ නිසා මම එය සැලකිල්ලට ගත්තේ නැහැ. පළමු නඩු විභාගයේ දී විනිසුරුවරයා පැවසුවා අවුරුදු දෙකක් මම පුනරුත්ථාපනයේ සිට ඇති නිසා, එය සුදුසු දඬුවමක් ලෙස සලකා මාව නිදහස් කළ

හැකි බව. මට විශ්වවිද්‍යාලයේ විභාග වැඩ තිබුණු නිසා ඔවුන් මාව රිමාන්ඩ්භාරයට ගත්තේ නැහැ. ඊ ළඟ සතියේ, මට දඬුවම් ලබා දීමට පැමිණිල්ලට අවශ්‍ය වන බව කියා, ඔවුන් මට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් දුන්නා. මෙය විශාල කම්පනයක් වුණා. මට තවමත් එය දරා ගැනීමට බැරි වී තිබෙනවා."

පනත යටතේ ජීවිතාන්තය දක්වා සිරගත වූවෙක්,
නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ්ගත වූවන්ගෙන් බහුතරය සිටින්නේ නඩු විභාගය සිදු වෙමින් පවතින අදියරේ බව ප්‍රමාණාත්මක දත්තවලින් පෙන්වයි. ප්‍රමාණාත්මක දත්ත ගුණාත්මක දත්ත මඟින් තව දුරටත් පැහැදිලි කරන පරිදි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සිරකරුවන් විසින් ප්‍රකාශ කරන ලද නීතිමය සහ අධිකරණ කටයුතු පිළිබඳ අත්දැකීම් තුළ නිරීක්ෂණය කෙරුණු රටාවන් ගණනාවක් තිබුණි. මේවා පහත දක්වා ඇත.

7.1. නෛතික නියෝජනයට ප්‍රවේශය

සුදුසු නෛතික නියෝජනයකට ප්‍රවේශය නොමැතිකම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රැඳවුම් භාරයේ තබාගෙන සිටින පුද්ගලයින්ගේ අයිතීන් වෙත අහිතකර ලෙස බලපාන බව දක්නට ලැබුණි.

නෛතික නියෝජනයට අයිතිය සහ, ඒ වෙනුවෙන් ගෙවීමට පුද්ගලයෙකුට ප්‍රමාණවත් වත්කමක් නොමැති විට, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි (ICCPR) 14 වන වගන්තියෙහි සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ (2007 අංක 56) 4(i) කොටස යටතේ, දේශීය නෛතික රාමුව තුළ නෛතික ආධාර නියම කර ඇත.

ජාතික නීතිය තුළ, නීතිඥයෙකු මඟින් නියෝජනය වීමට විත්තිකරුවෙකුට ඇති අයිතිය අපරාධ නඩු විධාන සංග්‍රහය ද (CCP) නියම කරයි.[16] අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 195(උ) වගන්තිය ප්‍රකාශ කරන්නේ විත්තිකරුගේ ඉල්ලීම මත විනිසුරුවරයා විසින් මහාධිකරණය තුළ නීතිඥයෙකු පත් කරනු ඇති බව සහ 353 වගන්තිය ප්‍රකාශ කරන්නේ 'අධිකරණයේ මතය අනුව යුක්තියේ අභිලාෂයන් සඳහා අභියාචකයා හට නෛතික ආධාර තිබීම යහපත් බව පෙනී යන්නේ නම්' විනිසුරුවරයාට අභියාචනාධිකරණය තුළ අභියාචකයා හට නීතිඥයෙකු පත් කළ හැකි බව යි.

රැඳවුම් කාල පරිච්ඡේදයේ ආරම්භක ස්ථානයෙන් ආරම්භ වී නඩු විභාගය දක්වා අඛණ්ඩ ව පැවති, නෛතික නියෝජනයට ප්‍රවේශ වීමේ දී සහ නෛතික නියෝජනය ලබා ගැනීමේ දී මුහුණ දුන් දුෂ්කරතා ගැන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සිරකරුවෝ කොමිෂන් සභාවට දැනුම් දුන්හ. උදාහරණයක් ලෙස, නීතිඥයින් හට රැඳවුම් භාරයේ සිටින තම සේවාදායකයින් බැහැදැකීමට ත්‍රස්ත විමර්ශන අංශයේ අධ්‍යක්ෂවරයාගෙන් ලිඛිත අවසරයක් ලබා ගත යුතු බව කොමිෂන් සභාවට දැනුම් දී තිබුණු අතර, බොහෝ අවස්ථාවල දී, අවසරය ලබා දීමට සති හෝ මාස ගණනක් පවා ගත විය හැකි ය. ඉන් පසු ව, අධිචෝදනා ඉදිරිපත් කිරීමෙන් පසු, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩුවලට ඇදී තිබුණු අපවාදය හේතුවෙන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් නියෝජනය කිරීමට නීතිඥවරුන් පසුබට වූ බව වාර්තා විය. අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයෙහි රැඳවියෙක් ප්‍රකාශ කළ පරිදි:

"මට දෙමළ නීතිඥයින් කවුරුවත් සිටියේ නැහැ. එක් නඩු විභාගයක් සඳහා මට දෙමළ නීතිඥයෙක් ලැබුණා. ඊත් පසු ව, ඔහුත් තම නඩුවට පෙනී සිටීමට බිය බව පවසා යළි පැමිණුනේ නැහැ."

16 Code of Criminal Procedure Act No. 15 of 197

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩුවලට ගත වන දීර්ඝ කාලය හේතුවෙන්, තමන්ට නෛතික ගාස්තු ගෙවීමට නොහැකි බව රැඳවියන් පවසන ලද අතර, ඒ හේතුවෙන් නෛතික ආධාර මත යැපීමට සිදු විය. 20.3 වගුවෙන් විදහා දැක් වූ පරිදි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින බොහෝ සිරකරුවෝ නෛතික නියෝජනය සඳහා ප්‍රධාන වශයෙන් එක් සිවිල් සමාජ නීති ආධාර සංවිධානයක් මත යැපුණහ.

20.2 වගුව තම නීතිඥයාට ගෙවීම් කරන්නේ කවුද, යන්න පිළිබඳ ව පිරිමි ප්‍රතිචාරකයින්

	ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි පිරිමි රැඳවියන්
මගේ නීතිඥයාට ගෙවන්නේ මමයි	7%
මගේ පවුල මගේ නීතිඥයාට ගෙවයි	44%
මා සඳහා අධිකරණය විසින් නීතිඥයෙක් පත් කරන ලදී	4%
නීති ආධාර සංවිධානයක් විසින් මට නීතිඥයෙක් ලබා දෙන ලදී	39%

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් හට පුද්ගලික නීතිඥවරුන් හෝ නීති ආධාර ලබා ගැනීමට නොහැකි වූ විට, අධිකරණය විසින් ඔවුන්ට නීතිඥයෙකු ලබා දිය යුතු වේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සිරකරුවන් පැවසුවේ රාජ්‍යය පත් කළ නීතිඥවරුන් නඩු විභාග දිනවල දී පෙනී නොසිටින බවත්, නඩු කල් දමා අධිකරණ දින ලබා ගන්නා බවත්, ඒ හේතුවෙන් නඩු විභාගයේ කාල සීමාව දිග්ගැස්සෙන බවත් ය. දෙමළ භාෂාව කථා කරන, රජය විසින් පත් කරන නීතිඥයින් නොමැති වීමෙන්, ශක්තිමත් ලෙස විත්තිය සූදානම් කර ගැනීමට පුද්ගලයින්ට ඇති හැකියාව සහ නීතිඥයින්ගෙන් අධිකරණ කටයුතු පිළිබඳ ව පැහැදිලි කිරීම් ලබා ගැනීමට ඇති හැකියාව සීමා කරයි. රජය විසින් පත් කරන නීතිඥවරුන් පිළිබඳ ව දරන පොදු මතයන් සහ ඔවුන් අධිකරණයේ පෙනී නොසිටීම පිළිබඳ ව නෛතික නියෝජනයට ප්‍රවේශය යන පරිච්ඡේදයෙහි තව දුරටත් සාකච්ඡා කර ඇත. සිරකරුවෝ පහත සඳහන් ලෙස මෙය විස්තර කරති:

> "මහාධිකරණයේ නඩු විභාගය අවුරුදු 4ක් තිස්සේ පැවතුණා. ගැටලුව වුණේ අප වෙනුවෙන් පෙනී සිටි අය දෙමළ දන්නේ නැහැ. අපි සිංහල දන්නේ නැහැ. අධිකරණයේ සිදු වන්නේ කුමක්ද කියා අපි දන්නේ නැහැ. අපි යුද්ධය නිසා අවතැන් වී, වධ හිංසාවට ලක් වී සිටි නිසා පෞද්ගලික නීතිඥයින් තබා ගැනීමට ප්‍රමාණවත් මුදල් අපට තිබුණේ නැහැ..."
>
> පනත යටතේ වරදකරු වූවෙක්,
> නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

ඔවුන්ගේ නීතිඥයින් ඔවුන් ව බැහැදැකීමට බන්ධනාගාරයට නොපැමිණි බව රැඳවියෝ ප්‍රකාශ කළ අතර, වැලිකඩ බන්ධනාගාරය හැර, අනෙක් බන්ධනාගාර, නීති නියෝජිතයින් සම්බන්ධ කර ගැනීම සඳහා විදුලි සන්දේශ පහසුකම් සපයා නොදෙන බැවින්, එම නීතිඥයින් විසින් පෙනී සිටි විත්තීන්, රැඳවියා සමඟ ප්‍රමාණවත් අදහස් විමසීමකින් තොර ව සූදානම් කරන ලද විත්ති වාචකයක් වන බැවින් එය මෙම විත්තීන්හි ගුණාත්මකභාවය කෙරෙහි අහිත කර ලෙස බලපෑවේ ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් සාමාන්‍යයෙන් රඳවා ගනු ලබන්නේ ඔවුන් වාසය කරන පෙදෙස්වලින් දුර බැහැර ප්‍රදේශවල බැවින්, ඔවුන් වෙනුවෙන් සන්නිවේදනය කිරීමට එම රැඳවියන් හට ප්‍රාදේශීය සම්බන්ධකම් ද නොතිබෙණු ඇත. වාර්තාවන පරිදි නීතිඥයින් අධිකරණයේ නඩු විභාගයට පෙර රැඳවියන් සමඟ විනාඩි කිහිපයක් පමණක් කථා කරන හේතුවෙන් මෙය තවත් උග්‍ර විය. ඔවුන්ගේ නීතිඥයින් සියලු ම අධිකරණ

නඩු විභාගවලට සහභාගි නොවී ඔවුන් වෙනුවට සමහර විට කනිෂ්ඨ නීතිඥයින් එවන බව ද රැඳවියෝ පැවසූහ. නඩු විභාගයක දී නීතිඥයා පෙනී නොසිටින සෑම අවස්ථාවක දී ම නඩුව තවත් මාස කිහිපයකට කල් යන අතර නඩු විභාගය තව දුරටත් ප්‍රමාද වේ.

නීතිඥයින් අධිකරණයට නොපැමිණීම සහ අධිකරණයේ දී ඔවුන් විත්තිකරු සමග අදහස් විමසීම අවම වශයෙන් කිරීමට එරෙහි ව පැමිණිලි ද පනත යටතේ නොවන සිරකරුවන්ගෙන් ලැබුණු අතර[17], පනත යටතේ සිටින රැඳවියන් නඩුවට පෙර රැඳවුම් භාරයේ දීර්ඝ කාලයක් ගත කරන බැවින්, ඔවුන් වෙනුවෙන් දක්ෂ නීති නියෝජනයක් සඳහා ඇති අවශ්‍යතාවය ඉතා දැඩි ය.

> "බල කිරීමකින් තොර ව අපි පාපොච්චාරණය ලබා දුන් බව පවසමින් අධිකරණය මගේ පාපොච්චාරණය පිළිගත්තා. අපි තීරණයට එරෙහි ව අභියාචනා කළා. නමුත් මෙහි ව්‍යාකූල බවක් තිබුණා: නඩුව අවුරුදු ගණනාවක් දිග්ගැස්සෙයි කියා සමහර නීතිඥයින් අභියාචනා නොකරන ලෙස අපට කිව්වා. සමහර නීතිඥයින් කිව්වා අපි අභියාචනා කළ යුතු බව. කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන සමහරු අවුරුදු ගණනාවක් අභියාචනා මත ගත කරන නිසා, අභියාචනා ඉදිරිපත් කර ප්‍රයෝජනයක් නැති වේවි කියා අපි සිතුවා. එසේ වුවත්, අපට වාසි වෙන අන්දමට තීරණය ලැබෙයි ද? කියා අපි දන්නේ නැහැ. විනිසුරුවරුන් සහ නීතිඥයින් සියලු දෙනා ම සිංහල. අපි නඩුවට වුවත් ගත යුත්තේ සිංහල නීතිඥයෙක්."
>
> පනත යටතේ ජීවිතාන්තය දක්වා සිරගත ව සිටින සිරකරුවෙක්,
> නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

සිවිල් සමාජ නීති ආධාර සංවිධානවල නීතිඥයින් පිළිබඳ ව සාකච්ඡා කළ විට, රැඳවියන් පැවසුවේ, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ආරම්භයේ දී තමන් බැහැදැකීමට ඔවුන්ගේ කනිෂ්ඨ නීතිඥයින් එවූ අතර, ඉන් පසු ව කනිෂ්ඨ නීතිඥයින් ඔවුන් බැහැදැකීමට පැමිණෙන්නේ ලියකියවිලිවලට අත්සන් ගැනීමට පමණක් බව ය. සිරකරුවන් ප්‍රකාශ කළේ, රජය විසින් පත් කරනු ලබන නීතිඥයින් මෙන් ම, සිවිල් සමාජ සංවිධානවල නීතිඥයින් ද, ඔවුන් සමග විත්තියට කරුණු ඉදිරිපත් කිරීමේ ක්‍රමෝපායය සාකච්ඡා කිරීමට විත්තියට කරුණු සූදානම් කිරීමට, ඔවුන්ගේ අදහස් විමසීමට, හෝ නඩු විභාගයේ ප්‍රගතිය පිළිබඳව රැඳවියන්ට පැහැදිලි කිරීමක් ලබා දීමට, ඔවුන් ව බැහැදැකීමට බන්ධනාගාරයට නොපැමිණි බව යි. තමන්ගේ නඩුව පිළිබඳ ව තොරතුරු ලබා ගැනීමට ඔවුන්ට ඇති එක ම අවස්ථාව වනුයේ, අධිකරණ කටයුතුවලට පෙර නීතිඥයින් සමග අදහස් විමසූ විනාඩි කිහිපය තුළ පමණක් බව සිරකරුවෝ ප්‍රකාශ කළහ. ඒ අනුව, සිවිල් සමාජ නීති ආධාර සංවිධාන ප්‍රතිචාර නොදක්වන බවට, නඩුවට අදාළ පටිපාටිමය කරුණු කඩිනමින් අවසන් නොකරන බවට, සහ අවශ්‍ය කරන මට්ටමේ සැලකිලිමත් බව සහ අවධානය සහිතව විත්තියට කරුණු සූදානම් කිරීමට අසමත් වීම පිළිබඳ ව සිරකරුවෝ චෝදනා කළහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සිරකරුවෝ ගණනාවක් ම, නීති නියෝජනයෙහි ගුණාත්මකභාවය ගැන දැඩි ව නොසතුටට පත්ව සිටි අතර, දක්ෂ නීති නියෝජනයක් නොමැති වීම ඔවුන්ගේ නඩු විභාගවලට අහිතකර ලෙස බලපෑ බව විශ්වාස කළහ. පෞද්ගලික නීති උපදෙස් ලබා ගැනීමට තමන්ට මූල්‍ය සම්පත් තිබුණේ නම්, ශක්තිමත් ලෙස විත්තියෙහි කරුණු ඉදිරිපත් කිරීමට ඔවුන්ට හැකියාව තිබූ බව ඔවුහු විශ්වාස කරති.

නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයෙහි වරදකරුවකු වී ඇති සිරකරුවකු පැහැදිලි කළ පරිදි:

> "මගේ අභියාචනය සම්බන්ධයෙන් ඔහු කුමක් කළේ දැයි මා දන්නේ නැහැ. ඔහු මාව මුණගැසුණේ නැහැ. ඔහු මට නොකඩවා ම කියා සිටින්නේ අභියාචනය සඳහා සියලු කටයුතු ඔහු විසින් සකස් කර ඇති බව යි. නමුත් මම සිතන්නේ නැහැ අවශ්‍ය කටයුතු ඔහු සකස්

17 For a detailed discussion, please refer chapter Access to Legal Representation.

කර ඇතැයි කියා. ඔහු මාව බැහැදැකීමට මෙහි එන්නෙත් නැහැ. මගේ අභියාචනය ගැන කිසි ම ලිපියක් මට අධිකරණයෙන් ලැබුණෙත් නැහැ."

පනත යටතේ වරදකරු වූවෙක්,
නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

7.2. නඩු විභාගයට පෙර දීර්ඝකාලීන රඳවා තබා ගැනීම.

"මගේ තරුණ කාලය මෙහි නාස්ති වෙනවා. මම අපරාධයක් සිදු කර, ඒ සඳහා දඬුවම් දුන්නා නම්, මම සෑහීමකට පත් වෙනවා. නමුත් මම එල්ටීටීඊ සාමාජිකයින් සමග මිතුරු ව සිටි නිසා ම මම දඬුවමක් විඳිනවා. මම මෙතැනින් පිටවුණාම මට මුල සිටම ආරම්භ කරන්න වෙනවා. වෙනත් කෙනෙකු සිදු කළ තවත් අපරාධ සම්බන්ධයෙන් ඔවුන් මාව අත්අඩංගුවට ගනු ඇතැයි මම බිය වෙන නිසා මම සැලසුම් කරන්නේ රට හැර යාමට යි."

පනත යටතේ වරදකරු වූවෙක්,
පල්ලේකැලේ සංවෘත බන්ධනාගාරය

සිවිල් සහ දේශපාලනික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මඟින් තහවුරු කර ඇති පරිදි, අනවශ්‍ය ප්‍රමාදයකින් තොර ව නඩු විභාග සිදු කිරීම, සාධාරණ නඩු විභාගයකට ඇති අයිතියේ ප්‍රධාන අංගයකි.[18] සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (3) වගන්තිය මඟින් ද තහවුරු කර ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 7 (2) වගන්තිය මගින් නඩු විභාගය අවසන් වන තෙක් රැඳවියා සිරගත කරන රිමාන්ඩ් නියෝගයක් නිකුත් කිරීමට මහේස්ත්‍රාත්වරුන්ට නියම කරයි. මෙහි දී ඇප ලබා දීම නීතිපතිවරයාගේ අනුමැතියට යටත් ව සිදු වේ. සියලු ම සැකකරුවන්ගෙන්, බොහෝ දෙනෙක් රිමාන්ඩ් ගත කරනු ලැබුවේ පරිපාලනමය රැඳවුම් භාරයේ සාමාන්‍යයෙන් අවම වශයෙන් මාස දහයක්වත් ගත කිරීමෙන් පසු ව ය. වාර්තාගත දීර්ඝතම කාලය වූයේ මාස විසි නවයකි (ත්‍රස්ත විමර්ශන අංශය විසින් අත්අඩංගුවට ගැනීමට පෙර යුද හමුදා කඳවුරු/ පුනරුත්ථාපන කඳවුරු තුළ ගත කළ කාලය සහ පරිපාලනමය රැඳවුම් භාරයේ තබා සිටි කාලය රැඳවියා ඇතුළත් කළේ ය). ඉහත සඳහන් කළ පරිදි, පරිපාලනමය රැඳවුම් කාලය අවසන් කර, පාපොච්චාරණයක් ලබා ගත් පසු, රිමාන්ඩ්ගත කිරීම සඳහා රැඳවියා මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කරන ලදී.

පනත යටතේ සිටින සිරකරුවන් විනිසුරුවරයෙකු වෙත ඉදිරිපත් කිරීමට පෙර දිගු කාලයක් රැඳවුම් භාරයේ සිටින බැවින් සහ පසු ව ඔවුන්ගේ නඩු විභාගය අවසන් වනතුරු රිමාන්ඩ් භාරයේ සිටින බැවින්, එම සිරකරුවෝ අත්අඩංගුවට ගත් කාලයේ සිට ඔවුන්ගේ නඩු විභාගය අවසන් වනතුරු දිග්ගැස්සුණු මුළු කාලයක් රැඳවුම් භාරයේ ගත කරති. බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් කොමිෂන් සභාවට සපයන ලද සංඛ්‍යා ලේඛන මත පදනම් ව[19], බන්ධනාගාරවල රඳවා ගෙන සිටින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සිරකරුවන් සම්පූර්ණ සංඛ්‍යාව 121ක් වන අතර, මොවුන්ගෙන් සිරකරුවන් හැත්තෑ එකක් රිමාන්ඩ් ගත වූවන් ය. මෙම සිරකරුවන් හැත්තෑ එක් දෙනාගෙන්, පණස් පහකට අධිචෝදනා ගොනු කර ඇති අතර, ඔවුන්ගේ නඩු විභාග අඛණ්ඩ ව සිදු වන අතර, සිරකරුවන් 16ක් සඳහා තවමත් අධිචෝදනා ගොනු කර නැත. පනත යටතේ සිටින සිරකරුවන් විසින් රිමාන්ඩ් භාරයේ ගත කරන ලද වසර සංඛ්‍යාව පහත වගුවේ සඳහන් කර ඇත.

18 ICCPR 1966, art 14.
19 As of 31 January 2018, DOP Statistics Department

20.3 වගුව පනත යටතේ සිටින සිරකරුවන් රිමාන්ඩ් භාරයේ ගත කර ඇති වසර සංඛ්‍යාව[20]

මාස 6කට අඩු	මාස 6 වසර 1 දක්වා	වසර 1 වසර 5 දක්වා	වසර 5 වසර 10 දක්වා	වසර 10 වසර 15 දක්වා
1	7	23	29	11

අධිචෝදනා ගොනු නොකර පුද්ගලයෙකු රිමාන්ඩ්ගත ව සිට ඇති දීර්ඝතම කාලය වසර 15ක් බව කොමිෂන් සභාවට දැනගන්නට ලැබුණි. නඩුවක් විභාග වූ දීර්ඝතම කාලය වන්නේ අවුරුදු 14ය. එම නඩු විභාගය 2002 වර්ෂයේ සිට මේ දක්වා ම විභාග වෙමින් පවතියි. 2018 සැප්තැම්බර් වන විට පනත යටතේ සිටින පුද්ගලයින් සතළිස් එක් දෙනෙකු තමන්ගේ දඬුවම් පිළිබඳ ව අභියාචනා ඉදිරිපත් කර ඇති අතර, පුද්ගලයෙකු තීන්දුව අපේක්ෂාවෙන් සිටි දීර්ඝතම කාලය වසර දාහතරක් විය.

රිමාන්ඩ් භාරයේ වසර දහතුනේ සිට පහළොව දක්වා ගත කර ඇති පුද්ගලයින් පිළිබඳ ව කොමිෂන් සභාවට දැනුම් දී ඇති අතර, තමා වසර දහතුනක් රිමාන්ඩ් භාරයේ සිටීමෙන් පසු වසර තුනක දඬුවමක් ලැබුණු බව එක් විශේෂ සිරකරුවෙක් ප්‍රකාශ කළේ ය[21]. රිමාන්ඩ් භාරයේ ගත කළ කාලය බොහෝ විට ඔවුන්ට දඬුවම් ලෙස ලැබුණු සිරගත වීමේ කාලය ඉක්ම වීම පිළිබඳ වූ මෙවැනි සමාන සිදු වීම් බොහෝ වරදකරුවන් වී ඇති රැඳවියෝ විසින් විස්තර කළහ.

විමර්ශනය අවසන් කිරීමට වැඩි කාලයක් ලබා ගැනීම සඳහා විමර්ශනය කරන බලධාරීන් විසින් නඩුවට "දින නියම නොකරන" ලෙස විනිසුරුවරයාගෙන් ඉල්ලා සිටින ලද නඩු පිළිබඳ ව කොමිෂන් සභාවට දැනුම් දී තිබුණි. නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයෙහි පනත යටතේ රිමාන්ඩ් භාරයේ සිටි එක් අයෙකු ප්‍රකාශ කළ පරිදි:

> "ඔවුන් [නිලධාරීන්] කීවේ කුමක්දැයි අපි දන්නේ නැහැ, නමුත් පසු ව අපි එක් පොලිස් නිලධාරියෙකුට කථා කළ විට ඔහු පැවසුවේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විමර්ශනයට වැඩියෙන් කල් ඉල්ලූ බව සහ දින නියම නොකරන ලෙස ඉල්ලූ බව යි. මා එහි සිටි මාස නවය ඇතුළත මාව විමර්ශනය නොකළේ මන්දැයි විනිසුරුවරයා ප්‍රශ්න කර තිබුණි. මෙය විශාල නඩුවක් බවත්, සිදු කෙරෙමින් පවතින තවත් විමර්ශන ඔවුන් සතුව ඇති බවත් අපරාධ විමර්ශන දෙපාර්මේන්තුව විසින් පවසා එයට දින නියම නොකරන ලෙස ඉල්ලුවා. විනිසුරුවරයා එයට එකඟ වී නඩුවට දින නියම නොකර තිබ්බා. ඔවුන් අපෙන් කිසිවක් ඇසුවේවත්, අපට පරිවර්තකයෙක් ලබා දුන්නේවත් නැහැ."

ඉහත සඳහන් කළ රැඳවියා තවත් වසර දෙක හමාරක් යනතුරු අධිකරණයට ගෙන ගොස් තිබුණේ නැත.

නඩුවට දින නියම නොකිරීමේ ප්‍රතිඵලය වනුයේ විත්තිකරුගේ දිනය සඳහා ඊළඟ අධිකරණ දිනය නියම කිරීමක් සිදු නොවීමයි සහ එහි ප්‍රතිඵලයක් ලෙස, රැඳවියාගේ නඩු විභාගය දින නියමයක් නොමැති ව ප්‍රමාද විය හැකි ය.[22] නඩුවට පෙර දින නියමයක් නොමැති ව රඳවා ගැනීම සිදු කිරීම අත්තනෝමතික ලෙස නිදහස අහිමි කිරීමට එරෙහි අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි. එබැවින්, එම අහිමි කිරීම මඟින් අවශ්‍යතාව, සමානුපාතිකත්වය යන කොන්දේසි සපුරාලිය යුතු අතර, නීතියෙන් අපක්ෂපාතී,

20 As of 31 January 2018, DOP Statistics Department

21 The Commission gathered this information based on the complaints received from PTA detainees prior to this study and was released in the Report of the Human Rights Commission to the Committee Against Torture (Review of The 5th Periodic Report of Sri Lanka) in October 2016. This information was confirmed by qualitative interviews undertaken during this study.

22 For a detailed discussion, please refer chapter Legal and Judicial Proceedings.

යුක්ති සහගත සහ සාධාරණ විය යුතු ය. ඒ අනුව, එවැනි රැඳවුම් කාලයක් අධිකරණ අධීක්ෂණය සහ වරින් වර සිදු කරන්නා වූ අධිකරණ සමාලෝචනයට ලක් නොවීම හේතුවෙන්, අත්අඩංගුවේ සිටියදී රැඳවියා බරපතළ ව නුසුදුසු ලෙස සැලකීමේ අවදානමට ලක් විය හැකි ය. එමෙන් ම රිමාන්ඩ් භාරයේ සිටිය දී නීති නියෝජිතයකු සහ පවුලේ සාමාජිකයින් සමඟ සන්නිවේදනය කිරීමේ මාර්ගයක් නොමැති ව අසරණ තත්ත්වයක සිටිනු ඇත. විත්තිකරුවෙකු නඩු විභාගයට පෙර රැඳවුම් භාරයේ තබා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ ස්වාධීන තක්සේරුවක් සිදු කිරීමේ වැදගත්කම එවැනි සිද්ධීන් මඟින් අවධාරණය කරයි.

රිමාන්ඩ් භාරයේ දිග්ගැස්සුණු කාලයක් සිටීමේ බලපෑම නානාවිධ වේ. නිදහස අවිනිශ්චිත ව අහිමි වීමේ ප්‍රමුඛතම බලපෑම වන්නේ පුද්ගලයා සහ පවුල මත ඇති වන හානි කර ශාරීරික සහ මනෝ විද්‍යාත්මක බලපෑම, පුද්ගලයාට සහ පවුලට ජීවනෝපායය අහිමි වීම, දුර බැහැර ජීවත් වන පවුලේ සාමාජිකයින් සමඟ සම්බන්ධකම් නොමැති වීම, යන මේවා ය. තව ද මේවායින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් සපයනු නොලබන පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන වැනි පුද්ගලික ප්‍රතිපාදනවලට ප්‍රවේශය කෙරෙහි ඇති හැකියාවට බලපෑම් කිරීම සහ නෛතික ගාස්තු එකතු වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස පනත යටතේ සිටින රැඳවියන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ජීවනෝපාය මත බලපෑම් ඇති කිරීම සිදු වේ. පෞද්ගලික දේපොළ සහ වත්කම් අහිමි වීම සහ බහුවිධ අවතැන් වීම් හේතුවෙන් සන්නද්ධ ගැටුමේ දී බොහෝ පවුල්වල ජීවන තත්ත්වය පැහැදිලි ව ලෙස අඩු වී තිබුණු අතර, පනත යටතේ සිටින බොහෝ රැඳවියෝ වසර ගණනාවක් තිස්සේ නීති නියෝජනය සඳහා මුදල් වියපැහැදම් කිරීමේ දී, විශේෂයෙන් ඔවුන් පවුලේ ප්‍රාථමික උපයන්නන් වූ සන්දර්භයක් තුළ මුහුණ දුන් අරගල ප්‍රකාශ කර සිටියහ.

7.3. නඩු විභාගවල දී පාපොච්චාරණ පිළිගත හැකි බව

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 16 වන වගන්තිය ප්‍රකාශ කරනු ලබන්නේ පාපොච්චාරණයක් පිළිගත නොහැකි බවට ඔප්පු කිරීමේ භාරය රඳා පවතින්නේ එය අදාළ නොවන බව තරයේ ප්‍රකාශ කරන පුද්ගලයා මත බව යි. එබැවින්, තර්ජන කිරීම යටතේ පාපොච්චාරණයක් කිරීමට බල කරන ලද බවට විත්තිකරුවෙකු චෝදනා කරන්නේ නම්, විත්තිකරු විසින් තර්ජනය කිරීම ඔප්පු කළ යුතු යි. මෙය දේශීය නෛතික රාමුවට පටහැනි ය. එහි දී, නඩු නීතියෙන් තහවුරු කරන පරිදි, චූදිතයා විසින් කරන ලද පාපොච්චාරණයක් ස්වේච්ඡාවෙන් කළ බව ඔප්පු කිරීමේ භාරය ඇත්තේ[23] පැමිණිල්ල මත ය[24].

ඉහත සඳහන් කළ පරිදි, විත්තිකරු ව දැඩි වධ හිංසාවට සහ නුසුදුසු ලෙස සැලකීමට යටත් කිරීමෙන් පසු, අන්‍යයන් සමඟ සන්නිවේදනය තහනම් කරන ලද පරිපාලනමය රැඳවුම් කාලය තුළ පාපොච්චාරණ ලබා ගෙන ඇත. එවැනි පාපොච්චාරණවල වලංගුභාවය පිළිබඳ ව වරදකරුවකු වූ නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය තුළ රැඳවියෙක් ප්‍රශ්න කළේ මේ අයුරිනි:

> “ඔවුන් අප ව අධිකරණයට ගෙනයන්නේ අපට චෝදනා කරන අදහසින්. විනිසුරුවරයා පවා දන්නවා අපේ චෝදනාව සත්‍ය නොවන බව. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සියලු ම රැඳවියන්, අපි සෑම කෙනෙකු ම, පාපොච්චාරණයක් ලබා දුන්නා වන්නේ කොහොම ද? එය එහෙම වන්නේ කොහොම ද? එහි කිසි තර්කානුකූලභාවයක් නැහැ. එය අසත්‍ය බව සෑම කෙනෙක් ම දන්නවා.”

[23] Evidence Ordinance No. 14 of 1895, s 24 ‘A confession made by an accused person is irrelevant in a criminal proceeding if the making of the confession appears to the court to have been caused by any inducement, threat, or promise having reference to the charge against the accused person, proceeding from a person in authority, or proceeding from another person in the presence of a person in authority and with his sanction, and which inducement, threat or promise is sufficient in the opinion of the court to give the accused person grounds, which would appear to him reasonable, for supposing that by making it he would gain any advantage or avoid any evil of a temporal nature in reference to the proceedings against him.’

[24] *The Queen v Rev. H. Gnanaseeha Thero and 21 Others* (1968) S. C. 66/67 (Western Circuit) – M.C. Colombo, 34638/A.

ඉහත සාකච්ඡා කළ පරිදි, පාපොච්චාරණය ලබා දීමට පෙර සහ පසු ව සමහර පොලිස් නිලධාරීන් රැඳවියා අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙතට ඉදිරිපත් කරනු ලැබුවත්, බහුවිධ සාධක හේතුවෙන් වධ හිංසාවට ලක් වූ බවට ලේඛනගත කළ අධිකරණ වෛද්‍ය නිලධාරී වාර්තා නිකුත් වීමක් එයින් සිදු වූයේ නැත. මින් අදහස් වූයේ, නුසුදුසු ලෙස සැලකීමේ වෛද්‍ය සාක්ෂි බොහෝ විට නොතිබූ බව සහ ඒ මඟින් විත්තිකරු හට තර්ජනය කළ බව ඔප්පු කිරීමට තිබූ හැකියාව අඩු කරන ලද බව යි.

තව ද, සහකාර පොලිස් අධිකාරිවරයෙකුගේ තනතුරට නොඅඩු නිලධාරියෙකු ඉදිරිපිට පාපොච්චාරණ සිදු කළ යුතු බව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 16 වෙනි වගන්තියෙන් අවශ්‍ය කරයි. බලහත්කාරයෙන් පාපොච්චාරණ ලබා ගැනීම වැළැක්වීම මෙම විධිවිධානය අරමුණු කරයි. කෙසේ වෙතත්, පාපොච්චාරණ ලබා ගැනීමට සහකාර පොලිස් අධිකාරී තනතුරට අඩු නිලධාරීන් රැඳවියන්ට බල කරන ලද අවස්ථා ගණනාවක් පිළිබඳ ව කොමිෂන් සභාවට දැනුම් දී තිබුණි. මෙයින් දැක්වෙන්නේ පවත්නා අවම ආරක්ෂාවන් පවා අනුගමනය කිරීම සහතික කිරීමට යාන්ත්‍රණයක් නොමැති බව යි. තව ද, අධිකරණය තුළ අසත්‍ය සාක්ෂි ලබා දීම සිදු කළ බවට ඇතැම් සහකාර පොලිස් අධිකාරිවරුන්ට එරෙහි ව චෝදනා ද කොමිෂන් සභාවට ලැබුණි. රැඳවියා ඔහුගේ ම කැමැත්තේ ප්‍රකාශයක් කළ බවත්, එසේ කිරීමට බල නොකරන ලද බවත් ඔවුන් පවසා තිබුණි. අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයෙහි සිටි එක් රැඳවියෙක් පැවසූ පරිදි:

> "ඔවුන් අප ව රවටා ප්‍රකාශයක් ගත් බව අපට තේරුම් ගියේ අධිකරණයේ දී යි. ඇත්ත වශයෙන් ම පාපොච්චාරණ ප්‍රකාශය ගත යුත්තේ සහකාර පොලිස් අධිකාරිවරයා වුවත් ඔහු එය එසේ ලබා ගත්තේ නැහැ. කෙසේ නමුත්, ඔහු අධිකරණයට ඇවිත් පැවසුවේ ඔහු එය ගත්තා කියා. ගැහැනු ළමයා විසින් ටයිප් කරන ලද කොපියක් [රැඳවියාගේ අත්සන සහිත ව] ඔහු ළඟ තිබුණා."

පාපොච්චාරණයෙහි සාක්ෂිකරුවන් පොලිස් නිලධාරීන් පමණක් වන මෙවැනි වාතාවරණයක් යටතේ, බලයෙහි පැහැදිලි අසමතුලිතතාවක් ඇති අතර, පරිපාලනමය රැඳවීම අතරතුර දී තමන් වධහිංසාවට ලක් වූ බවත්, පාපොච්චාරණයක් අත්සන් කිරීමට බල කරන ලද බවත් පෙන්වීමට සාක්ෂි නොමැති බැවින්, තර්ජනය කළ බව ඔප්පු කිරීමට හැකි තත්ත්වයක රැඳවියා නොසිටියි. රැඳවුම් නියෝගය යටතේ පරිපාලනමය රැඳවුම් භාරයේ සිටි මුල් කාලය අතරතුර දී වධහිංසාවට ලක් වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් හට බොහෝ විට සිදු වන්නේ ඔවුන්ගේ නඩු වසර ගණනාවකට පසු මහාධිකරණය වෙත යාම යි. එබැවින්, රැඳවුම් භාරයේ සිටිය දී ඇති වූ තුවාල තව දුරටත් හඳුනාගත නොහැකි වනු ඇත. තව ද, පාපොච්චාරණය පිළිගත හැකි වීම අභියෝගයට ලක් කිරීමට ප්‍රබල නීතිඥවරයෙකුගේ නියෝජනයක් ඔවුන්ට නොමැති විට, විත්තිකරු විශේෂයෙන් ම අවදානම් තත්ත්වයකට පත් වේ. ඉහත සඳහන් කළ කාරණා මත පදනම් ව, පොලිස් අත්අඩංගුවේ සිටිය දී ලබා ගත් පාපොච්චාරණ පිළිගත හැකි වන විට, රැඳවියෙකුගේ අයිතීන් උල්ලංඝනය වීමේ ඉහළ සම්භාවිතාවක් ඇත.

7.4. වරද පිළිගැනීමට තර්ජනය කිරීම

දීර්ඝ කාලයක් රිමාන්ඩ් භාරයේ සිටීම හේතුවෙන්, නඩුව අවසන් කර වඩා ලිහිල් තීන්දුවක් ලබා ගැනීම සඳහා පනත යටතේ රිමාන්ඩ් භාරයේ සිටින බොහෝ දෙනෙකු හට වරද පිළිගැනීමට අනුබල වීමක් වූ බව කොමිෂන් සභාවට දැනුම් දෙන ලදී. යාපනයේ රිමාන්ඩ් බන්ධනාගාරයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ්ගත වූවකු පැවසුවේ:

> "අවංක කාන්තා විනිසුරුවරියක් සිටියා......මගේ නීතිඥයා XX විනිසුරුවරියට නඩුව විස්තර කළා. විනිසුරුවරිය පවා මානුෂීය වෙලා මට කිව්වා මම වරද පිළිගන්නේ නම්, මම මෙපමණ දිගු කාලයක් රිමාන්ඩ්ගත ව සිටි බවත්, මගේ පවුලේ තත්ත්වයත්, යුද්ධය නිසා මම බලපෑමට සලකා, ඇය මට අවම තීන්දුවක් දෙන බව."

රැඳවියන් පැවසූ පරිදි:

> "අපෙන් බොහෝ දෙනෙක් වරද පිළිගෙන ඉක්මණින් පිටතට යාමට අවම දඬුවමක් ඉල්ලා සිටියත්, ගැටලුව වන්නේ ඔවුන් අපට දීර්ඝ දඬුවම් ලබා දීම යි. අපෙන් කුළුබඩු මිල දී ගන්න මෙහි පැමිණි අය අවුරුදු 443ක් අප ව පාලනය කළා. ඔවුන් දඬුවම් වශයෙන් මිනිස්සුන් එල්ලා මරණ විට අපට ප්‍රශ්න කිරීමටවත් නොහැකි වුණා. ඔවුන් අපට දඬුවම් දෙන විට ඔවුන්ට උවමනා වන්නේ අපි ඒ ආකාරයටම හැසිරීම යි. මෙතැන මානව හිමිකම් තිබෙන්නේ කොහේ ද?"

පනත යටතේ වරදකරුවකු වූවෙක්,
නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

නඩු විභාගයට පෙර අවිනිශ්චිත ව රඳවා තබා ගැනීම අවසන් කිරීමේ එක ම මාර්ගය වන්නේ සැකකරුවෙකු හට වරද පිළිගැනීමට බල කිරීම වූ විට, එවැනි නඩුවලින් පෙන්වා දෙන්නේ අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතියෙහි ඇති නිතැතින් පවත්නා දුර්වලතා ය. ඉහත සාකච්ඡා කළ පරිදි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් ඔවුන් හට නීති නියෝජනය සහ නීති ආධාරවලට ප්‍රවේශය හිඟ ව පවතින බව අවධාරණය කළ අතර, වරද පිළිගැනීමට තීරණය කිරීමට පෙර ප්‍රමාණවත් නෛතික උපදෙස් ඔවුන්ට නොමැති බව මෙයින් විදහා දක්වයි.

7.5. අධිකරණ කටයුතුවල භාෂාව

විත්තිකරුවෙකු හට තමාට තේරුම්ගත හැකි භාෂාවකින් අධිකරණ කටයුතු සිදු කිරීමේ අයිතිය තිබෙන බවත්, එසේ නොමැති නම්, සෑම පියවරක දී ම පරිවර්තකයෙකු සිටීමේ අයිතිය තිබෙන බවත්, සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ප්‍රකාශ කරයි. ඕනෑ ම ආකාරයක රඳවා තබා ගැනීමක් හෝ සිරගත කිරීමක් යටතේ සිටින සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වන මූලධර්ම සමූහයේ 14 වන මූලධර්මය ද ප්‍රකාශ කරන්නේ, තමා ව අත්අඩංගුවට ගන්නන්ගේ භාෂාව හෝ නෛතික කටයුතුවල භාෂාව ප්‍රමාණවත් ලෙස තේරුම් ගත නොහැකි පුද්ගලයෙකුට වහා ම පරිවර්තකයෙකු ලබා දිය යුතු බව යි.

විදේශීය ජාතිකයින් පරිදි ම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සිරකරුවන් ද, ඉතා දැඩි ලෙස ප්‍රකාශ කරන ලද්දේ මූලික ව ම සිංහලෙන් සිදු කරන අධිකරණ කටයුතු ඔවුන් වටහා නොගත් බව සහ යළි යළිත් ඉල්ලීම් කර තිබියදීත් ඔවුන්ට පරිවර්තකයින් ලබා නොදුන් බව යි. තමන්ට තේරුම් ගත හැකි භාෂාවකින් අධිකරණ කටයුතු සිදු කර ගැනීමට ඔවුන් විසින් ගන්නා ලද ඉතා දැඩි ක්‍රියාමාර්ග පිළිබඳ ව රැඳවියෙකු විස්තර කළේ මෙසේ ය:

> "විනිසුරුවරයා කථා කරන්නේ සිංහල, ලියන්නා සිංහල, රජයේ නීතිඥයා පෙනී සිටින්නේ සිංහලෙන්. එම නිසා අපට කිසි දෙයක් තේරෙන්නේ නැහැ. එබැවින් අපගේ නඩු විභාගය වවුනියාවට මාරු කර ගැනීමට දින හතක් උපවාසයේ යෙදුණා. නමුත් අපගේ අධිකරණ නඩු විභාගය අනුරාධපුරයේ සිට මාරු කිරීම ඔවුන් ප්‍රතික්ෂේප කළා. අපිට ඒක ලොකු බලාපොරොත්තු සුන් වීමක් වුණා."

පනත යටතේ වරදකරුවෙකු වූවෙක් (අභියාචනා මත),
අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරය

අධිකරණය මඟින් පරිවර්තකයින් සපයා දුන් අවස්ථාවල දී ඔවුන්ගේ යෝග්‍යතාව නීතිමය කටයුතු පරිවර්තනය සඳහා අවශ්‍ය මට්ටමට නොතිබූ බව නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරයෙහි සිටිනා වරදකරුවකු වී ඇති රැඳවියෙකු පහත සඳහන් ලෙස පැහැදිලි කළේ ය:

> "අධිකරණය තුළ පරිවර්තකයෙකු සිටි නමුත් පරිවර්තනය නිවැරදි වුණේ නැහැ. 50%ක් නිවැරදි වෙන්න ඇති. ඇය කථා කළේ කොළඹ දෙමළ. නමුත් අපි කථා කළේ යාපනේ දෙමළ නිසා ඇයගේ දෙමළ භාෂාවේ වෙනසක් තිබුණා. එම නිසා ඇය ව තේරුම් ගැනීම ඉතාමත් අපහසු වුණා. මම සිතන්නේ ඇය ඉගෙනගෙන ඇත්තේ සිංහල මාධ්‍යයෙන්, මම කථා කළ දෙමළ ඇයට තේරුම් ගැනීමට නොහැකි වුණා."

අධිකරණ කටයුතු විත්තිකරුවන්ට තේරුම් ගැනීමට නොහැකි වන විට, එය ප්‍රමාණවත් අන්දමින් විත්තිවාචකයක් සූදානම් කිරීමේ අයිතිය භුක්ති විඳීමට බාධා කරන අතර[25], ඔවුන්ට නීතිඥයින් වගවන ලෙස තබා ගැනී මද වළක්වයි. අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදයට දෙමළ ප්‍රවීණත්වය ඇති නිලධාරීන්ගේ බරපතල හිඟයක් ඇති අතර, එය සිංහල සහ දෙමළ යන දෙක ම ජාතික භාෂා බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති තහවුරුවට පටහැනි ය. භාෂා දෙකින් ම සේවා සැපයීමේ වගකීම පවතින්නේ රජය සතු ව ය.[26]

7.6. අත්අඩංගුවේ සිටිය දී සිදු වන උල්ලංඝන වැළැක්වීමට අධිකරණමය අධීක්ෂණය නොමැති වීම

විත්තිකරුවන් අවිධිමත් ව රඳවා ගැනීමෙන් සහ ප්‍රචණ්ඩත්වයට සහ නුසුදුසු ලෙස සැලකීමට යටත් වීමෙන් එමෙන් ම ඔවුන්ගේ නඩුවල ඇති සංවේදී ස්වභාවය හේතුවෙන් පුද්ගලික නීතිඥයෙකු තබා ගැනීමට නොහැකි වීම මඟින් හා අධිකරණ කටයුතු ප්‍රමාණවත් ව තේරුම් ගැනීමට නොහැකි වීමෙන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවත්නා නඩුවල පාර්ශ්වයන් අතර සුවිශාල බල අසමතුලිතතාවක් පවතින බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. එම නිසා නිර්දෝෂී බව උපකල්පනය කිරීම ආරක්ෂා කර නොමැති අතර, ප්‍රථම වරට සැකකරුවෙකු විනිසුරුවරයෙකු ඉදිරියේ ඉදිරිපත් කිරීමට බොහෝ කලකට පෙර පුද්ගලයාට දඬුවම් දීම සිදු කරයි. මෙම පසුබිම තිබිය දී, නුසුදුසු ලෙස සැලකීම හඳුනා ගැනීම සහ වැළැක්වීම කළ හැකි එක ම ස්වාධීන බලධාරියා වන්නේ අධිකරණ නිලධාරියෙකු පමණි. අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරයෙහි රිමාන්ඩ්ගත වූවෙකුගේ පහත විස්තරය මෙය පෙන්වා දෙයි.

> "2010 පෙබරවාරි මාසයේ ඔවුන් අප ව වවුනියාවේ අධිකරණයට ගෙන ගියා. XX නමින් විනිසුරුවරයෙක් එහි සිටියා. ඔවුන් අප ව රිමාන්ඩ්ගත කිරීමට ඔහුගේ කුටියට ගෙන ගියා. කුමක් ද සිදු වූයේ කියා ඔහු ඇසුවා. සිදු වූ හැමදේම මම ඔහුට කිව්වා, ඔවුන් අප ව ගෙනගොස් අපට පහර දී වධ හිංසා දුන් අන්දම. ඔහු අපගේ හිසකෙස් කපා දමා ඇති අයුරුත් අපගේ පෙනුමත් දැක්කා. ඊට පසුව ඒ පිළිබඳ ව සොයා බලන බව ප්‍රකාශ කළා. ඔහු අපේ වෛද්‍ය වාර්තා ද බැලුවා. අපට පහර දුන් නිලධාරීන් කිසිවකුගේ නම් අපට මතකදැයි කියා ද ඔහු අපෙන් ඇසුවා. මම කිව්වා බොහෝ දෙනෙක් සිටියා. අපට මතක නැහැ, නමුත් නිලධාරීන් තුන් දෙනෙකුගේ නම් මම දැන සිටියා. ඔවුන් හමුදා බුද්ධි අංශයේ අය නිසා. ඉතින් මම එම නම් තුන ඔහුට කිව්වා. ඔහු ඔවුන් තුන්දෙනා ම අත්අඩංගුවට ගන්නා ලෙස නියෝගයක් ලබා දුන්නා. ඉන් පසු ව ඔවුන් අප ව වවුනියා බන්ධනාගාරයේ රිමාන්ඩ් කෙරුවා."

කෙසේ නමුත්, නුසුදුසු ලෙස සැලකීම පිළිබඳ ව මහේස්ත්‍රාත්වරයා විමසූ බව පැවසුවේ පිරිමි ප්‍රතිචාරකයින්ගෙන් 21%ක් පමණක් බව ප්‍රමාණාත්මක දත්ත පෙන්වා දෙයි. ප්‍රථම වතාවට ඔවුන් ව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ විට, පොලිස් අත්අඩංගුවේ සිටිය දී ඔවුන්ට නුසුදුසු ලෙස සැලකුවේදැයි විනිසුරුවරයා සෑම අවස්ථාවක දී ම විමසූ බව හෝ රැඳවියා ව වෛද්‍ය නිලධාරී වෙත යොමු කිරීම නොකළ බව සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූවන් පැවසීමෙන් තහවුරු විය. ඒ වෙනුවට, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සමහර රැඳවියන් පැවසුවේ විනිසුරුවරයා ඔවුන් දෙස බැලුවේවත් නැති බව, සහ ඒ වෙනුවට ඔවුන් ව රිමාන්ඩ් කිරීමට පෙර පොලිස් නිලධාරීන්ගේ අදහස් විමසීම පමණක් සිදු කළ බව යි.

25 ICCPR 1966, art 14 (3)(b).

26 The Constitution of the Democratic Socialist Republic of Sri Lanka, art 25.

මෙලෙස ම, ඔවුන් ව අධිකරණයට ඉදිරිපත් කළ විට, නුසුදුසු ලෙස සැලකීම පිළිබඳ ව මහේස්ත්‍රාත්වරයා දැන සිටි බව පැවසුවේ පිරිමි රැඳවියන්ගෙන් 26%ක් පමණි. අධීක්ෂණය නොමැතිකම සහ ඒ අනුව දැනුවත් බව නොමැතිකම පිළිබඳ ව රැඳවියෙකු පහත සඳහන් ලෙස විස්තර කළේය:

> “ඔවුන් රැඳවියෙකුගෙන් ප්‍රකාශයක් ලබා ගන්නේ නම්, ප්‍රකාශය ගැනීමට පෙර සහ ප්‍රකාශය ලබා ගැනීමෙන් පසු ව රැඳවියා ව අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ගෙන යා යුතු යි. මෙය සිදු කරන්නේ ප්‍රකාශය ලබා ගත්තේ වධ හිංසා නොමැති ව සහ පුද්ගලයාට බල කිරීමක් නොමැති ව බව පෙන්වීමට යි. මාව අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ගෙන ගියේ එක් වරක් පමණයි. ඒ 2009 අගෝස්තු 31 වෙනි දා. මගේ ප්‍රකාශය 2009 සැප්තැම්බර් මස 3 වෙනි දා ඔවුන් ලබා ගත් බව ඔවුන් ප්‍රකාශ කර තිබුණා. අධිකරණයෙන් ඇසුවේ නැහැ දින හතරක පරතරයක් තිබෙන්නේ ඇයි කියා හෝ අධිකරණ වෛද්‍ය නිලධාරියාට මාව පෙන් වූ වහා ම මගේ පාපොච්චාරණය ලබා නොගත්තේ මන්ද කියා. මම මගේ නීතිඥවරයාට මේ ගැන කිව්වා, නමුත් මේ පිළිබඳ ව මගේ නීතිඥයා අධිකරණයේ දී කිසිවක් නොකියූ බව මම දැනගත්තේ තීන්දුව දුන්නාට පසු ව පමණයි.”
>
> පනත යටතේ රිමාන්ඩ්ගත වූවෙක්,
> අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරය

8. පොදු නිරීක්ෂණ

පනත යටතේ සිටින සිරකරුවන් වාර්තා කළේ බන්ධනාගාරය තුළ, ඔවුන්ගේ වරද හේතුවෙන්, ඔවුන් පීඩා විඳ ඇති බව සහ සෙසු සිරකරුවන් සහ බන්ධනාගාර නිලධාරීන් වෙතින් වුව ද හිරිහැරයට සහ අපයෝජනයට ලක් වීමේ අඛණ්ඩ අවදානමක සිටින බව ඔවුන්ට හැඟෙන බව යි. මේ හේතුවෙන්, අනෙකුත් සිරකරුවන් සමඟ වාට්ටුවල සිටීමට වඩා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින අනෙකුත් සිරකරුවන් සමඟ සිටීමට වැඩි කැමැත්තක් දක්වන බව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිරගත ව සිටිනා සියලු ම සිරකරුවන් ප්‍රකාශ කළේ ය.

ඔවුන්ගේ “විශේෂ” තත්ත්වය, එනම්, විශේෂ ආරක්ෂාව අවශ්‍ය කරන සිරකරුවන් ලෙස වර්ගීකරණය කර තිබීම මඟින්, වෛද්‍ය රැකවරණයට ප්‍රවේශය වැනි සමහර හිමිකම්වලට ඔවුන්ට ඇති ප්‍රවේශය සීමා කරයි. මන්ද යත්, සේවක පිරිස්වල සහ ප්‍රවාහනයේ ඇති දැඩි හිඟය හේතුවෙන්, අමතර ආරක්ෂක අවශ්‍යතාවලින් අදහස් වන්නේ, ඔවුන් ව කඩිනම් ව මහ රෝහල වෙත මාරු නොකරන බව හෝ ඔවුන්ගේ සායනවලට නිතිපතා රැගෙන නොයන බව යි. මීට අමතර ව, බන්ධනාගාරවල, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන්ගේ බහුතරයට යම් වෘත්තීය/ කුසලතා පුහුණු, අධ්‍යාපනය හෝ බන්ධනාගාර වැඩවලට සහභාගි වීමට ඇත්තේ ඉතා අඩු ප්‍රවේශයකි. එයට හේතු වූයේ ඔවුන්ගේ “විශේෂ” තත්ත්වයෙහි ස්වභාවය, එවැනි වැඩසටහන් තුළ ලබා ගත හැකි භාෂා විකල්ප සීමා වීම, හෝ ඔවුන් ව රඳවා සිටින බන්ධනාගාරයේ ස්වභාවය නිසා ය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සිරකරුවන්ගෙන් බොහෝ දෙනෙක් ඔවුන්ගේ පවුල්වලින් බොහෝ දුර බැහැර පිහිටි බන්ධනාගාරවල රඳවා සිටින බැවින් සහ එම පවුල්වලට ඔවුන් බැහැදැකීමට නිතර යා නොහැකි බැවින් තම පවුල් සම්බන්ධ කර ගැනීම දිගින් දිගටම දුෂ්කර වී ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියෝ ඔවුන් පොලිස් අත්අඩංගුවේ රඳවා සිටිය දී වධ හිංසාවලට ලක් වූ බව ඉතා විශාල වශයෙන් වාර්තා කළ අතර, ශාරීරික පීඩා කිරීම් යටතේ පාපොච්චරණ ලිවීමට ඔවුන්ට බල කරන ලද බවට චෝදනා කළහ. පාපොච්චාරණයක් අත්සන් කිරීමට පෙර සහ පසු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියන් අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතු බවට අවශ්‍ය කිරීම් තිබියදීත්, රැඳවුම් බලධාරීන් බොහෝ විට විවිධ ක්‍රම හරහා සහ අධිකරණ වෛද්‍ය

නිලධාරියා සමඟ එකඟතාවයන් ඇති කර ගැනීම වැනි ක්‍රම මඟින් ස්ථානගත කර ඇති ආරක්ෂාවන් මඟහැර යාමට උත්සාහ දරති.

සිරකරුවන්ගේ විස්තර කිරීම් මඟින් පෙන්වා දෙන, නෛතික විධිවිධාන එනම්, ප්‍රශ්න කිරීම සඳහා අධිකරණ භාරයෙන් පිටතට පුද්ගලයින් රැගෙන යාමට ඉඩ දෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි 7(3) වගන්තිය, ඔවුන්ගේ අයිතීන් දිගට ම උල්ලංඝනය කිරීමට අවකාශය නිර්මාණය කරන බව යි. ප්‍රශ්න කිරීම සඳහා බන්ධනාගාරයෙන් පිටතට ගෙනයන කාල වේලාවන්හි දී වධහිංසාවට ලක් වූ බව බොහෝ දෙනෙක් වාර්තා කළහ. තව ද එය අධිකරණමය භාරකාරීත්වය මඟින් ලබා දී ඇති ආරක්ෂාවන් ද අඩපණ කරයි.

නඩුවල ස්වභාවය සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා ලැබුවෙක් වෙනුවෙන් පෙනී සිටීම පිළිබඳ ඇති අපවාදය හේතුවෙන් නීතිඥයෙකු තබා ගැනීමේ දී මුහුණ දුන් මූල්‍යමය දුෂ්කරතා එමෙන් ම අධිචෝදනාවක් ගොනු කිරීමට සහ නඩු විභාගය ආරම්භ කිරීමට ගත වන දීර්ඝ කාල සීමාව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින බොහෝ සිරකරුවෝ දුෂ්කරතා ලෙස සඳහන් කළේ ය. නඩු විභාග ක්‍රියාවලිය අතරතුර දී ද, දීර්ඝ ප්‍රමාද වීම් සහ අධිකරණ කටයුතුවල භාෂාව තේරුම් ගැනීමට නොහැකි වීම ඇතුළු ව, සාධාරණ නඩු විභාගයකට ඔවුන්ට ඇති අයිතිය සම්පූර්ණ ව භුක්ති විඳීමේ දී ඔවුහු බොහෝ අභියෝගවලට මුහුණ දුන්හ. මෙම සියලු කාරණාවල ප්‍රතිඵලය වනුයේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින රැඳවියා නඩු විභාගයට පෙර දීර්ඝ කාලයක් තුළ රඳවා තබා ගැනීම වන අතර, එය ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට සහ නිසි නෛතික ක්‍රියාවලියෙන් රැකවරණය ලැබීමට ඇති අයිතියට ද අනුකූල නොවේ.

9. නිර්දේශ

1. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කර අලුතින් ගෙනෙන ඕනෑ ම ජාතික ආරක්ෂක/ ත්‍රස්ත විරෝධී නීතියක් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වන බවට සහතික කිරීම.

2. නෛතික විධිවිධාන මඟින් රිමාන්ඩ්ගත ව සිටින්නෙකු පොලිසිය මඟින් ප්‍රශ්න කිරීම සඳහා ෆිස්කල් භාරයෙන් ඉවත් කිරීමට ඉඩ නොදිය යුතු ය. සුවිශේෂී අවස්ථාවන්හි දී එය අවශ්‍ය කෙරේ නම්, එවැනි කාල පරිච්ඡේද තුළ රැඳවියන් අපයෝජනය කිරීම සඳහා අවකාශය නිර්මාණය නොවන බව සහතික කිරීමට ආරක්ෂාවන් තිබිය යුතු ය.

3. පාපොච්චාරණයන් සම්බන්ධයෙන් වන සාක්ෂි ආඥා පනතෙහි පවත්නා විධිවිධානවලට කිසිදු ව්‍යතිරේකයකට ඉඩ නොදිය යුතු ය. විශේෂයෙන්, බල කිරීම් යටතේ පාපොච්චාරණයක් සිදු කළ බව ඔප්පු කිරීමේ භාරය විත්තිකරු මත නොවිය යුතු ය.

4. ජාතික ආරක්ෂක නීති යටතේ අත්අඩංගුවට ගනු ලබන සෑම රැඳවියෙකු ම නිශ්චිත කාලයක් ඇතුළත අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම සහ සාමාන්‍ය පිළිවෙතක් ලෙස එම පරීක්ෂණයේ වාර්තාව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම.

5. අධිචෝදනා ගොනු කර ඇති නඩු සමාලෝචනය කිරීම සහ පොලිස් නිලධාරියෙකුට ලබා දුන් පාපොච්චාරණයක් මත පමණක් පදනම් වූ අධිචෝදනා සහ විශ්වාසදායක සාක්ෂි නොමැති නඩු ඉවත් කර ගැනීම.

6. දීර්ඝ කාල පරිච්ඡේදයක් තුළ රිමාන්ඩ් භාරයේ පසු වන රැඳවියන්ට ඇප ලබා දීම.

නිර්දේශ

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මුල පුරන ලද බන්ධනාගාර පිළිබඳ අධ්‍යයනය සිදු කරන ලද්දේ අරමුණු කිහිපයක් මුල් කර ගෙන ය. එනම් බන්ධනාගාර, දණ්ඩන සහ විශෝධන ක්‍රමවේදය මෙන් ම ශ්‍රී ලංකාවේ වඩා පුළුල් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය තුළ පවතින හිදැස පිරවීම ය. මෙම අධ්‍යයනය ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් දෙක ම අනුගමනය කළ අතර, බිම් මට්ටමේ සවිස්තර දත්ත එකතු කිරීමක් ඇතුළත් විය. මේ සඳහා තෝරා ගත් බන්ධනාගාරවලින් සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු ව සියලු පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ලැබුණි. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ගැන සිදු කරන ලද සවිස්තරාත්මක අධ්‍යයනයක් ලෙස, මෙම අධ්‍යයනය බන්ධනාගාර සහ රැඳවියන්ගේ භෞතික සහ සමාජ මානයන් යන දෙක ම, සිරගත කිරීම සහ විශෝධන ක්‍රමවේදවල අර්ථය මෙන් ම බන්ධනාගාර පද්ධතිය තුළ පවතින නෛතික රාමුව කෙරෙහි අවධානය යොමු කරයි. අධ්‍යයනයේ සාක්ෂි මත පදනම් ව, විශේෂයෙන් බන්ධනාගාර පද්ධතිය සහ පොදුවේ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය වැඩි දියුණු කිරීමේ සහ ඉහළ නැංවීමේ අරමුණ සහිත ව, පහත සඳහන් නිර්දේශ සම්පාදනය කර ඇත. එබැවින්, මෙම නිර්දේශ, නිශ්චිත ව ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ කෙරෙහි අවධානය යොමු කර, පුළුල් කොටස් තුනකට බෙදා ඇත. ඒවා නම්,

1. බන්ධනාගාරවල භෞතික තත්ත්වයන් සහ පරිපාලනය වැඩිදියුණු කිරීම.
2. සිරකරුවන්ගේ ශුභසාධනය ඉහළ නැංවීම.
3. අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය ප්‍රතිසංස්කරණය කිරීම.

ඉදිරිපත් කරන ලද නිර්දේශ අර්ථවත් අන්දමින් ඉටුකර ගැනීමට හැකි වීම සඳහා මෙම පුළුල් කොටස් සිරකරුවන්ට සැලකීම සඳහා වන එක්සත් ජාතීන්ගේ සම්මත අවම නීතිරීතිවලට අනුකූල ව සහ ශ්‍රී ලාංකීය සන්දර්භයට අනුවර්තනය කර, බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් යොදා ගත හැකි වෙන් ව ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායයන්ට සකසා ඇත. සෑම පුළුල් කොටසක් ම අධ්‍යයනයේ පරිච්ඡේදයන්ට අනුරූප වන බන්ධනාගාර පද්ධතියේ අදාළ කාණ්ඩවලින් සමන්විත වේ. මෙම කාණ්ඩ ඒවා එකිනෙකට යෝජිත නිර්දේශයන් සමඟ, අවධානය යොමු කළ යුතු නිශ්චිත ක්ෂේත්‍රවලට යළි බෙදා ඇත. අදාළ බලධාරීන් විසින් බන්ධනාගාරවල තත්ත්වය වැඩිදියුණු කිරීමට, සිරකරුවන්ගේ ශුභසාධනය ඉහළ නැංවීමට සහ විශෝධන පද්ධතිය පිළිබඳ වඩා යහපත් අවබෝධයක් ප්‍රවර්ධනය කිරීමේ අදහසින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය ප්‍රතිසංස්කරණය කිරීමට පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1 බන්ධනාගාරවල භෞතික තත්ත්වයන් සහ පරිපාලනය වැඩිදියුණු කිරීම.

අංකය	කාණ්ඩය	සැලකිලිමත් විය යුතු ක්ෂෙත්‍ර	නිර්දේශ
1.1	නවාතැන් (ඉඳුම් හිටුම්)		
1.1.1		තදබදය, ඕනෑවට වඩා පිරුණු	• 2016 නොවැම්බර් 09 වෙනිදා නිකුත් කරන ලද 'බන්ධනාගාර තුළ තදබදය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණය සඳහා අධිකරණමය සහ නෛතික හේතු පිළිබඳ කාර්යසාධක බලකායේ පළමු වාර්තාව' තුළ අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
1.1.2		සිරකරුවන් වෙන් කිරීම	• පවතින වාට්ටු පහසුකම් කල්පනාකාරී ව පරිහරණය කිරීම සමග මුළු බන්ධනාගාරයම සඵලදායී ලෙස වෙන් කිරීම. • තරුණ වරදකරුවන් වැඩිහිටි බන්ධනාගාර පහසුකම් තුළ නොව වෙන් කරන ලද ස්ථානවල රඳවා ගැනීම. • පළමු වරට වරදකරුවන් වූවන්, නැවත වරදකරුවන් වූවන් සහ යළි යළිත් අපරාධවලට යොමු වූවන් අතර දැඩි වෙන් කිරීමක් තබා ගැනීම සහ සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය මගින් විවිධ වර්ගවල පුනරුත්ථාපන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. • විශේෂ අවශ්‍යතා සහිත සිරකරුවන්ට සිය ආබාධ සහිත තත්ත්වය සමග ප්‍රවේශ විය හැකි අවකාශයන් තුළ නිවාසගත කිරීම. • මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පමණක් අත්අඩංගුවට ගත් පුද්ගලයින් බන්ධනාගාරය තුළ තබා නොගෙන පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට මාරු කිරීම. • සිරකරුවන්ගේ පුද්ගලික ලිපිගොනු ඔවුන් ව වෙන් කිරීම පදනම් වන සාධක නිර්ණය කිරීම සඳහා භාවිත කරන බැවින් ඒවා යාවත්කාලීන කර සම්පූර්ණ කළ යුතු ය. ලිංගිකත්වය සහ වයස, අපරාධ වාර්තාව, ඔවුන් ව රඳවා තබා ගැනීම සඳහා නෛතික පදනම සහ පුනරුත්ථාපනය සඳහා ඔවුන්ගේ වැඩසටහන, ඇතුල් කර ගැනීමේ දී ඔවුන්ට නියම කරන ලද කුටි අංකය හෝ ඇඳ අංකය මෙන් ම ඔවුන් වර්ගීකරණය කිරීමේ විස්තර සහිත තොරතුරු මේවාට ඇතුළත් වේ.
1.1.3		පවුල්වලින් සහ කුටුම්බයන්ගෙන් දුරස්ථභාවය	• හැකිතාක් දුරට සිරකරුවන්ට නිරන්තරයෙන් පවුල සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමට සහ යළි සමාජය සමඟ ඒකාබද්ධ වීමට හැකි වනු පිණිස ඔවුන්ගේ පවුල්වලට සමීප සිර කඳවුරුවල නවාතැන් දීම. • යළි සමාජගත වීම පහසු කිරීම සඳහා තමාගේ දඬුවම නියම වී ඇති අවසාන මාස හය ගෙවන සිරකරුවන් තම නිවස අසල පිහිටා ඇති බන්ධනාගාරයකට මාරු කිරීම.

1.1.4		බන්ධනාගාරයේ සැකසුම, සැලැස්ම සහ තත්ත්වයන්	• ජාත්‍යන්තර රතු කුරුස කමිටුවෙහි (2013) 'බන්ධනාගාර තුළ ජලය, සනීපාරක්ෂාව, ස්වස්ථතාව සහ වාසභූමිය' වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම් වූ බන්ධනාගාර සැලැස්මක් පිළිබඳ ජාතික ප්‍රමිතියක් සකස් කිරීම. මෙයට උෂ්ණත්ව කළමනාකරණය, වාතාශ්‍රය සහ රෝග වාහකයින් පාලනය, ආදිය ගැන සම්ප්‍රදායික ගෘහ නිර්මාණ ශිල්පීය දැනුම භාවිත කිරීම ගැන ගෘහ නිර්මාණ ශිල්පීන් සහ ඉංජිනේරුවන් වැනි දේශීය විශේෂඥයින්ගේ තීක්ෂණ බුද්ධිය භාවිත කිරීම. • වඩා ආර්ථිකමය විසඳුමක් සඳහා දේශීය සහ සාම්ප්‍රදායික දැනුම භාවිත කිරීම. • බහුවිනයානුකූල නිර්මාණ කණ්ඩායමක් පත් කර ආරක්ෂක විශේෂඥයින්, මනෝ විද්‍යාඥයින්, ගුරුවරුන්, බන්ධනාගාර නිලධාරීන්, සහ වෛද්‍ය වෘත්තිකයින් ඇතුළත් කිරීම. • බන්ධනාගාර තුළ ගරා වැටුණු වාට්ටු සහ ගොඩනැගිලි යළි සකස් කිරීමට සහ අළුත්වැඩියා කිරීමට සැලසුමක් සකස් කර, නියමිත කාල සීමාවක් තුළ ක්‍රියාත්මක කිරීමට හැකි වීම පිණිස ප්‍රමාණවත් මූල්‍ය සම්පත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට වෙන් කර දීම. • හදිසි අවස්ථාවක දී බන්ධනාගාර නාගරික පෙදෙස්වල සිට ග්‍රාමීය පෙදෙස්වලට යළි ස්ථානගත කිරීමේ දී සහ ග්‍රාමීය පෙදෙස්වල නව බන්ධනාගාර ඉදිකිරීමේ දී රෝහල් සහ වෙනත් ආයතන වැනි අත්‍යවශ්‍ය සේවාවන්ට පහසු ප්‍රවේශයක් තිබීමේ අවශ්‍යතාව සලකා බැලීම, මෙන් ම පොදු ප්‍රවාහනය හරහා සිරකරුවන්ගේ පවුල්වලට පහසුවෙන් ළඟා විය හැකි වීම සලකා බැලීම. • තමන්ගේ දඬුවම විවෘත කඳවුරක හෝ වැඩ කඳවුරක ක්‍රියාත්මක කිරීමට සුදුසුකම් ඇති අළුතෙන් වරදකරුවන් වූ සිරකරුවන්ට වැලිකඩ බන්ධනාගාරය තුළ සංක්‍රාන්ති ලෙස රඳවා ගැනීම වෙනුවට සෘජු ව ම අධිකරණයේ සිට කඳවුරට මාරු කිරීම සඳහා ප්‍රතිපත්ති හඳුන්වා දීම.
1.1.5		ආපදා කළමනාකරණ ප්‍රතිචාරය	• සෑම බන්ධනාගාරයක් සඳහා ම විස්තරාත්මක ආපදා අවදානම් කළමනාකරණ සැලැස්මක් අනුගමනය කළ යුතු අතර, බන්ධනාගාර කාර්යමණ්ඩලය සහ සිරකරුවන්, ස්වභාවික මෙන් ම මිනිසුන් විසින් සිදු කරන ආපදාවකට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ ව නිරන්තර පුහුණු ලබාගත යුතු ය. • හදිසි අවස්ථාවක දී සිරකරුවන් සියල්ලන් ම මාරු කිරීම සඳහා වාහන පිළියෙල කිරීමේ ප්‍රෝටොකෝලයක් ඇතුළත් කිරීම සහ සිරකරුවන්ට තාවකාලික ව නවාතැන් ගත හැකි විකල්ප පරිශ්‍රයන් සූදානම් කිරීම. • බන්ධනාගාර නිලධාරීන්ට ආපදා කළමනාකරණය ගැන අදාළ පුහුණු ලබා දීම. • ආපදා අවස්ථාවක දී වැඩියෙන් ම හානි පැමිණීමට ඉඩ ඇති ආබාධ සහිත පුද්ගලයින්, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ වැඩිහිටි සිරකරුවන්ගේ ආරක්ෂාව විශේෂ විධිවිධාන හරහා සහතික කිරීම. • ආපදාවකට මුහුණ දීම සඳහා, ගිනි නිවන උපකරණ වැනි බන්ධනාගාරවලට අවශ්‍ය කරන මෙවලම් සහ උපකරණ සපයා දී ඇති බව සහතික කිරීම.

1.1.6		ජීවන තත්ත්වයන් අධීක්ෂණය සහ සෝදිසි කිරීම	• සිරකරුවන්ගේ ජීවන තත්ත්වයන් වැඩි අධීක්ෂණයකට සහ සෝදිසි කිරීමකට ලක් කිරීම. එසේ නොකරන්නේ නම්, එය වධ හිංසා පැමිණ වීම, කුරිරු, අමානුෂික සහ පහත් ලෙස සැලකීමකට සහ දඬුවම් පැමිණ වීමට සමාන වනු ඇත.
1.2	ආහාර		
1.2.1		ආහාරවල ගුණාත්මක භාවය	• 1956 බන්ධනාගාර ආඥා පනත යටතේ අතිරේක නීති සම්පාදනයෙහි 25, 55 සහ 97 යන කොටස්වලට අනුව දිනපතා ආහාර සූදානම් කිරීමේ ගුණාත්මක භාවය සහ ස්වස්ථතාව පරීක්ෂා කර බැලීම. • පළපුරුද්දක් නොමැති සිරකරුවන්ට ආහාර වේල් පිළියෙළ කිරීමට නියම නොකර, ප්‍රදේශයෙන් ලබාගත හැකි ප්‍රාදේශීය නිෂ්පාදන සැලකිල්ලට ගෙන, එමෙන් ම ආහාරවල පෝෂ්‍යදායී වටිනාකම සැලකිල්ලට ගෙන ආහාර සැලසුම් කිරීම සහ සකස් කිරීම සඳහා පුහුණුව ලත් අරක්කැමියන් සහ පෝෂණවේදීන් සේවයේ යොදා ගැනීම. • නිසි දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් යන දෙක ම අනුගමනය කිරීම අධීක්ෂණය කිරීම සහ සහතික කිරීම සඳහා මුළුතැන්ගෙය භාර නිලධාරියෙකු පත් කිරීම. • පුහුණුව ලත් අරක්කැමියන් සේවයේ යොදන තෙක්, බන්ධනාගාර නිලධාරීන් සහ වෛද්‍ය නිලධාරීන් විසින් ආහාර පිළියෙළ කිරීමේ සනීපාරක්ෂක පිළිවෙත් පිළිබඳ ව, සිරකරුවන්, විශේෂයෙන් 'මුළුතැන්ගෙයි කණ්ඩායමට' නියම කර ඇති අය ව පුහුණු කිරීම.
1.2.2		මුළුතැන්ගෙයි සනීපාරක්ෂාව	• මුළුතැන්ගෙයි පළිබෝධ පාලන ක්‍රම සහ මීයන් බෝවීම පාලනය කිරීමේ යාන්ත්‍රණ සඳහා අරමුදල් වෙන් කර මහ නගර සභා හෝ පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන් හට මෙම කාර්යය ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත් භාර දීම. • නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම. ආහාර අපද්‍රව්‍ය කොම්පෝස්ට් බවට හැරවිය හැකි ක්‍රමවේදයක් නම් වඩාත් සුදුසු වේ. • සියලු ම බන්ධනාගාර හරහා තිරසර ආහාර අපද්‍රව්‍ය බැහැර කිරීමේ ප්‍රතිපත්තියක් සකසා ක්‍රියාත්මක කිරීම.
1.2.3		මුළුතැන්ගෙය පරීක්ෂා කිරීම සහ පාලනය	• මහජන සෞඛ්‍ය පරීක්ෂක බන්ධනාගාර වෙත අහඹු චාරිකා සිදු කර බන්ධනාගාර මුළුතැන් ගෙවල්, ආහාර සලාකවල ගුණාත්මක භාවය මෙන් ම ආහාර පිළියෙළ කරන ආකාරය පරීක්ෂා කිරීම. • අවශ්‍ය ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීම සහ නැතිවුණු යම් සලාක වේ නම් ඒවා ගැන සොයා බැලීම සඳහා, ලැබෙන සලාකවල සහ පසු ව ප්‍රයෝජනයට ගන්නා ලද සලාකවල විස්තරාත්මක වාර්තා තබා ගැනීම. • බන්ධනාගාරවල මුළුතැන් ගෙවල් තුළ දූෂිත භාවිතාවන් පිළිබඳ චෝදනා ගැන විමර්ශන පැවැත්වීම.

1.3	ජලය, සනීපාරක්ෂාව සහ පෞද්ගලික ස්වස්ථතාව		
1.3.1		පිරිසිදු සහ ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම්	• ප්‍රමාණවත් පහසුකම් සැපයීම සඳහා බන්ධනාගාර තුළ තදබදය ආමන්ත්‍රණය කිරීම. • සිරකරුවන්ට ලබාදෙන ජල සැපයුම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බව සහ දවස පුරාවට තිබෙන බව සහතික කිරීම. • හරියාකාර ව ක්‍රියා නොකරන හෝ කැඩුණු බිඳුණු උපකරණ පිළිබඳ ව ක්ෂණික අවධානය යොමු කර ජල සැපයුම් ස්ථාන සහ සනීපාරක්ෂක පහසුකම් නඩත්තු කිරීම. • වැසිකිළි පහසුකම් පිළිබඳ තත්වයන් අධීක්ෂණය කර අවශ්‍ය කරන අළුත්වැඩියා කිරීම් පරිපාලනය වෙත වාර්තා කිරීම සඳහා බන්ධනාගාර නිලධාරීන් පත් කිරීම. • බන්ධනාගාර නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් සෙප්ටික් (පූතිකර) ටැංකි සහ කාණු පිරිසිදු කිරීම නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම.
1.3.2		පිරිසිදු සහ ප්‍රමාණවත් ජල සැපයුම	• ජලය කපා හැරීම් සහ ජල හිඟ වීම් අනිවාර්යයෙන් ඇති වන අවස්ථා සඳහා "ස්වාරක්ෂක තොග" පවත්වා ගැනීම. සිරකරුවන්ට එම ජලය හිඟ වීම් ගැන කලින් දැනුම් දීම. "ස්වාරක්ෂක තොගවලින්'' හෝ බවුසර් මඟින් ජලය සැපයීම. • ජලය පවිත්‍ර කිරීමේ ක්‍රමවේදයක් බන්ධනාගාරය තුළ ස්ථාපිත කිරීම සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් ජලයේ ගුණාත්මක භාවය පුරුද්දක් ලෙස තක්සේරු කරන බව සහතික කිරීම. • නියමිත වේලාවන්හි දී පමණක් ජලය සපයන විට, හැකිතාක් දුරට බන්ධනාගාර පරිපාලනය එම කාල සටහනට අනුව ක්‍රියා කරන බව සහතික කිරීම. • පානීය ජලය ගබඩා කර ගැනීම සඳහා මුද්‍රා තැබූ බහාලුම් ලබා ගැනීමට සිරකරුවන්ට ඉඩ ප්‍රස්ථා ලබා දීම.
1.3.3		විෂබීජ සහ රෝග පැතිරීම අවම කිරීමට පෞද්ගලික ස්වස්ථතාව	• සිරකරුවන් හට ඔවුන් කැමති නම් දිනකට දෙවරක් ස්නානය කිරීමට අවසර දීම සහ ඔවුන්ගේ රෙදි සෝදා ගැනීමට සහ වැසිකිළි භාවිතයට ප්‍රමාණවත් ලෙස කාලය වෙන් කර දීම. • වාට්ටුවක රඳවා ඇති රැඳවියන් සංඛ්‍යාවට සමානුපාතික ව ජලය ගබඩා කිරීම. • නියමිත බාහිර වේලාවන්හි දී ඔවුන්ගේ රෙදි සේදීමට සහ ස්නානය කිරීම අවශ්‍ය කරනු වෙනුවට, හැකිතාක් දුරට ව්‍යායාම සඳහා අමතර බාහිර වේලාවකට ඉඩ දීම. • ස්නානය කිරීමේ පහසුකම් ආබාධ සහිත පුද්ගලයින්ට ද ප්‍රවේශ විය හැකි ආකාරයකින් අළුත්වැඩියා කිරීම සහ සිරකරුවන්ට ප්‍රමාණවත් පෞද්ගලිකත්වයක් ඇති ව සෝදා ගැනීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම. • සිරකරුවන්ට ප්‍රමාණවත් ධාරිතාවක් සහිත බාල්දි සහ තමන් පවිත්‍ර කර ගැනීමට ෂවර් (shower) නොමැති ස්ථානවල බාල්දි ප්‍රමාණවත් සංඛ්‍යාවක් සපයා දීම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව සහතික කිරීම.

			• සනීපාරක්ෂක පහසුකම් හැකි උපරිම පෞද්ගලිකත්වය තහවුරු කරන බවට සහතික කිරීම. එසේ නොවන අවස්ථාවල දී, සිරකරුවන්ට අභිමානයෙන් යුතු ව ඒවා භාවිත කළ හැකි ලෙස සහ ඔවුන්ගේ පෞද්ගලිකත්‍වය අනතුරේ නොහෙලන ආකාරයකින් ඒවා යළි ඉදි කර දීම. • වාට්ටු තුළ සහ පිටත (දඬුවම් කුටි ඇතුළුව) යන දෙකෙහි ම සනීපාරක්ෂක පහසුකම් දිවා සහ රාත්‍රි කාලය පුරාවට භාවිතය සඳහා පවතින අන්දමට සකසා දීම. මන්ද යත්, සිරකරුවන් අමානුෂික කිරීම සහ මූලික මානව කාර්යයන් ඉටු කිරීමේ දී ඔවුන්ගේ අභිමානය අහිමි වීම පුනරුත්ථාපන ක්‍රියාවලියට බාධාවකි. • වැසිකිළි පිරිසිදු ව තබා ගැනීම සඳහා භාවිතයෙන් පසු සෝදා හැරීමේ සහ ජලය පහසුවෙන් ඉවතට ගලා යාමේ ක්‍රමවේදයක් සකස් කිරීම සහ වෙනත් පෞද්ගලික සනීපාරක්ෂක අවශ්‍යතාවන් සඳහා සපයන ජලයට අමතර ව මළ මූත්‍රාදිය සෝදා හැරීම සඳහා සිරකරුවන්ට ජලය සපයා දීම. • තමන්ගේ වාට්ටුවල සහ නාන කාමරවල පවිත්‍රතාව සහ ස්වස්ථතාව පවත්වා ගැනීමට සිරකරුවන්ට පවිත්‍රකාරක ද්‍රව්‍ය සැපයීම සඳහා අරමුදල් වෙන් කිරීම. • බන්ධනාගාර තුළ හිසකෙස් කපන ස්ථාන හොඳින් නඩත්තු කිරීම සහ භාවිත කරන සියලු උපකරණ නිතරම විෂබීජහරණය කිරීම සහතික කිරීම. • බදුල්ල රිමාන්ඩ් බන්ධනාගාරයේ ඇති ක්‍රමවේදයට සමාන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. මෙහි දී අළුතින් ඇතුල් වන්නන් හට ලබා දෙන මූලික ප්‍රතිපාදන, ඔවුන්ගේ පවුල් ඔවුන් ව බැහැ දැකීමට පැමිණෙන විට ඔවුන්ට ලැබෙන භාණ්ඩ මඟින් ප්‍රතිස්ථාපනය කළ හැකි ය. • වරදකරුවන් වී ඇති සහ මරණීය දණ්ඩනයට තීන්දු වී ඇති සිරකරුවන්ට පිරිසිදු වීමට අවශ්‍ය දේ, කාන්තා සිරකාරියන් හට සනීපාරක්ෂක තුවා මෙන් ම පවුල්වලින් බැහැදැකීමට පැමිණෙන විට එවැනි භාණ්ඩ ලබා ගත නොහැකි රිමාන්ඩ් බාරයේ සිටින්නන් හට, මේවා නිරන්තරයෙන් සැපයීමේ ක්‍රමවේදයකට මුල පිරීම. • වෙනත් මහජන සෞඛ්‍ය ආයතනවල සහාය ඇති ව මදුරුවන් සඳහා ධූමිකා ඇල්ලීම ඇතුළු නිරන්තර දුම් ගැස්සීම ක්‍රියාවට නැංවීම. තව ද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් රැඳවියන්ට ඇති වන සෞඛ්‍ය අවදානම් තක්සේරු කිරීමට බන්ධනාගාර පහසුකම් තුළ නිරන්තර පරීක්ෂා කිරීම් සිදු කිරීම අවශ්‍ය කෙරේ.

1.4	ඇතුල්වීමේ සහ පිටවීමේ ක්‍රියා පටිපාටිය		
1.4.1		ඇතුළත් කිරීමේ ක්‍රියා පටිපාටිය	• දේශීය සහ විදේශීය සිරකරුවන් යන කාණ්ඩ දෙකට ම, ඔවුන්ගේ පවුල්වලට වහාම, හෝ සාධාරණ කාල සීමාවක් ඇතුළත, ඔවුන් සිරගත වීම පිළිබඳ ව දුරකථනයෙන් දැනුම් දීමට හෝ රැඳවියා අදාළ තානාපති (රාජ්‍යතාන්ත්‍රික) සේවය පිළිබඳ විස්තර නොදන්නේ නම්, අදාළ කොන්සල් කාර්යාලයට දුරකථනයෙන් ඇමතීමට අවශ්‍ය දුරකථන අංක ලබා දීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. • පොලිස් අත්අඩංගුවේ සිටින විට හෝ තෙවැනි පාර්ශ්වයක් වෙතින් සිදු කරන ලදුව මුහුණ දී ඇති ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඇතුල් කිරීමට පෙර සිදු වී ඇති තුවාල සඳහා සිරකරුවන් ඉතා හොඳින් පරීක්ෂා කිරීම සහතික කිරීම. • සිරකරුවන් ඇතුල් කරන අවස්ථාවේ දී ඡායාරූප ගැනීමට සහ තුවාල සලකුණු වාර්තා කිරීමට සැලසීම. ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය තුළ එසේ සිදු කිරීමට වඩා යම් තුවාල සලකුණු පිළිබඳ ව නිවැරදි කාල මුද්‍රාවක් තැබීම සඳහා මෙසේ කිරීම සුදුසු වේ. • රැඳවියන් පොලිස් අත්අඩංගුවේ සිටිය දී සිදු වී ඇතැයි සිතිය හැකි තුවාලවල දෘශ්‍යමාන සලකුණු ඔවුන් මත සොයා ගත හැකි නම් හෝ පොලිස් අත්අඩංගුවේ සිටිය දී වධහිංසාවලට ලක් වූ බවට රැඳවියා පැමිණිලි කරන්නේ නම්, රැඳවියන් අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා වෙත ඉදිරිපත් කිරීම, බන්ධනාගාර වෛද්‍යවරුන්ට අනිවාර්ය කෙරෙන ක්‍රියා පටිපාටියක්/ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. • ඇතුල් කිරීමේ දී රැඳවියන් විසින් ඉදිරිපත් කරන ලද පොලිස් වධ හිංසා පිළිබඳ පැමිණිල්ල පසු විපරම් කිරීමට සහ ජාතික පොලිස් කොමිෂන් සභාවට සහ මානව හිමිකම් කොමිෂන් සභාවට එම සිද්ධීන් දැනුම් දීමට යාන්ත්‍රණයක් පිහිටු වීම. • ශරීර සෝදිසි කිරීම් සිදු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය නිශ්චිත ව සඳහන් කරමින් චක්‍ර ලේඛයක් නිකුත් කිරීම සහ රැඳවියෙකුගේ ශරීර කුහරය සෝදිසි කිරීමට බලය ඇත්තේ වෛද්‍යවරයෙකුට පමණක් බව සියලු ම බන්ධනාගාර නිලධාරීන්ට සහ බන්ධනාගාර පොලිසියට දැනුම් දීම. • බන්ධනාගාරය තුළට තහනම් බඩු රැගෙන යාම වැළැක්වීමට නව තාක්ෂණය ස්ථාපිත කිරීමට පහසුකම් සැලසීම සහ දැනට පවතින යන්ත්‍රෝපකරණ, ශරීර ස්කෑන් කිරීමේ යන්ත්‍ර වැනි ඒවා, සම්පූර්ණයෙන් ම ක්‍රියා කරන බව සහතික කිරීම. • සියලු ම බන්ධනාගාරවලට රැඳවියන්ගේ මූලික සෞඛ්‍යය පරීක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියමු ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීමෙන්, ඇතුල් කිරීමේ දී වෛද්‍ය පරීක්ෂාවක් කිරීමේ ඒකාකාරී ක්‍රමයක් හඳුන්වා දීම. මෙහි දී මානසික රෝග/ශෝකය මඟින් පීඩා විඳින සහ සියදිවි හානි කර ගැනීමේ නැඹුරුවක් ඇති තැනැත්තන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

			• ඇතුල් කිරීමට පසු දින වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වන්නන් පරීක්ෂා කර ඔවුන් බන්ධනාගාර තුළ ගත කළ පළමු රාත්‍රියේ දී ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන්නේ දැයි විමසා බැලීම. • සියලු ම නව සිරකරුවන් සඳහා ආයතනය ක්‍රියාත්මක වන ආකාරය, නීතිරීති සහ රෙගුලාසි, දුක්ගැනවිලි යාන්ත්‍රණ, සහ විනය පිළිබඳ වැරදි බවට සැලකෙන හැසිරීම් පිළිබඳ ව දැනුවත් කිරීමට ඔවුන් භාවිත භාෂාවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. • කාර්යක්ෂම ව වාර්තා පවත්වා ගැනීම සඳහා, ඇතුල් කරන විට ලේඛනගත කළ තොරතුරුවල මධ්‍යගත ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායක් ස්ථාපිත කර, යම් පුද්ගලයෙකු නැවත වරදකරුවෙකු වූ/ යළි යළිත් අපරාධවලට යොමු වූවෙකු දැයි පරීක්ෂා කිරීමට පෙර වාර්තා වෙත යොමු වීම. මෙම පද්ධතිය කළමනාකරණය කිරීමට අදාළ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ (ICT) පුහුණුව සහිත නිලධාරීන් ලබා දිය යුතු අතර, නියම කළ නිලධාරීන් හට පමණක් මෙම පද්ධතියට ප්‍රවේශය තිබිය යුතු ය. දත්ත සමුදායට සිරකරුවන් ප්‍රවේශ වීම තහනම් කළ යුතු ය. • සිරකරුවන්ගේ පුද්ගලික බඩුබාහිරාදිය ගබඩා කිරීමට ඒකාකාර ක්‍රමයක් හඳුන්වා දී, රැඳවියන්ගේ පුද්ගලික බඩු බාහිරාදිය පිළිබඳ ව ආරක්ෂාව සහතික කිරීම පිණිස ගබඩාවෙහි තැන්පත් කළ භාණ්ඩවල විස්තරයක් අඩංගු ලදු පතක් නිකුත් කිරීම.
1.5	වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශය		
1.5.1		වෛද්‍ය පහසුකම්	• කලාපය තුළ බරපතළ රෝගාබාධ සහිත සිරකරුවන්ට අවශ්‍ය කරන සියලු පහසුකම් අන්තර්ගත ව, සෑම කලාපයකම පවතින විශාල ම බන්ධනාගාර රෝහල මූලික රෝහලක් බවට උසස් කිරීම, සහ රෝහල තුළ නේවාසික උවටැන් අවශ්‍ය කරන රැඳවියන් සඳහා තාවකාලික පියවරක් ලෙස බන්ධනාගාරයකට ආසන්න ව ම ඇති මහ රෝහලෙහි වෙන ම වාට්ටුවක් වෙන් කර ගැනීම. • කාර්යාල වේලාවෙන් පිටත සහ හදිසි අවස්ථාවල දී සිරකරුවන්ට ප්‍රතිකාර කිරීම පිණිස අවම වශයෙන් එක් නේවාසික වෛද්‍ය නිලධාරියෙක් සහ මනෝ චිකිත්සකයෙකු පත් කිරීම. • ළඟ ම ඇති මහරෝහලෙන් උපදේශක වෛද්‍යවරුන් සඳහා රාජකාරී ලේඛනයක් සකස් කිරීම.
1.5.2		වෛද්‍ය කාර්යමණ්ඩලය පුහුණු කිරීම සහ සංවේදීකරණය	• සිරකරුවන් සමඟ කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණුවීම් ලද වෛද්‍ය කාර්යමණ්ඩලයක් සපයා බන්ධනාගාර තුළ වැඩ කිරීම ගැන ඔවුන් ව සංවේදීකරණය කිරීම. • බන්ධනාගාර ආඥා පනත, 1956 දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග සහ ව්‍යවස්ථාපිත නීතිරීති යටතේ ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ව වෛද්‍ය සේවක පිරිස් දැනුවත් කිරීම.

			• වෛද්‍ය නිලධාරී විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෙත බන්ධනාගාර ආඥා පනත, 1956 දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග සහ ව්‍යවස්ථාපිත නීතිරීති යන මේවායේ සඳහන් කර ඇති වාර්තා නිතිපතා යැවීම. • බන්ධනාගාර රෝහල තුළ ප්‍රතිකාර මෙන් ම උපදේශනය ලබා ගන්නා සියලු රැඳවියන්ගේ යාවත්කාලීන කළ වාර්තා පවත්වා ගැනීම.
1.5.3		වෙනත් වෛද්‍ය පහසුකම් වෙත මාරු කිරීම	• සායන දින යළි කාර්ය සටහන් ගත කිරීම වැළැක්වීමට, බන්ධනාගාර රෝහලේ පැවැත්විය නොහැකි සහ මහ රෝහලේ පමණක් පැවැත්විය හැකි විශේෂ සායන සෑම මාසයක දී ම නිශ්චිත දිනයක පැවැත්වීම. • මානව සම්පත් හිඟය ආමන්ත්‍රණය කිරීම මෙන් ම අමතර බස් රථ ලබා ගැනීම මඟින්, රැඳවියන් රෝහල් වෙත මාරු කිරීම, නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් ප්‍රමාද වීම වැළැක්වීමට, බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම. • සෑම බන්ධනාගාරයකට ම අවම වශයෙන් එක් ගිලන් රථයක් සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් මූල්‍ය සම්පත් සපයා දීම සහ, තාවකාලික ව, උග්‍ර අවස්ථාවල දී සිරකරුවන් මාරු කිරීම සඳහා සෑම බන්ධනාගාරයකට ම ආසන්නව ම ඇති ජාතික වෛද්‍ය ආයතනයෙන් ගිලන් රථයක සේවා සැපයීම. • වෛද්‍ය ප්‍රතිකාර යටතේ සිටින සිරකරුවන්ට බාධාවක් නොමැති ව නව බන්ධනාගාරය තුළ තමන්ගේ ප්‍රතිකාර අඛණ්ඩ ව ලබා ගැනීමට සහ නව බන්ධනාගාරයේ වෛද්‍ය නිලධාරියාට මාරු කර යවා ඇති සියලු ම සිරකරුවන්ගේ වෛද්‍ය ඉතිහාසයන් වෙත ප්‍රවේශය ලබා ගැනීමට හැකි වනු පිණිස, වෙනත් බන්ධනාගාරවලට මාරු කර යවන සිරකරුවන්ගේ වෛද්‍ය ලිපිගොනු අප්‍රමාද ව යැවීම.
1.5.4		මානසික සෞඛ්‍යය	• මානසික රෝග සහිත වරදකරුවන් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදයෙන් බැහැර ව ප්‍රතිකාර පහසුකම් වෙත යොමු කිරීමට, අවශ්‍ය කරන නෛතික ප්‍රතිසංස්කරණ ඇතුළු ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම. • උග්‍ර මානසික රෝග ඇති ලෙස රෝග විනිශ්චය කර ඇති ප්‍රචණ්ඩ නොවන වරදකරුවන් හට අධිකරණමය අධීක්ෂණය යටතේ ප්‍රතිකාර සේවා ලබා දීම. • පොලිසිය විසින් රැගෙන එන, චිත්තවේගී හෝ මානසික සෞඛ්‍ය අර්බුද අත්දකින පුද්ගලයින්ට සෞඛ්‍ය අමාත්‍යංශයේ සේවක පිරිස් මඟින් මනෝචිකිත්සක සේවා සපයන 'විසිහතරපැය අර්බුද මධ්‍යස්ථානයක්' පිහිටුවීම. • සෑම බන්ධනාගාරයක ම සියදිවි නසාගැනීම් වැළැක්වීමේ පුළුල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මෙයට බන්ධනාගාරයට ඇතුළු කරන නවකයින් පරීක්ෂා කර බැලීම සහ සියදිවි නසා ගැනීමේ අවදානම සහිත ලෙස හඳුනා ගත් රැඳවියන් අධීක්ෂණය කිරීම ඇතුළත් කිරීම.

			• මනෝ විද්‍යාත්මක සේවා අවශ්‍ය කරන සිරකරුවන් සමඟ කටයුතු කිරීමට දක්ෂතාවය ඇති, සැම බන්ධනාගාරයක ම අවම වශයෙන් එක් සුදුසුකම් ලත් උපදේශන නිලධාරියෙකු සිටිය හැකි වන පරිදි උපදේශකයින්ගේ සේවක සංඛ්‍යාව වැඩි කිරීම. • සෞඛ්‍ය අමාත්‍යංශය විසින් සියලු ම බන්ධනාගාර නිලධාරීන්ට සහ වෛද්‍ය නිලධාරීන්ට සියදිවි නසා ගැනීම වැළැක්වීම පිළිබඳ නිරන්තර පුහුණු ලබා දීම.
1.6	බාහිර ලෝකය සමඟ සම්බන්ධ වීම		
1.6.1		පවුල මඟින් බැහැදැකීම	• වරදකරුවන් ඔවුන්ගේ නිවෙස්වලට ආසන්න ව තබා ගැනීමෙන් ඔවුන්ගේ පවුල්වලට නිතිපතා ඔවුන් බැහැදැකීමට ඉඩ දීම. • බන්ධනාගාරයේ සිට බොහෝ දුරින් ජීවත්වන පවුල්වලට දින කිහිපයක් තුළ දීර්ඝ වේලාවකට ඔවුන් බැහැදැකීමට ඉඩ දීම වැනි විකල්ප සැකසුම් ලබා දීම. • තම දඬුවම් කාලය අවසන් කිරීමට ආසන්න ව සිටින සිරකරුවන් හට යළි සමාජ ගත වීම පහසු කිරීමට ඔවුන්ගේ නිවෙස්වලට ආසන්න බන්ධනාගාරවලට මාරු කිරීමට ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම. • සිරකරුවන් ව වීදුරු බාධකයකින් තම පවුල්වලින් වෙන් කර රැඳවියන් හට තම අමුත්තන් සමඟ කථා කිරීමේ දී ඔවුන්ට ඇසෙන පරිදි කෑ ගැසීමෙන් තොර ව කතාබහ කිරීමට හැකි වීම සහතික කිරීමට දුරකථන සවි කර වඩා මානුෂික ආකාරයකින් පවුල් බැහැදැකීම් සිදු කිරීම. • සිරකරුවන්ට සහ ඔවුන්ගේ අමුත්තන්ට, විශේෂයෙන් වැඩිහිටි අමුත්තන්, ගැබිණි කාන්තාවන් හෝ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් හට බැහැදැකීම් අතරතුර පහසුවෙන් කතාබහ කිරීමේ නිරත වීමට හැකි වන පරිදි, ආසන සහිත පෙදෙස් සපයා දීම. • යහපත් හැසිරීම සඳහා පාරිතෝෂිකයන් ලෙස සමීප ව බැහැ දැකීමට ඉඩ දීම හෝ බැහැදැකීම් සඳහා වැඩි කාලයක් ලබා දීම කළ හැකි නමුත්, සිරකරුවෙකුට දඬුවමක් ලෙස බැහැදැකීමේ අයිතීන් කප්පාදු කිරීමෙන් වැළකීම.
1.6.2		බාහිරින් ආහාර සහ පාර්සල් ලැබීම නිසියාකාර ව අධීක්ෂණය කිරීම	• ආහාරවල සනීපාරක්ෂක තත්ත්වයන් රැක ගැනීම සඳහා අමුත්තන් විසින් රැගෙන එන ආහාර සහ වෙනත් භාණ්ඩ පරීක්ෂා කිරීමට පාර්සල් ස්කෑන් යන්ත්‍ර, එක්ස්රේ ස්කෑනර් වැනි තාක්ෂණය කෙරෙහි ආයෝජනය කිරීම. • බන්ධනාගාරය තුළ සපයන ආහාරවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමෙන්, සිරකරුවන් සඳහා පවුල්වලින් රැගෙන එන ආහාර පාර්සල් සංඛ්‍යාව අවම කිරීම. • පිටතින් ලැබෙන ආහාර පරීක්ෂා කිරීමට සනීපාරක්ෂක සහ විධිමත් ක්‍රමවේදයක් පිහිටුවීම.

			• අගුණකොළපැලැස්ස සංවෘත බන්ධනාගාරය තුළ පවතින ක්‍රමවේදය වන්නේ පවුල්වලට බන්ධනාගාර භෝජනාගාරයෙන් භාණ්ඩ මිල දී ගෙන, එම ලදුපත සිරකරුවාට ලබා දීමෙන් එම භාණ්ඩ අදාළ සිරකරුවන්ට ලබා ගැනීමට හැකි වීමයි. මෙම ක්‍රමවේදය ව්‍යාප්ත කිරීමෙන් දුරස්ථ ව පවා සිරකරුවාගේ වැය ඉහළ නැංවීමට ඉඩ දීම සහ භෝජනාගාරයෙන් ඕනෑ ම භාණ්ඩයක් මිල දී ගැනීම පිණිස සිරකරුවාට එය භාවිත කිරීමට ඉඩ සැලසීම.
1.6.3		තැපැල සහ දුරකථන හරහා සන්නිවේදනය	• දැනට පවතින තැපැල් සන්නිවේදන ක්‍රමවේදය වැඩිදියුණු කර, එය කාර්යක්ෂම ව සහ ප්‍රමාද වීම්වලින් තොර ව කළමනාකරණය කිරීම සහතික කිරීම. මෙහි දී සිරකරුවන්ට ඔවුන්ගේ ලිපි යවන ලද්දේ කවදා ද යන්න දැනුම් දීමෙන් සිරකරුවන්ට ඒවා තැපැල් කරන ලද්දේ ද හා එසේ කරනු ලැබුවේ කවදාද යන්න ගැන දැනුම ලබා ගැනීමට හැකි වීම. • දමිළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ මනා දැනුමක් ඇති නිලධාරීන් බඳවා ගැනීම සහ දමිළ හෝ ඉංග්‍රීසි දැනුම පමණක් ඇති සිරකරුවන් සහ ඔවුන්ගේ පවුල් අතර සන්නිවේදනයට පහසුකම් සැලසීම සඳහා දැනට සිටින නිලධාරීන්ට භාෂා පුහුණුව ලබා දී, සිරකරුවන්ගේ ලිපි පවුල් වෙත තැපැල් කිරීම සඳහා දමිළ හෝ ඉංග්‍රිසි භාෂාවෙන් ලියා ඇති ලිපි සමාලෝචනය කිරීමට නිලධාරීන්ට හැකියාව ලබා දීම. • වැලිකඩ බන්ධනාගාරයෙහි ඇති ක්‍රමවේදයට සමාන ව, දුරකථන කුටි ස්ථාපිත කර, සිරකරුවන්ට පවුල් සමඟ සබඳතා පවත්වා ගැනීමට හැකියාව ලබා දී, බන්ධනාග ාරයට නීති විරෝධී ලෙස රැගෙන එන දුරකථන භාවිතය හරහා ඔවුන්ගේ පවුල් සම්බන්ධ කර ගැනීම වැනි නීති විරෝධි ක්‍රමවල පිහිට සෙවීමේ අවශ්‍යතාව අවම කිරීම. • නීතිඥයින් හට තම සේවාදායකයින් සමඟ සාකච්ඡා කිරීම සඳහා සෑම විටම බන්ධනාගාරයට යාම අවශ්‍ය නොවීම සඳහා, රිමාන්ඩ් භාරයේ සිටින්නන් සහ අභියාචනා මත සිටින රැඳවියන් හට ඔවුන්ගේ නීතිඥයින් නියම කරන වේලාවක දුරකථනයෙන් ඇමතීම සඳහා වෙන ම පහසුකමක් ලබා දීම.
1.7	දුක්ගැනවිලි යාන්ත්‍රණය		
1.7.1		අභ්‍යන්තර දුක්ගැනවිලි යාන්ත්‍රණය	• දැනුවත් කිරීමේ වැඩසටහන අතරතුර, අභ්‍යන්තර දුක් ගැනවිලි යාන්ත්‍රණය පිළිබඳව රැඳවියන්ට දැනුම් දීම සහ රැඳවියන්ගේ දැන ගැනීම සඳහා බන්ධනාගාර පරිශ්‍රය තුළ භාෂා තුනෙන් ම, ලිඛිත ව එම උපදෙස් ප්‍රදර්ශනය කිරීම. • සම්මත අවම නීතිරීති වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කරමින් බන්ධනාගාර පද්ධතිය තුළ පවතින අභ්‍යන්තර දුක් ගැනවිලි යාන්ත්‍රණවලට, බාධාවලින් තොර ප්‍රවේශය සිරකරුවන්ට ලබා දීම. • තවත් නිලධාරියෙකු යටතේ සිටින නිලධාරියෙකු හරහා නොගොස් බන්ධනාගාර පරිපාලනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වෙත ඍජු ව ම පිවිසීමට ඉඩ සැලසීම.

			• බන්ධනාගාර අධිකාරි හෝ ප්‍රධාන ජේලර්වරයා වෙත සෘජු ව ම ඔවුන්ගේ ගැටලු ප්‍රකාශ කිරීමට ඉඩ ප්‍රස්ථාව සියලු ම රැඳවියන්ට තිබීම සහතික කිරීම පිණිස, නිතිපතා පරීක්ෂණ වට සිදු කිරීමට බන්ධනාගාර අධිකාරිවරුන්ට සහ ප්‍රධාන ජේලර්වරුන්ට පහසුකම් සැලසීම. • සිරකරුවන් විසින් ඉදිරිපත් කරන පුද්ගලික සහ විශ්වාසනීය පැමිණිලි සඳහා, බන්ධනාග ාරය තුළ පහසුවෙන් පිවිසිය හැකි පොදු ප්‍රදේශ තුළ පැමිණිලි ලියුම් පෙට්ටියක් පවත්වා ගෙන යාම. මේවා වෙනත් බන්ධනාගාර නිලධාරීන්ගේ ඇඟිලි ගැසීමේ හෝ බාධා කිරීමේ අවදානමකින් තොර ව, ප්‍රධාන ජේලර්වරයා හෝ බන්ධනාගාර අධිකාරි විසින් පමණක් දෛනික පදනමක් මත විවෘත කිරීමට හැකි වීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ නිලධාරීන් හෝ ශාඛා මෙහෙය වීම. • පළිගැනීම පිළිබඳ ව ඇති බිය හේතුවෙන් රැඳවියන් ඔවුන්ගේ දුක්ගැනවිලි බන්ධනාග ාර අධිකාරීන්ට සහ බාහිර පාර්ශ්ව වෙත පැමිණිලි කිරීමට බාධා නොකිරීම පිණිස, පැමිණිලි ඉදිරිපත් කිරීමේ දී පූර්ණ විශ්වසනීයත්වය සහ පෞද්ගලිකත්වය ලබා දීම සහතික කිරීම. • බන්ධනාගාර නිලධාරීන්ට එරෙහි ව පැමිණිලි කිරීම වෙනුවෙන් ඔවුන් පළිගැනීම්වලට භාජනය වන බවට රැඳවියන්ගෙන් එන චෝදනා පිළිබඳ ව ක්ෂණික විමර්ශන පැවැත්වීම. අධිකාරි විසින් රැඳවියාගේ ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රමුඛතාගත කර, එවැනි පළිගැනීම්වල නිරත වූ බවට සොයාගත් නිලධාරීන්ට එරෙහි ව බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් දැඩි ක්‍රියාමාර්ග ගැනීම. • සිරකරුවන්ගේ ඉල්ලීම් සහ දුක්ගැනවිලි අදාළ කොට්ඨාසවලට හෝ බලධාරීන් වෙත යොමු කිරීම සහතික කිරීම පිණිස, අභ්‍යන්තර දුක්ගැනවිලි යාන්ත්‍රණයේ වැදගත්කම සහ ඔවුන්ගේ රාජකාරි නිසි පරිදි ඉටු කිරීම පිළිබඳ ව බන්ධනාගාර නිලධාරීන් හට පුහුණුව ලබා දීම.
1.7.2		බාහිර දුක්ගැනවිලි යාන්ත්‍රණය	• ජේලර්වරයෙකුගේ ශ්‍රේණියෙන් ඉහළ නිලධාරියෙකුට එරෙහි ව එනම්, ප්‍රධාන ජේලර්වරයා හෝ බන්ධනාගාර අධිකාරිවරයාට එරෙහි ව පැමිණිල්ලක් කර ඇති විට, නිලධාරීන්ට එරෙහි පැමිණිලි ආමන්ත්‍රණය කිරීමට අපක්ෂපාතී සහ ස්වාධීන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. • රැඳවියන් හට ඔවුන්ගේ පැමිණිලි සෘජු ව ම බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත, ඕනෑ ම බන්ධනාගාර කොමසාරිස්වරයෙකු වෙත හෝ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාරණයකින් තොර ව ඉදිරිපත් කිරීමට මාර්ගයක් සැපයීම. මේවා බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් හෝ අධිකරණ ඇමති වෙත ආමන්ත්‍රණය කරන ලද පැමිණිලි හෝ ලිපි හරහා වැනි ක්‍රමවලින් සිදු කළ හැකි අතර, බන්ධනාගාර නිලධාරීන් ඒවා විවෘත නොකළ යුතු ය.

			• සිරකරුවන් හට පරිපාලනයට එරෙහි ව යම් පැමිණිලි තිබේ නම් විමර්ශනය කිරීමට සිරකරුවන්ගේ ශුභසාධනය වෙනුවෙන් සහාය වෙන කරන අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් පත් කරන ලද බාහිර කමිටු (visiting committees) තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි සහ ජනවාර්ගිකත්වයෙහි සමතුලිතතාව තිබීම සහතික කිරීම. මෙම ආයතනයට නොවැදගත් පැමිණිලි සිදු කිරීම වෙනුවෙන් සිරකරුවන්ට කිසිදු දඬුවමක් පැනවීමට එය බලය නොමැති ය. • වාරණයකින් තොර ව තැපෑලෙන් සෘජු ව ම අධිකරණ බලධාරීන් වෙත තමන්ගේ පෙත්සම් හෝ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට රැඳවියන්ට ප්‍රවේශය ලබා ගැනීමට පහසුකම් සැලසීම. • අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට හෝ මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කිරීමට ඕනෑ ම සිරකරුවෙකුට පිවිසිය හැකි ලෙස, බන්ධනාගාර පරිශ්‍රය තුළ පැමිණිලි පෙට්ටි දෙකක් සවි කිරීම. මේවා අදාළ ආයතනය මඟින් මාසික ව එකතු කර ගැනීම. • අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මාසික පදනමක් මත බන්ධනාගාර වෙත යාම සහ ක්‍රියාවලියේ විනිවිද භාවය ආරක්‍ෂා කිරීමට බන්ධනාග ාර බලධාරීන්ගේ මැදිහත් වීමකින් තොර ව සෘජු ව ම ලිඛිත දුක්ගැනවිලි එකතු කර ගැනීම සහතික කිරීම. • සිරකරුවන් විසින් පැමිණිලි ඉදිරිපත් කරන ආයතන මඟින් ඒවා ලැබුණු බව පිළිග නිමින් ලිපියක් නිකුත් කිරීම. • දැනට පවතින නඩු මෙන් ම අභියාචනා සඳහා නෛතික සහාය අවශ්‍ය කරන සිරකරුවන් සඳහා, ලිපි හරහා නීති ආධාර කොමිෂන් සභාවෙන් නෛතික සහාය ඉල්ලා සිටීමට යාන්ත්‍රණයක් පිහිටුවීම සහ අධිකරණ ක්‍රියාවලියේ ප්‍රමාද වීම් වැළැක්වීමට එම ලිපි වහා ම බලපාන පරිදි නීති ආධාර කොමිෂන් සභාව වෙත යැවීම සහතික කිරීම. • බන්ධනාගාර චාරිකා සිදු කරන මහේස්ත්‍රාත්වරුන් එම චාරිකාවල වාර්තා අධිකරණ සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සහතික කිරීම. බන්ධනාගාර දෙපාර්තමේන්තුව, අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සහ කොමිෂන් සභාව යන ආයතනවලට සිරකරුවන්ගේ අවශ්‍යතා සහ ගැටලුවලට ප්‍රතිචාර දැක්වීමේ දී පවතින ක්‍රියාවලියන්ට සහාය දීමට ඒවායේ මුලපිරීම් සකස් කිරීමට හැකියාව ලබා දීම පිණිස මෙම වාර්තා මෙකී ආයතන සමඟ බෙදා හදා ගැනීම. • මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ අධිකරණයට ඉදිරිපත් කරන රිමාන්ඩ් භාරයේ සිටින්නන්ගෙන්, අදාළ මහේස්ත්‍රාත්වරයා ප්‍රථමයෙන් ම බන්ධනාගාරය තුළ ඔවුන්ට සලකන ලද ආකාරය සහ තත්ත්වයන් පිළිබඳ ව විමසිය යුතු බවට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.

1.8	රැඳවියා නිලධාරියා අතර සම්බන්ධතාව		
1.8.1		බන්ධනාගාර නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය	• සිරගත කිරීම පිළිබඳ බන්ධනාගාර නිලධාරීන්ගේ අවබෝධය හුදෙක් දණ්ඩනීය ක්‍රියාමාර්ගයක සිට, සිරකරුවන් යළි සාර්ථක ව සමාජගත කිරීම සහතික කිරීමට උත්සාහ දරන පුනරුත්ථාපන ක්‍රියාවලියකි යන්න කරා මාරු වීම සඳහා අදාළ පුහුණුව ලබා දීම. • පුනරුථාපනය සහ විශෝධන ප්‍රතිපත්ති කේන්ද්‍රීය මූලධර්ම ලෙස බන්ධනාගාර නිලධාරීන් සඳහා ආරම්භක පුහුණු ලබා දීම. • ගැටුම් නිරාකරණය, අවිහිංසාවාදී සන්නිවේදනය, සහ පුනරුත්ථාපනයට උපකාරී වන අන්දමින් රැඳවියන් සමඟ සම්බන්ධතාවක් ගොඩනගන්නේ කෙසේ ද? එනම්, ගතික ආරක්ෂාව පිළිබඳ ව නිලධාරීන් සඳහා නිතිපතා පුහුණු පැවැත්වීම. • බන්ධනාගාරවල සිදු වන වෙනස්කොට සැලකීමේ සහ දූෂිත භාවිතාවන් බන්ධනාගාර බලධාරීන්ට සහ අදාළ විට, මානව හිමිකම් කොමිෂන් සභාව සහ අල්ලස් හෝ දූෂණය පිළිබඳ චෝදනා විමර්ශන කිරීම සඳහා වන කොමිෂන් සභාව වැනි බාහිර බලධාරීන් වෙත විශ්වසනීය ආකාරයකින් වාර්තා කිරීමට රැඳවියන් සහ නිලධාරීන් යන දෙපාර්ශවයම බලදායී කිරීමට පවතින පැමිණිලි යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සමඟ ම, නිලධාරීන්ට එරෙහි ව සිරකරුවන් විසින් කරනු ලබන චෝදනා පිළිබඳ ව විමර්ශනය කිරීමට අදාළ ආයතන විසින් කඩිනම් පියවර ගැනීම.
1.8.2		බන්ධනාගාර නිලධාරීන්ට හිතකර සේවා තත්ත්වයන්	• දුක්ගැනවිලි යාන්ත්‍රණ සහ බන්ධනාගාර පරිපාලනය මුහුණ දෙන අභියෝග පිළිබඳ පරිච්ඡේදවල නිර්දේශ කර ඇති පරිදි බන්ධනාගාර නිලධාරීන්ගේ වැටුප් සංශෝධනය කිරීම සහ වැඩි කිරීම මගින් ඔවුන්ට පහසු වන පරිසරයක වැඩ කිරීමට සහ පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට උත්සාහ දරන ක්‍රමවේදයක් කළමනාකරණය කිරීමට බලදායී කිරීම. • බන්ධනාගාරවල කාර්යයන් අධීක්ෂණය කිරීමට සහ අවශ්‍ය කරන ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා සහිත ව වරින් වර වාර්තා ඉදිරිපත් කිරීමට, අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය තුළ ස්ථිර අංශයක් පිහිටු වීම. මෙම අංශයේ නිලධාරීන් වරින් වර බන්ධනාගාර චාරිකා සිදු කළ යුතු අතර, ඒ අතරතුර සිරකරුවන්ගෙන් සහ ඔවුන්ගේ පවුල්වලින් දුක්ගැනවිලි ලබා ගැනීම ද සිදු කළ යුතු ය. • තිබිය හැකි දූෂිත පුරුදු හඳුනා ගැනීම සඳහා උපකාරී වීමට දූෂණය අවදානම තක්සේරු කිරීමක් සිදු කිරීම.

1.9	විනය සහ දඬුවම් කිරීම		
1.9.1		බන්ධනාගාර නිලධාරීන් විසින් කායික බලය භාවිත කිරීම.	• ශාරීරික ප්‍රචණ්ඩත්වයට එරෙහි ව ශූන්‍යඉවසීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සහ නිලධාරීන් විසින් අනිසි හෝ අධික ලෙස බලය භාවිතා කිරීම පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සහ පියවර ගැනීම සහතික කිරීම. • වධහිංසාවට එරෙහි සම්මුතිය පිළිබඳ පනත යටතේ වැරදි සිදු කළ බවට චෝදනා ලබා ඇති නිලධාරීන්ට එරෙහි ව නඩු පැවරීම ආරම්භ කිරීම. • බලය භාවිතා කිරීමට සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ ව මාර්ගෝපදේශ සහ පුහුණු ලබා දීම, බලය අවශ්‍ය ලෙස සහ සමානුපාතික ව භාවිත කිරීම මෙන් ම බන්ධනාගාරය තුළ විනය සහ සාමය පවත්වා ගෙන යාමේ විකල්ප ක්‍රියාමාර්ග ගැන නිලධාරීන් පුහුණු කිරීම, අමානුෂික හෝ නොහොබිනා නොවන ආකාරයකින් සහ තුවාල සිදු නොවන අයුරින් සිරකරුවන් හික්ම වීම සහ සීමාවන්ට යටත් කිරීමට හොඳ ම භාවිතාවන් හඳුන්වා දීම. • සිරකරුවන් හික්මවීම සඳහා බලය යෙදීමට සිදු වූ අවස්ථා වාර්තා කිරීම සහ පටිගත කිරීම වැනි ආරක්ෂක ක්‍රියාමාර්ග විනය පවත්වා ගැනීම සඳහා බලය භාවිත කිරීමේ දී අනුගමනය කිරීම.
1.9.2		බන්ධනාගාර තුළ සිදු වන වැරදි සහ සම්බාධක	• බන්ධනාගාරවල වැරදි සහ ඒවාට අදාළ සම්බාධක ගැන ලිඛිත තොරතුරු ලබා දීම සහ සියලු ම සිරකරුවන් දැනුවත් වීම සහතික කිරීම සඳහා බන්ධනාගාරය තුළ ප්‍රදර්ශනය කිරීම. • තාවකාලික ව වරප්‍රසාද ඉවත් කිරීම සහ බන්ධනාගාර විනිශ්චය සභා කටයුතුවලට විනය සම්බාධක සීමා කිරීම. • හැකිතාක් දුරට සම්බාධකයක් ලෙස හුදෙකලා සිර අඩස්සිය භාවිත කිරීමෙන් වැළකීම සහ ව්‍යතිරේක සිද්ධීන්හි දී භාවිත කරන විට, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ පිළිපැදීම.
1.9.3		බන්ධනාගාර විනිශ්චය සභා	• බන්ධනාගාර විනිශ්චය සභාවල නඩු විභාග කිරීම සැමවිටම සිරකරුවෙකුට නිසි ආරක්ෂක ක්‍රියාවලියක් සමඟ නෛතික නියෝජනය සොයා ගැනීමට වැඩියෙන් ඉඩප්‍රස්ථා පවතින අධිකරණයක් තුළ පැවැත්වීම සහතික කිරීම. • බන්ධනාගාර විනිශ්චය සභාවක් ඉදිරියේ ඉදිරිපත් කරන සිරකරුවන්ට නෛතික නියෝජනයට සහ නීති ආධාරවලට ප්‍රවේශය ලබා දීම. • විනිශ්චය සභා කටයුතුවල දී රැඳවියන්ට ඔවුන් ව නියෝජනය කිරීමට නීතිඥයින්ගේ සේවය ලබා ගත හැකි බව දැනුම් දීම සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ නීති ආධාර කොමිෂන් සභාව හරහා නීතිඥයින් කැඳවීමට සන්නිවේදන පහසුකම්වලට ප්‍රවේශය ලබා දීම.

1.9.4		බන්ධනාගාර නිලධාරීන්ගේ සේවා තත්ත්වයන් වැඩිදියුණු කිරීම.	• බන්ධනාගාරයේ සමස්ත තත්ත්වයන්, සුවිශේෂී ව බන්ධනාගාර නිලධාරීන්ගේ සේවා තත්ත්වයන් වැඩිදියුණු කර, ඔවුන් සිරකරුවන්ට හිරිහැර කිරීම සහ එවැනි ක්‍රියා සාධාරණීකරණය කිරීමෙන් වැළැක්වීම. • වෛද්‍ය නිලධාරීන්, ඔවුන්ගේ ම සිතුවිල්ලක් ලෙස, අත්අඩංගුවේ සිටිය දී පහරදීමට ලක් වූ සිරකරුවන් බන්ධනාගාර අධිකාරිවරයාගේ අනුමැතිය අවශ්‍ය නොකර අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යැවීමට හැකි වීම පිණිස ප්‍රෝටොකෝලයක් ස්ථාපිත කිරීම, සහ වෛද්‍ය නිලධාරියාගේ යොමු කිරීම ප්‍රමාදයකින් තොර ව ක්‍රියාත්මක කිරීමට අධීක්ෂණ යාන්ත්‍රණ ස්ථානගත කිරීම සහතික කිරීම.
1.10	බන්ධනාගාර තුළ සිදු වන මරණ		
1.10.1		බන්ධනාගාර තුළ මරණ පිළිබඳ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ	• මරණයක් සිදු වූ අවස්ථාවක දී අනුගමනය කළ යුතු පියවර පිළිබඳ ව, හදිසි වෛද්‍ය ආධාර කැඳවීම, මරණය සිදු වූ ස්ථානය සුරක්ෂිත කිරීම, සැකකරුවන්/සාක්ෂිකරුවන් වන සිරකරුවන් අන් අයගෙන් සහ එකිනෙකාගෙන් වෙන් කිරීම වැනි ප්‍රතිපත්තිමය නියෝග සහ මාර්ගෝපදේශ සම්මත කර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම, පුහුණු, ප්‍රසිද්ධ දැන්වීම්, පුරුදු කිරීම්, ආදිය හරහා මෙම නියෝග පිළිබඳ ව සියලු ම බන්ධනාගාර නිලධාරීන් සහ සිරකරුවන් දැනුවත් කිරීම. • මිනෙසොටා ප්‍රෝටොකෝලයට අනුව බන්ධනාගාරය තුළ මරණයක් විමර්ශනය කිරීමේ ක්‍රියාවලිය ප්‍රමිතිගත කිරීම. • බන්ධනාගාර නිලධාරියෙකු මඟින් අපරාධය සිදු වූ ස්ථානය පිළිබඳ ලොගයක් සකස් කර, පොලීසිය එම ස්ථානයේ පාලනය තමන් අතට ගන්නා තුරු මරණය සිදු වූ ස්ථානයට පැමිණෙන හෝ පිටව යන අයගේ නම් සහ අදාළ වේලාවල් සටහන් කර ගැනීම. • ලොග් පොත තුළ බන්ධනාගාරය මඟින් මරණ පිළිබඳ ව ක්‍රමවත් සහ සවිස්තරාත්මක සටහන් පවත්වා ගැනීම. • වැදගත් සිදුවීම්වල නිශ්චිත වේලාවල් සටහන් කිරීම. එනම්, අවට සිටි අනෙක් සිරකරුවන් මරණය පිළිබඳ ව දැනුවත් වූ වේලාව, මරණය පිළිබඳ ව නිලධාරීන්ට දැනුම් දුන් වේලාව, නිලධාරීන් එම ස්ථානයට ළඟා වූ වේලාව, මරණයට පත් තැනැත්තා/ සිරුර රෝහලට රැගෙන ගිය වේලාව ආදිය යි. • සිරකරුවා බන්ධනාගාරය තුළ දී මියගිය බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්, බන්ධනාගාර වාර්තාව තුළ මරණය සිදු වූ නිශ්චිත ස්ථානය සඳහන් කිරීම. එම වාර්තා බන්ධනාගාර බලධාරීන් ප්‍රතිචාර දැක්වීමෙහි දී තිබූ ප්‍රමාද වීම් හෝ හිඩැස් හඳුනා ගැනීමට සහ එවැනි ප්‍රමාද වීම් අනාගතයේ දී වැළැක් වීමට තීරණාත්මක වේ.
1.10.2		වෛද්‍ය හදිසි අවස්ථා සඳහා ප්‍රථමාධාර පිළිබඳ ව ප්‍රමාණවත් පුහුණුව	• රැඳවියන් සමඟ නිරන්තර සම්බන්ධතා ඇති කාර්යමණ්ඩලයට සම්මත ප්‍රථමාධාර සහ හෘද්පුප්ඵුසීය ප්‍රබෝධ කිරීම පිළිබඳ පුහුණුව ලබා දීම. එමෙන් ම බොහෝ විට ප්‍රථමාධාර සැපයීමට නිලධාරීන් පහසුවෙන් ලබා ගත නොහැකි විය හැකි බැවින්, සාන්ත ජෝන් ගිලන් රථ බලකායේ සහයෝගය ඇති ව හෝ සිරකරුවන්ට ප්‍රථමාධාර පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

1.10.3		බන්ධනාගාරය තුළ සිදුවන මරණ ගැන වාර්තා කිරීම සහ වගවීම සඳහා විධිමත් යාන්ත්‍රණයක්	• නොසැලකිලිමත් කමේ ප්‍රතිඵලයක් ලෙස සිරකරුවෙකු මිය යාමට හේතු වන ලෙස සිය රාජකාරි ඉටු කිරීමට අසමත් වී ඇති බන්ධනාගාර නිලධාරීන් සඳහා වගවීමේ යාන්ත්‍රණ පිහිටුවීම සහ ඔවුන්ට එරෙහි ව විනය ක්‍රියාමාර්ග ගැනීම. • රටාවන් සහ ප්‍රවණතා හඳුනා ගැනීම පහසු කිරීමට වාර්ෂික බන්ධනාගාර සංඛ්‍යා ලේඛන වාර්තාව තුළ මරණ වර්ග වෙන් කොට දැක්වීම. • ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි වරය සහ විමර්ශනාත්මක බලතල පිළිබඳ ව බන්ධනාගාර කාර්ය මණ්ඩලය දැනුවත් කර, සියලු ම කාර්යමණ්ඩල සාමාජිකයින් විසින් උපරිම සහයෝගය ලබා දීමෙන් කොමිෂන් සභාව මඟින් සිදු කරන ඕනෑම විමර්ශනයක් සුමට ව සිදු කිරීම සහතික කිරීම. • අත්අඩංගුවේ සිටිය දී සිදු වන මරණ විමර්ශනය පිළිබඳ ප්‍රෝටොකෝලය තුළ අධිකරණ වෛද්‍ය සහ විෂවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් නිලධාරීන් විශේෂ කණ්ඩායමක් ඇතුළත් කිරීම, සහ වෙනත් විමර්ශනය කිරීමේ බලධාරීන් විමර්ශනයේ පාලනය සියතට ගැනීමට පෙර, ස්ථානය සහ සාක්ෂි සුරක්ෂිත කිරීම සඳහා මරණයක් සිදු වූ ස්ථානයක් පිළිබඳ මූලික පරීක්ෂණයක් පැවැත්වීමට වහා ම ඔවුන්ට දැනුම් දීම සහ කැඳවීම. මේ මඟින් බන්ධනාගාර නිලධාරීන්, හෝ සිරකරුවන් වුව ද සාක්ෂි අපවේශනය(පළුදු) කිරීමේ අවදානම අවම කිරීම.
1.10.4		බන්ධනාගාරය තුළ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සිදු වන මරණ ගැන කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ	• සිරගත වීමට පෙර අත්විඳි ප්‍රචණ්ඩත්වය ගැන පැමිණිලි කරන සිරකරුවන් ගැන පරීක්ෂාකාරී වීම සහ අවශ්‍ය ප්‍රතිකාර ලබා දීමට අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කර, ඇතුල් කිරීමට පෙර ඇති වූ එවැනි ප්‍රචණ්ඩත්වයන් හේතුවෙන් මිය යාම වැළැක්වීමට අපරාධකරුවන්ට එරෙහි ව නීතිමය පියවර ආරම්භ කිරීම. • ප්‍රතිවාදී රැඳවියන් අතර ප්‍රතික්‍රියා වැළැක්වීමේ පියවර ගැනීම සහ තර්ජන හේතුවෙන් වාට්ටු මාරු කිරීමට ඉල්ලීම් කළ හොත් අවසර දීම මෙන් ම එවැනි පැමිණිලි පිළිබඳ ව වහා ම පියවර ගැනීම. • අපරාධ චක්‍රලේඛය 19/2014 (1ඨ චක්‍රලේඛය 2508/2014)ට අනුව බන්ධනාගාරයට යවන විශ්වසනීය වාර්තාව හරහා දැනුම් දෙනු ලබන සිරකරුවාගේ පසුබිම, සංවිධානාත්මක අපරාධ කල්ලි තුළ ඔවුන්ගේ සාමාජිකත්වය සහ අදාළ ප්‍රතිවාදීන් පිළිබඳ තොරතුරු අනුව යමින් සිරකරුවන් සඵලදායක ලෙස වෙන් කර තැබීම.
			• බන්ධනාගාර නිලධාරීන් විසින් බලය යෙදීම සහ හික්මවීමේ මෙවලම භාවිතා කිරීම ගැන ඇති නෛතික සීමාවන් පිළිබඳ ව දැනුවත් කිරීම සහ 1956 දෙපාර්තමේන්තු ස්ථාවර නියෝගවල 15 වන කොටසට අනුව කෲර ලෙස සැලකීම, පහරදීම හෝ වෙනත් අක්‍රමිකතා ගැන බන්ධනාගාර අධිකාරි විසින් කඩිනම් පියවර ගැනීම. • ප්‍රචණ්ඩත්වය හේතුවෙන් මරණයක් සිදු වූ විට වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගැනීම සඳහා මියගිය පුද්ගලයාගේ වාට්ටු මාරු කිරීම් පිළිබඳ වාර්තා තබා ගැනීම.

1.10.5		බන්ධනාගාරය තුළ සියදිවි හානි කර ගැනීමෙන් සිදු වන මරණ ගැන කටයුතු කිරීමට ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ	• හැඩගැස්මේ වැඩසටහන්වල දී, පරාජිත හැඟීම් ඇති සිරකරුවන් හට හඳුනා ගත් නිලධාරීන් හරහා උදව් සහ සහයෝගය පවතින බවට දැනුවත් ව සිටීම සහතික කිරීම. • ඇතුල් කිරීමේ ක්‍රියාපටිපාටිය සහ මූලික වෛද්‍ය පරීක්ෂණය අතරතුර, සියදිවි නසා ගැනීමේ අවදානම තක්සේරු කිරීම සහ පරීක්ෂා කිරීම හරහා, සියදිවි නසා ගැනීමේ අවදානම සහිත ව සිටින සිරකරුවන් හඳුනා ගැනීමට යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම. • සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරීන් නොමැති විට පරීක්ෂා කිරීම සිදු කිරීමට බන්ධනාගාර නිලධාරීන් බලදායී කිරීම. මේ සඳහා ස්ථිතික (ඓතිහාසික සහ ජනවිකාස) සහ ගතික (අවස්ථායික සහ පෞද්ගලික) විචල්‍යයන් යන දෙවර්ගය ම ඇතුළත් සරල මාර්ගෝපදේශයක් ලබා දීම. • ඇතුල් කිරීමේ දී සිය දිවි නසා ගැනීමේ ප්‍රබල අවදානමක සිටින ලෙස හඳුනා ගන්නා සිරකරුවන් විශේෂඥ අවධානය ලැබිය හැකි වෛද්‍ය පහසුකමකට මාරු කිරීම හෝ ඔවුන් ව නිරන්තරයෙන් නිරීක්ෂණය නොකර තනි ව තැබීම නොකළ යුතු බැවින්, ඔවුන් ව නිරීක්ෂණය, අධීක්ෂණය කිරීම සහ චිත්ත වේගීය සහයෝගය ලබා දීමට පහසුකම් සැපයීම සඳහා ඔවුන්ගේ රැඳවුම් තත්ත්වයන් වෙනස් කිරීම. • සියදිවි නසා ගැනීමේ චේතනා හෝ මානසික රෝග පිළිබඳ ඇගැයීම් සඳහා සිරිතක් ලෙස පරීක්ෂා කිරීම් සිදු කිරීම. මෙයට ඇතුළත් විය හැකි, නමුත් මේවාට සීමා නොවන සලකුණුවලට අයත් මනෝභාවයෙහි, ආහාර ගැනීමේ පුරුදු හෝ නින්ද යන මේවායෙහි හදිසි වෙනස් වීම්, පෞද්ගලික වස්තු බෙදා දීම වැනි අත්හැර දැමීම්, ක්‍රියාකාරකම් හෝ සම්බන්ධතා කෙරෙහි උනන්දුව නැති වීම, නැවත නැවතත් බෙහෙත් ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ වැඩි මාත්‍රාවක් ඉල්ලා සිටීම සඳහන් කෙරේ. • සියලුම විශෝධන කාර්යමණ්ඩලය මෙන් ම, සෞඛ්‍ය සේවා සහ මානසික සෞඛ්‍ය සේවක පිරිස් සඳහා සියදිවි නසා ගැනීම වැළැක්වීම පිළිබඳ ආරම්භක පුහුණු ලබා දීම සහ වාර්ෂික ව නැවත සිහි කිරීමේ පාඨමාලාවක් පැවැත්වීම. • සියදිවි නසා ගැනීමේ සිද්ධි වාර්තා ගත කිරීම. විශෝධන සහ සෞඛ්‍ය කාර්යමණ්ඩලය විසින් සිය දිවි නසා ගැනීමට තුඩු දුන් සිදු වීම් යළි සකස් කරන අතර හේතු හඳුනා ගැනීම, රැඳවියාගේ මරණයට තුඩු දිය හැකි ව අතපසු වූ හෝ ප්‍රමාණවත් ව ආමන්ත්‍රණය නොවූ සාධක හඳුනා ගැනීම, හදිසි අවස්ථා ප්‍රතිචාරයේ ප්‍රමාණවත් බව තක්සේරු කිරීම සහ වැළැක්වීමේ ඉදිරි ප්‍රයත්නයන් වැඩිදියුණු කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය කිරීම. මෙයට, සිය දිවි නසා ගැනීමේ චේතනා ඇති රැඳවියන් නිලධාරීන් ව විශ්වාස කිරීමට කැමති නොවිය හැකි, නමුත් සගයින් ලෙස සිටින රැඳවියන් වෙත විවෘත විය හැකි බැවින්, විශේෂයෙන් පුහුණුව ලත් රැඳවියන් "මිතුරන්" හෝ "සවන් දෙන්නන්" ලෙස හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම. • මනෝ චිකිත්සක රෝග සහිත සිරකරුවන් සඳහා සුරක්ෂිත මනෝ චිකිත්සක රැකවරණය ලබා දීමෙන් අන් අයට බලපෑ හැකි සියදිවි නසා ගැනීමේ අවදානම අවම කිරීමට ක්‍රමෝපායයන් හඳුන්වා දීම.

1.10.6		බන්ධනාගාරය තුළ ප්‍රමාණවත් ව වෛද්‍ය අවධානය යොමු නොවීම හේතුවෙන් සිදු වන මරණ ගැන කටයුතු කිරීමට ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ	• බන්ධනාගාරයට පැමිණීමේ දී පුළුල් වෛද්‍ය පරීක්ෂාවක් පැවැත්වීම. • නිතිපතා සියලු ම සිරකරුවන් සඳහා වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම සහ අවශ්‍ය කරන සම්පත් බෙදා වෙන් කිරීම. • නේවාසික රෝගීන් සහ බාහිර රෝගීන් සඳහා උචිත යටිතල පහසුකම් ස්ථාපිත කිරීම. • සිරකරුවන් තුළ ඇති යම් ශාරීරික සහ මානසික රෝග සිරකරුවා වෛද්‍ය නිලධාරියා වෙත යන තුරු නොසිට නිරීක්ෂණය කිරීම සහ වෛද්‍ය නිලධාරියා වෙත වාර්තා කිරීම. • යොමු කිරීම ලද විට අප්‍රමාද ව හෝ ව්‍යතිරේකයකින් තොර ව බාහිර වෛද්‍ය සේවාවට මාරු කිරීම. • හදිසියේ, විශේෂයෙන් රාත්‍රී කාලයේ රෝගී වන සිරකරුවන් මාරු කිරීම සඳහා, හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා විශේෂ අවධානය යොමු කිරීම සහිත ව, ආපතිකතා සැලැස්මක් සකස් කිරීම (ගිලන් රථ සේවා සහ/ හෝ පරිපූරක වෛද්‍ය සේවකයෙකුගේ සේවා). • එක් බන්ධනාගාරයක සිට වෙනත් එකකට සිරකරුවන් මාරු කිරීමේ දී, ශාරීරික හෝ විශේෂයෙන් සියදිවි නසා ගැනීම වැනි අස්වාභාවික මරණවලට දායක විය හැකි මනෝ විද්‍යාත්මක රෝගවලට ප්‍රතිකාර කිරීම ප්‍රමාද වීම් වැළැක්වීමට සිරකරුවාගේ පෙර වෛද්‍ය වාර්තා භාර දීම.
1.10.7		බන්ධනාගාරය තුළ හදිසි අනතුරු හේතුවෙන් සිදු වන මරණ ගැන කටයුතු කිරීමට ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ	• සේවා ස්ථාන හදිසි අනතුරු හේතුවෙන් බන්ධනාගාර තුළ සිදු වන මරණ අවම කිරීම සඳහා, බන්ධනාගාර වැඩ සහ නවාතැන් පිළිබඳ පරිච්ඡේද යටතේ දක්වා ඇති පරිදි නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
1.11	බන්ධනාගාර පරිපාලනය මුහුණ දෙන අභියෝග		
1.11.1		බන්ධනාගාර නිලධාරීන්ගේ වේතන (පාරිතෝෂික) සහ සේවා තත්ත්වයන්	• බන්ධනාගාර නිලධාරීන් ගේ ආත්මාභිමානය සහ ස්වයංවටිනාකම පිළිබඳ හැඟීම් ඉහළ නැංවීමට බන්ධනාගාර නිලධාරීන් ඉටු කරන කාර්යයන් සහ ඔවුන්ගෙන් රටට සිදුවන සේවාවන්හි වටිනාකම පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීම. • බහුවිධ, අනුක්‍රමික වැඩ මුර නිම කරන නිලධාරීන්ට අනිවාර්ය නිවාඩු ලබා දීම. • සියලු මට්ටම්වල බන්ධනාගාර කාර්යමණ්ඩලයන්හි වැඩවල සංකීර්ණ සහ බොහෝ විට අනතුරුදායක ස්වභාවය පිළිබිඹු කිරීමට සහ අනෙක් රාජ්‍ය නිලධාරීන්ගේ මෙන් ම අපරාධ යුක්ති අංශයේ නිලධාරීන්ගේ වැටුප් තලවලට ගැළපෙන අන්දමට වැටුප් තල සංශෝධනය කිරීම.

			• බන්ධනාගාර කාර්යමණ්ඩලයේ රැකියාවේ හුදෙකලා බව සහ භූගෝලීය වශයෙන් ජංගම ස්වභාවය සැලකිල්ලට ගෙන අඩු මට්ටම්වල වැටුප් සඳහා හානිපූරණය කළ හැකි අතුරු පියවරක් ලෙස, නොමිලේ හෝ සහනාධාර සහිත නිවාස, වෛද්‍ය රක්ෂණය, ප්‍රවාහන දීමනා ආදියට ප්‍රවේශය වැනි අමතර ප්‍රතිලාභ ලබා දීම. • බන්ධනාගාර නිලධාරීන්ගේ සේවා ආතතිය අවම කිරීමේ අරමුණින්, බන්ධනාගාර නිලධාරීන් කායික ව සහ මානසික ව විඩාපත් වීම පිළිබඳ ව සෞඛ්‍ය අමාත්‍යංශය විසින් සිදු කරන ලද පර්යේෂණයේ නිර්දේශ සැලකිල්ලට ගෙන, ගෘහස්ථ ක්‍රීඩා වැනි විනෝදාත්මක ක්‍රියාකාරකම් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් රාජ්‍ය ආයතන සහ බාහිර පාර්ශ්වකරුවන්ගේ සහයෝගිත්වය සහිත ව බන්ධනාගාර නිලධාරීන් වෙනුවෙන් හඳුන්වා දීම. • සමාජ එක්රැස් වීම් සහ වැඩ සම්බන්ධ ගැටලු සාකච්ඡා කර නිරාකරණය කිරීමට සේවා රැස්වීම්, ක්‍රීඩා කටයුතු සහ බන්ධනාගාර නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල් සඳහා චාරිකා සංවිධානය කිරීම වැනි කණ්ඩායම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම. • බන්ධනාගාර නිලධාරීන් සඳහා ප්‍රමාණවත් උපදේශන සේවා සහ ආතතිය කළමනාකිරීමේ යාන්ත්‍රණ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. • වැඩිදුර අධ්‍යාපන සුදුසුකම් සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දීම සහ දිරි දීමනා මගින් පෙළඹවීම.
1.11.2		බන්ධනාගාර නිලධාරීන් සඳහා බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටිය	• බඳවා ගැනීමේ ප්‍රතිපත්ති සංශෝධනය සහ දැඩි බඳවා ගැනීමේ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියන් පිළිපැදීම. මෙහි දී අයදුම්කරුවන්ගේ වෘත්තීය සුදුසුකම්වලට පමණක් නොව, ඔවුන්ගේ පෞද්ගලික සුදුසුකම්වලට ද අවධානය යොමු කිරීම. ඒ මගින් ඔවුන් රැඳවියන් සමඟ කටයුතු කරන ආකාරය සහ කළමනාකරණය කරන්නේ කෙසේද යන්න තීර්ණය කරයි. • බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ තනතුරට සේවයෙන් බාහිර පුද්ගලයෙක් වෙනුවට විශෝධන පද්ධතියේ කාර්යමණ්ඩලය අතරින් පත් කිරීම. අභ්‍යන්තර නිලධාරියෙකුට සිරකරුවන් සහ බන්ධනාගාර නිලධාරීන් මුහුණ දෙන අභියෝග පිළිබඳ වඩා හොඳ අවබෝධයක් සහ සූක්ෂම දෘෂ්ටියක් තිබිය හැකි අතර ඒ මඟින්, පවතින අවශ්‍යතා සහ ගැටලු ආමන්ත්‍රණය කරන වඩාත් ප්‍රතිචාරාත්මක මැදිහත් වීම් සහ තීරණ ගැනීමට හේතු වනු ඇත. • මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (ඔහධෘක) බන්ධනාග ාර තුළ දූෂණ විරෝධී ක්‍රියාමාර්ග පිළිබඳ අත්පොතෙහි නියම කර ඇති පරිදි, බඳවා ගැනීම සඳහා මෙන් ම, උසස් කිරීමට සුදුසු හෝ වැඩිදියුණු වීම සඳහා වැඩිදුර පුහුණු අවශ්‍ය කරන නිලධාරීන් හඳුනා ගැනීමට මනෝමිතික පරීක්ෂණ භාවිතය සලකා බැලීම. පරීක්ෂණ සැලසුම් කර ඇත්තේ වෘත්තීය මනෝ විද්‍යාඥයින් විසින් වන අතර, වෙනත් අංග අතර බුද්ධිය, දක්ෂතාව සහ පෞරුෂත්වය පරීක්ෂා කිරීම ඇතුළත් වේ.

1.11.3		බන්ධනාගාර කාර්යමණ්ඩලය පුහුණු කිරීම සහ සංවර්ධනය	• බන්ධනාගාර කාර්යමණ්ඩලය හට බන්ධනාගාරය තුළ ඔවුන්ගේ කාර්යභාරය දණ්ඩනීය එකක් නොව පුනරුත්ථාපනීය එකක් වන බවට නිසි අවබෝධය ලබා දීම. • වැරදිකරුවන් සමඟ කටයුතු කිරීමට අත්‍යවශ්‍ය දෘඪ සහ මෘදු කුසලතා, තාක්ෂණය භාවිතය වැනි තාක්ෂණික කුසලතා, සහ ස්ථිතික කාර්යයකට වඩා බන්ධනාගාර කළමනාකරණය තුළ ගතික කාර්යභාරයක් ඔවුන් ඉටු කරන බව සහතික කිරීමට ප්‍රලේඛන ක්‍රියාවලි පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ මූලික අයිතිවාසිකම්, මානව හිමිකම්, සම්මත අවම නීතිරීති, මෙන් ම සිරකරුවන්ට සැලකීම සහ ඔවුන්ගේ පුනරුත්ථාපනයට අදාළ නවීන පිළිවෙත් ගැන සැසි ද ඇතුළත් කිරීම. • රැඳවියන් හික්මවීමට අවම බලය භාවිත කිරීම පිළිබඳ ශිල්පක්‍රම සහ රැඳවියන් සමඟ කටයුතු කිරීමේ අවිහිංසාවාදී ක්‍රම ඇතුළු ව, අපයෝජනය, වධහිංසා සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට බලය උචිත ලෙස භාවිත කිරීමේ පුහුණුව ලබා දීම. • ගිනි අවි දරා සිටින බන්ධනාගාර නියාමකයින්ට ගිනි අවි භාවිතය මෙන් ම ගිනි අවි භාවිතයේ දී අනුගමනය කළ යුතු ප්‍රෝටොකෝලයන් පිළිබඳ ව ද්විවාර්ෂික ව හෝ වාර්ෂික ව පුහුණු පැවැත්වීම. • සියදිවි නසා ගැනීම වැළැක්වීම පිළිබඳ පුහුණ ලබා දීම. මෙම පුහුණුවලට සියදිවි නසා ගැනීමට තුඩු දෙන හැසිරීම්වලට විශෝධන පරිසර උපකාරී වන්නේ මන් ද, සියදිවි නසා ගැනීමට පූර්ව හේතු විය හැකි සාධක, අධි අවදානම් සියදිවි නසා ගැනීමේ කාල පරිච්ඡේද, අනතුරු ඇඟවීමේ සලකුණු සහ රෝග ලක්ෂණ, මධ්‍යස්ථානයේ/ නියෝජිතායතනයේ සියදිවි නසා ගැනීමේ ප්‍රතිපත්තිය මෙන් ම අත්හදා බැලීමේ පුරුදු කිරීම් යන ක්ෂෙත්‍ර ඇතුළත් කිරීම.
1.11.4		බන්ධනාගාර කාර්යමණ්ඩලය අතර දූෂණය වැළැක්වීමට සියලු සුදුසුකම් පරීක්ෂා කිරීමේ :ඩැඑඑසබට* යාන්ත්‍රණයක්	• අපරාධ වාර්තාවක් හෝ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඉතිහාසයක්, හෝ මීට පෙර සේවා නියුක්තියෙහි මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ චෝදනා සහිත පුද්ගලයින් බඳවා ගැනීම වළක්වා ගැනීම සඳහා බන්ධනාගාර පද්ධතිය තුළ ඇබෑර්තු සඳහා අයදුම් කර ඇති අපේක්ෂකයින් ගැන පසුබිම පරීක්ෂා කිරීම් සිදු කිරීම. • දූෂණයට තුඩු දිය හැකි බැඳියාවන් පිළිබඳ ගැටුම් වැළැක්වීමට මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ බන්ධනාගාර තුළ දූෂණවිරෝධී ක්‍රියාමාර්ග පිළිබඳ අත්පොතෙහි ඇති නිර්දේශවලට අනුකූල ක්‍රමවේද අනුගමනය කිරීම. මෙහි දී බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින්, ලියාපදිංචි කිරීම, සීමා කිරීම සහ අත්හැර දැමීම යන ක්‍රමවේද තුන අනුගමනය කිරීම. • දූෂණයට ඇති ඉඩකඩ අවම කිරීමේ යාන්ත්‍රණයක් ලෙස රාජකාරි පැවරීමේ දී කාර්යමණ්ඩලය චක්‍රීය ආකාරයෙන් මාරු කිරීම. • අළුතින් බඳවා ගන්නා ලද මෙන් ම දැනටමත් බඳවා ගෙන ඇති බන්ධනාගාර නිලධාරීන්ගේ පසුබිම ගැන ගැඹුරින් පරීක්ෂා කර, නිවෙස් බැහැදැකීම්, ඥාතීන් සහ පවුල් සබඳතා, මත්ද්‍රව්‍ය සහ මද්‍යසාර පරීක්ෂණ, පෞද්ගලික පසුබිම සහ පෞද්ගලික මූල්‍යමය තත්ත්වය පරීක්ෂා කිරීම මෙන් ම, එවැනි නිලධාරීන් ඉහළ ප්‍රසිද්ධියක් ලබා

			ඇති සිරකරුවන් වෙත පවරා ඇත්නම්, සිරකරුවා විසින් අහිතකර ලෙස බලපෑම් කළ හැකි, එනම් අල්ලස් දීම වැනි අවදානම් තිබිය හැකි විට සත්‍යය පවසන්නේදැයි බලන අනාවරකය භාවිත කර සිදු කරන පරීක්ෂණ පැවැත්වීම.
1.11.5		බන්ධනාගාර පොලීසිය	• බන්ධනාගාර පොලිසියේ රාජකාරි සහ වගකීම් ඇතුළත් කර නෛතික රාමුවක් සකස් කිරීම

2. සිරකරුවන්ගේ ශුභසාධනය ඉහළ නැංවීම

අංකය	කාණ්ඩය	සැලකිලිමත් විය යුතු ක්ෂෙත්‍ර	නිර්දේශ
2.1	සිරකරුවන් පුනරුත්ථාපනය කිරීම		
2.1.1		අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණු වැඩසටහන්	• සිරකරුවන්ට ඇති විවිධ අධ්‍යාපන මට්ටම්වලට අනුව ඔවුන් සඳහා අධ්‍යාපන ඉඩප්‍රස්ථා සහිත ව්‍යුහගත ක්‍රමවේදයක් සකස් කිරීම. • බන්ධනාගාරය තුළ අධ්‍යාපන සංස්කෘතියක් පෝෂ්‍ය කිරීමට සුදුසුකම් ලත් ගුරුවරුන්, උපකරණ සහ ගොඩනැගිලි පහසුකම් සපයා දීම. • වෙළඳ පොළෙහි වර්තමාන අවශ්‍යතාවලට අනුව ප්‍රයෝජනවත් සහ ආදායම් උත්පාදන ව්‍යාපාර පිළිබඳ ව වෘත්තීය පුහුණු ලබා දීම. • සිරකරුවන්ට තෝරා ගත හැකි වෘත්තීය පුහුණු පරාසයක් ලබා දීම. • සෑම බන්ධනාගාරයක් තුළ ම ස්ථිර සහ අමතර අර්ධ කාලීන හෝ ස්වේච්ඡා උපදේශකයින්ගෙන් සමන්විත උපදේශක කණ්ඩායමක් සම්බන්ධ කර ගැනීම. • වෘත්තීය පුහුණු අතරතුර දී සිරකරුවන් සාදන නිෂ්පාදන විකිණීමට, විශේෂයෙන් රාජ්‍ය ආයතනවලට, අලෙවි කිරීමේ මාර්ග පුළුල් කිරීම.
2.1.2		ආගමික සහ සංස්කෘතික ක්‍රියාකාරකම්	• ආගමික ක්‍රියාකාරකම්වල යෙදීමට කැමැත්තක් දක්වන සියලු ම සිරකරුවන්ට සමාන ඉඩ ප්‍රස්ථා, ප්‍රමාණවත් සහ සමාන ප්‍රවේශය ලබා දෙන අතර එවැනි පිළිවෙත්වලට සහභාගි වීමට අකැමති අයට ගරු කිරීම. • ඔවුන්ගේ ජනවාර්ගිකත්වය නොතකා, සංස්කෘතිකමය සහ වෙනත් උත්සවවලට සහභාගි වීමට සමාන අවස්ථා සපයා දීම. • බන්ධනාගාර තුළ සියලු ආගමික උත්සව සැමරීම්වලට පහසුකම් සැපයීම.

2.1.3		බාහිර ලෝකය සමඟ සම්බන්ධ වීම	• පොත් සහ පුවත්පත් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සහ රූපවාහිනි සහ ගුවන් විදුලි වැනි වත්මන් කටයුතු පිළිබඳ ව දැනුවත් වීමේ මාර්ග සපයා දීම. • සිරකරුවන් සාර්ථක ව සමාජගත කිරීම බලදායී කිරීමට බාහිර ලෝකය සමඟ අන්තර් ක්‍රියා කිරීම දිරිමත් කිරීම සඳහා පුනරුත්ථාපන වැඩසටහන් පුළුල් කිරීමට ප්‍රජාව සහ වෙනත් සංවිධාන සම්බන්ධ කර ගැනීම. • සිරකරුවන් ඇමතීම සඳහා සුප්‍රසිද්ධ පුද්ගලයින් සහ අභිප්‍රේරණ කථිකයින්ට ආරාධනා කිරීම.
2.1.4		වෙනත් පුනරුත්ථාපන වැඩසටහන්	• ප්‍රමාණවත් ක්‍රීඩා සහ ශාරීරික පුහුණු උපකරණ සපයා දීම.
2.1.5		පුනරුත්ථාපන වැඩසටහන් ඇගයීම්	• කාන්තා සිරකරුවන්ට පුනරුත්ථාපනය වීමට සමාන ඉඩ ප්‍රස්ථා සපයා දීම. • කලින් කලට පුනරුත්ථාපන වැඩසටහන්වල ඵලදායීතාව සහ බලපෑම අධීක්ෂණය කිරීම.
2.1.6		පෞද්ගලීකරණය කරන ලද පුනරුත්ථාපනය සහ නිදහස් කිරීමේ රැකවරණ සැලැස්ම	• සිරකරුවන්ගේ සමාජ සහ අපරාධ ඉතිහාසය, ශාරීරික සහ මානසික ධාරිතාවන් සහ දක්ෂතා, පෞද්ගලික චිත්ත ස්වභාවය, දණ්ඩනය නියම කර ඇති කාලය සහ නිදහස් වීමෙන් පසු අපේක්ෂාවන් සැලකිල්ලට ගැනීමෙන් පසු, සෑම සිරකරුවෙක් සඳහා ම ඇතුල් කිරීමේ දී පුනරුත්ථාපන සැලැස්මක් සුදානම් කිරීම. • සිරකරුවාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි පුනරුත්ථාපන සැලැස්මේ වාර්තාවක් තැබීම සහ කලින් කලට ප්‍රගතිය ඇගයීම සහ අවශ්‍ය කරන විට සංශෝධන සිදු කිරීම. • අදාළ රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා සංවිධානවල උපකාරය ඇතිව සිරකරුවෙකු ක්‍රමයෙන් සමාජ ගත වීම පහසු කිරීම. • ආපසු යාමට නිවසක් නොමැති සිරකරුවන්ට, ආහාර, සෙවන සැලසීම සහ රැකියා සඳහා ආධාර සැපයීම සඳහා සංක්‍රාන්ති/අතරමැදි නිවස්න ¦ක්ලේහ යදම්¦* තුළ නිදහස් කිරීමේ රැකවරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
2.1.7		පුනරුත්ථාපනය සහ ශුභසාධනය පරිපාලනය	• පුනරුත්ථාපන නිලධාරීන් සහ උපදේශන නිලධාරීන් සඳහා ප්‍රමාණවත් සේවක සමූහ තනතුරු ලබා දීමෙන් පුනරුත්ථාපනය බන්ධනාගාර දෙපර්තමේන්තුවේ ප්‍රධාන අභිමතාර්ථය ලෙස පිළිබිඹු කිරීම සඳහා නවීකරණය කිරීම. • පද්ධතියේ මූලික ප්‍රමුඛතාවක් ලෙස සිරකරුවන් පුනරුත්ථාපනය බලදායී කිරීමට පුනරුත්ථාපන නිලධාරීන් සහ නිල ඇඳුම් ලා ගත් නිලධාරීන්ට සිරකරුවන්ගේ අනුපාතය සහතික කිරීම. • සියලු ම බන්ධනාගාරවලට උපදේශකයින් සහ පුනරුත්ථාපන නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සේවා නියුක්තියෙහි යෙදවීම. • ශුභසාධන අංශයට අත්‍යවශ්‍ය සහායක කාර්ය මණ්ඩලය සහ සම්පත් සැපයීම. • සිරගත කිරීමේ අරමුණ පිළිබඳ ව දැනුවත් වීම සඳහා නිල ඇඳුම් ලත් සහ නිල ඇඳුම් නොලත් කාර්ය මණ්ඩලය යන කාණ්ඩ දෙකට ම පුනරුත්ථාපනය පිළිබඳ විශේෂ පුහුණු ලබා දීම.

2.2.	බන්ධනාගාරය තුළ වැඩ		
2.2.1		වැඩ වර්ග සහ කොන්දේසි	• ස්වභාවයෙන් ම ප්‍රයෝජනවත් වන වැඩ සහ බන්ධනාගාරයෙන් පිටත සේවා තත්ත්වයන්ට සමාන සේවා තත්ත්ව යටතේ වැඩ ලබා දීමෙන්, නිදහස් වීමෙන් පසු සේවා නියුක්තිය කෙරෙහි ඇති උපයෝගීතාව සැලකිල්ලට ගෙන සිරකරුවන් තුළ ආත්මාභිමානය සහ වගකීමේ හැඟීම ඉහළ නැංවීම. • සිරකරුවාගේ පවතින කුසලතා, මනාපයන්, සහ ඉදිරි සැලසුම්වලට විශේෂ අවධානය යොමු කර සහ සිරකරුවාගේ පෞද්ගලීකරණය කළ පුනරුත්ථාපන සැලැස්මට අනුකූල ව වැඩ පැවරීම සිදු කිරීම. • අකාර්යක්ෂමතාව සහ ප්‍රතිලාභ පිළිබඳ මූලධර්මය විකෘති කිරීම වැළැක්වීම සඳහා රැඳවියෙකුගේ සමාජ තත්ත්වය හෝ පක්ෂපාතීව සැලකීම මත පදනම් ව සේවා කණ්ඩායම් වෙන් කිරීමෙන් වැළකීම. • යම් විශේෂ සිරකරුවෙකුට පවරා ඇති වැඩ එම පුද්ගලයාට සුදුසු ම ගැළපීම නොවන බව ඔප්පු කළ හැකි නම් හැකි අවස්ථාවල දී සේවා කණ්ඩායම් වෙන් කරන අයුරු වෙනස් කිරීමට ඉඩ දීම. • විවෘත සිර කඳවුරු සහ වැඩ සඳහා නිදහස් කිරීම වැනි යළි සමාජගත කිරීම සඳහා වඩා යහපත් ඉඩ ප්‍රස්ථා ලබා දෙන දැනට පවතින විධිවිධාන ක්‍රියාත්මක කිරීම. • පෞද්ගලික අංශයේ වැඩ කිරීම සඳහා අවස්ථා ඇතුළත් කිරීමට වැඩ සඳහා නිදහස් කිරීමේ යෝජනා ක්‍රමය පුළුල් කිරීම. • සිරකරුවන්ට අලෙවි කළ හැකි වෘත්තිමය නිපුණතා ලබා ගැනීම සඳහා නව ව්‍යාපාරවලට මුල පිරීම, වෙළඳපොළ අනුපාතයන්ට අනුකූල ව වඩා ඉහළ වේතන උපයා ගැනීමෙන් ප්‍රතිලාභ ලබා ගැනීම, සහ නිදහස් වූ පසු එම ව්‍යවසායයේ ම සේවයේ යෙදවීමේ අපේක්ෂාව ඇති කිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ සහයෝග යෙන් කටයුතු කිරීම. • පෞද්ගලික අංශය සිරකරුවන්ගේ ශ්‍රමය සූරා නොකන බව, ප්‍රතිලාභ සහ රක්ෂණය සඳහා ප්‍රවේශය තිබීම, අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දැඩි අධීක්ෂණ සහිත ව කම්කරු නීතිවල රැකවරණය භුක්ති විඳීම සහ කලින් කලට වාර්තා කිරීම මෙන් ම දුක්ගැනවිලි යාන්ත්‍රණයක් තිබීම සහතික කිරීම. • තොරතුරු කළමනාකරණ පද්ධතිය ඩිජිටල්කරණය (සංඛ්‍යාංකනය කිරීම) කිරීමෙන් හෝ බන්ධනාගාර නිලධාරීන් වැඩි සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් සිරකරුවන් පිළිබඳ විශ්වසනීය තොරතුරු ඇති බන්ධනාගාර කාර්යාල තුළ සිරකරුවන් සේවයේ යෙදවීමෙන් වැළකී සිටීම. • බන්ධනාගාරය තුළ තමන්ගේ වෘත්තීය පුහුණු පාඨමාලා සාර්ථක ව නිම කරන සහ නිදහස් කළ පසු අදාළ අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීමට කැමති සිරකරුවන් නිදහස් කරන විට, මෙවලම් සහ උපකරණ සැපයීම සඳහා අයවැය වෙන් කිරීමෙන්, නිදහස් කිරීමෙන් පසු සහයෝගය ලබා ගැනීමට ඇති ප්‍රවේශය වැඩි කිරීම.

2.2.2		වැඩ සඳහා උපකරණ සහ සේවක පිරිස්	• උපරිම ඵලදායිතාව මෙන් ම, සේවයේ යෙදෙන විට සිරකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් කාර්මික උපකරණ, යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය ප්‍රසම්පාදනයට අරමුදල් ලබා දීම. • සිරකරුවන්ට නිදහස් වූ පසු ප්‍රයෝජන ලබාගත හැකි පරිදි ඔවුන්ට සඵලදායි පුහුණු ලබා දීමට විශේෂිත බාහිර ආයතන ඇතුළු ව වැඩ කණ්ඩායම්වලට සුදුසුකම් ලත් පුහුණුකරුවන්/ උපදේශකවරුන් බඳවා ගැනීම.
2.2.3		සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව	• වැඩ කිරීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ ව වෛද්‍ය නිලධාරීන්ගේ නිර්දේශවලට අනුකූල වීම. • විවෘත කඳවුරකට මාරු කිරීමට පෙර වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීම සහ යෙදවිය යුත්තේ කුමන වර්ගයක සේවාවකට ද යන්න පිළිබඳ ව වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශය සිරකරුවා ලබා ගන්නා බන්ධනාගාරයට සන්නිවේදනය කිරීම සහතික කිරීම. • වැඩ කිරීමට අපහසු සිරකරුවන් හඳුනා ගැනීම පිණිස වෛද්‍ය නිලධාරියා සිරකරුවන් සේවයේ යෙදෙන විට බැහැදැකීම සහ අධීක්ෂණය කිරීම. • සිරකරුවන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස වැඩපළවල් සහ වෙනත් සේවා ස්ථාන අළුත්වැඩියා කිරීම, සහ ප්‍රමාණවත් පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සපයා ඒවාට ප්‍රවේශයට ප්‍රමුඛත්වය දීම. • සේවා ස්ථානයේ ආරක්ෂාව පිළිබඳ ව සේවා කණ්ඩායමක සේවා නියුක්තියේ යෙදෙන සෑම සිරකරුවෙකුටම පුහුණු ලබා දීම. • ආරක්ෂණ උපකරණ භාවිතය සක්‍රීය ව ප්‍රවර්ධනය කිරීම සහ සෑම සේවා කණ්ඩායමකට ම ආරක්ෂක උපදෙස් ප්‍රදර්ශනය කිරීම. • සෑම සේවා කණ්ඩායමකට ම ප්‍රථමාධාර පෙට්ටි සවි කිරීම සහ සියලු ම බන්ධනාග ාර නිලධාරීන් හට ප්‍රථමාධාර සහ හෘද් පුප්ඵුසීය පුනර්ජීවනය පිළිබඳ පුහුණු ලබා දීම, සහ බලපත්‍ර මණ්ඩලය (බසජැබිෑ ඊද්රා) ඉදිරිපිට පුනරුත්ථාපනය සඳහා ධනාත්මක ඇගැයීමක් ලෙස දිරිමත් කිරීමට ලක් වූ සිරකරුවන්ට ද ඊට සමාන පුහුණු ලබා දීම. • නීති සම්පාදනයෙහි/ රෙගුලාසිවල දක්වා ඇති උපරිම පැය ගණන ඉක්මවා සේවා කාලය දීර්ඝ කරන්නේ නම්, අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම. • දේශීය නීති සම්පාදනය/රෙගුලාසි මෙන් ම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව, සිරකරුවන්ට විවේක ගැනීමට සහ බන්ධනාගාර ජීවිතයේ වෙනත් පුරුත්ථාපන අංගවල නිරත වීම සඳහා ප්‍රමාණවත් විවේක කාලයන් සහ විවේක දින ලබා දීම.

2.2.4		වේතනය (පාරිතෝෂිකය)	• වර්තමාන වෙළඳපොළ ශ්‍රම පිරිවැයට අනුකූල වන පරිදි සහ ජාතික අවම වේතන ප්‍රමිතියට ගැළපෙන පරිදි සිරකරුවන්ගේ වේතන ක්‍රමය සංශෝධනය කිරීම. • පවතින වේතන ක්‍රම සහ ඔවුන්ගේ හිමිකම් පිළිබඳ ව සිරකරුවන් අතර දැනුවත් භාවය ඇති කිරීම. • සිරකරුවන්ට ඔවුන්ගේ ඉපැයුම්වලින් කොටසක් තමන්ට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දීම, එනම් බන්ධනාගාර ගබඩාවලින් අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට සහ/ හෝ ඔවුන්ගේ ඉපැයුම්වලින් කොටසක් පවුලට යැවීමට ඉඩ ලබා දීම. • සිරකරුවන්ට ඔවුන්ගේ ඉල්ලීම පරිදි, තම පවතින ශේෂය බැලීමට ඔවුන්ගේ පාස් පොත් සෝදිසි කිරීමට ඉඩ දීම. ඒ මගින් බන්ධනාගාර පරිපාලනයේ වගවීම ද වැඩි වනු ඇත.
2.3	කලින් නිදහස් කිරීම		
2.3.1		ප්‍රතිපත්ති සහ ක්‍රියාපාටිපාටි	• ශ්‍රී ලංකා දණ්ඩන ක්‍රමවේදය තුළ දැනට පවතින කලින් නිදහස් කිරීමේ පියවර යළි සංකල්පනය කිරීම සහ ශක්තිමත් කිරීම. සිරකරුවාගේ පුනරුත්ථාපනය පියවරෙන් පියවරට සමාලෝචනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි සංකල්ප ක්‍රමවේදයක් සැලසුම් කිරීමෙන් ඇගයීමේ ක්‍රමවේදය සමලෝචනය කිරීම සහ දුර්වලතා ආමන්ත්‍රණය කිරීම. • මූලස්ථානය සහ අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය මගින් නිවාස නිවාඩු සහ බලපත්‍ර මණ්ඩලයට සම්බන්ධ ප්‍රමාද වීම් වැළැක්වීම සඳහා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම. • පිළිගත් ප්‍රජා සංවිධානයක හෝ අතරමැදි නිවස්නයක (Half- way home) රැකවරණය යටතේ සිටීමට පුනරුත්ථාපනය වී ඇති සිරකරුවන්ට භාරකරුවෙකු හෝ පවුලක් නොමැති විට පවා නිවාස නිවාඩු සඳහා යාමට අවස්ථාව ලබා දීම. • ක්‍රියාවලියේ විනිවිදභාවය සහ වගවීම සඳහා, බලපත්‍ර මණ්ඩලය මගින් නිදහස් කිරීමට යෙදෙන පුල්ගලයින්ගේ සුදුසුකම මෙන් ම ප්‍රතික්ෂේප කිරීමට හේතු තක්සේරු කිරීමට ලිඛිත සහ ප්‍රකාශයට පත් කර ඇති ලේඛනයක් හෝ මාර්ගෝපදේශයක් අනුගමනය කිරීම. • ක්‍රියාවලියේ සාධාරණත්වය සහ අවංකභාවය ශක්තිමත් කිරීමට බලපත්‍ර මණ්ඩලය තුළ මානව හිමිකම් උද්දේශකයින්, මනෝ චිකිත්සකයින්, ආදිය වැනි සිරකරුවන්ගේ අභිලාෂයන් නියෝජනය කරන පුද්ගලයින් ඇතුළත් කිරීම. • නිවාස නිවාඩු සහ බලපත්‍ර මණ්ඩලයේ ක්‍රියාපටිපාටි කාර්යක්ෂම සහ ප්‍රමාදවීම්වලින් තොර ව, සහ විශෝධන සහ පුනරුත්ථාපන අරමුණු සහිත ව හැසිර වීම සහතික කිරීම සඳහා සෑම බන්ධනාගාරයක ම ශුභසාධන අංශයට පුනරුත්ථාපන නිලධාරීන් වැඩි සංඛ්‍යාවක් සමග ප්‍රමාණවත් සම්පත් සහ සහයෝගය ලබා දීම. • අපරාධය පිළිබඳ අංගයන් මෙන් ම බරපතළකම ලිහිල් කිරීමේ වාතාවරණයන් සැලකිල්ලට ගැනීමට දඬුවම් නියම කිරීමේ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සඳහා අපරාධ යුක්තිය පසිඳලීමේ පරිපාලනය පිළිබඳ විධික්‍රම ගවේෂණය කිරීම.

2.4	මරණ දඬුවමට නියම වී ඇති සිරකරුවන්		
2.4.1		මරණ දඬුවම පිළිබඳ ප්‍රතිපත්ති	• මරණීය දණ්ඩනය අහෝසි කිරීමට යෝජනා කිරීම. • මරණීය දණ්ඩනය නියම කර ඇති සියලු ම සිරකරුවන් හට ජීවිතාන්තය දක්වා සිර දඬුවම නියම කර, පසු ව නිශ්චිත කාලයකට සිරගත කිරීම සහ මෙය ඔවුන් ව කලින් නිදහස් කිරීමට පියවර ගැනීම සඳහා යෝග්‍ය කිරීමට බන්ධනාගාරය තුළ ඔවුන්ගේ පුනරුත්ථාපනය පිළිබඳ ඒක පුද්ගල ඇගයීම් කළ පසු සිදු කිරීම. • මරණීය දණ්ඩනය නියම වී ඇති සිරකරුවන්ගේ ශාරීරික සහ මානසික සෞඛ්‍ය අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම.
2.5	ත්‍රස්තවාදය පිටුදැකීමේ පනත යටතේ රඳවාගෙන ඇති සිරකරුවන්		
2.5.1		ත්‍රස්තවාදය පිටුදැකීමේ පනත යටතේ රඳවා තබා ගැනීම සඳහා ක්‍රියාපටිපාටි සහ මාර්ගෙ ්පදේශ	• ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කර ජාතික ආරක්ෂාව/ ත්‍රස්තවිරෝධී නීතිය ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම. • රැඳවියකු පිස්කල් අත් අඩංගුවේ සිටින කාලය අතරතුර දී අපයෝජනයට ලක්වීමට අවස්ථා නිර්මාණය නොවීම පිණිස, සුවිශේෂී වාතාවරණයන් යටතේ රිමාන්ඩ් භාරයේ සිටින්නෙකුට පිස්කල් භාරයේ සිට පොලිසිය මඟින් ප්‍රශ්න කිරීම සඳහා ගෙන යාමට ආරක්ෂක තත්ත්වයන් පවතින බව සහතික කිරීම. • පාපොච්චාරණ සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතෙහි පවතින විධිවිධානවලට කිසිදු ව්‍යතිරේකයක් වෙනුවෙන් ඉඩ නොදෙන බව සහතික කිරීම. විශේෂයෙන්, බිය වැද්දීම යටතේ පාපොච්චාරණයක් කළ බව ඔප්පු කිරීමේ බර විත්තිකරු මත නොතිබිය යුතු ය. • ජාතික ආරක්ෂක නීති යටතේ අත්අඩංගුවට ගෙන ඇති සෑම රැඳවියෙකු ම නිශ්චිත කාලයක් ඇතුළත අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කිරීම සහ එවැනි පරීක්ෂා කිරීමක වාර්තාව සාමාන්‍ය කරුණක් ලෙස මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම. • අධි චෝදනා ලැබූවන්ගේ නඩු සමාලෝචනය කිරීම, සහ පොලිස් නිලධාරියෙකුට ලබා දුන් පාපොච්චාරණයක් මත පමණක් පදනම් වූ අධිචෝදනා සහ විශ්වාස දායක සාක්ෂි නොපවතින නඩු ඉවත් කිරීම. • දිගු කාලයක් තුළ රිමාන්ඩ් භාරයේ සිට ඇති රැඳවියන් හට ඇප ලබා දීම.

2.6	තරුණ වරදකරුවන්		
2.6.1		ප්‍රතිපත්තිය, ක්‍රියාපටිපාටි සහ මාර්ගෝපදේශ	• වයස අවුරුදු දහ අටට අඩු පුද්ගලයින් සඳහා බන්ධනාගාරගත නොකරන අත් අඩංගුවෙහි නොවන, විකල්ප විශෝධන ක්‍රම භාවිත කිරීම සහ තරුණ රැඳවියන් සඳහා සිරගත කිරීම අවසාන පියවරක් ලෙස භාවිතා කරන්නේ නම් පමණක් තරුණ රැඳවුම් මධ්‍යස්ථානයක රඳවා තැබීම. • සියලු ම ආඥා පනත් හරහා තරුණ වරදකරුවෙකු පිළිබඳ සම්මත අර්ථ දැක්වීමක් සහතික කිරීම සඳහා නෛතික රාමුව සංශෝධනය කිරීම සහ වයස අවුරුදු දහ අටට අඩු වරදකරුවන් වැඩිහිටි බන්ධනාගාරවල රඳවා නොගත යුතු බවට නියම කිරීම. • ප්‍රචණ්ඩත්වය පිළිබඳ ව ශුන්‍යඉවසීමේ ප්‍රතිපත්තියක් බලාත්මක කිරීම සහ තරුණ වරදකරුවන්ට පහර දීමේ චෝදනා ලබන නිලධාරීන්ට එරෙහි ව දැඩි විනය ක්‍රියා මාර්ග, සහ අවශ්‍ය වූ විට සහ උචිත පරිදි අපරාධ නීතියට අනුව ක්‍රියාමාර්ග ගැනීම. • ප්‍රචණ්ඩත්වයට ලක් වී ඇති තරුණ වරදකරුවන් සඳහා පැමිණිලි ඉදිරිපත් කිරීමට නිරුපද්‍රිත සහ සුරක්ෂිත දුක්ගැනවිලි යාන්ත්‍රණයකට ප්‍රවේශය තිබීම සඳහා ආරක්ෂාවන් ස්ථාන ගත කර ඇති බව සහතික කිරීම. • තරුණ වරදකරුවන්ට දුරකථන පහසුකම් හරහා ඔවුන්ගේ පවුල් සමග නිතිපතා සන්නිවේදනය කිරීමට හැකි බව සහතික කිරීම සහ නෛතික නියෝජනයට ප්‍රවේශය සහ සහාය ලබා දීම. • තරුණ වරදකරුවන් අධිකරණයේ සිට තරුණ රැඳවුම් මධ්‍යස්ථානවලට මාරු කිරීම බන්ධනාගාර පද්ධතිය හෝ බන්ධනාගාර නිලධාරීන් හරහා නොව, එය සැලසුම් කිරීමට සහ අධීක්ෂණය කිරීමට ජාතික ළමා ආරක්ෂණ අධිකාරියට බලය පැවරීම.
2.6.2		පුනරුත්ථාපනය සහ අධ්‍යාපනය	• සියලු ම තරුණ වරදකරුවන් හට, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජනවාර්ගිකත්වය, භාෂා ප්‍රවීණත්වය, ආදිය නොතකා, රැඳවුම් ස්ථාන තුළ අධ්‍යාපනයට සහ වෘත්තීය පුහුණුවලට ප්‍රවේශය තිබීම සහතික කිරීම. • තරුණ වරදකරුවන්ට පුළුල් අධ්‍යාපනයක් ලැබෙන බව සහතික කිරීම. • තරුණ වරදකරුවන් රඳවා සිටින සෑම ආයතනයක ම අධ්‍යාපන පහසුකම් සපයා දීම සහ තරුණ වරදකරුවන්ට ඔවුන්ගේ පෞද්ගලික අධ්‍යාපන සහ සාක්ෂරතා මට්ටම්වලට අනුව ඔවුන්ගේ කඩාකප්පල් වූ අධ්‍යාපනය අඛණ්ඩ ව කරගෙන යාමේ අවස්ථාව තිබීම සඳහා ජාතික විෂය මාලාව සමඟ ඒකාබද්ධ කිරීම. • තරුණ වරදකරුවන් හට සාපරාධී ක්‍රියාකාරකම්වල මාවතෙන් ඉවත් වීමට පොළඹවන නව්‍ය සහ නිර්මාණාත්මක ක්‍රම හඳුන්වා දීම. • තරුණ වරදකරුවන් බන්ධනාගාරයට ඇතුල් කිරීමේ දී කෙරෙන හැඩගැස්වීමේ වැඩසටහන අතරතුර දැනුම් දී, මනෝ විද්‍යාත්මක සහ උපදේශන පහසුකම්වල ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීම සහ උපදේශක වරුන් සමඟ සතිපතා සැසි සංවිධානය කිරීම. • ආත්මාභිමානය, චිත්තවේග කළමනාකරණය සහ හිතකර සම්බන්ධතා වර්ධනය කිරීම පිළිබඳ ව වැඩසටහන් සහ වැඩමුළු සංවිධානය කිරීම.

2.6.3		මානව සම්පත් සහ සේවක පිරිස්	• තරුණ වරදකරුවන් රඳවා ඇති සියලු ම විශෝධන මධ්‍යස්ථාන සඳහා ළමා ර කවරණය සහ ළමා මනෝ විද්‍යාව පිළිබඳ අදාළ, පිළිගත් සහ සුදුසුකම් සහිත, සහ හැසිරීමේ ගැටලු සමඟ කටයුතු කළ හැකි සේවක පිරිස් බඳවා ගැනීම සහ නිතිපතා දැනුම අළුත් කිරීමේ සහ සේවාස්ථ පුහුණුවක් ලබා දීම. • සුදුසුකම් සහිත වෘත්තිකයින් ආකර්ෂණය කර ගැනීමට එවැනි කාර්යමණ්ඩල සාමාජිකයින් සඳහා ප්‍රමාණවත් අන්දමින් වේතන සහ දීමනා සංශෝධනය කිරීම.
2.7	බන්ධනාගාරය තුළ සිටින විදේශීය ජාතිකයින්		
2.7.1		ප්‍රතිපත්තිය, ක්‍රියාපටිපාටි සහ මාර්ගෝපදේශ	• විදේශීය ජාතිකයින් ඔවුන්ගේ ජාතිකත්වය හෝ භාෂා ප්‍රවීණත්වය මත අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාපටිපාටිය තුළ හෝ සිරගත වීමේ කිසිදු අදියරයක දී වෙනස් කොට සැලකීමට භාජනය නොවන බව සහතික කිරීම. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් විදේශීය රැඳවියන්ට, ඔවුන්ගේ ඕනෑ එපාකම් ආරක්ෂා කළ හැකි කිසිදු සම්බන්ධයක් බන්ධනාගාරයෙන් පිටත නොමැති බැවින් අත් අඩංගුවේ දී ඔවුන්ගේ යහ පැවැත්ම ගැන විශේෂයෙන් ඔවුන්ගෙන් විමසීමට විනිසුරුවරුන්ට අවශ්‍ය කරන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම ගැන සලකා බැලීම. • විදේශිය ජාතිකයින් අත් අඩංගුවට ගෙන පොලිසිය සහ බන්ධනාගාර නිලධාරීන් විසින් බන්ධනාගාරයට ඇතුල් කරන විට, අප්‍රමාද ව, අවම වශයෙන් පැය 48ක් ඇතුළත අදාළ විදේශ තානාපති කාර්යාලවලට දැනුම් දීම. • අත් අඩංගුවට පත්වීමෙන් පසු, රැඳවියෙකුට තමන්ගේ රටට සහ රජයට ඇති පිවිසුම් මධ්‍යස්ථානය වනුයේ තානාපති කාර්යාලය බැවින්, බන්ධනාගාර නිලධාරීන් විසින් සැලසුම් කර, විදේශීය ජාතිකයින්ට ඔවුන්ගේ ඉල්ලීම මත, ඔවුන්ගේ තානාපති කාර්යාලවල නියෝජිතයින් හමු වීමට හෝ කතා කිරීමට ඉඩ දීම. • නඩු විභාගය කිසිදු ප්‍රමාද වීමකට ලක් නොකර, පොලිස් පරීක්ෂණය සහ නඩු විභාගය සිදු කරන අතරතුර පරිවර්තකයෙකුගේ සේවා සැපයීම. • විදේශීය රැඳවියන් ව බන්ධනාගාරයට ඇතුල් කිරීමේ දී සහ පවුල් බැහැ දැකීමට නොහැකි නිසා මාසික ව ඔවුන්ගේ පවුල් ඇමතීමට, ඔවුන්ගේ තානාපති කාර්යාලවල සහාය ඇති ව සැලසුම් කර පහසුකම් සපයා දීම. • විදේශීය රැඳවියන්ගේ පවුල් ඔවුන් බැහැදැකීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණ ඇති විට, සමීප ව බැහැදැකීම සඳහා සාධාරණ කාල සීමාවක් සහ පසු ව අඛණ්ඩ ව කිහිප වතාවක් බැහැදැකීමට අවසර දීම. විශේෂයෙන් සාමාන්‍යයෙන් රැඳවියාව බැහැදැකීමට කිසිවෙකු නොපැමිණෙන්නේ නම්, එසේ ඉඩ දීම. • රැඳවියන්ට අවශ්‍ය කරන කළමනා මිල දී ගැනීමට බන්ධනාගාරයේ භෝජනාගාරයට හෝ ගබඩාවට පවුලේ සාමාජිකයින් විසින් විදුලි පණිවුඩ මගින් මුදල් මාරු කිරීමට සියලු ම බන්ධානාගාරවලට සේවාවක් සකසා දීම.

			• නීති ආධාර කොමිෂන් සභාවේ සහ/ හෝ ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමයේ සහයෝගීත්වය ඇති ව නීති නියෝජිතයින් තෝරා ගැනීමට, ඔවුන් සම්බන්ධ කර ගැනීමේ විස්තර සහ සුදුසුකම්වල සාක්ෂි සහිත ව නීතිඥයින්ගේ ලැයිස්තුවක් විදේශීය ජාතිකයින් වෙත ලබා දීම. • විදේශීය ජාතිකයින් බන්ධනාගාරයට ඇතුල් කිරීමේ දී, බන්ධනාගාරය පාලනය වන මූලික නීති රීති අවබෝධ කර ගැනීමට හැකි වනු පිණිස, ඇතුල් කිරීම, බැහැදැකීම්, පැමිණිලි කිරීමේ ක්‍රියාපටිපාටි, ආදිය ගැන තොරතුරු ඇතුළත් කෙරෙන භාෂා පරාසයකින් ලබාගත හැකි හැඩගැස්වීමේ පොත් පිංචක් ලබා දීම. • විදේශීය ජාතිකයින් හට වරින් වර මූලික ව අවශ්‍ය වන කළමනා සැපයීම.
2.7.2		පෙරළා සියරට යැවීම	• සෑම කෙනෙකුට ම ඔහුගේ/ ඇයගේ රටට ආපසු යාමට අයිතිය ඇති බැවින්, සුදුසුකම් ලබන සහ එකඟ වන විදේශීය ජාතික සිරකරුවන් අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය මඟින් කඩිනමින් පෙරළා සියරට යැවීම සිදු කළ යුතු අතර, පෙරළා සියරට යැවීමේ ක්‍රියාපටිපාටි දේශපාලන අභිමතයන්ට යටත් නොවී, සාමාන්‍ය ක්‍රියාවක් ලෙස ස්ථාපිත ක්‍රියාපටිපාටියක කොටසක් ලෙස ක්‍රියාත්මක කිරීම. • විදේශීය සිරකරුවකු වරදකරුවකු වූ වහා ම සිය රටට ආපසු යාමට කැමති වන්නේ නම්, මාරු කිරීමේ ක්‍රියාපටිපාටි ආරම්භ කිරීම. මාරු නොකිරීමට නීත්‍යනුකූල හේතු ඇත්නම්, සත්කාරක බන්ධනාගාරයේ විදේශීය සිරකරුවාට අවම කාල සීමාවක් ගත කිරීමට අවශ්‍ය කරනු ඇත. • දණ්ඩනය නිමා කර ඇති පුද්ගලයින්, තදබදය ඇති පහසුකම් රහිත, අවිනිශ්චිත ව නිදහස අහිමි කිරීමට යටත් වන, මිරිහානේ විදේශීය ජාතිකයින්ගේ රැඳවුම් මධ්‍යස්ථානයට යැවීමේ දැනට පවතින ක්‍රියාවලිය සංශෝධනය කිරීම සහ පුද්ගලයෙකු පෙරළා සියරට යැවීමේ පරිපාලන ප්‍රෝටොකෝලය නිම කිරීමට බලධාරීන් ගනු ලබන කාලය අවම කිරීම.
2.8	කාන්තාවෝ		
2.8.1		වෛද්‍ය සහ සෞඛ්‍ය රැකවරණ පහසුකම්	• සෑම බන්ධනාගාරයකම කාන්තා සිරකාරියන් සඳහා ඔවුන්ට අදාළ අංශය තුළ වෙන ම, අංග සම්පූර්ණ පහසුකම් සහිත වෛද්‍ය මධ්‍යස්ථානයකට ප්‍රවේශය තිබීම සහතික කිරීම සහ ඔවුන් කැමති නම්, කාන්තා වෛද්‍ය නිලධාරිනියක් හමුවීමට අවස්ථාව සලසා දීම. • වෛද්‍ය තත්ත්වයක් හේතුවෙන් වෙන් කර තැබිය යුතු රෝගීන් සඳහා කාන්තා සෞඛ්‍ය සේවා අංශ ඇතුළත නිරෝධානය කළ අවකාශ තිබීම සහතික කිරීම. • කාන්තා සිරකාරියන් අතර මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම් සඳහා ප්‍රතිකාර කිරීමට, රැඳවියන්ගේ ප්‍රගතිය නිතිපතා අධීක්ෂණයට ලක් කිරීම සහිත ව, පුළුල් වැඩසටහනක් සකස් කිරීම.

<table>
<tr><td></td><td></td><td></td><td>• සිරගත වී සිටින කාන්තාවන් සඳහා වන බැංකොක් නීති රීති තුළ හඳුනා ගත් පරිදි, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ශාරීරික සහ ලිංගික අපයෝජනයට ලක් වන කාන්තා වින්දිතයින්ගේ වඩා ඉහළ අනුපාතය සිත්හි තබාගෙන, මනෝ විද්‍යාත්මක සේවා සැපයීම.
• කාන්තාවන්ට (වරදකරුවන් වූ සහ රිමාන්ඩ් භාරයේ සිටිමින් කිසිවෙක් බැහැදැකීමට නොපැමිණෙන) මසකට වරක් සනීපාරක්ෂක තුවා ලබා ගැනීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් තිබීම සහතික කිරීම.
• සනීපාරක්ෂක තුවා සහ පෑඩ් නිතිපතා බැහැර කිරීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් තිබීම සහතික කිරීම සහ සෞඛ්‍යමය ආකාරයකින් එවැනි අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ඒවා පිළිබඳ ව කටයුතු කරන්නේ කෙසේ ද යන්න ගැන රැඳවියන්ට උපදෙස් ලබා දීම.
• නිවාරණ සෞඛ්‍ය සේවාවේ විෂය පථය පුළුල් කිරීම සිරකරුවන්ට පියයුරු සහ ගැබ්ගෙල පිළිකා පරීක්ෂණ පැවැත්වීම මෙන් ම, පියයුරු සහ ගැබ්ගෙල පිළිකා සම්බන්ධ ව දැනුවත් කිරීමේ වැඩසටහන් නිරන්තරයෙන් පැවැත්වීම.
• ගර්භණී කාන්තාවන්ට හෝ මෑතක දී දරුවන් බිහි කළ මව්වරුන් සඳහා නිතිපතා සළුලදායී පූර්වප්‍රසව සහ පශ්චාත්ප්‍රසව රැකවරණ පහසුකම් සඳහා ප්‍රතිපාදන ලබා දීම. විශේෂ ආහාර සැලසුම් සකස් කිරීම සහ අලුත උපන් දරුවා රැක බලා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ වැඩසටහන්වලට ප්‍රවේශය ලබා දීම.
• තමන්ගේ රැකවරණය යටතේ සිටින දරුවන් ප්‍රාථමික ව රැකබලා ගන්නන් වන කාන්තාවන්ට සහ ගැබිණි කාන්තාවන්ට සිරගත වීමට විකල්පයක් ලෙස සිරභාරයේ නොසිටින පියවර භාවිත කිරීම ව්‍යාප්ත කිරීම ගැන සලකා බලා, ඔවුන්ගේ දරුවන්ගේ ජීවිත කඩාකප්පල් කිරීම වැළැක්වීම සහ එවැනි දරුවන් රාජ්‍ය ළමාරක්ෂක මධ්‍යස්ථානවල තැබීමෙන් රජය මත පැටවෙන බර අවම කිරීම.</td></tr>
<tr><td>2.8.2</td><td></td><td>පුනරුත්ථාපනය</td><td>• පවිත්‍ර කිරීමට පමණක් සීමා නොවූ, අර්ථවත් බන්ධනාගාර සේවාවල කාන්තාවන් නිරත කර වීම සහ සේවා සඳහා නිදහස් කිරීමේ යෝජනා ක්‍රමවලට සහ බන්ධනාගාරය තුළ පෞද්ගලික ව්‍යාපාරවලට සහභාගි වීමට මානව හිමිකම්වලට අනුකූල සේවා තත්ත්වයන් තහවුරු කිරීමට යටත් ව සමාන අවස්ථා ලබා දීම.
• කාන්තාවන්ට ඔවුන්ගේ කුසලතා ඉහළ නැංවීමට බාහිර උපදේශකයින්ට ප්‍රවේශය සහිත ව වෘත්තීය පුහුණු සහ අධ්‍යාපන ක්‍රියාකාරකම් හා පුළුල් පරාසයකට ප්‍රවේශය ලබා දෙන පුළුල් වැඩසටහනක් සකස් කිරීම සහ ඔවුන්ගේ පුහුණුව අවසානයේ දී වෘත්තීය සහතිකයක් ලබා ගැනීමට අවස්ථාව සලසා දීම.
• අවශ්‍ය පහසුකම්වලින් සමන්විත පූජනීය ස්ථාන ලෙස බන්ධනාගාරය තුළ අවකාශයන් වෙන් කර තැබීම.</td></tr>
</table>

2.8.3		ළමා රැකවරණය	• පහත සඳහන් කරුණු ඇතුළත් ව සඵලදායී ළමාරක්ෂක පහසුකම් සඳහා ප්‍රතිපාදන සැලසීම. බන්ධනාගාරය තුළ ළමා රෝග විශේෂඥයින්ගේ සේවාව, ළමුන්ට යෝග්‍ය ආහාර වේල්, ළමුන් සඳහා ළදරු පාසැල් හෝ වෙන් කළ අවකාශයන් ලබා දී ඒවා හොඳින් නඩත්තු කරන බව සහතික කිරීම. ක්‍රීඩා කිරීමට ප්‍රදේශ සහ උගෙනීම සඳහා අවශ්‍ය කරන මෙවලම්, වයස අවුරුදු පහ සපිරෙන තෙක් ශිෂ්‍යයින් සඳහා නිසි විෂය මාලාවක් සහ විෂය නිර්දේශයක් සකස් කිරීම සහ සහතික ලත් ළදරු පාසැල් ගුරුවරුන්ගේ සේවාව ලබා දීම. • වැලිකඩ බන්ධනාගාරයෙහි ඇති පෙරපාසැල් ක්‍රමවේදය පද්ධතිය තුළ ඇති සියලු ම බන්ධනාගාරවලට ව්‍යාප්ත කිරීම.
2.8.4		කාන්තා බන්ධනාගාර සේවක පිරිස්	• සිරුරු සෝදිසි කිරීම් සිදු කරන විට පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටිය සඳහන් කරමින් චක්‍ර ලේඛයක් නිකුත් කිරීම සහ කාන්තා රැඳවියෙකුගේ කායික කුහර පරීක්ෂාවක් අත් භාවිතයෙන් සිදු කිරීමට බලය ඇත්තේ වෛද්‍යවරියකට පමණක් බව සියලු ම බන්ධනාගාර නිලධාරීන්ට සහ බන්ධනාගාර පොලීසියට දැනුම් දීම. • බන්ධනාගාර සේවයට කාන්තා නිලධාරීන් වැඩියෙන් බඳවා ගෙන ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂම ව ඉටු කිරීමට අවශ්‍ය කරන පුහුණු ඔවුන් හට ලැබෙන බව සහතික කිරීම.
2.9	ආබාධිතතා සහිත සිරකරුවන්		
2.9.1		පහසුකම්	• වැසිකිළි පහසුකම් ඇතුළු ව, ආබාධිතතා සහිත පුද්ගලයින්ට ප්‍රවේශය පහසු කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව සියලු ම බන්ධනාගාර අළුත්වැඩියා කිරීම. • ආබාධිතතා සහිත පුද්ගලයින්ගේ සහ වැඩිහිටි සිරකරුවන්ගේ අවශ්‍යතා, අවශ්‍ය කරන අන්දමින් ඔවුන්ගේ ආබාධිතතා සහ වයසට අනුව තිබිය හැකි රෝග සඳහා විශේෂයෙන් වෛද්‍ය ප්‍රතිකාරවලට ප්‍රමුඛත්වය ලබා දීම. • ආබාධිතතා සහිත සිරකරුවන් සඳහා ආධාරක සහ උපකරණ වෙනුවෙන් බාහිර ආයතනවලින් ලැබෙන ප්‍රදාන මත යැපෙන්නේ නැති ව, ඒවා ලබා ගැනීම සඳහා බන්ධනාගාර පරිපාලනයට හැකි වනු පිණිස මූල්‍ය සම්පත් සැපයීම. • ආබාධිතතා සහිත සිරකරුවන් හට සෑමවිට ම අවශ්‍ය කරන සහාය අනෙකුත් සිරකරුවන්ගෙන් ලැබෙන බැවින් ඔවුන් වෙන් කර රඳවා නොගෙන උචිත ලෙස නවාතැන් දීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. • හදිසි හෝ ආපදා අවස්ථාවක දී වැඩිහිටි සහ ආබාධිතතා සහිත සිරකරුවන් ඉවත් කර ගැනීම සඳහා පැහැදිලි ප්‍රෝටොකෝලයක් සකස් කිරීම. • බන්ධනාගාරය තුළ තම කාලය ඵලදායි ආකාරයකින් ගෙවීමට ඔවුන්ට ඉඩ ප්‍රස්ථා ඇති බව සහතික කිරීමට ආබාධිතතා සහිත සිරකරුවන් හට ප්‍රවේශ විය හැකි පරිදි පුනරුත්ථාපන වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.

2.9.2		ශුභසාධන සහ පුනරුත්ථාපන වැඩසටහන්	• ආබාධිතතා සහිත සහ වැඩිහිටි සිරකරුවන් හට, විශේෂයෙන් එවැනි සිරකරුවන් රැකබලා ගැනීමට කැමැත්තෙන් සිටින පවුල් ඇති විට, නිවාස නිවාඩු ලබා ගැනීම දිරිමත් කිරීම. • නිවාස නිවාඩු රෙගුලාසි වෙනස් කිරීම සහ ඔවුන් නිදහස් කිරීම නිර්ණය කරන විට ඔවුන්ගේ වයස සැලකිල්ලට ගත යුතු සාධකයක් බවට පත් කිරීම. වයසට සම්බන්ධ අවදානම්වල ඇගයීම් සිදු කරන විට එසේ කළ හැකි වේ. • පූර්ණ හෝ අර්ධ අංශභාගය සහ මාරාන්තික රෝගවලින් පෙළෙන සිරකරුවන් සඳහා සානුකම්පිත ව නිදහස් කිරීම ප්‍රයෝජනයට ගැනීම සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සහයෝගිත්වයෙන්, ස්ථිර ව අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් සිදු කිරීම. • අනෙකුත් සිරකරුවන් මගින් අපයෝජනය සහ පීඩාකාරී ලෙස ලෙස සැලකීම වැළැක්වීමට කාර්ය මණ්ඩලය පුහුණු කිරීම මගින් ආබාධිතතා සහිත සිරකරුවන් සඵලදායී ලෙස අධීක්ෂණය කිරීම.

3. අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය ප්‍රතිසංස්කරණය

අංකය	කාණ්ඩය	සැලකිලිමත් විය යුතු ක්ෂේත්‍ර	නිර්දේශ
3.1	අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම		
3.1.1		අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාපටිපාටි	• අපරාධ නඩු විධාන සංග්‍රහය පිළිබඳ 1979 අංක 15 දරන පනතේ සඳහන් කර ඇති නිසි ක්‍රියාවලියේ ප්‍රමිතීන් අනුගමනය කිරීමට පොලිස් නිලධාරීන්ට අවශ්‍ය කිරීම සහ මෙම විධිවිධාන උල්ලංඝනය කර ඇති බව පෙනී යන නිලධාරීන්ට එරෙහි ව විනය ක්‍රියා මාර්ග ගැනීම ආරම්භ කිරීම. • විදේශීය ජාතිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා නෛතික ක්‍රියා පටිපාටි සකස් කිරීම සහ අත් අඩංගුවට ගත් විගස ඔවුන්ගේ තානාපති කාර්යාලය සහ පවුල් සම්බන්ධ කර ගැනීමට විධි විධාන ඇතුළත් කිරීම. • ප්‍රචණ්ඩත්වය සහ වධහිංසා පැමිණ වීම, අමානුෂික නොහොබිනා සැලකීම් සහ දඬුවම් කිරීමට සමාන වන ක්‍රියා පිළිබඳ ව ශුන්‍යඉවසීමේ ප්‍රතිපත්තියක් බලාත්මක කිරීම. • අවශ්‍යතාව සහ සමානුපාතිකතාව පිළිබඳ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල ව බලය භාවිත කිරීම ගැන පොලිස් නිලධාරීන්ට පුහුණු ලබා දීම. • 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයින් අත්අඩංගුවට ගෙන රඳවා ගන්නා විට නියෝගවල සඳහන් කර ඇති ආරක්ෂක ක්‍රියා මාර්ග අනුගමනය කිරීම සහතික කිරීම සහ එවැනි නියෝග ඉටු නොකරන නිලධාරීන් ගැන සොයා බැලීමට සහ විනය ක්‍රියා මාර්ග ආරම්භ කිරීමට ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම.

3.1.2		රඳවා ගැනීමේ ක්‍රියාපටිපාටි	• හුදකලාව තබන රඳවා ගැනීම් තහනම් කිරීම සහ අත් අඩංගුවේ සිටින අතරතුර රැඳවියා වධහිංසාවට ලක්වීමේ අවදානම අවම කිරීම සඳහා රැඳවියන් හට පවුල, නීති නියෝජිතයින් සහ ස්වාධීන සංවිධාන සමඟ සම්බන්ධ වීමට ප්‍රවේශය ලබා දීම. • පරිපාලනමය රඳවා ගැනීම තහනම් කිරීම සහ රඳවා ගැනීමෙහි යම් දීර්ඝ කිරීමක් සිදු කිරීම තීරණය කිරීමට මෙන් ම රඳවා ගැනීම අධීක්ෂණය කිරීමට අධිකරණ නිලධාරියෙකුට පමණක් ඉඩ දීම.
3.1.3		කාන්තා රැඳවියන්	• පොලීසිය මඟින් සිදු කරන කාන්තා සැකකරුවන්ගේ සිරුරු පරීක්ෂා කිරීම් සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය පිළිබඳ 1979 අංක 15 දරන පනතේ මාර්ගෝපදේශ ලබා දීම. • කාන්තාවක් අත් අඩංගුවට ගෙන රැගෙන යාමේ දී එවැනි කාන්තාවන්ගේ අභිමානය සහ පෞද්ගලික සුරක්ෂිතතාව ආරක්ෂා කිරීමට කාන්තා පොලිස් කොස්තාපල්වරියක් සිටීම අනිවාර්ය කරන විධි විධානයක් ඇතුළත් කිරීමට අපරාධ නඩු විධාන සංග්‍රහය පිළිබඳ 1979 අංක 15 දරන පනත සංශෝධනය කිරීම. • රැයක් තුළ රඳවා තබා ගන්නා කාන්තාවන් වෙනුවෙන් නීතිය බලාත්මක කරන නිලධාරියෙක් වගකීම සහ වගවීම සඳහා කාන්තා පොලිස් කොස්තාපල්වරියක් ඉදිරියේ තබා ගැනීම සහතික කිරීම. • අත්අඩංගුවට ගන්නා ගැබිණි කාන්තාවන් සහ කිරි දෙන මව්වරුන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම සඳහා විශේෂ පහසුකම් සපයා දීම.
3.2	නෛතික නියෝජනයට ප්‍රවේශය		
3.2.1		නීති ආධාර පද්ධතිය	• නීති ආධාර කොමිෂන් සභාවට ඔවුන්ගේ සේවක සංඛ්‍යාව වැඩි කර ගැනීමට සහ ග්‍රාමීය පෙදෙස්වල ඇති බන්ධනාගාරවල නීති ආධාර සායන පැවැත්වීම සඳහා වන අයවැය වැඩිපුර වෙන් කිරීම් හරහා නීති ආධාර පද්ධතිය ශක්තිමත් කිරීම. • නීති ආධාර කොමිෂන් සභාවට අත්දැකීම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට හැකි වීම පිණිස කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා වැටුප් පරිමාණ වැඩි කිරීම. • සියලු ම නීතිඥයින්/ ආධුනික නීතිඥයින් හට වාර්ෂික ව මහජන සුබ සිද්ධිය පිණිස නීති සේවා සැපයීම සඳහා අනිවාර්ය පැය ගණනක් වෙන් කිරීම සහ නීති ආධාරවලට ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමය හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් අධීක්ෂණය කිරීම. • නීතිඥවරුන්ගේ අවකල් ක්‍රියා පිළිබඳ ව සෘජු ව ම ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කිරීමට සිරකරුවන් බලාත්මක කිරීම. • රජය විසින් පත් කරන නීතිඥයින්ට ලබා දෙන වේතනය වැඩි දියුණු කිරීම.

3.2.2		නෛතික නියෝජනයට ප්‍රවේශය	• බන්ධනාගාර පරිපාලනය මඟින් සිරකරුවන්ට, විශේෂයෙන් විදේශීය ජාතිකයින්ට, අපරාධ නීතිඥයින්ගේ නම්, සම්බන්ධ කර ගැනීමේ විස්තර සහ සුදුසුකම් සහිත සාක්ෂි පත්‍ර ලබා දී ඒ මඟින් නීති නියෝජනය කෙරෙහි රිමාන්ඩ් භාරයේ සිටින්නන්ගේ ප්‍රවේශය වැඩි දියුණු කිරීම. • සියලු බන්ධනාගාර තුළ, විශේෂයෙන් නීති නියෝජිතයින් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය වන රිමාන්ඩ් භාරයේ සිටින්නන් සඳහා දුරකථන කුටි පහසුකම් සැපයීම. • සැකකරුවන්ට පොලිස් ස්ථානයේ සිට නීති උපදේශකවරුන් හෝ නීති ආධාර නියෝජිතයින් සම්බන්ධ කර ගැනීමට ඉඩ දීම. • පළාත්වල නඩු ඇසීමට හැකි වීම පිණිස මෙන් ම, කොළඹින් පිට සිටින්නන් හට අභියාචනා ක්‍රියාවලියට පිවිසීම පහසු කිරීමට අභියාචනාධිකරණය විමධ්‍යගත කිරීම, සහ අභියාචනා ඉදිරිපත් කිරීමේ පිරිවැය අඩු කර ඒ මඟින් ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීම.
3.3	නෛතික සහ අධිකරණ ක්‍රියාවලිය		
3.3.1		ඇපදීම සහ ඇපදීමේ කොන්දේසි	• ඇප ප්‍රදානය කිරීම ව්‍යතිරේකයට වඩා රීතිය බව සහතික කිරීමට ඇප ලබා දීමේ පනතෙහි (ඇප පනත) විධිවිධානවලට අනුව, නඩුවෙන් නඩුව මත (සිද්ධියෙන් සිද්ධිය මත) පදනම් ව, සාධාරණ ඇප කොන්දේසි සැකසීම බලදායී කිරීමට මාර්ගෝපදේශ නිකුත් කිරීම. • ඇප ප්‍රතික්ෂේප කිරීම/ රිමාන්ඩ් කාලය දීර්ඝ කිරීම සඳහා හේතුව ලබා දීම ලිඛිත ව සිදු කරන ලෙස අනිවාර්ය කිරීම. • ඇප කොන්දේසි ඉටු කිරීමට නොහැකි රැඳවියන් නිදහස් කිරීමට රිමාන්ඩ් සිරකරුවන් නිදහස් කිරීමේ පනතෙහි විධිවිධාන පිළිපැදීම සහතික කිරීම සහ එසේ කිරීම සඳහා මහේස්ත්‍රාත්වරුන් බන්ධනාගාරවලට යාම අනිවාර්ය කිරීම. • දඩ ගෙවීම් කිරීමට වත්කමක් නොමැති පුද්ගලයින් සිරගත කිරීම වෙනුවට එය වාරික වශයෙන් ගෙවීමට ඔවුන්ට ඉඩ දීම.
3.3.2		අධිකරණ ක්‍රියාවලියේ ප්‍රමාද වීම්	• මහේස්ත්‍රාත් අධිකරණයේ ප්‍රමාද වීම්වලට හේතු අවබෝධ කර ගැනීමට සහ විසඳුම් යෝජනා කිරීමට අධිකරණ කටයුතු පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම. • නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රමාද වීම්වලට හේතු නිශ්චය කිරීමට දෙපාර්තමේන්තුව මඟින් අභ්‍යන්තර සමාලෝචනයක් සිදු කිරීම සහ ලිපිගොනු පිරිසැකසුම් කරන අයුරු සොයා බැලීමට නඩු කළමනාකරණ ක්‍රමවේදය ඩිජිටල්කරණය කිරීම වැනි විසඳුම් සැලසුම් කිරීම සහ නිලධාරීන් වග වන ලෙස තබා ගැනීම.

3.3.3		අධිකරණ සහ අධිකරණ කටයුතු තුළ නෛතික ආධාර සහ වෙනත් සහාය	• සිරකරුවන් සඳහා නීති නියෝජනයට සම ප්‍රවේශයක් තිබීමට නෛතික සහාය ශක්තිමත් කිරීම, සහ මේ සම්බන්ධයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව ස්වේච්ඡා සංවිධානවල සහාය පැතීම. • භාෂා ප්‍රවීණත්වය නොමැති වීම හේතුවෙන් අධිකරණ කටයුතු තේරුම් ගැනීමට රැඳවියන් අසමත් වීම ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රමාණවත් පරිවර්තකයින් බඳවා ගැනීම. • අධිකරණ විනිසුරුවරුන්ට විශාල නඩු ප්‍රමාණයක් පවතින සන්දර්භයක් තුළ විත්තිකරුවන්ට තම ගැටලු විනිසුරුවරුන් වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීමෙන් යුක්තිය කෙරෙහි සම ප්‍රවේශයක් තිබීම සහතික කිරීම සඳහා අධිකරණයට සහාය ලබා දීම. • සිරකරුවන් මාරු කිරීමේ දී ඔවුන් මුහුණ දෙන දුෂ්කරතා අඩු කර ගැනීමට බන්ධනාග ාර දෙපාර්තමේන්තුවට වාහන සහ සේවක පිරිස් වැඩිපුර ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සහ සම්පත් වෙන් කර දීම සහ සිරකරුවන්ට විශේෂයෙන් බොහෝ දුර ගමන් කිරීමට සිදු වන විට, සුදුසු වේලාවන්හි දී ආහාර ලබා දීම සහ සාධාරණ කාල වේලාවල දී වැසිකිළි පහසුකම්වලට ප්‍රවේශය ලබාදීම සඳහා සිරකරුවන් මාරු කිරීමේ ප්‍රෝටොකෝලයක් පිහිටුවීම. • විත්තිකරුවන් කුටියක (කූඩුවක) රඳවා ගැනීම වෙනුවට, මහේස්ත්‍රාත් අධිකරණය තුළ මායිම් කළ ප්‍රදේශයක වාඩි වීමට ඉඩ දීම.
3.4	ප්‍රචණ්ඩත්වයේ අඛණ්ඩතාව		
3.4.1		අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ	• අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ශුන්‍යඉවසීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සහ බන්ධනාගාර සහ පොලිස් නිලධාරීන්ට එරෙහි ව ප්‍රචණ්ඩත්වය පිළිබඳ ව ඇති චෝදනා ගැන අභ්‍යන්තර සහ බාහිර ආයතන දෙක ම විසින් විමර්ශන පැවැත්වීම සහ දැඩි ක්‍රියාමාර්ග ගැනීම. • නිලධාරීන්ට එරෙහි ව ප්‍රමාණවත් සාක්ෂි ඇති අවස්ථාවල දී වධ හිංසාවට එරෙහි සම්මුතිය පිළිබඳ පනත යටතේ ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කිරීම. • අත්අඩංගුවේ දී සිදු වන ප්‍රචණ්ඩත්වය මැඩලීමට අධිකරණ නිලධාරියෙක් වෙත ඉදිරිපත් කිරීමේ දී සහ මහේස්ත්‍රාත්වරුන් බන්ධනාගාරය බැහැදැකීමට යාම හරහා දැඩි අධිකරණ අධීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම. • අධිකරණයට ඉදිරිපත් කරන සියලු ම පුද්ගලයින්ගෙන් ඔවුන් අත්අඩංගුවේ සිටිය දී පහරදීමට ලක්වී දැයි විනිසුරුවරුන් විසින් විමසීම අවශ්‍ය බවට අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් හඳුන්වා දුන් ප්‍රතිපත්තිය ගැන සලකා බැලීම. • රැඳවියන්ට පහරකෑම් පිළිබඳ ව පැමිණිලි මානව හිමිකම් කොමිෂන් සභාව ඇතුළු ව බාහිර ආයතනවලට ඉදිරිපත් කිරීමට සුරක්ෂිත සහ විශ්වසනීය මාර්ගයක් සපයා දීම.

			• බන්ධනාගාර නිලධාරීන්ට සාමය හා විනය පවත්වා ගැනීමේ අවිහිංසාවාදී විධික්‍රම පිළිබඳ ව පුහුණු ලබා දීම. • නීති විරෝධී බලය භාවිත නොකර අත්අඩංගුවට ගැනීම් සිදු කිරීමට සහ සාක්ෂි ලබා ගැනීමට පොලිස් දෙපාර්තමේන්තුව මඟින් පොලිස් නිලධාරීන්ට පුහුණු ලබා දීම. • සිරකරුවෙකුට පහර දීමේ ප්‍රතිවිපාක සහ වධහිංසාවට එරෙහි සම්මුතිය පිළිබඳ පනත යටතේ පැනවිය හැකි දඬුවම ගැන බන්ධනාගාර සහ පොලිස් නිලධාරීන් අතර දැනුවත්භාවය ඇති කිරීම.
3.5	සිරගත නොකරන ක්‍රියාමාර්ග		
3.5.1		බන්ධනාගාර ගත කිරීම වෙනුවට විකල්ප	• සිරභාරයට නොගන්නා ක්‍රමවේදවලට ප්‍රමුඛත්වය දීම සඳහා දණ්ඩන ප්‍රතිපත්ති සහ නීති සංශෝධනය කිරීම සහ නවීකරණය කිරීම. • නිශ්චිත අදාළ නීතිමය විධිවිධාන යටතේ සිරභාරයට නොගන්නා ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිපාදන ලබා දී ඇති ප්‍රජා මූල විශෝධනයන්, මත්ද්‍රව්‍ය පුනරුත්ථාපනය සහ පරිවාසය වැනි විකල්පවලට ප්‍රමුඛත්වය දීමට අධිකරණ නිලධාරීන්ට අනුබල දීම. • මාර්ගෝපදේශ සහ නිර්ණායක නිකුත් කිරීම සහ සිරභාරයට නොගන්නා ක්‍රියාමාර්ග සඳහා නියම කර ඇති කොන්දේසි, සිරකරුවන්ට ඒවා නිෂ්ඵල වී සිරගත වීමට හේතු වන තරම් දැඩි නොවන බව සහතික කිරීමට, ප්‍රජා මූල විශෝධන නියමයන් සකස් කිරීමේ දී විනිසුරුවරුන්ට සහාය වීමට ප්‍රජා මූල විශෝධන දෙපාර්තමේන්තුවේ සහයෝගිත්වයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් මාර්ගෝපදේශ සහ නිර්ණායක නිකුත් කිරීම. • ප්‍රබල මානසික සහ ශාරීරික ආබාධිතතා සහිත පුද්ගලයින් සිරගත කිරීම වැළැක්වීම. බන්ධනාගාරය තුළ ශාරීරික සහ මානසික සෞඛ්‍යය උග්‍ර විය හැකි පුද්ගලයින්, දඩ මුදල් ගෙවිය නොහැකි පුද්ගලයින් සහ තරුණ වරදකරුවන්, වැඩිහිටි සිරකරුවන් සහ පුනරුත්ථාපනය අවශ්‍ය කරන මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී ඇති පුද්ගලයින් සඳහා හිර අඩස්සියේ නොසිටින ක්‍රියා මාර්ග භාවිත කිරීම. • පොලීසිය සහ නඩු පැවරීමේ බලධාරීන් විසින් ඉහත සඳහන් කළ වරද කරුවන් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදයෙන් ඉවතට ගෙන, හිර අඩස්සියේ නොසිටින සහ පුනරුත්ථාපන ක්‍රමවේදයට ඇතුළු කිරීම. • ප්‍රතිකාර සඳහා යොමු කළ යුතු මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් සහ නඩු පැවරිය යුතු මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් අතර වෙන් කොට හඳුනා ගැනීමේ විධික්‍රම පිළිබඳ ව පොලීසියට පුහුණු ලබා දීම. • ප්‍රජා මූල විශෝධන දෙපාර්තමේන්තුවෙහි සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමෙන්, ප්‍රජා මූල විශෝධන නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමෙන් එය ශක්තිමත් කිරීම. අමතර ව සේවක සංඛ්‍යාව බඳවා ගැනීම සඳහා මෙන් ම පරිපාලන සහ මනා සංවිධාන පහසුකම් සඳහා අවශ්‍ය කරන මූල්‍ය සම්පත් වෙන් කිරීම.

			• 1999 අංක 46 දරන ප්‍රජා මූල විශෝධන පනත ගැන සහ ප්‍රජාවන් වෙත ළඟා වීම සඳහා පුනරුත්ථාපනය සහ යළි ප්‍රකෘති තත්ත්වයට පත් කිරීම තුළ එහි වැදගත් කාර්යභාරය ගැන දැනුවත් භාවය වැඩි කිරීම සහ ප්‍රජා මූල විශෝධනය කිරීම සහ ප්‍රජා මූල විශෝධන සිරගත කිරීමෙන් වෙනස් වන අන්දම සම්පූර්ණයෙන් තේරුම් ගැනීම සඳහා වරදකරුවන් බලාත්මක කිරීම. • වැඩිහිටි වරදකරුවන් සඳහා පරිවාස කාලය ක්‍රියාත්මක කිරීමට වෙන ම ජාතික ආයතනයක් පිහිටුවීම සහ ඔවුන්ගේ පරිවාස කොන්දේසි පිළි පැදීම අධීක්ෂණය කිරීම. • සිරගත කිරීමට විකල්පයක් ලෙස වරදකරුවන් පරිවාස කිරීමේ ආඥා පනත භාවිත කළ හැකි වීම පිළිබඳ ව අධිකරණ නිලධාරීන්ට සහ නීති වෘත්තිකයින්ට සන්නිවේදනය කිරීම. • ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට සංවේදී වීමට සහ දරිද්‍රතාවය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ සාපරාධී හැසිරීම් පිළිබඳ චක්‍රයකට හසු වී සිටින, ශ්‍රී ලංකා දණ්ඩනීය ක්‍රමවේදය යටතේ සිරගත වී සිටින කාන්තාවන්ගේ විශේෂිත තත්ත්වයන් සැලකිල්ලට ගැනීමට අධිකරණයට අනුබල දීම. • ප්‍රාථමික රැකබලා ගන්නන් සහ තනි ආදායම් උපයන්නන්ට එම චක්‍රය බිඳ දැමීමට සහ ඔවුන්ගේ දරුවන් ඒ වෙත ඇදී නොයාම සහතික කිරීම සඳහා ප්‍රජා මූල විශෝධන ප්‍රවර්ධනය කිරීම. • මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම මහජන සෞඛ්‍ය ගැටලුවක් ලෙස සැලකීම සහ ගැටලු සහිත පුද්ගලයින්ට ප්‍රතිකාර සඳහා ප්‍රවේශය, උපදේශනය සහ අවශ්‍ය වුවහොත්, තාවකාලික නවාතැන් සැපයීම සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් අතින් කෙරෙන සුළු නීති කඩ කිරීම් හැකි තාක් දුරට සිරගත කිරීම වෙනුවට ඇති විකල්ප හරහා ආමන්ත්‍රණය කිරීම.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද බන්ධනාගාර පිළිබඳ ජාතික අධ්‍යයනයේ වාර්තාවේ විධායක සාරාංශය සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සිරකරුවන් පිළිබඳ පරිච්ඡේදයේ නිල නොවන පරිවර්තනයකි

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவினால் வெளியிடப்பட்ட சிறைச்சாலைகள் தொடர்பான தேசிய ஆய்வறிக்கையில் இருந்து நிறைவேற்றுச் சுருக்கம் மற்றும் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின் கீழ் தடுத்து வைக்கப்பட்டுள்ள கைதிகள் பற்றிய அத்தியாயத்தின் உத்தியோகபூர்வமற்ற மொழிபெயர்ப்பு

ISBN 978-624-5860-03-6